

# ධම්මපද පුරාණ

# සන්නය.

# ධම්මපද පුරාණ සන්නය.

(ග්‍රන්ථිපද විවරණ සහිතයි.)

---

පැලියගොඩ විද්‍යාලඞ්කාරමහාවිද්‍යාලයෙහි උපාචාර්‍ය්‍යධුරන්ධර

**කඹුරුපිටියේ ධම්මරතන ස්ථවිරපාදයන්වහන්සේ**

- විසින් -

ද්විතීය සංස්කරණයෙන්

සංශොධිතයි.

---

ඩී. පී. ඊ. දිසානායකමහතා විසින්

මහාබොධියන්ත්‍රාලයෙහි

මුද්‍රාපිතයි.

---

# THE OLD COMMENTARY

OF THE

# DHAMMAPADA

(WITH A GLOSSARY.)

---

EDITED BY

KAMBURUPITIYE DHAMMARATANA STHAVIRA

Member of the Oriental Studies Society

and

Assistant Teacher, Vidyalankara Oriental College,

Peliyagoda, Kelaniya.

---

PRINTED BY

D. P. E. DISSANAYAKA

AT THE

MAHA BODHI PRESS

B. E. 2469.

C. E. 1926.

# සංඥපනය.

**"යථාසභාවතො කථිතත්තා සත්තතිංසබොධපක්ඛිය ධම්මසංඛාතං ධම්මපදං"** යි අර්ථකථායෙහි යු බැවින් සප්තත්‍රිංශද්බොධපාක්ෂිකධර්මපදසඞ්ඛ්‍යාත ධර්මසමූහපර්‍ය්‍යාපන්න **ධම්මපද** (ධම්පියා) නම්වූ මේ ප්‍රශස්තග්‍රන්ථයතෙමෙ චතුර්වෛශාරද්‍යවිශාරදවූ දශබලධාරීවූ සද්ධර්මවරචක්‍රවර්ත්තිස්වාමීවූ අප තථාගත සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ විසින් සම්ප්‍රාප්තපර්ෂද්දට අනුරූප ප්‍රාතිහාර්‍ය්‍යයෙන් වැඩහිඳ නානානයනිපුණවූ අනෙකාධ්‍යාශය සමුත්ථානවූ අර්ථව්‍යඤ්ජනසම්පන්න වූ ධර්මාර්ථදෙශනාප්‍රතිවෙධ ගම්භීරවූ සර්වසත්වයනට ස්වභාෂානුරූපසේ ලක්ෂණීයස්වභාව ඇති ශ්‍රැතිරම්‍යවූ අෂ්ටාඞ්ගසමුපෙතදෙශනාරශ්මින් වෛනෙය ජනකුමුද්වනයන් ප්‍රබොධකොට ඒ ඒ තන්හි උපනුපන් ඉන්ද්‍රගොපකමද්දන අක්ඛිභෙදනාදි ඒ ඒ කරුණු අරභයා මහකුලුණුවෙයින් ඔසවනලදසිත්ඇති වැ දෙශනාකර වදාරන ලද පිටකත්‍රයධර්මයන් අතුරෙන් සූත්‍රපිටකයට අයත්වූ පස් මහනිකායයන් අතුරෙන් පස්වනුවූ **ඛුද්දකනිකායාන්තර්ගත** මාහැඟි ධර්මප්‍රකරණයෙකි.

**"ධම්මො ච සො පදං චාති ධම්මපදං"** යනු විග්‍රහ හෙයින් ධර්මවූයේත් හේමයැ පදවූයේත් හේමනුයි **ධම්මපද** නම්වේ. මෙහි ධර්මශබ්දය තෙමෙ **"ඉධ භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං"** යනාදිතන්හි සෙයින් පෙලදහම ප්‍රකාශකෙරෙයි. පද ශබ්දය තෙමෙ **"සන්තිපදං"** යනතන්හි සෙයින් ප්‍රතිෂ්ඨාර්ථය හා **"නස්ස න ඵ ධම්මපද අපිලාපනති"** යන තන්හි සෙයින් කොට්ඨාසාර්ථයද ප්‍රකාශකෙරෙයි. පාල්‍යර්ථයෙන් ධර්මවූයේත් හේමයැ ප්‍රතිෂ්ඨාර්ථයෙන් හා කොට්ඨාසාර්ථයෙන් පදවූයේත් හේමනුයි **ධම්මපද** නම්වේ යනු මෙහි තාත්පර්‍ය්‍යාර්ථයි. මෙහි ප්‍රතිෂ්ඨාර්ථය නම් මෙය අවබොධකළවුන් දුගතියකට හෝ සසරට හෝ නොවැටියදී ඉන් වළකා යන අර්ථයැ; කොට්ඨාසාර්ථ නම් පෙළ දම්හි අවයවාර්ථයි.

"රත්පැහැ සෙසු මල්හි ඇතද රත්මල යුව එක් මෙ මලක් ගැණෙන බැවින් මෙ අරුත් හැමයට සාමාන්‍යහොතුදු මෙතැනැ "ධම්මපදං" යනුයෙන් **තුන්සියක්වක්** පිණිස දෙසූ **සතරසිය සොවිසිගයෙක්** ද හේ මෙ ගැනේ" යි **ධම්පියාගැටපද යෙහි** දක්වූ නියායි. "**පඤ්ඤවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස**" යි වදළ බැවින් තථාගතයන්වහන්සේගේ එක ගාථාමාත්‍රවූ බුඩවචනයකුදු චතුරාර්‍යසත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදාදී ධර්මවිභාගයන් උපුටාගැනීමෙහි සමර්ථවූ නයක්‍රමයෙන් ප්‍රතිමණ්ඩිතහෙයින් පරමගම්භිරයැ; අතිසූක්ෂමඥනවිෂයක වන හෙයින් පැනැතියන්හට මුත් නොපැනැතියන් හට ගොචර නොවේමැයි.

ඒ මේ ධර්මපදසඞ්ඛ්‍යාත සියලු බුඩවචනයම **පඤ්චසතිකා, සත්තසතිකා, සාහස්සිකා**, නම්වූ සඞ්ගීතිත්‍රයෙහි අන්තර්ගත වූයේය. එහි ශ්‍රීඝනසුගතතථාගත අප සම්මාසම්බුද්ධරජාණන්වහන්සේ පන්සාලිස්වසක්මුළුල්ලෙහි දෙව්මිනිසුන්සහිත ලෝකයාහට සිදුකරනලද ලෞකිකලොකොත්තරාර්ථ හිතසුඛඇතිසේක් කුසිනාරානුවර උපවත්තනනම්වූ මල්ලරජුන්ගේ **සල්උයන්හි** යුගම්සාලාන්තරයෙහි වෙසගපුණුපොහෝදින අලුයම්හි නිරුපධිශෙෂපරිනිර්වාණධාතුවෙන් පිරිනිවි සියුවනමසෙහි රජගහානුවර වෙභාරනම්පර්වතපාර්ශ්වයෙහි සප්තපර්ණීගුහාවාරයෙහි **අජාතශත්‍රු**මහරජතුමන් විසින් දෙව්විමනක් සෙයින් විසිතුරු කොට කරවනලද ධර්මමණ්ඩපයෙහි රැස්වූ **අනුබුද්ධමහාකාශ්‍යප** මහරහතන් ප්‍රමුඛකොටඇති අතීතසත්ථුකපාවචනාභිලාසී පන්සියයක් මහානුභාවසම්පන්න මහරහතන්වහන්සේලා විසින් සත්මසකින් නිමවනලද **ප්‍රථමසඞ්ගීතිය** පන්සියයක් දෙනාවහන්සේ විසින් කොට නිමවූහෙයින් **පඤ්චසතිකා** නමැයි කියනු ලැබේ

ඉක්බිති ලොකනාථවූ තථාගතයන්වහන්සේ පිරිනිවි සියක් :න හවුරුදුයෙහි දසදහසක් වෙසාලියපාපභික්ෂූන් විසින් උපදවනලද සියලුශාසනමලය පිරිසුදුකොට **යශස්ථවිර**ප්‍රමුඛ සත්සියයක් මහරහත්හු **කාලාශොක** නරපතිහු විසින් කරවන ලද ආරක්ෂාසංවිධාන ඇතිවැ අටමසෙකින් **ද්විතීය සඞ්ගීතිය** කොට නිමවූහ. මෝතොමෝ සත්සියයක්දෙනා වහන්සේ විසින් කරනලද හෙයින් **සත්තසතිකා** නමැයි කියනු ලැබේ

ඉක්බිති තථාගතපරිනිර්වාණයෙන් දෙසියසතිසවනවසෙහි මූළමහත්දඹදිව ඒකාතපත්‍රකොට රජසිරිවන් මහපිනැති මහපැණැති **ධර්මාශෝක**නරපතිහු විසින් දිනක්පාසා පන්ලක්ෂයක් පමණ මහඝනපරිත්‍යාගයෙන් බුදුසසුන්හි පවත්වනලද ලාභසත්කාරයන්හි ගිජුවූ සැටදහසක්තීර්ථකයන් විසින් මේ ධර්මය මේ විනය යයි දක්වමින් උපදවනලද සියලුශාසනමලය දුරුකොට **මොග්ගලිපුත්තතිස්ස** මහරහතන් ප්‍රමුඛකොටඇති දහසක් පමණ මහරහත්හු පැළලුප්නුවර අශෝකාරාමමහාවිහාරයෙහි රැස්වූවාහු තන්නරපතිහුගෙන් ලබනලද ආරක්ෂාසංවිධාන ඇතිව නවමසකින් **තෘතීය සඞ්ගීතිය** කොට නිමවූහ. මේ තොමෝ දහසක්දෙනාවහන්සේ විසින් කරනලද හෙයින් **සාහස්සිකා** යයි කියනුලැබේ.

මෙසේ සඞ්ගීතිත්‍රයාරූඪවූ සියලුම බුද්ධවචන ඒකම විමුක්තිරසයෙන් යුක්තහෙයින් රසවිසින් ඒකවිධයැ; ධර්ම විනය විසින් ද්විවිධයැ; ප්‍රථම මධ්‍යම පශ්චිම විසින් ත්‍රිවිධයැ; සූත්‍ර අභිධර්ම විනය විසින් ද ත්‍රිවිධ යැ; දීඝනිකාය යැ මජ්ඣිමනිකාය යැ සංයුත්ත නිකාය යැ අඞ්ගුත්තර නිකාය යැ ඛුද්දක නිකායැ යි නිකාය විසින් පඤ්චවිධ යැ; සූත්‍රාදි අඞ්ගවිසින් නවවිධ යැ; ධර්මස්කන්ධ විසින් අසූසාරදහසෙකැයි දතයුතු.

එවුනතුරෙහි සූත්‍රපිටකයෙහි පස්මහානිකායට අයත් පස්වනුවූ ඛුද්දකනිකායතෙම ඛුද්දකපාඨය; ධම්මපදය; උදානය; ඉතිවුත්තකය; සුත්තනිපාතය; විමානවත්ථුය; පේතවත්ථුය; ථෙරගාථාය; ථෙරීගාථාය; ජාතකය; නිද්දේසය; පටිසම්භිදාය; අපදානය; බුද්ධවංසය; චරියාපිටකයයි කියනලද පසළොස්ප්‍රකරණයකින් සඞ්ගෘහිතයැ. එහෙයින් මේ ධම්මපදය ද ඛුද්දකනිකායයට අයැතිවේ.

හෙද සූත්‍රය; ගෙය්‍යය; වෙය්‍යාකරණය; ගාථාය; උදානය; ඉතිවුත්තකය; ජාතකය; අද්භූතධර්මය; වෙදල්ලය; යන නවාඞ්ග ශාස්තෘශාසනපර්‍යාපන්න සකලබුද්ධවචනයන් අතුරෙහි සතර වැනිවූ ගාථාඞ්ගයට අයත් වේ.

මෙහි උභතොවිභඞ්ගය, නිද්දෙසය, ඛන්ධකය, පරිවාරය, සූත්‍රනිපාතයෙහි මඞ්ගලසූත්‍රය, රතනසූත්‍රය, නාලකසූත්‍රය, තුවටකසූත්‍රය, යන මේ ආදිය හා එසේම සූත්‍රනාමක සියලු තථාගතවචනද **සූත්‍රාඞ්ග** නම් වේ. සියලුම සගාථක (ගාථා

ඇති) සූත්‍ර හා සංයුත්සඟියෙහි සියලුසගාථකවර්ගීද **ගෙය්‍යාඞ්ග** නම් වේ. සියලුඅභිධර්මපිටකය හා නිර්ගාථකසූත්‍ර හා අනික් අටඅඟින් සඞ්ග්‍රහනොවූ සියලුබුද්ධවචනද **වෙය්‍යාකරණාඞ්ග** නම් වේ. ධම්මපද ථෙරගාථා ථෙරිගාථා හා සූත්‍රනිපාතයෙහි සූත්‍රනාමයට අයත්නොවූ සුද්ධිකගාථාද **ගාථාඞ්ග** නම් වේ. සෞමනස්‍යඥානමයිකගාථාප්‍රතිසංයුක්ත දෙඅසූසූත්‍රාන්තයෝ **උදානාඞ්ග** නම් වෙති. "වුත්තං හෙතං භගවතා" යන ආදීන් දක්වූ එක්සිය දසයක් පමණ සූත්‍රාන්තයෝ **ඉතිවුත්තකාඞ්ග** නම් වෙති. අපණ්ණකජාතකාදි පන්සියපනස්ජාතකදෙශනාවෝ **ජාතකාඞ්ග** නම් වෙති. "චත්තාරො මෙ භික්ඛවෙ අච්ඡරියා, අබ්භුතා ධම්මා ආනන්දෙ" යන ආදීන් පැවති සියලු ආශ්චර්‍ය්‍ය අද්භූතධර්මප්‍රතිසංයුක්තසූත්‍රාන්තයෝ **අද්භූතධර්මාඞ්ග** නම් වෙති. චූලවෙදල්ල මහාවෙදල්ල සම්මාදිට්ඨි සක්කපඤ්හ සංඛාරභාජනිය මහාපුණ්ණමසූත්‍රාදීහු වෙදය හා තුෂ්ටියත් ලැබ ලැබ ප්‍රකාශකරනලද හෙයින් **වෛදල්‍යාඞ්ග** නම් වෙත්යයි දතයුතු.

ලෞකිකලොකොත්තරාර්ථයන් ප්‍රකාශකරනහෙයින්ද වෛනෙයජනයන්ගේ අධ්‍යාශයයන්ට අනුකූලව වදාරනලද හෙයින්ද ඵලයන් නිපදවන ශස්‍යජාතයන් මෙන් අනුපූර්වශික්ෂාදීන් සදුපායපථානුයායිපුද්ගලයනට මහදර්ථයන් නිපදවන හෙයින් ද යථාකාලයෙහි උපායයෙන් කිරිවගුරුවන දෙනක් මෙන් නිර්මලාර්ථයන් වගුරුවන හෙයින් ද ප්‍රතිපන්නකයන් සතර අපායයෙහි නොවැටියදී මනාකොට ආරක්ෂාකරන හෙයින්ද වඩුවන්ගේ දැලිනූලමෙන් පණ්ඩිතයන් හට කාරුණු විසඳලීමට සභාගවනහෙයින්ද හුයෙක්හි ඇවුණු මල්රැසක් මෙන් අර්ථයන් සඞ්ගෘහිතවන බැවින් ද සියලුබුද්ධවචනයහට සූත්‍රනාමය තෙමෙ **සාමාන්‍යවිධි** වශයෙන් ව්‍යවහාරකරනුලැබේ

එහෙයින් කීහ.

"සුත්තන්ති සාමඤ්ඤවිධි විසෙසවිධයො පරෙ
සනිමිත්තා නිරූළ්හත්තා සහිතාඤ්ඤනනාඤ්ඤතො"යි

**"එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං"** **"සාවත්ථියා සුත්තවිභඞ්ගෙ" "සකවාදෙ" පඤ්චසුත්තසතානි"** යන ආදිවචනහෙයින් විනයාභිධර්මපර්‍ය්‍යාප්තිවිශෙෂයෙහිදු සූත්‍රව්‍යවහාරය පැනෙයි. මෙයින් අන්‍යවූ ගෙය්‍යදිනාමයෝ තත්තත්කාරණහෙතුයෙන් පනවනලදබැවින් **විශෙෂවිධිහු** වෙත්. ගාථායෙන් වෙන්වූ ප්‍රශ්නවිසර්ජනයෙන් යුත් සූත්‍රයෝ වෙය්‍යාකරණ නම් වෙත්.

එහෙයින් කීහු.

"**සගාථකං සුත්තං ගෙය්‍යං නිග්ගාථකං සුත්තං වෙය්‍යාකරණං**"යි එසේ කලැ සගාථකසූත්‍රයන්ටද ප්‍රශ්නවිසඳීම් වශයෙන් පැවතිකලැ වෙය්‍යාකරණාඞ්ගභාවය පැමිණේද යත්? ගෙය්‍යාදි සඥාවන්ට අනවකාශහෙයින්ද නිග්ගාථකමය යි වෙසෙසූ හෙයින්ද එසේ නොවේමැයි.

ධම්මපදාදිකෙවලගාථාබන්ධ දෙශනාවන්හිද ගාථාසහිත වුවත් සොමනස්සඤාණමයිකදෙශනාවන්හිද "වුත්තං හෙතං" යන ආදි වචනසම්බන්ධයඇති දෙශනාවන්හිද අද්භූතධර්මප්‍රතිසංයුක්ත දෙශනාවන්හිද පිළිවෙළින් ගාථා උදාන ඉතිවුත්තක අද්භූතධර්මසංඥාවෝ ප්‍රතිෂ්ඨිතයහ. ගාථාබන්ධභාවයඇතත් භාග්‍යවත්හුගේ අතීතජාතියෙහි චර්‍ය්‍යානුභාවප්‍රකාශක දෙශනාවිශෙෂයන්හි ජාතකසංඥාවද ප්‍රශ්නවිසර්ජනයහා සගාථකත්වය ඇතත් සතුටලැබලැබම දෙසූහෙයින් ඇතැම්සූත්‍රයන්හි වෙදල්ලසංඥාවදැයි මෙසේ ඒ ඒ සගාථකත්වාදිනිමිත්තින් ගෙය්‍යාඞ්ගාදිනාමයන් ප්‍රකාශිතහෙයින් සූත්‍රාඞ්ගයහැර අවශෙෂ අෂ්ටාඞ්ගයෝ **විශෙෂවිධිහු** වෙත්යයි දතයුතු.

මෙසේ සමාසව්‍යාසසාකල්‍යාදීන්අතුරෙහි සමාසමුඛයෙන් හා එකත්වනය නානාත්වනයාදීවශයෙන්ද යථාස්වභාව වශයෙන්ද දෙශනාකරවදාරනලද ගාථාඞ්ගපර්‍ය්‍යාපන්නවූ මේ ධම්මපදය සාරසියතෙවිස්සක් ගාථාවන්ගෙන් හා **යමක, අප්පමාද, චිත්ත, පුප්ඵ, බාල, පණ්ඩිත, අරහන්ත, සහස්ස, පාප, දණ්ඩ, ජර, අත්ත, ලොක, බුද්ධ, සුඛ, පිය, කොධ, මල; ධම්මට්ඨ' මග්ග, පකිණ්ණක, නිරය, නාග, තණ්හා, භික්ඛු, බ්‍රාහ්මණ,** යන මෙකී සව්සිවගකින් ප්‍රතිමණ්ඩිත වැ සම්බුද්ධශාසනමාමක ශික්ෂාගරුක සියලුශාසනිකආචාර්‍ය්‍යපරම්පරාවන්හි මුඛපාඨවශයෙන්ද අධ්‍යයනඅධ්‍යාපනාදිවශයෙන්ද මුදුන්මල්කඩක්මෙන් සතතසම්භාවිත වැ පවත්නේය. ප්‍රථමසංගායනාසමයෙහි මහාකාශ්‍යපමහරහතන් ප්‍රමුඛවූ සියුපිළිසිඹියාපත්මහරහතුන්, විසින් සඞ්ගායනලද මේ ධර්මපදයපිළිබඳවූ අර්ථකථාතොමෝ ශ්‍රීලඞ්කාශාසනප්‍රතිෂ්ඨාපක **මහාමහෙන්ද්‍ර**මහරහතන් වහන්සේ විසින් මෙහි ගෙනඑනලදුව සිංහලභාෂායෙන් තබනලද නමුත් ඒ සිංහලඅටුවාතොමෝ සිංහලවිපවාසීන් හැර සියලුලොකයාගේ හිතාර්ථසිද්ධිනිෂ්පාදනයෙහි සමර්ථාකාරයෙන් පමණ නොවන්නීයැයි සලකාවදාළ අශෙෂදෙශවාසීන්ගේ හිතසම්පත්

කැමැතිවූ **කුමාරකාශ්‍යප** නම් මහාස්ථවිරයන් විසින් අයදනා ලද සකසමයසමයාන්තරපාරාවාරපාරදර්ශීවූ මහාවිහාර වංශාලංකාර අට්ඨකථාචාර්‍ය්‍ය ශ්‍රීමත් **අනුබුද්ධ බුද්ධඝෝෂ** මාහිමියන් විසින් පෙරතුබූ සිංහලභාෂාවත් අතිවිස්තරගතවචනක්‍රමයත් අත්හැර සාර්වජනීනමූලභාෂාවවූ මාගධීභාෂායෙන් අර්ථවිභාවනයකරනලදුව බණවර දෙසැත්තෑවකින් ප්‍රතිමණ්ඩිත වූවා **ධම්මපදට්ඨකථා** යයි ප්‍රකටවැ පවත්නීය.

මෙහිවනාහි යමකවර්ගයෙහි කථාවස්තු දසසතරකින්ද; අප්‍රමාදවර්ගයෙහි නවයකින්ද; චිත්තවර්ගයෙහි නවයකින්ද; පුෂ්පවර්ගයෙහි එකොළොසකින්ද; බාලවර්ගයෙහි දසසතරකින්ද; පණ්ඩිතවර්ගයෙහි එකොළොසකින්ද; අර්හද්වර්ගයෙහි දසයකින්ද; සහශ්‍රවර්ගයෙහි දසසතරකින්ද; පාපවර්ගයෙහි දොළොසකින්ද; දණ්ඩවර්ගයෙහි එකොළොසකින්ද; ජරාවර්ගයෙහි නවයකින්ද; ආත්මවර්ගයෙහි දසයකින්ද; ලෝකවර්ගයෙහි එකොළොසකින්ද; බුද්ධවර්ගයෙහි නවයකින් ද; සුඛවර්ගයෙහි අටකින් ද; ප්‍රියවර්ගයෙහි නවයකින් ද; ක්‍රෝධවර්ගයෙහි අටකින් ද; මලවර්ගයෙහි දොළොසකින් ද; ධර්මස්ථවර්ගයෙහි දසයකින්ද; මාර්ගවර්ගයෙහි දොළොසකින් ද; ප්‍රකීර්ණකවර්ගයෙහි දසයකින් ද; නිරයවර්ගයෙහි නවයකින් ද; නාගවර්ගයෙහි නවයකින් ද; තෘෂ්ණාවර්ගයෙහි දොළොසකින් ද; භික්ෂුවර්ගයෙහි දොළොසකින් ද; බ්‍රාහ්මණවර්ගයෙහි තිස්නවයකින්දැයි මෙසේ **වර්ගසවිස්සෙහි කථාවස්තු තුන්සියයකින්** යුක්තවේ.

මෙකියනලද ධර්මපදාර්ථකථාව හා **ශිලාමේඝවර්ණ අභය කාශ්‍යප** නරේන්ද්‍රයන් විසින් හෙළබසින් කරනලද **ධම්පියා ගැටපදය**ද; එසේම **ධම්මසෙන** මහතෙරුන් විසින් කරනලද **රත්නාවලි** නම් සෛංහලීයමහාප්‍රකරණය ද; යන පරිවාර ග්‍රන්ථාන්තරසම්පත්තින් පරිවෘතවූ මෙම ධම්මපදපාළියට සම්භාවනීය පණ්ඩිතොත්තමයකු විසින් අර්ථකථානුගත කොට කරනලද මධුරමනොහරභාෂාලාලිත්‍යයඇති මේ **"ධම්මපද පුරාණ සන්නය"** වූකලි සකලසෛංහලීයයන් අතරෙහි ගෞරවපාත්‍රවැ පවත්නේමැයි.

මෙම ව්‍යාඛ්‍යාකතෘහු පිළිබඳ කිසිවක් ඉතිහාසාදී අන්‍යවූ ග්‍රන්ථයක දක්නට නොලැබෙනබැවින් කවරකාලෙක කොතැනක විසූ කිනම් පඬිවරයෙක්දැයි අවිනිශ්චිතයැ.

ද්විතීය සංස්කරණයෙහිදී දෙමටගොඩ ධම්මප්‍රාසාදවිහාරස්ථානයෙන් ලැබුනු ධම්මපදපුරාණසන්නයෙක්හි "මොලගඹවෙ මහතෙරසාමින්කළ ධම්පියා සන්නයයි" යන මේ වාක්‍යය පමණක් අගට දක්නාලැබේ. මෙපමණෙකින්ම මෙහි කර්තෘහු පිළිබඳවිනිශ්චයක් කළනොහැකිවේ.

අනුමෙයබුද්ධීන් සලකනකලැ මෙහි භාෂාතත්වය හා අර්ථෝච්චාරණවිධිය "ප්‍රාතිමොක්ෂසන්නය" "විශුද්ධිමාර්ගසන්න" ආදියට සමකළහැකිබැවින් ඊට සමකාලීනවූ බුද්ධධර්මයෙහි හා නානාශාස්ත්‍රයන්හි විශාරදබුද්ධිමත් පඬිවරයෙක් යැයි සැලකීමට කරුණු පැනේ.

පඬිවරතෙමෙ කවරෙක්වුවත් අටුවාඅදහස් නොපිරිහෙළා හේ ගරුකිරීමෙන්ම අර්ථවර්ණනාකළඅයුරු සන්නයෙන්ම අටුවාඅදහසද මනාලෙසඅවබොධකරවනහෙයින් අතිශයින්ම ප්‍රශස්තවේ.

මෙම සන්නය ශුද්ධකොට මුද්‍රණයකරවීමෙහි ඇති විපුලාර්ථය සැලකූ අපවිසින් පුරාණසන්නකීපයක් සපයා අටුවාවටද සංසන්දනයකොට බැලීමෙන් පුරාණසන්නයෙහි ආලෙස කථාවස්තුනාමයන්ද නිරවද්‍යඅක්ෂරවින්‍යාසයද භාෂාරීතියද නොඉක්මැ ලෙඛකප්‍රමාදාදියෙන් ජනිතව ධර්මවිරොධව තුබූ තැන් රාශියක්ද සකස්කිරීමෙන් මෙසේ ශුද්ධියට පැමිණවූයෙමු.

ඉරුදින බෞද්ධපාඨශාලාවන්හි ඉගෙනුම්ලබන බෞද්ධ කුල දරුවන්ගේ හා පාරිවෙණික ශිෂ්‍යයන්ගේ විශෙෂප්‍රයොජනය සලකා සන්නයෙහි පදගතාර්ථ හැර වැඩිවිස්තරාර්ථ වක්‍රරෙඛා (බ්‍රැකට්) වලින් වටකරයෙදීමු.

පුරාණසන්නයෙහි බොහෝසෙයින් භාවාර්ථය ගරුකිරීමෙන් අර්ථදීතිබෙනහෙයින් පදාර්ථය පුහුණුකරන ආධුනිකයන්ට ඒ විස්තරාර්ථය පාඩම්කිරීමෙහි ඇති දුෂ්කරතාවය හා කෙටිවූ අර්ථය උපුටාගැනීමෙහි ඇති අපහසුවත් සලකා මෙකල සමහර ආධුනිකයන්ට මේ අනගිසන්නය අතැර අමුතුසන්නපවා පිළියෙළ කරන්ට වී තිබේ මේවර පොත සකස්කිරීමේ පිළිවෙළින් හෙද මෙයින්ම පරිපූර්ණ වේ යැයි සලකමු.

මෙම සන්නය භාවිතාකරන ධර්මශාස්ත්‍රාභිලාෂී සකල සාධූන්ගේ සුඛාවබෝධපිණිස සිංහලව්‍යාඛ්‍යානයෙහි අර්ථාවබෝධයට දුෂ්කරවචනයන්ට අර්ථදීමෙන් හා දුර්බෝධවූ ඒ ඒ ධර්මපදයන් විස්තරකිරීමෙන් **අකාරාදි** පිළිවෙළින් **ශුද්ධපදවිවරණයක්** ද මෙහි ග්‍රන්ථාවසානයෙහි යොදලීමු.

වුවමනා අවස්ථාවන්හි නමුදු ඇතැම් ගාථාවන් පිළිබඳ මූල පදය මුත් සෙසුපදයන් සිහිනොවීමෙන් අර්ථරසය හා ධර්මරසයත් විඳගතනොහැකිවීමෙහි චිත්තපරිශ්‍රමය දුරුකරනු සඳ හා ඒ ඒ ගාථාවන්ගේ මුල්පද ගෙනැ **ධම්පිශා අකාරාදියක්ද** පිළිවෙළින් මෙහි යෙදීමු.

තවද මෙම ග්‍රන්ථය ප්‍රථම ශෝධනයෙහිදී විද්‍යාලඞ්කාර පරිවේණාධිපති ශ්‍රීමත් අපනායක මාහිමියන්වහන්සේගේ ප්‍රතිග්‍රහණය ද කීර්තිශෙෂභාවොපගත මාතර බටුවිට "ඩී. ජී. අභයගුණරතන" පඬිතුමාගෙන් ලැබුනුඋපදෙස්සමූහයද ග්‍රන්ථශෝධනයෙහි විශෙෂා ධාරවූ බැව් කෘතඥතාවශයෙන් මෙහි සඳහන් කරමු.

නැවත මෙය මුද්‍රණයකරවීම අපඅදහස්පරිදි වියයුතුයි.

K. Dhammaratana,

$\frac{2466}{1923}$ ඔක්තෝබර් මස 1 වෙනි දින
පැළියගොඩ විද්‍යාලඞ්කාර පිරිවෙන්හිදීය.,

| පටුන. | | ගාථා |
|---|---|---|
| 1. යමක | වග්ගො | 1-20 |
| 2. අප්පමාද | " | 21-32 |
| 3. චිත්ත | " | 33-43 |
| 4. පුප්ඵ | " | 44-59 |
| 5. බාල | " | 60-75 |
| 6. පණ්ඩිත | " | 76-89 |
| 7. අරහන්ත | " | 90-99 |
| 8. සහස්ස | " | 100-115 |
| 9. පාප | " | 116-128 |
| 10. දණ්ඩ | " | 129-145 |
| 11. ජරා | " | 146-156 |
| 12. අත්ත | " | 157-166 |
| 13. ලෝක | " | 167-178 |
| 14. බුද්ධ | " | 179-196 |
| 15. සුඛ | " | 197-208 |
| 16. පිය | " | 209-220 |
| 17. කෝධ | " | 221-234 |
| 18. මල | " | 235-255 |
| 19. ධම්මට්ඨ | " | 256-272 |
| 20. මග්ග | " | 273-289 |
| 21. පකිණ්ණක | " | 290-305 |
| 22. නිරය | වග්ගො | 306-319 |
| 23. නාග | " | 320-333 |
| 24. තණ්හා | " | 334-359 |
| 25. භික්ඛු | " | 360-382 |
| 26. බ්‍රාහ්මණ | " | 383-423 |

# ධම්මපදං.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

1. මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා
තතො නං දුක්ඛමන්වෙති චක්කංව වහතො පදං. 1

## 1—1.

1. ධම්මා,(වෙදනාදි ස්කන්ධත්‍රයසංඛ්‍යාත)අරූපිධර්මයෝ;මනොපුබ්බඞ්ගමා, (කාමාවචරාදිභෙදයෙන් චාතුර්භූමකවූ) චිත්තය පූර්වඞ්ගම කොට ඇත්තාහ; (නිස්සත්වනිර්ජීවාර්ථයෙන් ධර්ම නම්වූ වෙදනාදි ස්කන්ධත්‍රයසඞ්ගෘහීත සියලු චෛතසිකයෝ චිත්තය හා එකොත්පාද එකනිරොධ එකාලම්බන එකවස්තුක වූවාහුද චිත්තය නොඋපදනහොත් චෛතසිකයන්ගේ උත්පත්තියෙක් නම් නැත්තුයි චෛතසිකයන්ගේ උත්පත්තියට චිත්තය ප්‍රධානකාරණහෙයින් මනස පූර්වඞ්ගමකොට ඇත්තාහ යී සේයි;)මනොසෙට්ඨා,(සහජාතාධිපතිවශයෙන් චිත්තය ශ්‍රෙෂ්ඨ වනබැවින්) මනස උතුම් කොට ඇත්තාහ; මනොමයා, (දුරුආදියෙන් නිපන් ඒ ඒ භාණ්ඩ දුරුමයාදි නම් වන්නාසේ මනසින් නිපදනාහෙයින්) මනොමයහ;-සිත්මුවාහ; (එහෙයින්-මනසින් නිපදනා හෙයින්;) චෙ, ඉදින්;පදුට්ඨෙන මනසා, (ආගන්තුකවූ අභිධ්‍යාදෞර්මනස්‍යාදි දොෂයෙකින් දූෂිතවූ කැලඹුණාවූ සිතින්යුක්ත වැ; භාසති වා, (මෘෂාවාද පිශුනවචන පරුෂවචන සම්ඵප්‍රලාපයැයි කියනලද චතුර්විධ වාග්දුශ්චරිතය)බෙණේ නම් හෝ; කරොති වා, (ප්‍රාණවධ අදත්තාදාන කාමමිථ්‍යාචාරයැයි කියනලද ත්‍රිවිධකායදුශ්චරිතය) කෙරේනම් හෝ; (කායවාග්දුශ්චරිතයන් නැතිවත් අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටියයි කියනලද ත්‍රිවිධ මනොදුශ්චරිතය පුරා නම් හෝ;)තතො, ඒ (ත්‍රිවිධදුශ්චරිත) හෙතුයෙන්; දුක්ඛං,(සතර අපායෙහිද මනුෂ්‍යලොකයෙහි ද කායිකවූ ද චෛතසිකවූ ද විපාක) දුඃඛය; නං, ඒ දුශ්චරිතසමඞ්ගීපුද්ගලයා; අන්වෙති, අනු වැ යන්නේයැ; (කුමක්මෙන්දයත්?)වහතො, ගැල (සොදනලදුවැ) උසුලන්නාවූ (හෙවත්: ගැල ඇදූ ගෙනැ යන්නාවූ) ගොනුගේ; පදං, පිය අනුවැ යන්නාවූ; චක්කං ඉව, ගැල්සක මෙනි.—ගැල

2. මනොපුබ්බඞ්ගමා ධම්මා මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති ඡායාව අනපායිනී. 2

---

ඇදගෙනැයන ගොනුගේ පිය අනුවැ ඔහු පසුපස්සෙහි යන්නාවූ ගැල්සකමෙන් ආපායිකවූ ද මානුසිකවූ ද කායික චෛතසික විපාකදුඃඛය දුශ්චරිතසමඞ්ගී පුද්ගලයා නො හැරැ භවයෙන් භවයට අනුවැ යන්නේයැ යී සේයි.

## — චක්ඛුපාලත්ථෙරවත්ථු —

### 1—2.

2. ධම්මා,(වෙදනාදි ස්කන්ධත්‍රයසඞ්ඛ්‍යාත)අරූපීධර්මයෝ;මනොපුබ්බඞ්ගමා, (කාමාවචරාදිභෙදයෙන් චාතුර්භූමකවූ) චිත්තය පූර්වඞ්ගම කොට ඇත්තාහ; (නිඃසත්ත්වනිර්ජීවාර්ථයෙන් ධර්ම නම්වූ වෙදනාදි ස්කන්ධත්‍රයසඞ්ගෘහීත සියලු චෛතසිකයෝ චිත්තය හා එකොත්පාද එකනිරොධ එකාලම්බන එකවස්තුක වූවාහු ද චිත්තය නො උපනහොත් චෛතසිකයන්ගේ උත්පත්තියෙක් නම් නැත් නුයි චෛතසිකයන්ගේ ඉපදීමට චිත්තය ප්‍රධාන කාරණහෙයින් මනස පූර්වඞ්ගම කොට ඇත්තාහ යී සේයි;) මනොසෙට්ඨා, (සහජාතාධිපතිවශයෙන් චිත්තය ශ්‍රෙෂ්ඨ වන බැවින්) මනස උතුම් කොට ඇත්තාහ; මනොමයා, (සුවර්ණාදියෙන් නිපන් ඒ ඒ භාණ්ඩ සුවර්ණමයාදි නම් වන්නාසේ මනසින් නිපදනාහෙයින්) මනොමයහ;-සිත්මූවාහ; (එහෙයින්-මනසින් නිපදනාහෙයින්;) චෙ, ඉදින්; පසන්නෙන මනසා, (අනභිධ්‍යාදි ගුණයොගයෙන්) ප්‍රසන්නවූ-නිර්මලවූ සිතින් යුක්තවැ; භාසති වා, (චතුර්විධවාක්සුචරිතය) බෙණේ නම් හෝ; කරොති වා, (ත්‍රිවිධ කායසුචරිතය) කෙරේ නම් හෝ; (කායවාක්සුචරිතයන් නැති වත් ත්‍රිවිධ මනස්සුචරිතය පුරා නම් හෝ;) තතො, ඒ (ත්‍රිවිධ සුචරිත) හෙතුයෙන්; සුඛං,(කායිකවූ ද චෛතසිකවූ ද විපාක) සුඛය; නං, ඒ (ත්‍රිවිධසුචරිතසමඞ්ගී) පුද්ගලයා; අන්වෙති, අනුව යන්නේය; (කුමක්මෙන්ද යත්?) අනපායිනී, ශරීරයෙන් පහ නොවන්නාවූ; ඡායා ඉව, සේය මෙති.— ත්‍රිවිධසුචරිතසමඞ්ගී පුද්ගලයා සුගතියෙහි උපන්නාහුද දුගතියෙහිදු සුව අනුභව කරන්නට නිසි තන්හි උපන්නාහුද කායික චෛතසික විපාක සුඛය ශරීරප්‍රතිබද්ධහෙයින් ශරීරයෙන් පහනොවන්නාවූ ඡායාව මෙන් ගිය තැන්හි නොහැරැ අනුව යන්නේයැ යී සේයි.

## — මට්ඨකුණ්ඩලිවත්ථු —

## පඨමො යමකවග්ගො.

3. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ
යෙ තං උපනය්හන්ති වෙරං තෙසං න සම්මති.

4. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ
යෙ තං න උපනය්හන්ති වෙරං තෙසූපසම්මති.

5. නහි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං
අවෙරෙන ච සම්මන්ති එස ධම්මො සනන්තනො.

---

### 1—3.

3. මං, මට; අක්කොච්ඡි, ආක්‍රොශ කෙළේයැ යි ද හෙවත් ජාත්‍යාදියෙන් සවා බිණියැයි ද; මං, මට; අවධි, (අතින් පයින් දණ්ඩෙන් සැතින්)පහළේයැ යි ද[1]; මං, මා; අජිනි, (කුළුදෙස් කියවීම් ආදි විසින්) දිනීයැ යිද; මෙ, මාගේ උපභොග පරිභොග වස්තු; අහාසි, පැහැරගත්තේයැ යි ද; යෙ, යම් ගෘහස්ථප්‍රව්‍රජිත කෙනෙක්; තං, ඒ (ආක්‍රොශාදිය කාරණකොට උපන්) වෛරය; උපනය්හන්ති, (කණපිදුරු ආදියෙන් කුණුමස් වසා වෙළන්න වුන්මෙන් නැවත නැවත)සිතැ බඳිත්ද;තෙසං, ඔවුන්ගේ; වෙරං, (එකවරෙකද උපන්) ඒ වෛරය; න සම්මති, නො සන්හිඳෙන්නේයි (නැවත නැවත වැඩෙන්නේයි.)

4. මං, මට; අක්කොච්ඡි, ආක්‍රොශ කෙළේයැ යි ද හෙවත් ජාත්‍යාදියෙන් සවා බිණියැ යි ද; මං, මා; අවධි, (අතින් පයින් දණ්ඩෙන් සැතින්) පහළේයැ යි ද[1]; මං, මා; අජිනි, (කුළුදෙස් කියවීම් ආදි විසින්)දිනීයැ යි ද; මෙ,මාගේ(උපභොග පරිභොග) වස්තු; අහාසි, පැහැරගතැයි ද; යෙ, යම් (ගෘහස්ථ ප්‍රව්‍රජිත) කෙනෙක්; තං, ඒ (ආක්‍රොශාදිය කාරණකොට උපන්) වෛරය; න උපනය්හන්ති,(අමනස්කාරවශයෙන් හෝ පෙර මා අනුනට කීදෙය කළදෙය දැන් මා විඳුවන්නේයැයි කර්මප්‍රත්‍යවෙක්ෂාවශයෙන් හෝ) සිතැ නො බඳිත්ද; තෙසං, ඔවුන්ගේ; වෙරං, (ප්‍රමාදදෙෂයෙකින් ඉපැද ගියාවූ ද) ඒ වෛරය; උපසම්මති, (තිරිඛනවහනියක් මෙන්) සන්හිඳීයන්නේයි.

### ථුල්ලතිස්සත්ථෙරවත්ථු

### 1—4.

5. ඉධ, මේ සත්වලොකයෙහි; වෙරානි, ("අනත්ථං මෙ අචරි" යනාදි නව ආඝාත වස්තූන් කාරණ කොට උපන්) වෛරයෝ; වෙරෙන, වෛරයෙන්; කුදාචනං, කිසිකලෙක්හිදු; න සම්මන්ති,

---

1 පහළෙයි ද.

6. පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා. 6

නො සන්හිඳෙන්නාහ; (කොලමුකුණු මලමූත්‍රාදී අශුචි වැකිතැන් එ මැ කොලමුකුණු මලමූත්‍රාදී අශුචියෙන් දෙවැ පිරිසුදු නො කට හැක්කාසේ බිණුවහුට බැණැ ඇන්නහුට ඇණැ බැන්දහු බැඳැ වෛරයෙන් වෛරයෝ සන්හිඳවිය නො හැක්කාහ;) අවෛරෙන ච, අවෛරයෙන් මැ; සම්මන්ති, සන්හිඳෙන්නාහ; (කොලමුකුණු මලමූත්‍රාදි අශුචි වැකිතැන් (ශුචි) පිරිසුදු පැනින් දෙවැ පිරිසුදු කරන්නාසේ අවෛරයෙන් මැ ක්‍ෂාන්ති මෛත්‍රීන් යොනිසොම නසිකාරයෙන් වෛරයෝ සන්හිඳෙන්නාහ;) එසො, මේ (අවෛරයෙන් වෛර සන්හිඳුවීම් තෙමෙ;) සනන්තනො ධම්මො, පුරාතනවූ (බුදු පසේබුදු මහරහතන් විසින් පුරුදු කොට ආ) ගුණ ධර්මයෙකි; නොහොත්:- එසො සනන්තනො ධම්මො, (අවෛරයෙන් වෛර සන්හිඳිවිමයයි කියනලද) මේ පුරාතන ධර්මය තෙමෙ බුදු පසේබුදු මහරහතන් විසින් ගියාවූ මඟෙකි.

## කාලියක්ඛිනීයාවත්ථු

### 1—5.

6. එත්ථ, මේ සඟමැද (කොලාහල කරන්නාවූ); පරෙ, (පණ්ඩිතජනයන්කෙරෙන්) අන්‍යවූ කලහකාරකජනයෝ; මයං, ඇපි; යමාමසෙ, නසුම්හයි (සතතයෙන් හැමවේලෙහි මැ මරුමුඛයට යම්හයි); න විජානන්ති, නො දන්නාහ; හෙවත්: නො සලකන්නාහ; තත්ථ, ඒ කලහකාරකජනයන් අතුරෙහි; යෙ ච, යම් පණ්ඩිතජනකෙනෙක් වනාහි; විජානන්ති, (ඇපි සතතයෙන් හැමවේලෙහි මැ මරුමුඛයට යම්හයි) දනිත්ද (දැනැ කලහ සන්හිඳීවීමට යත්න කෙරෙත්ද); තතො, ඒ (ඔවුන්ගේ සම්‍යක්ප්‍රතිපත්තිය) හෙතුකොට ගෙනැ; මෙධගා, කලහයෝ; සම්මන්ති, සන්හිඳෙන්නාහුයි. නොහොත්:- පරෙ, ("මහණෙනි කලහ විග්‍රහ[1] නොකරම සම්හිවව" යනාදීන් මා විසින් අවවාද කරනලද්දුවද මාගේ අවවාද නොපිළිගත් බැවින් ලාමකවූ,) මාගේ නොවන්නාවූ කලහකාරක භික්‍ෂුහු; මයං, ඇපි; එත්ථ, මේ සඟමැද; යමාමසෙ, (ඡන්දාදිවශයෙන් මිථ්‍යාග්‍රහණය කොට කලහවිග්‍රහවෘද්ධියට) යත්න කරම්හයි; න විජානන්ති, නො දන්නාහ; තත්ථ, ඒ කලහකාරකවූ තොප හැම්දෙනා අතුරෙහි; යෙ ච, යම් පණ්ඩිත පුරුෂකෙනෙක් වනාහි; විජානන්ති, (පෙර ඇපි ඡන්දාදිවශයෙන් මිථ්‍යාග්‍රහණය කොට කලහවිග්‍රහවෘද්ධියට ව්‍යායාම කරන්නමො

1 විවාද.

7. සුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු අසංවුතං
භොජනම්හි ච අමත්තඤ්ඤුං කුසීතං හීනවීරියං
තං වෙ පසහති මාරො වාතො රුක්ඛංව දුබ්බලං. 7

---

නුනුවණින් පිළිපදුම්හයි) දූන් දනිත්ද; තතො, ඒ පණ්ඩිත පුරුෂයන් හෙතු කොට ගෙනැ හෙවත්: ඒ නුවණැත්තන් නිසා; මෙධගා, නුනුවණින් උපන් කලහයෝ; සම්මන්ති, සන්හිඳෙන් නාහුයි.

## කොසම්බකවත්ථු

**1—6.**

7. සුභානුපස්සිං විහරන්තං, (ඉෂ්ටාලම්බනයෙහි සිත විහිදූ රුව යහපත අත්ල පත්ල යහපත තන බඩතුරු යහපත මුහුණ යහපත දත් මුව යහපත ඇස් යහපත කන් යහපත යනාදීන් නිමිත්තානුව්‍යඤ්ජනග්‍රහණය කොට විෂභාග අරමුණු) ශුභ වශයෙන් අනුවැ බලමින් වසන්නාවූ; ඉන්ද්‍රියෙසු අසංවුතං, (එහෙයින් මැ චක්ඛුන්ද්‍රිය සොතින්ද්‍රිය ඝානින්ද්‍රිය ජිව්හින්ද්‍රිය කායින්ද්‍රිය මනින්ද්‍රියයි කියන්ලද) සඳුරන් කෙරෙහි සංවරයක් නැත්තාවූ; (ස්මෘති කවාටයෙන් අපිහිතවූ ෂඩ්වාරයන් ඇතිබැවින් චක්ෂුරාදි සදොර නොරක්නාවූ;) භොජනම්හි ච අමත්තඤ්ඤුං, ආහාරයෙහි ද මාත්‍රඥ නො වූ; (අහර පිරියෙස්නෙහි ද[1] පිළිගැන්මෙහි ද වැළඳීමෙහි ද ෂරහට දීමෙහි ද පමණ නොදන්නාවූ; නොහොත්:- භොජන මූඛයෙන් වදුරනලද සතරපසය නො පස්විකා වළඳ කරන හෙයින් ද කුලන් සගන්නට දීමෙන් කුලදූෂණයට පමුණුවන හෙයින් ද සිල්වත්නට දුන්නා නො එසේවූවනට දීමෙන් අඬානතියොජනයට පමුණුවන හෙයින් ද භොජනයෙහි පමණ නොදන්නාවූ; නොහොත්:- මේ භොජනය එක්විසි අනෙස්නෙන් උපදවනලද හෙයින් ධාම්මික නො වෙයි මේ භොජනය පිණ්ඩපාතචර්‍ය්‍යාදියෙන් ධැමින් සෙමින් උපදවන ලදහෙයින් ධාම්මිකයැයි භොජනයාගේ කප්පියාකප්පියභාවය නො දැනැ කරන හෙයින් භොජනයෙහි පමණ නොදන්නාවූ;) කුසීතං, (කාමවිතර්ක ව්‍යාපාදවිතර්ක විහිංසාවිතර්කවශික මැ වසන හෙයින් කුසීතවූ හෙවත්: ග්‍රන්ථධුරයෙහිද විදර්ශනාධුරයෙහිද[2] වත්පිළිවෙත් පිරීමෙහිද) මැලිවූ; හීනවීරියං, (සතර ඉරියව්වෙහි මැ) වීර්‍ය්‍යශූන්‍යවූ (වත්පිළිවෙත් පුරන ආජීව පිරිසුදු කරන කායිකවීර්‍ය්‍යයෙන්ද කෙලෙසුන් තවන කුසල්ධම් වඩන චෛතසිකවීර්‍ය්‍යයෙන්ද යුක්තනොවූ;) තං, ඒ මෙබඳු පුද්ගලයා;

---

1 පිරියස්මෙහි.    2 වාසධුරයෙහි ද චතවාසධුරයෙහි ද.

8. අසුභානුපස්සිං විහරන්තං ඉන්ද්‍රියෙසු සුසංවුතං
භොජනම්හි ච මත්තඤ්ඤුං සද්ධං ආරද්ධවීරියං
තං වෙ නප්පසහති මාරො වාතො සෙලංව පබ්බතං. ෪

මාරො, (ඔහු සන්තානයෙහි බලවත් වැ උපන් කෙලෙස්) මර තෙමේ; වෙ, එකාන්තයෙන්; පසහති, මැඩැ පවත්වන්නේයි; (අභිභවනය කොට නොබෝ කලකින් ඔහු සස්නෙන් පිරිහෙළා පියන්නේයි;) කුමක්මෙන්දයත්? දුබ්බලං රුක්ඛං, ප්‍රපාතයෙක්හි සිටි දුර්වලරුකක් මුලින් උපුටා හෙළන්නාවූ; වාතො ඉව, ප්‍රචණ්ඩවාතයක් මෙන්.

8. අසුභානුපස්සිං විහරන්තං, (උද්ධුමාතකාදි දස අසුභයන් අතුරෙන් එක්තරා) අශුභයක් අනුව බලමින් වසන්නාවූ; (නොහොත්:- කෙස් ලොම් නිය දත් ආදිවූ දෙතිස්කුණුකොට සුත් වණ්ණසණ්ඨානදිසොකාසපරිච්ඡෙදවසයෙන් පිළිකුල්සේ මෙනෙහි කෙරෙමින් වසන්නාවූ;) ඉන්ද්‍රියෙසු සුසංවුතං, (එහෙයින් මැ චක්ඛුන්ද්‍රිය ශ්‍රොත්‍රෙන්ද්‍රිය ඝ්‍රාණෙන්ද්‍රිය ජිව්හින්ද්‍රිය කායින්ද්‍රිය මනින්ද්‍රියයි කියනලද්දවූ) සඉඳුරන් කෙරෙහි සුසංවෘතවූ; (ඉෂ්ටාලම්බනසමායොගයක් ඇති කල්හි "එසා සුභා සුසණ්ඨානා" යනාදි විසින් නිමිත්තග්‍රහණයක්ද "එතිස්සා හත්ථා සොභනා පාදා සොභනා මුඛං සොභනං" යනාදි විසින් අනුව්‍යඤ්ජනග්‍රාහයක්ද නො කොට සමෘතිකවාටයෙන් සුපිහිතවූ ෂඩ්ද්වාරයන් ඇති බැවින් චක්ෂුරාදි සදෙර සකස් කොට රක්නාවූ;) භොජනම්හි ච මත්තඤ්ඤුං, ආහාරයෙහිද මාත්‍රඥවූ;(අහරපිරියෙස්නෙහි ද පිළිගැන්මෙහි ද වැළඳීමෙහි ද පරහට දීමෙහි ද පමණ දන්නාවූ; නොහොත්:-භොජනමුඛයෙන් දක්වනලද සතර පසය ඒ ඒ පසයට බුදුන් වදාළ පස්විකිමෙන් පස්විකා වළඳ කිරීමෙන්ද කුල දූසනයට අඩානනියොජනයට නො පැමිණීමෙන් ද භොජන යෙහි පමණ දන්නාවූ; නොහොත්:- මේ භොජනය එක්විසි අනෙස්නෙන් උපදවනලද හෙයින් ධාර්මික නො වෙයි මේ භොජනය පිණ්ඩපාතචය්‍යාදියෙන් දැහැමින් සෙමින් උපදවන ලද හෙයින් ධාර්මිකයැයි භොජනයාගේ කප්පියාකප්පියභාවය දැනැ අකැප බොජුන් දුරු කොට කැප බොජුන් වැළඳීමෙන් ද ආහාරයෙහි පමණ දන්නාවූ;)සද්ධං,කර්මයද කර්මඵලයද හැදහීම ලක්ෂණ කොට ඇති ලෞකික ශ්‍රද්ධායෙන්ද රත්නත්‍රයෙහි අචල ප්‍රසාදයයි කියනලද ලොකොත්තරශ්‍රද්ධායෙන්ද යුක්තවූ; ආරද්ධවීරියං, (සතර ඉරියව්වෙහි) වඩනලද වීය්‍ය ඇති; (වත්පිළිවෙත් පුරන ආජීව පිරිසුදු කරන කායික වීය්‍යයෙන්ද කෙලෙසුන්

9. අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති
අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති.

10. යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො
උපෙතො දමසච්චෙන ස වෙ කාසාවමරහති.

11. අසාරෙ සාරමතිනො සාරෙ චා සාරදස්සිනො
තෙ සාරං නාධිගච්ඡන්ති මිච්ඡාසඞ්කප්පගොචරා.

---

තවත කුසල්ධර්ම වඩන චෛතසිකවීර්‍ය්‍යයෙන්ද යුක්තවූ;) තං, ඒ මෙබඳු පුද්ගලයා; මාරො, (ඔහු සන්තානයෙහි උපදනාවූද දුර්වලවූ කෙලශ) මාරතෙමෙ; වෙ, එකාන්තයෙන්; නප්පසහති, මැඩැ නොපවත්නේයි;(ඔහු අලළන්නට කම්පාකරන්නට අසමර්ථ වන්නේයි;[1]) කුමක්මෙන්දයත්? සෙලං පබ්බතං, ඝනශෛල පර්වතයක් (කම්පාකරන්නට අසමර්ථවූ); වාතො ඉව, (මඳ මඳ වැ හමන්නාවූ දුර්වල) පවනක් මෙනි.

### චූලකාලමහාකාල වත්ථු

1—7.

9. යො, යම් පුද්ගලයෙක් තෙමෙ; අනික්කසාවො, නිෂ්කෂාය නො වූයේ (රාගාදි කෂායසහිතවූයේ); දමසච්චෙන, ඉන්ද්‍රියදමන යෙන්ද පරමාර්ථසත්‍යපාක්ෂිකවූ වාක්සත්‍යයෙන්ද; අපෙතො, පහවූයේ; කාසාවං වත්ථං, කෂායවස්ත්‍රය; පරිදහෙස්සති, හඳනේ පොරෝනේ වේද; සො,(මෙබඳුවූ) ඒ පුද්ගල තෙමෙ; කාසාවං, (බුදු පසේබුදු මහරහතන්ගේ ධ්වජවූ) කෂායවස්ත්‍රධාරණයට; න අරහති, සුදුසු නො වන්නේයි.

10. යො ච, යම් ආර්‍ය්‍යපුද්ගලයෙක් වනාහි; වන්තකසාවො අස්ස, (ආර්‍ය්‍යමාර්ගඥානමුඛයෙන්) නහාපියනලද රාගාදිකෂාය ඇත්තේ වේද හෙවත්: චතුර්විධමාර්ගඥානයෙන් ප්‍රහීණවූ රාගාදි සකල කෙලශයන් ඇත්තේවේද; සීලෙසු, චතුපාරිසුද්ධිසීලයෙහි; සුසමාහිතො, මනා වැ පිහිටියේ වේද; දමසච්චෙන, ඉන්ද්‍රියදමන යෙන්ද දුඃඛයැ සමුදයයැ නිරොධයැ මාර්ගයයි කියනලද චතුරාර්‍ය්‍යසත්‍යයෙන්ද; උපෙතො, යුක්තද; (මෙබඳු) ඒ පුද්ගල තෙමෙ; වෙ, එකාන්තයෙන්; කාසාවං, කෂායවස්ත්‍රධාරණයට අරහති, සුදුසුයි.

### දෙවදත්තවත්ථු

1—8.

11. අසාරෙ,(චීවරාදිචතුර්විධප්‍රත්‍යය මිච්ඡාදිට්ඨිමිච්ඡාසංකප්පාදි අට හා මිච්ඡාඤාණ මිච්ඡාවිමුත්තියයි කියනලද දශවස්තුක

---

(1) සමර්ථනොවන්නේයි-මු.

12. සාරඤ්ච සාරතො ඤත්වා අසාරඤ්ච අසාරතො
තෙ සාරං අධිගච්ඡන්ති සම්මාසඞ්කප්පගොචරා. 12

13. යථාගාරං දුච්ඡන්නං වුට්ඨී සමතිවිජ්ඣති
එවං අභාවිතං චිත්තං රාගො සමතිවිජ්ඣති. 13

---

මිථ්‍යාදෘෂ්ටියැ තදුපනිශ්‍රයවූ ධර්මදෙශනායැ යන මේ) අසාරයෙහි; සාරමතිනො, මේ සාරයයි යන දෘෂ්ටි ඇත්තාවූ; සාරෙ ච, (සම්මාදිට්ඨිසම්මාසංකප්පාදි අට හා සම්මාඤාණ සම්මාවිමුත්තියයි කියන ලද දශවස්තුක සම්‍යග්දෘෂ්ටියැ තදුපනිශ්‍රයවූ ධර්මදෙශනායැ යන මේ) සාරයෙහි; අසාරදස්සිනො, මේ අසාරයයි යන දෘෂ්ටි ඇත්තාවූ; මිච්ඡාසංකප්පගොචරා, (කාමවිතර්ක ව්‍යාපාදවිතර්ක විහිංසා විතර්ක වශයෙන්) මිථ්‍යාසඞ්කල්පය මැ ගොචර කොට ඇත්තාවූ; තෙ, ඒ අඥනජනයෝ; සාරං, (ශිලසාරසමාධිසාරප්‍රඥසාරවිමුක්ති සාරවිමුක්තිඥනදර්ශනසාර නිර්වාණසාරයැ යන මේ ලෞකිකලොකොත්තරධර්ම) සාරයට; නාධිගච්ඡන්ති, නොපැමිණෙන්නාහුයි.

1 . සාරඤ්ච, දශවස්තුකසම්‍යග්දෘෂ්ටියැ තදුපනිශ්‍රයවූධර්මදෙශනායැ ශීලසාරාදිපඤ්චවිධධර්මසාරයැ නිර්වාණසාරයැ යනමේසියලූ) සාරයද; සාරතො ඤත්වා, (මේ සාරයැයි) සාරහෙයින් දැන; අසාරඤ්ච, (චතුර්විධ ප්‍රත්‍යයයැ දශවස්තුකමිථ්‍යාදෘෂ්ටියැ තදුපනිශ්‍රයවූ ධර්මදෙශනායැ යන මේ) අසාරය ද; අසාරතො ඤත්වා, (මේ අසාරයැයි) අසාරහෙයින් දැන වසන්නාවූ; සම්මාසඞ්කප්පගොචරා, (නෛෂ්ක්‍රම්‍යසඞ්කල්පයැ අව්‍යාපාදසඞ්කල්පයැ අවිහිංසා සඞ්කල්පයැ යන ත්‍රිවිධ) සම්‍යක්සඞ්කල්පය මැ ගොචර කොට ඇත්තාවූ; තෙ, ඒ ප්‍රාඥයෝ; සාරං, (ශීලසාර සමාධිසාර ප්‍රඥසාර විමුක්තිසාර විමුක්තිඥනදර්ශනසාරයටද පරමාර්ථසාරයයි කියන ලද නිර්වාණ) සාරයට ද; අධිගච්ඡන්ති, පැමිණෙන්නාහුයි.

## අග්ගසාවකවත්ථු

### 1—9.

13. දුච්ඡන්නං, නො සකස් කොට ඡොයනලද්දවූ ගෙවත්: කුදුමහත් සිදුරැ පැනෙනසේ විරල කොට සොයනලද්දවූ; අගාරං, (තෘණකුටි ආදි යම්කිසි) ගෙයක්; වුට්ඨි, වැසි ධාරා තොමෝ; යථා, යම්සේ; සමතිවිජ්ඣති, විශෙෂයෙන් මැ විනිවිදිනී වේද; එවං, එපරිද්දෙන් මැ; අභාවිතං චිත්තං, (සමථවිදර්ශනා භාවනායෙන්) අභාවිතවූ සිත; රාගො, (සුභඅරමුණෙහි අයොනිසොමනස්කාරබලයෙන් උපදනාවූ) කාමරාගය තෙමෙ; සමතිවිජ්ඣති, වෙසෙසින් ඉතා මැ විනිවිදා පවත්නේයි.

14. යථාගාරං සුච්ඡන්නං වුට්ඨි න සමතිවිජ්ඣති
එවං සුභාවිතං චිත්තං රාගො න සමතිවිජ්ඣති.
15. ඉධ සොචති පෙච්ච සොචති පාපකාරී උභයත්ථ සොචති
සො සොචති සො විහඤ්ඤති දිස්වා කම්මකිලිට්ඨමත්තනො.

16. ඉධ මොදති පෙච්ච මොදති
කතපුඤ්ඤො උභයත්ථ මොදති
සො මොදති සො පමොදති
දිස්වා කම්ම විසුද්ධිමත්තනො.

---

14. සුච්ඡන්නං, ඝනස් කොට සොයනලද්දවූ (වළ ගොඩ නොකොට සමයේ ඝන කොට සොයනලද්දවූ;) අගාරං, (තෘණ කුටි ආදී යම්කිසි) ගෙයක්; වුට්ඨි, වැසි ධාරා පෙ‍ාමො; යථා, යම් සේ; න සමතිවිජ්ඣති, වෙසෙසින් ඉතා මැ විනිවිදිනී නො වේද; එවං, එපරිද්දෙන් මැ; සුභාවිතං චිත්තං, (සමථවිදර්ශනාභාවනා යෙන්) මනාකොට පවත්නාවූ-භාවිතවූ සිත; රාගො, (රූපාදි අරමුණුවිෂය කොට උපදනාවූ) කාමරාගය තෙමෙ; න සමති විජ්ඣති, අතිශයින් විනිවිද නො පවත්නේයි

෴ නන්දත්ථෙරවත්ථු ෴

**1—10.**

15. පාපකාරී, (ප්‍රාණවධාදි නොඑක්) පව්කම් කරන සුලුවූ පුද්ගලතෙමෙ; ඉධ සොචති, (සෙසුදවස් ශොක නොකළ නමුත් මරණකාලයෙහි ගතිනිමිත්තවශයෙන් එළැඹැ සිටි නරකවත් නාදිය දැකැ මා විසින් කුසල් නොකොට ගන්නාලද පව් මැ කරනලදැයි මෙසේ කර්මානුස්මරණවශයෙන්) මෙලොවැ මැ ඒකාන්තයෙන් ශොක කරන්නෙයැ; පෙච්ච සොචති, පරලොවැ (අපාය දුක් විඳිමින් විපාකානුභවවශයෙන්) ශොක : රන් නෙයැ; උභයත්ථ සොචති, (මෙසේ පාපකාරී පුද්ගල තෙමෙ) දෙලොවැ මැ ශොක කරන්නෙයැ; සො, ඒ (පාපකාරී) පුද්ගල තෙමෙ; අත්තනො, තමාගෙ හෙවත්: තමා විසින් කරනලද්දවූ; කිලිට්ඨං කම්මං දිස්වා, කිලුටුවූ කායවාක්කර්මය දැකැ; සොචති, (මෙලොව මැ) ශොක කරන්නෙය; සො, හෙතෙම; විහඤ්ඤති, පරලොව අපායදුක් විඳිමින්) වෙසෙසින් පෙළෙන්නේයි.

෴ චුන්දසූකරිකවත්ථු ෴

**1—11.**

16. කතපුඤ්ඤො, (දානශීලාදිවශයෙන්) කරනලද (නොඑක්) පින්කම් ඇති පුද්ගල තෙමෙ; ඉධ, මෙලෙව්හි මැ; මොදතී, (මා

17. ඉධ තප්පති පෙච්ච තප්පති
පාපකාරී උභයත්ථ තප්පති
පාපං මෙ කතන්ති තප්පති
භිය්‍යො තප්පති දුග්ගතිං ගතො.

18. ඉධ නන්දති පෙච්ච නන්දති
කතපුඤ්ඤො උභයත්ථ නන්දති
පුඤ්ඤං මෙ කතන්ති නන්දති
භිය්‍යො නන්දති සුග්ගතිං ගතො.

---

විසින් පව් නොකරනලද පින්කම් කරනලදැයි කුශලකර්මානුස්මරණයෙන්) සතුටුවන්නෙයැ; පෙච්ච, පරලෙව්හි ද; මොදති, (දිව්‍යමනුෂ්‍යසම්පත් අනුභව කරන්නේ විපාකානුභවයෙන්) සතුටුවන්නෙයැ; උභයත්ථ මොදති, (කුශලකාරීවූ පුද්ගල තෙමෙ මෙසේ දෙලෙව්හි මැ) සතුටු වන්නෙයැ; සො, ඒ (කළ පින්කම් ඇති) සත්පුරුෂ තෙමෙ; අත්තනො, තමාගෙ හෙවත්: තමා විසින් කරනලද; කම්මවිසුද්ධිං දිස්වා, පුණ්‍යකර්මවිශුද්ධිය දැක; මොදති, (මෙලොවත්) සතුටු වන්නෙයැ; සො, හෙ තෙමෙ; පමොදති, (පරලොවත් ස්වර්ගසම්පත් විඳිමින්) වෙසෙසින් සතුටු වන්නේයි.

### ධම්මිකඋපාසකවත්ථු

### 1—12.

17. පාපකාරී, (ප්‍රාණවධාදි නොඑක්) පව්කම් කරන සුළුවූ පුද්ගල තෙමෙ; ඉධ, මෙ ලොවෙහි මැ; තප්පති, කර්මසන්තාපයෙන්) තැවෙන්නෙයැ; පෙච්ච, පරලෙව්හි ද; තප්පති (විපාකසන්තාපයෙන්) තැවෙන්නෙයැ; උභයත්ථ, මෙලෝ පරලෝ දෙක්හි මැ; තප්පති, (උක්තප්‍රකාරවූ කර්මසන්තාප විපාකසන්තාපයෙන්) තැවෙන්නෙයැ; මෙ, මා විසින්; පාපං කතං ඉති, පව් කම් කරනලදැයි; තප්පති, (මෙලොව) තැවෙන්නෙයැ; දුග්ගතිං ගතො, (පරලොව) දුගතියට ගියේ; භිය්‍යො තප්පති, (නරකාදි සතර අපායෙහි අතිකර්කශවූ අනිෂ්ටවිපාකසන්තාපයෙන්) බොහෝ කොට තැවෙන්නේයි.

### දෙවදත්තස්සවත්ථු

### 1—13.

18. කතපුඤ්ඤො, (දානශීලාදිවශයෙන්) කරනලද පින්කම් ඇති පුද්ගල තෙමෙ; ඉධ, මෙලොව මැ; නන්දති, (විපාකනන්දන

19. බහුම්පි චෙ සහිතං භාසමානො
න තක්කරො හොති නරො පමත්තො
ගොපොව ගාවො ගණයං පරෙසං
න භාගවා සාමඤ්ඤස්ස හොති.

---

යෙන්) සතුටු වන්නේය; උභයත්‍ර, මෙලෝ පරලෝ දෙක්හි, නන්‍දති, (කර්‍මනන්‍දනයෙන්ද විපාකනන්‍දනයෙන්ද) සතුටුවන්නේය; මේ, මා විසින්; පුඤ්ඤං කතං ඉති, පින්කම් කරනලදැයි; නන්‍දති, (මෙලොවැ) සතුටු වන්නේය; සුගතිං ගතො, සුගතියට ගියේ; (සප්තකාමස්වර්ගයෙහි උපන්නේ;) භිය්‍යො නන්‍දති, (අපරිමිතවිපාකසන්තොෂයෙන්) බොහෝකොට මැ සතුටු වන්නේයි.

## සුමනාදෙවියාවස්තු

## 1—14.

19. පමත්තො නරො, (සිල්වත් වැ සිටත් කුකුළකු පියා පහරනා පමණ කලකුදු අනිත්‍යාදිවශයෙන් යොනිසො මනස්කාරයෙහි යුක්ත ප්‍රයුක්ත වැ නොවසනහෙයින්; ප්‍රමත්ත [1] පුද්ගල තෙමේ; සහිතං, ත්‍රිපිටකබුද්ධවචනය; බහුම්පි භාසමානො, බොහෝ කොට කියන්නේද; නොහොත්:- බහුම්පි, බොහෝවූ ද; සහිතං, ත්‍රිපිටකබුද්ධවචනය උගෙනැ; භාසමානො, (උද්දේසපරිපුච්ඡාදිවසයෙන් ද උපනිසින්නකකථා භුත්තානුමොදනා වශයෙන් ද සර්‍වරාත්‍රිකධර්‍මදෙශනාවශයෙන් ද අනුන්ට) කියන්නේ වී නමුත්; චෙ, ඉදින්; තක්කරො න හොති, ඒ නොකරන්නේ වී නම්; (ධර්‍මය අසා කාරකපුද්ගලයා විසින් යම් භාවනානුයොගයෙක් කටයුතු ද ඒ නොකරන්නේ වී නම්;) පරෙසං ගාවො ගණයං ගොපො ඉව, අනුන්ගේ ගෙරින් රක්නාවූ ගොපල්ලා මෙන්; (හෙවත්: දවස්කුලී [2] ගිවිසැ අනුන්ගේ ගෙරින් පාවා ගෙනැ දවස් මුළුල්ලෙහි රැකැ බලා කවා පොවා අනුවැ ගෙනැ අවුත් සවස හිමියනට ගැණැ පාවාදීලා තමාවිසින් ලැබියයුතු දවස්බැළ පමණක් මැ ලබන්නාවූ පස්ගොරසයට ද ගවයනට ද හිමි නොවන්නාවූ ගොපල්ලා මෙන්;) සාමඤ්ඤස්ස භාගවා න හොති, (හුදෙක් අතවැස්සන් කෙරෙන් වත්පිළිවෙත් පමණකට [3] හිමිවත් මුත් සතරමඟ සතරඵලයයි කියනලද) ශ්‍රාමණ්‍යගුණයට හිමි නො වන්නේයි.

---

1 ප්‍රමාද. 2 බැළ. 3 ඵලයට.

20. අප්පම්පි චෙ සහිතං භාසමානො ධම්මස්ස හොති අනුධම්මචාරී
රාගඤ්ච දොසඤ්ච පහාය මොහං සම්මප්පජානො සුවිමුත්තචිත්තො
අනුපාදියානො ඉධ වා හුරං වා ස භගවා සාමඤ්ඤස්ස හොතීති.

**යමකවග්ගො පඨමො** 20

---

20. අප්පම්පි, ස්වල්පවූ ද; සහිතං, බුද්ධවචනය; භාසමානො, කියන්නා වූ; (හෙවත්: ත්‍රිපිටක බුද්ධවචනයෙන් මඳදෙයකුදු උගෙන එකුදානියස්ථවිරයන් මෙන් එකගාථාවකුදු ධර්මදෙශනා වශයෙන් අනුන්ට කියන්නාවූ) පුද්ගල තෙමෙ; චෙ, ඉදින්; ධම්මස්ස අනුධම්මචාරී හොති, (සතරමඟ සතරඵල නිවන යි කියනලද නවලොකොත්තරධර්මයට අනුරූපවූ චතුඃපාරිශුද්ධිශීල ත්‍රයොදශධුතාඞ්ග අශුභකර්මස්ථානාදි ප්‍රභෙද ඇති පූර්වභාග ප්‍රතිපත්තිසඞ්ඛ්‍යාත) අනුධර්මයෙහි පවත්නා සුලු වී නම්; රාගඤ්ච, (කාමරාග රූපරාග අරූපරාග වශයෙන් ත්‍රිවිධවූ) රාගය ද; දොසඤ්ච, (මේ සත්හු නසිත්ව යි යනාදීන් සත්වයන් විෂයකොට හෝ යම්කිසි පරිද්දෙකින් යම්කිසි අරමුණක් විෂය කොට හෝ සැටෙමින් උපදනා) ද්වෙෂය ද; මොහඤ්ච, (දුඃඛයෙහි සුඛ යයි මෙසේ සංඥාවිපර්‍ය්‍යාස චිත්තවිපර්‍ය්‍යාස වශයෙන් ප්‍රවෘත්තවූ) සම්මොහය ද; පහාය, (ශ්‍රොතආපත්තිමාර්ගාදීන්ට අනුරූප පරිද්දෙන් චතුර්විධමාර්ගයෙන්)ප්‍රහාණය කොට; සම්මප්පජානො, (පිරිසිඳ දතයුතුවූ ධර්මයන්) මනා කොට දන්නාවූ; (හෙවත්: කාමරූපාරූපභූමිවශයෙන් ත්‍රෛභූමකවූ උපාදානස්කන්ධසඞ්ඛ්‍යා තවෘත්තය කුත්සිතාර්ථයෙන් දුඃඛසත්‍ය නම් වෙයි, කාමතෘෂ්ණා දිවශයෙන් අෂ්ටොත්තරශතප්‍රභෙදවූ තෘෂ්ණාතොමෝ දුඃඛො ත්පත්තියට කාරණ හෙයින් සමුදයසත්‍ය නම් වෙයි. මාර්ගඵල යනට ආලම්බනවූ ශාන්තිලක්ෂණවූ නිර්වාණය දුඃඛනිරොධයට කාරණහෙයින් හෙවත් නිමිත්ත හෙයින් නිරොධසත්‍ය නම්වෙයි, උපාදානස්කන්ධ සඞ්ඛ්‍යාත ලොකසමතික්‍රමණය කරනහෙයින් ලොකොත්තරවූ අෂ්ටාංගික මාර්ගය කෙලශමාරණය කෙරෙමින් යන හෙයිනුදු නිර්වාණාර්ථීන් විසින් මාර්ගණය කටයුතු බැවිනුදු මාර්ගසත්‍ය නම් වෙයි. දුඃඛසත්‍යය පරිඥෙයයැ සමුදයසත්‍යය ප්‍රහාතව්‍යයැ නිරොධ සත්‍යය සාක්ෂාත්කර්තව්‍යයැ මාර්ගසත්‍යය භාවිතව්‍ය යැයි මනාකොට දන්නාවූ;)සුවිමුත්තචිත්තො, (තදඞ්ගවිමුක්ති විෂ් කම්භණවිමුක්ති සමුච්ඡෙදවිමුක්ති ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිමුක්ති නිශ්ශරණ විමුක්තියයි කියනලද පඤ්ච විමුක්තීන්ගේ වශයෙන් සකලකෙලශ යන් කෙරෙන්) මනාවැ මිදුණු සිත් ඇත්තාවූ; ඉධවා, මෙලොව

---

පටිප්පස්සද්ධි-ප්‍රතිප්‍රශ්‍රබ්ධි.

1. අප්පමාදෙ අමතපදං පමාදෙ මච්චුනො පදං 21
අප්පමත්තා න මීයන්ති යෙ පමත්තා යථා මතා.

---

(පවත්නාවූ) ද; හුරං වා, පරලෝව (වන්නාවූද [1] ආධ්‍යාත්මික බාහ්‍යස්කන්ධායතනයන්;) අනුපාදියානො, (කාමූපාදානාදි චතුරුපාදානයන් හෙතුකොටගෙනැ නිත්‍යසුඛශුභාත්මවශයෙන්) නොගන්නාවූ; සො, ඒ (මහාක්ෂීණාශ්‍රවවූ සකලලොකෛක පුණ්‍යක්ෂෙත්‍රවූ) චතුර්ථායී පුද්ගල තෙමෙ; සාමඤ්ඤස්ස භාගවා හොති, (සතරමඟ සතරඵලය ශීලාදි පඤ්චවිධ අශෛක්ෂ ධර්මස්කන්ධයයි කියනලද) ශ්‍රාමණ්‍යගුණයට [2] හිමිවන්නේ යි.

ද්වෙසහායක භික්ඛුවත්ථු

## යමකවග්ගො පඨමො.

—:O:—

### 2—1.

1. අප්පමාදෙ, (සුචරිතධර්මවිෂයෙහි ස්මෘති අවිප්‍රවාසයයි කියනලද සියලු කුශලධර්මයන්ට ද ඓහලෞකික පාරලෞකික ආත්මාර්ථපරාර්ථයට ද මූලකාරණවූ) අප්‍රමාදය; හෙවත්: නොපමා බව; අමතපදං, (තමා ජරාමරණ රහිත හෙයින් ද අධිගතවූ ආර්‍යයන්ගේ ජරාමරණ නසන හෙයින් ද අමෘතයයි කියනලද) නිර්වාණයාගේ අධිගමයට කාරණයැ; පමාදෙ, සුචරිත ධර්මවිෂයෙහි ස්මෘතිවිප්‍රවාසයයි කියනලද) ප්‍රමාදභාවය; මච්චුනො පදං, (ප්‍රමත්තයා ජාතිය නොඉක්මවන බැවින් ජාතයහට ජරා මරණ ඒකාන්ත බැවින් සන්තතිවිච්ඡේදසඞ්ඛ්‍යාත) මරණයට කාරණයැ; අප්පමත්තා, (කල්‍යාණධර්මයෙහි) අප්‍රමත්ත [3] සත්වයෝ නමීයන්ති, නොමියන්නාහ; (මෙසේ කීහෙයින් අප්‍රමත්ත [3] සත්වයෝ අජරාමරයහයි සැලකියයුතු නොවෙති, අජරාමර සත්වයෙක් නම් නැති, ප්‍රමත්තයාහට සංසාරවෘත්තය අපරිවර්ජිතය. අප්‍රමත්තයහට පරිවර්ජිතයැ, එහෙයින් ප්‍රමත්තසත්වයෝ ජාති ආදියෙන් අපරිමුක්ත බැවින් ජීවත් වන්නාහුද මළාහු නම් වෙති අප්‍රමත්ත සත්වයෝ වනාහි අප්‍රමාදලක්ෂණය වඩා වහා මැ මාර්ගඵලාධිගමය කොට දෙවන තුන්වන අත්බව නො උපදනාහ. එහෙයින් ඔහු නොමළාහුද මළාහුද ජීවත්වන්නාහු නම් වෙති;) යෙ, යම් සත්ව කෙනෙක් වනාහි; පමත්තා, (කල්‍යාණ ධර්මයෙහි) ප්‍රමත්තයෝද; තෙ, ඔහු; යථා මතා, (ප්‍රමාදමරණයෙන් මළහෙයින්) මළවුන් බඳුවූවෝයි. (යම්සේ මළාහු ජීවිතෙන්ද්‍රියරහිත හෙයින් දර

---

1 පවත්නාවූ. 2 ශ්‍රමණ ශ්‍රාමණ්‍යයට. 3 අප්‍රමාද

2. එතං විසෙසතො ඤත්වා අප්පමාදම්හි පණ්ඩිතා
අප්පමාදෙ පමොදන්ති අරියානං ගොචරෙ රතා. 22

3. තෙ ඣායිනො සාතතිකා නිච්චං දළ්හපරක්කමා
ඵුසන්ති ධීරා නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං. 23

---

දණ්ඩක් මෙන් අචෙතනයෝද එසේ මැ දන් දෙම්හ සිල්රකුම්හ පෙහෙවස් වසම්හ බණ අසම්හයි යන එකද සිතක් නො උපද වන්නාවූ ගෘහස්ථයෝ ද ආචාර්‍ය්‍ය උපාධ්‍යාය වත් ආදීන් පුරම්හ ධූතාඞ්ග සමාදන් වම්හ. භාවනා කරම්හයි යන එකද සිතක් නො උපදවන ප්‍රව්‍රජිතයෝ ද අචෙතනත්වයෙන් මළවුන් හා නිර්විශෙෂ හෙයින් මළවුන් හා සමයෝයි සේයි.

2. එතං, මේ නොමියන මියන කාරණය; (නොහොත්, ප්‍රමත්තයහට සසරින් මිදීම නැත අප්‍රමත්තයහට ඇත යන මේ කාරණයැ;) විසෙසතො ඤත්වා, විශෙෂයෙන් දැනැ; අප්පමාදම්හි, නොපමාබැවැ පිහිටියාවූ; පණ්ඩිතා, නුවණැත්තාහු; අප්පමාදෙ: (තමන්ගේ) අප්‍රමාද ගුණයෙහි; පමොදන්ති, සතුටුවෙති; අරියානං, (බුද්ධප්‍රත්‍යෙකබුද්ධක්‍ෂීණාශ්‍රවසඞ්ඛ්‍යාත) ආර්‍ය්‍යයන්ගේ; ගොචරෙ, (චතුසතිපට්ඨානාදි භෙද ඇති සත්තිස් බොධපාක්‍ෂික ධර්‍මයැ නවලොකොත්තර ධර්‍මයැ යන) ගොචරයෙහි; රතා (හොන්ති,) ඇලුණාහු වෙත්.

3. ඣායිනො,(රූපාරූප අෂ්ටසමාපත්තිසඞ්ඛ්‍යාත ආලම්බනොපනිධ්‍යානයැ විදර්‍ශනා මාර්‍ගඵල සඞ්ඛ්‍යාත ලක්‍ෂණොපනිධ්‍යානයැ යන විප්‍රකාරධ්‍යානයෙන්) ධ්‍යායීවූ; හෙවත්: සමථ විදර්‍ශනාභාවනායෙහි යුක්ත ප්‍රයුක්තවූ; සාතතිකා, අභිනිෂ්ක්‍රමණයෙහි පටන් අර්හත්මාර්ගප්‍රතිලාභය දක්වා) සතතයෙන් ප්‍රවෘත්තවූ කායිකචෛතසිකවීර්‍ය්‍ය ඇති; නිච්චං, සතතයෙ ; දළ්හපරක්කමා, (පුරුෂවීර්‍ය්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් යම් නිර්‍වාණයෙක් පැමිණිය යුතු ද ඒ නිර්‍වාණයට නොපැමිණැ අතරෙහි නොනවතිම්යි මෙසේ පැවැත්වූ) දෘඪවීර්‍ය්‍යයෙන් සමන්විතවූ; තෙ ධීරා, ඒ ප්‍රාඥයෝ; යොගක්ඛෙමං, කාමයොගාදි සතර යොගයන් කෙරෙන් නිර්භයවූ; අනුත්තරං, (තමහට අධික තරවූ ලෞකිකලොකොත්තරධර්‍මයක් නැතිහෙයින්)අනුත්තරවූ; නිබ්බානං, (අත්‍යන්තශාන්ත වූ නිත්‍ය වූ ධ්‍රැව වූ) අමෘතමහානිර්‍වාණය; ඵුසන්ති, (සතරමඟ සතරඵලයයි කියනලද ඤාණඵුසනා

4. උට්ඨානවතො සතීමතො සුචිකම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො අප්පමත්තස්ස යසොභිවඩ්ඪති. 24

5. උට්ඨානෙනප්පමාදෙන සඤ්ඤමෙන දමෙන ච
දීපං කයිරාථ මෙධාවී යං ඔඝො නාභිකීරති. 25

---

විපාකඵුසනාවත් අතුරෙහි ආයතිඵලසඞ්ඛ්‍යාත විපාකඵුසනායෙන්) ඵුසනය කරන්නාහුයි. ආලම්බන කාරණවශයෙන් නිවනට පැමිණෙන්නාහුයැ යි සේයි.

## උදෙනවත්ථු

## 2—2

4. උට්ඨානවතො, උත්ථානසඞ්ඛ්‍යාතවීර්‍ය්‍යයෙන් යුක්තවූ; සතිමතො, ස්මෘතිසම්පන්නවූ; හෙවත්: කුදු මහත් කටයුත්තෙහි එළැඹැ සිටිනා සිහි ඇති; සුචිකම්මස්ස, සුචිවූ-නිර්දොෂවූ කාය කර්මාදිය ඇති; නිසම්මකාරිනො, (මෙය කළකල මෙවැනි වැඩෙක් අවැඩෙක් වෙයි කියා මෙසේ නිදන් බලා පිළියම්කිරීමක්සේ සියලු කටයුතු) පරීක්‍ෂා කොට කරනසුළුවූ; සඤ්ඤතස්ස ච, කායාදියෙන් සංයතවූ; හෙවත්: සංයතවූ කායවාක්කර්ම ඇති; ධම්මජීවිනො, (ප්‍රාණවධාදීයෙන් තුලාකූට මානකූටාදියෙන් ද දුරුවැ කෘෂිවාණිජ්‍යකර්මාන්තාදි) ධාර්මික ජීවිකායෙන් ජීවත්වන්නාවූ; අප්පමත්තස්ස,(කෘෂිවාණිජ්‍යකර්මාන්ත රාජසෙවාදියෙහි)[1] අප්‍රමත්තවූ පුරුෂයහට; යසො, (ඓශ්වර්‍ය්‍ය භොගපරිවාර සම්මානසඞ්ඛ්‍යාතවූ ද කීර්ත්තිවර්ණසඞ්ඛ්‍යාතවූ ද) යශස; අභිවඩ්ඪති, (ඔදවැඩි මුහුද මෙන්) විශෙෂයෙන් වඩනේයි.

## කුම්භඝොසකවත්ථු

## 2—3

5. උට්ඨානෙන, (කායික චෛතසික වීර්‍ය්‍යසඞ්ඛ්‍යාත) උත්ථානයෙන්ද; අප්පමාදෙන, (සුචරිතධර්මවිෂයෙහි ස්මෘතිසම්පන්න බව යයි කියනලද) අප්‍රමාදයෙන්ද; සඤ්ඤමෙන, (චතුඃපාරිශුද්ධිශීල සඞ්ඛ්‍යාත) කායවාක්සංයමයෙන් ද; දමෙන ච,(චක්‍ෂුරාදි සදොරට හමුවූ රූපාදි සඅරමුණෙහි ලොභ ද්වෙෂ මොහ නො උපදවා යොනිසො අවජන් පැවැත්වීමයයි කියනලද) ඉන්ද්‍රියදමනයෙන් ද; හෙවත්: මෙකියනලද සතරධර්මයන් කාරණ කොට ගෙනැ; මෙධාවී, (ධර්මෞජඃප්‍රඥායයි කියනලද විදර්ශනාඥනයෙන් සමන්විතවූ) ප්‍රාඥ තෙමෙ; යං, යම් ප්‍රතිෂ්ඨාවක්: ඔඝො, කාමෞඝාදි වශයෙන්

---

1. අප්‍රමාදවූ පුරුෂයාගෙ.

6. පමාදමනුයුඤ්ජන්ති බාලා දුම්මෙධිනො ජනා
අප්පමාදඤ්ච මෙධාවී ධනං සෙට්ඨංව රක්ඛති. 26
7. මා පමාදමනුයුඤ්ජෙථ මා කාමරතිසන්ථවං
අප්පමත්තො හි ඣායන්තො පප්පොති විපුලං සුඛං. 27

---

චතුර්විධවූ කෙලෙස් මහවතුර; න අභිකීරති, නො නසාද? නසාපිය නොහේද; තං දීපං,(අර්හත්ඵලසඞ්ඛ්‍යාතවූ) ඒ ප්‍රතිෂ්ඨාව; කයිරාථ,, කරන්නේයි —— මෙකියනලද සතරගුණයෙන් යුක්තවූ ප්‍රාඥ තෙමෙ අගාධ අපාරවූ සංසාර සාගරයෙහි කෙලෙස්මහවතුරෙන් නසා පිය නොහැකිවූ රහත්ඵලයයි කියනලද ප්‍රතිෂ්ඨාව තමහට කොටගන්නට පොහොසත් වන්නේයැ යනු භාවයි.

## චූලපන්ථකත්ථෙරවත්ථු

2—4

6. බාලා, මෙලෝ පරලෝ වැඩ නොදන්නාවූ; දුම්මෙධිනො ජනා, එහෙයින් මැ නුවණනැති සත්ත්වයෝ; පමාදං අනුයුඤ්ජන්ති, (ප්‍රමාදයෙහි අදීනව නොදක්නාහු) ප්‍රමාදයෙහි යෙදී පවත්නාහ; හෙවත්: ප්‍රමාදයෙන් දවස්යවන්නාහ; මෙධාවී, (ධම්මොජඃප්‍රඥයෙන් යුක්තවූ) ප්‍රාඥ වනාහි; අප්පමාදං, අප්‍රමාද බව; සෙට්ඨං ධනං ඉව, (කුලවංශාගතවූ) උත්තමරත්නයක්මෙන්; රක්ඛති, රක්නෙයැ; (යම්සේ ලෝවැස්සෝ මුතු මැණික් ආදී උතුම් ධන නිසා යෙහෙන් ජීවත්වම්හ අඹු දරුවන් සුවසේ රකුම්හ දන් පින් කරම්හයි මෙසේ ධනයෙහි අනුසස් දක්නාහු ධන රක්‍ෂා කෙරෙත්ද එසේ මැ නුවණැති පුරුෂ ද නොපමා තැනැත්තේ ප්‍රථමධ්‍යානාදීන් පිළිලබයි සතරමග සතරඵලයට ත්‍රිවිද්‍යා ෂඩභිඥවට සියුපිළිසිඹියාවට පැමිණෙන්නෙයැයි අප්‍රමාදයෙහි අනුසස් දක්නේ උතුම් ධනයක්මෙන් නොපමාබව රක්නේයැ යි සේයි.)

7. පමාදං, පමාබව; මා අනුයුඤ්ජෙථ, නහමක් පුරුදු කරන්නෙයැ; හෙවත්: පමාබැව්හි යෙදී නොවසන්නෙයැ; කාමරතිසන්ථවං, වස්තුකාම ක්ලෙශකාමයෙහි [1] රතියයි කියනලද තෘෂ්ණාසංස්තවයෙහි; මා අනුයුඤ්ජෙථ, නහමක් යෙදෙන්නෙයැ; අප්පමත්තො හි, එළඹැ සිටි සිහි ඇති බැවින් නොපමා වැ මැ; ඣායන්තො, (ආලම්බනොපනිධ්‍යාන ලක්ෂණොපනිධ්‍යාන සඞ්ඛ්‍යාත) සමථවිදර්ශනා භාවනා කරන්නාවූ පුද්ගල තෙමෙ; විපුලං සුඛං, මහත්වූ නිවන්සුවයට; පප්පොති, පැමිණෙන්නේයි.

## බාලනක්ඛත්තඝුට්ඨවත්ථු

---

1. දෙක්හි.

8. පමාදං අප්පමාදෙන යදා නුදති පණ්ඩිතො
පඤ්ඤාපාසාදමාරුය්හ අසොකො සොකිනිං පජං
පබ්බතට්ඨොව භුම්මට්ඨෙ ධීරො බාලෙ අවෙක්ඛති. 28

9. අප්පමත්තො පමත්තෙසු සුත්තෙසු බහුජාගරො
අබලස්සංව සීඝස්සො හිත්වා යාති සුමෙධසො. 29

---

2—5.

8. පණ්ඩිතො, ප්‍රාඥවූ ආය්‍ය්‍යශ්‍රාවකතෙමෙ; යදා, යම් කලෙක්හි; අප්පමාදෙන, (කුශලධර්මයෙහි ස්මෘතිසම්පන්නබවයයි කියන ලද)[1] අප්‍රමාදභාවයෙන්; පමාදං, (ස්මෘතිවිප්‍රවාසසඞ්ඛ්‍යාතවූ)[2] ප්‍රමාදය; නුදති, දුරුකෙරේද (පුරණජලයට අවකාශ නො දී ඒ යන ගෙනැ විද්නාවූ නවදියවතුරක් මෙන් ප්‍රමාදයට අවකාශ නො දී ප්‍රමාදය මැඩගෙනැ පවත්නේ වේද) එකල්හි; පඤ්ඤාපාසාදං, (දිවඇසැ යි කියනලද අභිඥචිත්තසම්ප්‍රයුක්ත වූ) ප්‍රඥ නැමැති ප්‍රාසාදයට; ආරුය්හ, නැගී; (හෙවත්: දිවඇස් ලැබීමට සුදුසු පිළිවෙත් පිරීමෙන් හිණෙකින් පහයකට නැඟෙන්නාක්හු මෙන් නැගී;) අසොකො, (අනාගාමිමාර්ගයෙන් මැ උදුරා හරනාලද ශොකශල්‍ය ඇති බැවින්) ශොකරහිතවූ; ධීරො, ප්‍රාඥවූ ඒ මහාක්ෂීණශ්‍රවතෙමෙ; සොකිනිං පජං, (අනුඩෘතවූ ශොකශල්‍ය ඇතිබැවින්) ශොකිවූ ප්‍රජාව; (හෙවත් චුතවන්නාවූ ද උපදනාවූ ද ශොක සහිතවූ සත්වසමූහයා;) අවෙක්ඛති, බලන්නේයි; (කුමක්මෙන්දැ යත්?) භුම්මට්ඨෙ, බිමැ සිටියවුන් (සුවසේ බලන්නාවූ); පබ්බතට්ඨො ඉව, පර්වත මුදුනෙක්හි සිටි එකක්හුමෙන්; බාලෙ, (අසමුච්ඡින්නවූ වට්ටබීජ[3] ඇති හෙයින් ච්‍යවමානවූ ද උත්පද්‍යමානවූ ද) බාලජනයන්; අවෙක්ඛති, (දිවඇසින්) සුවසේ දක්නේයි.

මහාකස්සපත්ථෙරවත්ථු

2—6.

9. පමත්තෙසු, (කල්‍යාණධර්මවිෂයෙහි ස්මෘතිවිප්‍රවාසය හෙතු කොට ගෙනැ)[4] ප්‍රමත්තසත්වයන් අතුරෙහි; අප්පමත්තො, (ස්මෘතිවෛපුල්‍යයට පැමිණි බැවින්) අප්‍රමත්ත වූ[5]; සුත්තෙසු, (ස්මෘතිජාගය්‍ය්‍යභාවයෙන් සතර ඉරියව්වෙහි මැ ක්ලෙශනිද්‍රායෙන්) නිදන්නාවූ සත්වයන් අතුරෙහි; බහුජාගරො, මහත්වූ ස්මෘතිවෛපුල්‍යජාගය්‍ය්‍යයෙහි සිටියාවූ; (හෙවත් ක්ලෙශනිද්‍රායෙන් නො නිදනහෙයින් බහුල ජාගරියා ඇති;) සුමෙධසො, සුන්දරවූ ප්‍රඥ

---

1 අප්‍රමත්තභාව. 2 ප්‍රමාදය. 3 පරිත්තබීජ. 4 ප්‍රමාදවූ. 5 අප්‍රමාදවූ.

10. අප්පමාදෙන මඝවා දෙවානං සෙට්ඨතං ගතො
අප්පමාදං පසංසන්ති පමාදො ගරහිතො සදා. 30

11. අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා
සංයොජනං අණුං ථූලං ඩහං අග්ගීව ගච්ඡති. 31

---

ඇති මහාක්ෂීණාශ්‍රව තෙමෙ; අබලස්සං, (කොරපා ඇති ජවහීනවූ) දුර්වල අශ්වයකු (හැරපියා යන්නාවූ); සීඝස්සො ඉව, ශීඝ්‍රවූ ජව ඇති සෛන්ධව අශ්වයකු මෙන්; හිත්වා, (ප්‍රමත්ත[1] සත්ත්වයන් සසරවට මැ) හැර පියා (ආගමයෙන් ද අධිගමයෙන් ද ඔවුන් පසු කොට පියා); යාති, (සසරින් නික්මැ නිවන්පුරයට වහා මැ) යන්නේයි.

### මෙඝභායකභික්ඛූනං වත්ථු

### 2—7.

10. මඝවා, ශක්‍ර දෙවේන්ද්‍ර තෙමෙ; අප්පමාදෙන, (මඝ මාණවක කාල මචලග්‍රාමයෙහි භූමිශොධනයෙහි පටන් කරනලද අප්‍රමාදභාවය හෙතු කොට ගෙනැ; දෙවානං, (දෙදෙව්ලොවැ) දෙවතාවන්ට; සෙට්ඨතං ගතො, උතුම් බවට පැමිණියේ; (රජබවට පැමිණියේයැ යි සේයි. එහෙයින්;) අප්පමාදං, නොපමා බව; පසංසන්ති, (සියලු ලෞකිකලොකොත්තරගුණවිශෙෂයන්ගේ ප්‍රතිලාභයට කාරණහෙයින් බුද්ධාදි පණ්ඩිතවරයෝ) ප්‍රශංසා කෙරෙති; පමාදො, පමාබව වනාහි; සදා, හැමකල්හි මැ; ගරහිතො, (සියලුවිපත්තියට කාරණහෙයින් බුද්ධාදි ආර්ය්‍යයන් විසින්) ගර්හිතයි; (නින්‍දා කරනලදී.)

### මහාලිපඤ්හවත්ථු

### 2—8.

11. අප්පමාදරතො, නොපමා බැවැ ඇලුණාවූ; පමාදෙ භයදස්සි වා, (නරකොත්පත්තිය ආදි කොට ඇති) ප්‍රමාදයෙහි භය දක්නාවූ; නොහොත්: (නරකොත්පත්ත්‍යාදියට කාරණහෙයින්) ප්‍රමාදය භයවිසින් දක්නාවූ; භික්ඛු, මහණ තෙමෙ; අණුං, (උද්ධම්භාගියවසයෙන්) අණුවූ ද[2]; ථූලං, (ඔරම්භාගියවසයෙන්) ස්ථූලවූද; සංයොජනං, (රූපරාගසංයොජනාදි දසවිධ) සංයොජනයන්; අග්ගි ඉව, (කුදුමහත් උපාදානයන් දවමින් යන) ලැව්ගින්නක් මෙන්; ඩහං, (අභිනවාභිඥානවගතියෙන්) දවමින් (පුනරුත්පත්තියට අයොග්‍ය කෙරෙමින්); ගච්ඡති, (නිවන්පුරයට[3]) යන්නේ යි.

### අඤ්ඤතරභික්ඛු වත්ථු

---

1 ප්‍රමාද. 2 කුඩාවූද. 3 නිර්වාණපුරයට.

12. අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සි වා
අභබ්බො පරිහාණාය නිබ්බාණස්සෙව සන්තිකෙ ති. 32

අප්පමාදවග්ගො දුතියො

1. ඵන්දනං චපලං චිත්තං දුරක්ඛං දුන්නිවාරයං
උජුං කරොති මෙධාවී උසුකාරොව තෙජනං. 33

---

2—9.

12. අප්පමාදරතො, අප්‍රමාදබව ඇලුණාවූ හෙවත්: නොපමා වැ වසන්නාවූ; පමාදෙ භයදස්සි වා, (නරකොත්පත්තිය ආදි කොට ඇති) ප්‍රමාදයෙහි භය දක්නාවූ; නොහොත්: (නරකොත්පත්ත්‍යාදියට කාරණහෙයින්) ප්‍රමාදය භයවිසින් දක්නාවූ; භික්ඛු, මහණ තෙමෙ; පරිහාණාය, (ශමථවිදර්ශනාධර්මයෙන් වත් මාර්ගඵලාධිගමයෙන්වත්) පිරිහීමට; අභබ්බො, අයොග්‍යයැ; නිබ්බාණස්ස, ක්ලෙශනිර්වාණයට ද අනුපාදාපරිනිර්වාණයට ද; සන්තිකෙ එව, සමීපයෙහි මැ වසන්නේ යි.

නිගමතිස්සත්ථෙරවත්ථු.

## අප්පමාදවග්ගො දුතියො.

3—1.

1. ඵන්දනං, (රූපාදි නානාලම්බනයෙහි) චලිත වැ පවත්නාවූ; චපලං, (එක ඉරියව්වෙක නොපිහිටන ග්‍රාමදරයකු මෙන් එක අරමුණෙක්හි නො පිහිටන හෙයින් චපලවූ) අනවස්ථිත වූ; දුරක්ඛං, (සත්ප්‍රායවූ එක අරමුණෙක්හි මැ පිහිටුවන්නට නො පිළිවන් හෙයින් නොඑක් හැතින් වැදූ ගොයම් කන කුළුගොනකු මෙන්) නො රැක්කැ හැක්කාවූ; දුන්නිවාරයං, (විසභාගාලම්බනයට දිවනහෙයින් [1] තුන්දොරින්) නොවැළැක්වියැ හැක්කා වූ; චිත්තං, (භූමිවස්තුවාලම්බනක්‍රියාදිවශයෙන් චිත්‍ර හෙයින් චිත්ත නම්වූ) විඥානය; මෙධාවී, ප්‍රාඥවූ පුරුෂ තෙමෙ; උජුං කරොති, ඍජු කරන්නේයි; (කුමක්මෙන්දූ යත්) තෙජනං, හීදණ්ඩක් (හැදූ මැඩැ ඉදි කරන්නාවූ); උසුකාරො ඉව, හීවඩුවා මෙති. යම්සේ උසුකාර යන නාමාන්තරයක් ඇති ධනුර්ධර තෙමෙ හී දණ්ඩකට නිසි දණ්ඩක් වලින් කපා ගෙනවුත් පිට පොත්ත හැරැ තෙල්කාඩියෙන් තෙමා අඟුරුකබලෙහි තවා හීඅළුයෙහි ලා හැදූ මැඩැ ඉදි කොට වාලවෙධියට යොග්‍ය කොට

---

1. තුන්දුසිරිත්-මු

2. වාරිජොව ථලෙ ඛිත්තො ඔකමොකත උබ්භතො
පරිඵන්දතිදං චිත්තං මාරධෙය්‍යං පහාතවෙ. 34

---

රජරාජමහාමාත්‍යයනට ශිල්ප දක්වා මහත් සත්කාර සම්මාන ලබාද, එසේ මැ නුවණැති පුරුෂ තෙමෙ ස්පන්දනාදිස්වභාව වූ ද මේ සිත ධුතාඞ්ගාරණ්‍යවාශයෙන් හීදණ්ඩෙහි පිටපොත්ත වැනිවූ ඖදාරිකකෙලශයන් තදඞ්ගාදිවශයෙන් පහ කොට ඉක්බිති ශ්‍රද්ධාස්නෙහයෙන් තෙමා කායිකචෛතසිකවීර්‍ය්‍ය නමැති ගිනිඅඟුරෙහි තවා ශමථවිදර්ශනාභාවනා නමැති අළුයෙහි ලා හැදූ මැඩැ ඉදි කොට ත්‍රෛභූමකසංස්කාරයන් අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනය කොට අවිද්‍යාස්කන්ධප්‍රදාලනය කොට ත්‍රිවිද්‍යායෑ ෂඩභිඥයෑ නවලොකොත්තරධර්මයෑ යන මේ ගුණවිශෙෂයන් අත්පත්කොට ගෙනැ අග්‍රදක්ෂිණෙය බව ලබන්නේයෑ යී සේයි

2. ඔකමොකතො, උදකාලයෙන් හෙවත්: උදකසඞ්ඛ්‍යාත වාසස්ථානයෙන්; උබ්භතො, නඟනලද්දාවූ; ථලෙ ඛිත්තො, (අතින් හෝ පයින් හෝ දැල්ආදි එක්තරා දෙයකින් හෝ) ගොඩ දමනලද්දාවූ; වාරිජො ඉව, (දියනොලදින්සැලෙන) මසකුමෙන්; ඉදං චිත්තං, (පඤ්චකාමගුණාලයෙහි අභිරතවූ බාලපෘථග්ජනයන්ගේ අභාවිතවූ) මේ සිත (පඤ්චකාමගුණාලයෙන් නඟා); මාරධෙය්‍යං, (මාරායතනහෙයින් මාරධෙයයයි කියනලද) ත්‍රෛභූමකවෘත්තය; පහාතවෙ, පහ කරන්නට ප්‍රයොගකරනකල්හි; (හෙවත්: විදර්ශනාකර්මස්ථානයෙහි බහාලා කායිකචෛතසිකවීර්‍ය්‍යයෙන් තවනුලබනකල්හි;) පරිඵන්දති, හැමපරිද්දෙන් සැලෙන්නෙයෑ; (එකාග්‍රාලම්බනයෙහි නොපිහිටන්නෙයෑ, එතෙකුදුවුවත් ධුරනික්ෂෙප නො කොට ප්‍රාඥවූ පුද්ගල තෙමෙ උකතක්‍රමයෙන් සිත ඍජු කරන්නේයෑ යී සේයි;) නොහොත්: ඉදං චිත්තං, (මාරධෙය්‍ය යයි කියනලද කෙලශවෘත්තය නොහැරැ සිටියාවූ බාලපෘථග්ජනයන්ගේ අභාවිතවූ) මේ චිත්තය; ඔකමොකතො, උදකසඞ්ඛ්‍යාතවූ ආලයෙන්; උබ්භතො, නඟනලද්දාවූ; ථලෙ ඛිත්තො, ගොඩ දමනලද්දාවූ; වාරිජොව, මත්ස්‍යයකු මෙන්; පරිඵන්දති, (නානාලම්බනයෙහි පරිභ්‍රමණය කිරීම් වශයෙන්) සැලෙන්නෙයෑ (එහෙයින්); මාරධෙය්‍යං, (යම් කෙලශවෘත්ත සංඛ්‍යාතමාරාධෙයයක් නිසා චිත්තය චලිත වේ ද ඒ) මාරධෙයය; පහාතවෙ, (පහාතබ්බං,) පහකටයුතුයි; (මාර්ග ඵල නිර්වාණ ප්‍රත්‍යක්ෂ කිරීමෙන් කෙලශවෘත්තසංඛ්‍යාතමාරධෙයය ප්‍රහීණ කටයුතු යෑ යී සේයි.)

මෙඝියත්ථෙරවත්ථු

3. දුන්නිග්ගහස්ස ලහුනො යත්ථ කාමනිපාතිනො
චිත්තස්ස දමථො සාධු චිත්තං දන්තං සුඛාවහං. 35

4. සුදුද්දසං සුනිපුණං යත්ථ කාමනිපාතිනං
චිත්තං රක්ඛෙථ මෙධාවී චිත්තං ගුත්තං සුඛාවහං. 36

5. දූරඞ්ගමං එකචරං අසරීරං ගුහාසයං
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති මොක්ඛන්ති මාරබන්ධනා. 37

---

**1—2.**

3. දුන්නිග්ගහස්ස, දුකින් නිගතහැකිවූ; (හෙවත්: නිග්‍රහ කරන්නට නොපිළිවන්වූ;) ලහුනො, ලඝුවූ; (හෙවත්: ලඝු වැ ඉපැද ලඝු වැ නිරුඬ වන්නාවූ;) යත්ථ කාමනිපාතිනො, (ජාතිය වත් ගොත්‍රය වත් වයස වත් නො බලා ලැබෙන්නාවූ ද නො ලැබෙන්නාවූ ද යුක්තවූ ද අයුක්තවූද) යම් කැමැති අරමුණෙකැ හෙනසුලුවූ; චිත්තස්ස, (කුළුඅසෙකුමෙන් දුර්විනීතවූ) චිත්තයාගේ; දමථො, (නානාලම්බනග්‍රහණය නො කටදී එකත්වාලම්බන යෙහි පිහිටුවා චතුර්විධ ආර්‍ය්‍යමාර්ගයෙන්) දැමීම; (නිපොපි කිරිම;) සාධු, මැනැවි; (කාරණ කිමැ යත්?) චිත්තං, (මෙ) සිත; දන්තං, දමනලද්දේ (නිපොපි කරනලද්දේ); සුඛාවහං, මාර්ගඵල සුව ද නිවන්සුව ද එළවන්නේයි.

~ අඤ්ඤතරභික්ඛුවත්ථු ~

**3—3.**

4. සුදුද්දසං, ඉතාමත් දක්නට නො පිළිවන්වූ; සුනිපුණං, ඉතාසියුම්වූ; යත්ථ කාමනිපාතිනං, (ජාත්‍යාදිය නො බලා ලැබෙන් නාවූ ද නො ලැබෙන්නාවූ ද යුක්තවූ ද අයුක්තවූ ද) යම් කැමැති අරමුණෙක්හි හෙනසුලුවූ; චිත්තං, සිත; මෙධාවී, ප්‍රාඥ (පුද්ගල තෙමෙ) රක්ඛෙථ, රක්නේයි; (චිත්තවශික වැ [1] අනය ව්‍යසනයට පැමිණෙන අඥනයා මෙන් නො වැ ප්‍රාඥපුද්ගල තෙමෙ සිත රක්නේයි;) චිත්තං, (මේ) චිත්තය; ගුත්තං, (නානාලම්බනයෙහි විසිරැ පැවැත්ත නොදී එකත්වාලම්බනයෙහි පිහිටුවා) රක්නාලද්දේ; සුඛාවහං, (ලොවීලොවුතුරු) සුව එළවන්නේයි.

~ උක්කණ්ඨිතඤ්ඤතරභික්ඛුවත්ථු ~

**3—4.**

5. දූරඞ්ගමං, (මකුළුහුයක් පමණ තැනු දු පූර්වදිග්ආදියට චිත්තයාගේ සඞ්ක්‍රමණයෙක් නැතද යොදුන්දහසකින් දුරුවූද

---

1 වශග වැ.

6. අනවට්ඨිතචිත්තස්ස සද්ධම්මං අවිජානතො
පරිප්ලවපසාදස්ස පඤ්ඤා න පරිපූරති. ... 38

7. අනවස්සුතචිත්තස්ස අනන්වාහතචෙතසො
පුඤ්ඤපාපපහීණස්ස නත්ථි ජාගරතො භයං. 39

---

අරමුණුගන්නාබැවින්) දුරට යන්නා වූ; එකචරං, (යටත්පිරිසෙයින් දෙසිතකුදු එකවට නො ඉපැදී එක් සිතක් ඉපැද නිරුද්ධවූ කල්හි මැ අනික් එක මැ සිතක් උපදනාහෙයින්) එකචරවූ (හුදෙකලාවැ මැ පවත්නාවූ); අසරීරං, (තමා අරූපධර්ම බැවින් වර්ණසංස්ථානයෙක් නැත් නු සි) ශරීරයක් නැත්තාවූ; ගුහාසයං, (සතර මහාභූතයන් නිසා පවත්නා මේ ශරීර නමැති) ගුහායෙහි පවත්නාවූ හෙවත්: හෘදය රූපය නිසා පවත්නාවූ; චිත්තං, සිත; යෙ, යම් ස්ත්‍රී පුරුෂ කෙනෙක් හෝ ගෘහස්ථප්‍රව්‍රජිත කෙනෙක් හෝ; සඤ්ඤමෙස්සන්ති, (නොඋපන්කෙලෙසුන් නො ඉපැද්දදී ප්‍රමාදදොෂයෙකින් උපන් කෙලෙසුන් දුරු කෙරෙමින්) සංවරයෙහි පිහිටුවත්ද; තෙ, ඔහු; මාරබන්ධනා, (මාරබන්ධනයයි කියන ලද) ත්‍රෛභූමකවෘත්තයෙන්; මොක්ඛන්ති, මිදෙන්නාහුයි.

## භාගිනෙය්‍යසංඝරක්ඛිතස්ථවිරවස්තු

### 3—6.

6. අනවට්ඨිතචිත්තස්ස, (අසුපිට තුබූ කොමඬුපුසුලක් මෙන් ද දවසෙයි රැසැ හිඳුවූ කණුවක් මෙන් ද මට්ටත්තලයා හිසැ තුබූ කොලොම්මලක් මෙන් ද එකෙකැ නො පිහිටා කිසිකලෙකැ සෙවක වැ කිසිකලෙකැ ආජීවක වැ කිසිකලෙකැ නිගණ්ඨ වැ කිසිකලෙකැ තාපස වැ කිසිකලෙකැ ගිහි වැ කිසිකලෙකැ පැවිජි වැ වසනහෙයින්) අනවස්ථිතවූ සිත් ඇති; සද්ධම්මං අවිජානතො, බුද්ධාදි සත්පුරුෂයන් විසින් ප්‍රශස්තවූ සත්තිස් බොධිපාක්ෂිකධර්මය [1] නොදන්නාවූ; පරිප්ලවපසාදස්ස; (අචලප්‍රසාදයෙහි නොපිහිටි හෙයින් හෝ ශ්‍රද්ධාව මඳහෙයින් හෝ) ඉපිලෙන සැදැහැ ඇත්තාහට; පඤ්ඤා, (කාමාවචරාදිප්‍රභෙද ඇති) ප්‍රඥා තොමො; න පරිපූරති, නො පිරෙන්නීයි; (කාමාවචරප්‍රඥාව පවා නොපිරෙන කල රූපාවචර අරූපාවචර ලොකොත්තර ප්‍රඥා කැල මැ නොපිරෙන්නීයි.)

7. අනවස්සුතචිත්තස්ස, රාගයෙන් තෙත්නොවූ සිත්ඇති; අනන්වාහතචෙතසො, ද්වෙෂයෙන් නොපහරනලද සිත්ඇති;

---

1 ධර්මය.

8 කුම්භූපමං කායමිමං විදිත්වා නගරූපමං චිත්තමිදං ඨපෙත්වා
යොධෙථ මාරං පඤ්ඤාවුධෙන ජිතඤ්ච රක්ඛෙ අනිවෙසනො සියා.

---

පුඤ්ඤපාපපහීණස්ස, (අග්‍රමාර්ගයෙන්) ප්‍රහීණ කළ කුශලාකුශල ඇති; ජාගරතො, (ශ්‍රද්ධාදිපඤ්චවිධජාගරධර්මයෙන් සමන්විත බැවින් කායග්ලානාදිවශයෙන් නිද්‍රොපගත වූවද ක්ලේශනිද්‍රායෙන් නොනිදන හෙයින්) නොනිදන්නා නම් වූ ක්ෂීණාශ්‍රවයාහට; භයං නත්ථි, (ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණවූ ක්ලේශයන්ගේ අපුනරාවර්තනය හෙතු කොට ගෙනැ කෙලෙසුන්කෙරෙන්) භයෙක් නැති.

## චිත්තහත්ථත්ථෙරවත්ථු

## 3—6.

8. ඉමං කායං, (කෙශාදිසමූහයයි කියනලද) මේ ශරීරය; කුම්භූපමං, (අබලදුබල බැවින් ද නොතර බැවින් ද තාවකාලි බැවින් ද) කුලාලභාජනයක් බඳු වූවා හෙවත්: මැටිබඳුනක් වැනි කොට; විදිත්වා, දැනැ; ඉදං චිත්තං, (ප්‍රාඥවූ කුලපුත්‍ර තෙමෙ තමාගේ) මේ විදර්ශනාචිත්තය; නගරූපමං ඨපෙත්වා, (ගැඹුරුවූ කටුඅගල දියඅගල ඇති තරවූ පවුරුපදනම් හා දොරටුඅටලු ඇති පසමිතුරන් විසින් අයොධ්‍යවූ සුරක්ෂිත) නුවරක් මෙන් (කෙලෙස්සතුරන් විසින් පැරැදවියැ නොහැකි කොට) තබා; පඤ්ඤාවුධෙන; (විදර්ශනාමය වූ ද ආර්‍ය්‍යමාර්ගමයවූ ද) ප්‍රඥා නමැති ආවුධයෙන් (තත්තද්මාර්ගයෙන් වධ්‍යවූ ක්ලේශයන් තාක් ප්‍රතිබාහණය කෙරෙමින්;) මාරං, ක්ලේශමාරයා; යොධෙථ, පහරන්නේයැ; ජිතං ච, දිනනලද්දවූ තරුණ විදර්ශනාව ද; රක්ඛෙ, (ආවාසසත්ප්‍රාය-ඍතුසත්ප්‍රාය-භොජනසත්ප්‍රාය-පුද්ගලසත්ප්‍රාය-ධර්මශ්‍රවණසත්ප්‍රායාදිය සෙවනය කෙරෙමින් අතුරතුරෙහි සමාපත්තියට සමවැදැ එයින් නැගී ශුද්ධචිත්තයෙන් සංස්කාරයන් අනිත්‍යාදිවශයෙන් සම්මර්ශනය කෙරෙමින්) රක්නේය; අනිවෙසනො සියා, අනාලය වන්නේයැ; (සමාපත්තිය ආස්වාද කෙරෙමින් සමාපත්තිය ගේ කොට නොවසන්නේයැ සමාපත්තිය මැ ආස්වාද කෙරෙමින් ශුද්ධචිත්තයෙන් සංස්කාර සම්මර්ශනය නොකෙරේ නම් මාර්ගඵලප්‍රතිවෙධය කරන්නට නො පොහොසත එහෙයින් සමාපත්තියෙහි ආලය නො කරන්නේ යැ යී සේ යි.)

## පඤ්චසතවිපස්සකභික්ඛූනං වත්ථු

9. අචිරං වතයං කායො පඨවිං අධිසෙස්සති
ඡුඩො අපෙතවිඤ්ඤණො නිරත්ථං ව කලිඞ්ගරං. 41

10. දිසො දිසං යන්තං කයිරා වෙරි වා පන වෙරිනං
මිච්ඡාපණිහිතං චිත්තං පාපියො නං තතො කරෙ. 42

---

3—7.

9. අයං කායො, (මහණ තාගේ) මේ කය; අචිරං නො බොහො කලෙකින් මැ; වත, එකාන්තයෙන්; අපෙතවිඤ්ඤණො, පහවූ සිත්ඇත්තේ; ඡුඩො, (අපගතවූ විඤ්ඤණ ඇතිබැවින්) දමන ලදුයේ; නිරත්ථං කලිඞ්ගරං ඉව, (දරුසම්භාරයෙන් ප්‍රයොජන ඇත්තවිනව) නිරුපකාරවූ පූතිගුෂිරකාෂ්ඨයක් මෙන් හෙවත්: (වල දමාපු) දිරාගිය දඬුකඩක් මෙන් නිෂ්ප්‍රයොජන වූයේ; පඨවිං අධිසෙස්සති, පොළොව මත්තෙහි හෝනේ යි.

~ පූතිගත්තතිස්සත්ථෙරවත්ථු ~

3—8.

10. දිසො, (එක්තරා එකක්හුගෙ අඹු දරු කෙත් වත් දූසි දස් ගෙරි මීවුන් ආදිවූ සජීවහරණය කළාවූ මිත්‍රද්‍රොහී වූ) සොරෙක්; දිසං, (නැවත එසේ මැ තමාගේ ද සැපත් පැහැරගත්) සොරකු දැක; තං, ඔහට; යං කයිරා, (සජීවහරණ-ජීවිතහර ණාදි) යම් අනයව්‍යසනයක් කෙරේද; වෙරී වා පන, (කිසි කාරණයෙකින්) බද්ධවෛර ඇති එකෙක් හෝ; වෙරිනං, (එසේ මැ තමා කෙරෙහි) බද්ධවෛර ඇති එකක්හු දැක; යං තං කයිරා, යම් ඒ අවැඩක් ඔහට කෙරේද එයට වඩා; මිච්ඡාපණි හිතං චිත්තං, වරදවා (දශඅකුශලකර්මපථයෙහි) පිහිටුවනලද චිත්තය; තතො, ඒ හෙතුයෙන්; නං, ඔහු; පාපියො කරෙ, අතිශයෙන් ලාමක කරන්නේයි ~ සොරෙක් හෝ සතුරෙක් හෝ එක්තරා එකක්හට අවැඩක් කෙරේ නම් එක මැ ජාතියෙක්හි ඔහුගේ පුත්‍රදාරදාසිදාසගවමහිෂාදීනට පීඩා කරන්නේ හෝ යැ කෙත්වත්ආදිය නසන්නේ හෝ යැ ඔහුගේ ධනහරණය හෝ ජීවිතහරණය හෝ කරන්නේ යැ, දශඅකුශල කර්මපථයෙහි පිහිටුවනලද සිත වනාහි මේ ජාතියෙහි මැ ගහීාවට ද වධ බන්ධනයට ද පමුණුවන්නේයැ පරලොව නොඑක් ජාතිශත සහස්‍රයෙහි සතරඅපායෙහි හෙළා ගෙනැ හිස නැගිය නොදෙන් නේයැ යි සේයි.

~ නන්දගොපාලවත්ථු ~

11. න තං මාතා පිතා කයිරා අඤ්ඤෙ වා පි ච ඤාතකා
සම්මාපණිහිතං චිත්තං සෙය්‍යසො නං තතො කරෙති. 43

චිත්තවග්ගො තතියො

1. කො ඉමං පඨවිං විජෙස්සති යමලොකඤ්ච ඉමං සදෙවකං
කො ධම්මපදං සුදෙසිතං කුසලො පුප්ඵමිව පචෙස්සති. 44

---

3—9.

11. තං, ඒකාරණය (හෙවත් යම් කාරණයෙක් ස්වර්ගමොක්ෂ සම්පත්තිදායක ද ඒ කාරණය); මාතා න කයිරා, මවු නො ද කරන්නීය; පිතා න කයිරා, පියෙ නො ද කරන්නේය; අඤ්ඤෙ වා පි ච ඤාතකා, (නං මල් බෑ බුන් ආදි) සෙසු නෑයෝ හෝ; න කරෙය්‍යුං, නො ද කරන්නාහ; සම්මාපණිහිතං චිත්තං, (දශකුශලකර්මපථයෙහි) මනා කොට පිහිටුවනලද සිත වනාහි; තතො, ඒ හෙතුවින්; නං, ඒ පුද්ගලයා; සෙය්‍යසො කරෙ, අතිශයෙන් උත්තම කරන්නේ යි. මව්පියෝ පවා දරුවනට දායාද දෙන්නාහු එක මැ ජාතියෙකැ කර්මාන්ත නො කොට යෙහෙන් ජීවත් වන පමණක් දෙති; විශාඛාවන්ගේ මව්පියෝ පවා ඒසා මහධන මහාභොග ඇත්තාහු ඒ විශාඛාවන්ට එක මැ අත්බැවෙකැ යෙහෙන් ජීවත්වන පමණක් දුන්හ. චක්‍රවර්ති රාජ්‍යශ්‍රීපමණකුදු දරුවනට දෙන්නට පොහොසත් මව්පිය කෙනෙක් නම් නැති, දිව්‍යසම්පත් හෝ ධ්‍යානසම්පත් හෝ දෙන්නට පොහොසත්හු කැල මැ නැති, ලොකොත්තරසම්පත් දීමෙහි නොපොහොසත්බැව් කියයුතු මැ නැත්. දශකුශලකර්මපථයෙහි මනා කොට පිහිටුවනලද සිත වනාහි මෙ සියලු සැපැත් මෙ දෙන්නට පොහොසතැ යනු භාව යි.

සොරෙය්‍යත්ථෙරවත්ථු

## චිත්තවග්ගො තතියො

4—1.

1. ඉමං පඨවිං, ආත්මභාවසංඛ්‍යාතවූ මේ පෘථිවිය; කො විජෙස්සති, කවරෙක් දනන්නෙදූ? කවරෙක් ප්‍රතිවෙධ කරන්නෙදූ; යමලොකං ච, සතරඅපාය ද; සදෙවකං, දෙව්ලෝ සහිතවූ; ඉමං, මේ මනුෂ්‍යලොකය ද; කො විජෙස්සති, කවරෙක් දනන්නෙදූ? කවරෙක් ප්‍රතිවෙධ කරන්නෙදූ; සුදෙසිතං, (යථාස්වභාව වශයෙන් දෙසනලදහෙයින්) මනා කොට දෙසන ලද්දදූවූ; ධම්මපදං, (සත්තිස් බොධපාක්‍ෂිකධර්මසඞ්ඛ්‍යාත) ධර්මකොට්ඨාසය;

2. සෙඛො පඨවිං විජෙස්සති යමලොකඤ්ච ඉමං සදෙවකං
සෙඛො ධම්මපදං සුදෙසිතං කුසලො පුප්ඵමිව පචෙස්සති. 45

3. ඵෙණූපමං කායමිමං විදිත්වා මරීචිධම්මං අභිසම්බුධානො
ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ. 46

---

පුප්ඵං, මල් කඩා රැස්කරන්නාවූ; කුසලො ඉව, දක්‍ෂවූ මාලාකාරයක්හු මෙන්; කො, කවරෙක්; පචෙස්සති, පරීක්‍ෂා කරන්නෙ ද? හෙ වත්: කවරෙක් ප්‍රතිවෙධ කරන්නෙ ද?

2. සෙඛො, (අධිශීල අධිචිත්ත අධිප්‍රඥයයි කියනලද ත්‍රිවිධ ශික්‍ෂායෙහි හික්මෙන හෙයින් සෙඛ නම් වූ ශ්‍රොතආපත්ති මාර්ගස්ථයා කෙරෙහි පටන් අර්හත්මාර්ගස්ථයා දක්වා සප්තවිධ) ශෛක්‍ෂ තෙමෙ; පඨවිං, (ආත්මභාවයයි කියනලද මේ) පෘථිවිය; විජෙස්සති, (අර්හත්මාර්ගයෙන් ආත්මස්නෙහය දුරුකිරීම් වශයෙන්) දතන්නෙයැ හෙවත්: ප්‍රතිවෙධ කරන්නෙයැ; යමලොකං ච, (සතරඅපාය යි කියනලද) යමලොව ද; සදෙවකං, දෙව්ලොව සහිතවූ; ඉමං, මේ මනුෂ්‍යලොකය ද; විජෙස්සති, දතන්නෙයැ හෙවත්: ප්‍රතිවෙධ කරන්නෙයැ; සෙඛො, එ මැ සප්තවිධශෛක්‍ෂ පුද්ගලතෙමෙ; සුදෙසිතං, (සමාසව්‍යාසසාකල්‍යාදිවශයෙන් ද එකත්වනයනානාත්වනයාදී නයවශයෙන් ද යථාස්වභාවවශයෙන් ද දෙසනලද හෙයින්) මනා කොට දෙසනලද්දවූ; ධම්මපදං, (සත්තිස් බොධපාක්‍ෂික) ධර්මකොට්ඨාසය; කුසලො පුප්ඵං ඉව, (පුෂ්පාරාමයට වැදලා කැකුළුමල් පරමල් ගැටවතුමල් හැරැ යහපත් මල් කඩා රැස් කරන්නාවූ) දක්‍ෂමාලාකාරයකුමෙන්; පචෙස්සති, පරීක්‍ෂා කරන්නේයි හෙවත්: ප්‍රතිවෙධකරන්නේයි.

~පඨවිකථාපසුතපඤ්චසතභික්ඛූනං වත්ථු~

4—2.

3. ඉමං කායං, (කෙස්ඇදෙතිස්කුණුකොටස් සමූහයයි කියනලද) මේ කය; ඵෙණූපමං, (අබලදුබලඅනධවතිය තාවත්කාලික අර්ථයෙන්) පෙණපිඩක් වැන්නැයි; විදිත්වා, දැන; මරීචිධම්මං, (ක්‍ෂණයෙහි නස්නා බැවින් ද ස්වල්ප වැ වැටහෙන කාරණයෙන් ද මේ කය) මිරිඟුවැන්නැයි; අභිසම්බුධානො, සලකන්නාවූ මහණ තෙමෙ; මාරස්ස, ක්ලෙශමාරයා අයත්වූ; පපුප්ඵකානි, පඤ්චකාමගුණයන්; (නොහොත්: කර්මවට්ටයැ ක්ලෙශවට්ටයැ විපාකවට්ටයැ යන මේ ත්‍රෛභූමකදුඃඛධර්මයන්;) ඡෙත්වාන,

4. පුප්ඵානිහෙව පචිනන්තං බ්‍යාසත්තමනසං නරං
සුත්තං ගාමං මහොඝොව මච්චු ආදාය ගච්ඡති. 47

5. පුප්ඵානිහෙව පචිනන්තං බ්‍යාසත්තමනසං නරං
අතිත්තංයෙව කාමෙසු අන්තකො කුරුතෙ වසං. 48

---

(ආර්‍ය්‍යමාර්ගී ශස්ත්‍රයෙන්) කපා; මච්චුරාජස්ස, මෘත්‍යුමාරයාහට; අදස්සනං, අවිෂයවූ අමෘතමහානිර්වාණයට; ගච්ඡෙ, ආලම්බනකරණවශයෙන් යන්නේයි.

## මරීචිකම්මට්ඨානිකත්ථෙරවත්ථු

### 4—3.

4. පුප්ඵානි පචිනන්තං ඉව, (පුෂ්පාරාමයෙන් මල් කඩා රැස් කරන්නාවූ මාලාකාරයක්හු මෙන්) පඤ්චකාමගුණපුෂ්පයන් සොයන්නා මෙ වූ; ඉහ, මේ සත්ත්වලොකයෙහි; බ්‍යාසත්තමනසං, (අසම්ප්‍රාප්තවස්තුයෙහි ප්‍රාර්ථනාවශයෙන් ද සම්ප්‍රාප්තවස්තුයෙහි ගෙධ වශයෙන් ද නොඑක් පරිද්දෙන් පඤ්චකාමගුණයෙහි) ඇලුණු සිත්ඇති; නරං, සත්ත්වයා; සුත්තං ගාමං, නිඳන්නාවූ ගම් වැසි ජනයා (මුහුදට ගෙනැයන); මහොඝො ඉව, (දෙතුන් යොද්නක් තැනැ පැතිරැ යන ගැඹුරු) මහවතුරක් මෙන්; මච්චු, මරණ තෙමෙ; ආදාය, හැරැ ගෙන; ගච්ඡති, යන්නේ යි— අපායමහමුහුදට පමුණුවන්නේයැ යී සේ යි.

## විඩූඩභවත්ථු

### 4—4.

5. පුප්ඵානි පචිනන්තං ඉව, (පුෂ්පාරාමයෙන් මල් කඩා රැස් කරන්නා වූ මාලාකාරයක්හු මෙන්) පඤ්චකාමගුණපුෂ්පයන් සොයන්නා මෙ වූ; ඉහ, මේ සත්ත්වලොකයෙහි; බ්‍යාසත්තමනසං, (අසම්ප්‍රාප්තවස්තුයෙහි ප්‍රාර්ථනාවශයෙන් ද සම්ප්‍රාප්තවස්තුයෙහි ගෙධවශයෙන් ද නොඑක් පරිද්දෙන් පඤ්චකාමගුණයෙහි) ඇලුණු සිත් ඇති; නරං, සත්ත්වයා; කාමෙසු, වස්තුකාම-ක්ලේශකාමයෙහි; අතිත්තංයෙව, (පර්‍ය්‍යෙෂණයෙන් ද ප්‍රතිලාභයෙන් ද පරිභොගයෙන් ද නිධාන කිරීමෙන් ද) අතෘප්ති වූවහු මැ; අන්තකො, මාර තෙමෙ; වසං කුරුතෙ, (හඬන්නහු වලප්නහු මැ ගෙනැ තමා) වශග කැරැගන්නේයි.

## පතිපූජිකාවත්ථු

6 යථාපි හමරෙ පුප්ඵං වණ්ණගන්ධං අහෙඨයං
පලෙති රසමාදාය එවං ගාමෙ මුනී චරෙ. 49

7. න පරෙසං විලොමානි න පරෙසං කතාකතං
අත්තනොව අවෙක්ඛෙය්‍ය කතානි අකතානි ච. 50

---

**4—5.**

6. යථාපි, යම්සේ; හමරෙ, (පුෂ්පාරමයෙහි මල්මුවරඳ ගෙනැ ඇවිදුනා) භ්‍රමර තෙමේ; පුප්ඵං, මල් ද; වණ්ණගන්ධං, වර්ණය ද ගන්ධය ද; අහෙඨයං, නොනසමින් ඇවිදිනේ; රසං ආදාය, පුෂ්ප රසය පමණක් හැරගෙනැ; පලෙති, වනයට නැඟියේද; එවං, එපරිද්දෙන් මැ; (හෙවත්: මලකට පෙත්තකට කෙසුරකට වර්ණගන්ධයට හානියක් නො කොට රොන්පමණක් මැ හැර ගෙනැ යන්නාවූ බමරක්හු මෙන්;) මුනී, (සෙඛවූ ද අසෙඛවූ ද අනගාරයී) මුනි තෙමේ; ගාමෙ, ගොදුරුගම්හි; චරෙ, (උපාසක කුලයාගේ ශ්‍රද්ධාවට ද භොගයට ද හානියක් නො කොට ගෙපිළිවෙළින් දොර දොර සිටැ යැපෙන පමණක් බික් සිඟා) ඇවිදිනේ යි.

**—මච්ඡරියකොසියසෙට්ඨිවත්ථු—**

**4—6.**

7. පරෙසං, මෙරමාගේ; විලොමානි, (ජීත්‍යාදීන් සටා බණන ලද මර්මච්ඡේදකවූ) පරුෂවචනයෝ; න, මෙතෙහි නො කට යුත් තාහ; පරෙසං, මෙරමාගේ; කතාකතං, කරනලද්දාවූ ද නො කරනලද්දාවූ ද දුශ්චරිත-සුචරිතයන්; න, නො බලන්නේයැ; අත්තනො එව, තමාගේ මැ; කතානි, කරනලද දුශ්චරිතයන් ද; අකතානි ච, නොකරනලද සුචරිතයන් ද; අවෙක්ඛෙය්‍ය, බලන් නේයි.—අසෝ උපාසක අස්සඩයැ අප්පසන්නයැ ලාබත්පම ණත් සැදිබත්පමණත් නො දෙන්නෙයැ යනාදීන් ද අසෝ මහණ ඇදුරුවත් තෙරවත් ආගන්තුකවත් ගමිකවත් ගිලන් වත් නො කරන්නෙයැ ධුතඞ්ගසමාදානයත් නො කරන්නෙයැ යනාදීන් ද අනුන්ගේ ගුණ නුගුණ නො සැලකියැ යුත්තේයැ "කථම්භූතස්ස මෙ රත්තින්දිවා වීතිපතන්තීති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං"යි වදාරනලද අවවාද සිහි කරන් නාවූ ශ්‍රද්ධාප්‍රව්‍රජිතකුලපුත්‍රයා විසින් කිමෙක් ඈ හෝ රෑ දවහල්හු වත්පිළිවෙත් කරන්නාවූ බණ හදාරන්නාවූ කමටහන් මෙනෙහි කරන්නාවූ මට ඉක්මෙත් ඈ හෝ කායදඩ්ඪබහුල වැ

8 යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං අගන්ධකං
එවං සුභාසිතා වාචා අඵලා හොති අකුබ්බතො. 51

9 යථාපි රුචිරං පුප්ඵං වණ්ණවන්තං සගන්ධකං
එවං සුභාසිතා වාචා සඵලා හොති සකුබ්බතො. 52

---

නිද්‍රාරාම වැ හස්සාරාම වැ සඞ්ගණිකාරාම වැ විසංඥකාය චිත්ත වැ වසන්නාවූ මට ඉක්මෙන් ඥේ හෝ සි මෙසේ තමාගේ මැ යහපත නපුර සැලැකියැ යුත්තේයැ යනු භාව සි.

## පාඨිකාජීවකවත්ථු

4—7.

8. රුචිරං, සිත්කලුවූ; වණ්ණවන්තං, මනාවූ පැහැඇති නොහොත්:මනාවූ සටහන් ඇති; අගන්ධකං, සුවඳ නැති; පුප්ඵං, (එර බදු-ගිරිතිල්ල-බදුවද-ආදිවූ) මල්; යථාපි, යම්සේ පලඳනාහුගේ ශරීරයෙහි සුවඳ නො පතුරුවා ද; එවං, එපරිද්දෙන් මැ; සුභාසිතා වාචා, (සමාසව්‍යාසසාකල්‍යාදිවශයෙන් ද එකත්වනය නානාත්වනයාදි නයවශයෙන් ද) මනාකොට දෙසනලද (ත්‍රිපිටක බුද්ධවචනසංඛ්‍යාතවූ) වාචා තොමො; අකුබ්බතො, (ශ්‍රවණ ධාරණ ප්‍රතිපත්තිවශයෙන් ඒ ධර්මය) නොකරන්නාහට; අඵලා හොති, (ශ්‍රැතගන්ධය ද ත්‍යාගගන්ධය ද ප්‍රතිපත්තිගන්ධය ද නො එළවන හෙයින්) නිස්ඵල වන්නී සි.

9. රුචිරං, මනොඥවූ; වණ්ණවන්තං, වර්ණසම්පන්නවූ නොහොත්:මනාවූ සටහන්ඇති; සගන්ධකං, සුගන්ධසහිතවූ; පුප්ඵං, (සපු දුනුකේ දෑසමන් ආදි වූ සුවඳ) මල්; යථාපි, යම්සේ පලඳනාහුගේ ශරීරයෙහි සුවඳ පතුරුවාද; එවං, එපරිද්දෙන් මැ; සුභාසිතා වාචා, (සමාසව්‍යාසසාකල්‍යාදිවශයෙන් ද එකත්වනය නානාත්වනයාදී නයවශයෙන් ද) මනාකොට දෙසනලද (ත්‍රිපිටක බුද්ධවචනසංඛ්‍යාත) වාචා තොමො; සකුබ්බතො, (සත්කාත්‍ය ශ්‍රවණධාරණප්‍රතිපත්තිවශයෙන්) ඒ ධර්මය මනාකොට කරන්නාහට; සඵලා හොති, (ශ්‍රැතගන්ධත්‍යාගගන්ධප්‍රතිපත්තිගන්ධයන් එළවනහෙයින්) සඵල වන්නී සි.

## ඡත්තපාණිඋපාසකවත්ථු

10 යථාපි පුප්ඵරාසිම්හා කයිරා මාලාගුණෙ බහූ
එවං ජාතෙන මච්චෙන කත්තබ්බං කුසලං බහුං. 53

11 න පුප්ඵගන්ධො පටිවාතමෙති න චන්දනං තගරමල්ලිකා වා
සතඤ්ච ගන්ධො පටිවාතමෙති සබ්බා දිසා සප්පුරිසො පවාති. 54

12 චන්දනං තගරං වා පි උප්පලං අථ වස්සිකී
එතෙසං ගන්ධජාතානං සීලගන්ධො අනුත්තරො. 55

---

4—8.

10. පුප්ඵරාසිම්හා, (වර්ණගන්ධසම්පන්නවූ නානාප්‍රකාර පුෂ්ප රාශියකින්; බහූ මාලාගුණෙ, (එකතොවණ්ටිකඋභතොවණ්ටිකාදිවශයෙන් නොඑක් ප්‍රභෙද ඇති) බොහෝ මල්දම්; යථාපි කයිරා, (දක්‍ෂවූ මාලාකාරයෙක්) යම්සේ කෙරේද; (හෙවත්: බොහෝ මල්දම් ගොතා රැස් කෙරේද;) එවං, එපරිද්දෙන් මැ; (හෙවත්: නන්වැදෑරුම් වූ සුවඳමල්රැසෙකින් බොහෝ මල්දම් ගොතා රැස් කරන්නා වූ දක්‍ෂමාලාකාරයකු මෙන්;) ජාතෙන, උපන්නාවූ; මච්චෙන, සත්‍වයා විසින්; බහුං කුසලං (දානශීලාදි වශයෙන්) බොහෝ වූ කුශලය; කත්තබ්බං, කටයුත්තේ සි.

විශාඛාවත්ථු

4—9.

11. පුප්ඵගන්ධො, (සපු දුනුකේ ආදිවූ) පුෂ්පයන්ගේ සුගන්ධය; පටිවාතං, උඩුසුළඟට; න එති, නො පැමිණෙන්නේයි; (සෙසුමල් තබා සියක්යොදුන් තැනැ සුවඳ පැතිරෙන පරසතුමල් පවා උඩුසුළඟට අඟලක්පමණතැනට ද නො හමන්නේයි;) චන්දනං, සඳුනෙහි සුවඳ ද; තගර, තුවරලායෙහි සුවඳ ද; මල්ලිකා වා, සිහිද්දබෝලිද්දයෙහි සුවඳ ද; න, උඩුසුළඟට නො යන්නේයැ; සතං ච ගන්ධො, (බුදු පසේබුදු බුදුසවහ යන) සත්පුරුෂයන්ගේ ශීලසුගන්ධය වනාහි; පටිවාතං, උඩුසුළඟට; එති, පැමිණෙන්නේයි; (කුමක්හෙයින් ද යත්?) සප්පුරිසො, සත්පුරුෂ තෙමේ; සබ්බා දිසා පවාති, (යම්හෙයකින් ශීලසුගන්ධයෙන්) සියලු දශදිග් හැමැ පවතී ද එහෙයිනි.

12 චන්දනං, සඳුන් ද; තගරං වා, තුවරලා ද; අපි, නැවත; උප්පලං, මහනෙල්මල් ද; අථ, නැවත; වස්සිකී, දෑසමන්මල් ද යන; එතෙසං ගන්ධජාතානං, මෙ කියනලද සුගන්ධසමූහයන්ගේ

13 අප්පමත්තො අයං ගන්ධො යායං තගරචන්දනී
යො ච සීලවතං ගන්ධො වාති දෙවෙසු උත්තමො. 56

14 තෙසං සම්පන්නසීලානං අප්පමාදවිහාරිනං
සම්මදඤ්ඤා විමුත්තානං මාරො මග්ගං න වින්දති. 57

15 යථා සංකාරධානස්මිං උජ්ඣිතස්මිං මහාපථෙ
පදුමං තත්ථ ජායෙථ සුචිගන්ධං මනොරමං. 58

---

සුගන්ධයට වඩා; සීලගන්ධො, (බුද්ධාදිසත්පුරුෂයන්ගේ) ශීල සුගන්ධය තෙම; අනුත්තරෙ, තමහට ඉතිරියක්හු නැතිහෙයින් නිරුත්තරයි.

### ආනන්දත්ථෙරස්ස පඤ්හවිස්සජ්ජනවත්ථු.

### 4—10.

13. තගර, තුවරලායෙහි සුවඳයෑ; චන්දනී, සඳුනෙහි සුවඳයෑ යන; යො අයං ගන්ධො, යම් මේ සුගන්ධයෙක් ඇත්ද; (සො අයං ගන්ධො, හේ මේ සුගන්ධය තෙමෙ;) අප්පමත්තො, ස්වල්පප්‍රමාණය; සීලවතං, සිල්වත්වූ බුද්ධාදිසත්පුරුෂයන්ගේ; යො ච අයං ගන්ධො, යම් මේ ශීලසුගන්ධයෙක් ඇත් ද; (සො, හෙ තෙමෙ;) උත්තමො, උතුම් මෙ වූයේ; දෙවෙසු, දෙව්ලෙව්හි දූ; වාති, ගමන්නේයි.

### මහාකස්සපත්ථෙරස්ස පිණ්ඩපාතදින්නවත්ථු.

### 4—11.

14. සම්පන්නසීලානං, පරිපූර්ණවූ (ලෞකිකලොකොත්තර) ශීල ඇති; අප්පමාදවිහාරිනං, (ස්මෘතිසම්පන්න බැවින්) අප්‍රමාද විහාර ඇති[1]; සම්මා, මනා කොට; අඤ්ඤාය, (චතුරාර්‍ය්‍යසත්‍යයන්වූ පරිද්දෙන්)දැන; විමුත්තානං, (තදඞ්ගවිමුක්ත්‍යාදිපඤ්චවිධවිමුක්තීන්ගේ වශයෙන් සකලක්ලෙශයන් කෙරෙන්) මුක්තවූ; තෙසං, ඔවුන් විසින්; (හෙවත්: මෙබඳුගුණයෙන් යුක්තවූ ඒ මහාක්ෂීණාශ්‍රවයන් විසින් යනලද්දවූ;) මග්ගං, මඟ; මාරො, (දිව්‍යපුත්‍ර) මාර තෙමෙ; න වින්දති, (සියලු උත්සාහයෙන් බලා ද) නො දන්නේ යි.

### ගොධිකත්ථෙරපරිනිබ්බානවත්ථු.

### 4—12.

15. මහාපථෙ, මහමඟෙහි; උජ්ඣිතස්මිං, දමනලද්දවූ; තත්ථ සඞ්කාරධානස්මිං, ඒ කසළගොඬෙක්හි; සුචිගන්ධං, සුචිවූ සුවඳ

---

1. අප්‍රමාදවාස ඇති.

16 එවං සඞ්ඛාරභූතෙසු අන්ධභූතෙ පුථුජ්ජනෙ
අතිරොචති පඤ්ඤාය සම්මාසම්බුද්ධසාවකොති. 59

—පුප්ඵවග්ගො චතුත්ථො—

1 දීඝා ජාගරතො රත්ති දීඝං සන්තස්ස යොජනං
දීඝො බාලානං සංසාරෙ සද්ධම්මං අවිජානතං. 60

---

ඇති; මනොරමං, සිත්ඇලවන්නාවූ; පදුමං, පද්මයෙක්; යථා ජායෙථ, යම්සේ උපදී ද.

16. එවං, එසේ මැ; (හෙවත්: මහමඟැ දැමූ කසළගොඩෙකැ නැඟි මුවරඳබර සුවඳගඳවහන පියුමක් මෙන්;) සංඛාරභූතෙසු, කසළගොඩක් බඳු වූ; අන්ධභූතෙ, නුවණැස් නැතිහෙයින් අන්ධ වූ; පුථුජ්ජනෙ, පුහුදුන් ලෞකිකමහජනයා කෙරෙහි උපන්නාවූ ද; සම්මාසම්බුද්ධසාවකො, සම්‍යක්සම්බුද්ධයන්ගේ ශ්‍රාවකවූ මහාක්ෂීණාශ්‍රව තෙමෙ; පඤ්ඤාය, ප්‍රඥයෙන්; අතිරොචති, පෘථග්ජන වූ ලෞකිකමහාජනයා ඉක්මැ දිලියෙන්නේ සිහොබනේයැ යී සේ යි—

—ගරහදින්නවත්ථු—

## —පුප්ඵවග්ගො චතුත්ථො—

**5 —1.**

**1.** ජාගරතො, නොනිඳන්නාහට; රත්ති, රාත්‍රි තොමෝ; දීඝා, දිගැ; සන්තස්ස, ශ්‍රාන්තයාහට (ගමන්විඩාව මහැ මිරිකුණහට); යොජනං, යොදන; දීඝං, දිගැ; සද්ධම්මං අවිජානතං, (සත්තිස් බොධපාක්ෂික) සද්ධර්මය නොදන්නාවූ; බාලානං,(මෙලෝ පරලෝ වැඩ අවැඩ නොදන්නා) අඥාන ජනයනට; සංසාරො,(අවිච්ඡින්න වැ පවත්නා ස්කන්ධධාත්වායතනපරිපාටියයි කියනලද) සංසාරය; දීඝො, (තමාගේ ධර්මතාවශයෙන් මැ) දිගි—රැ නිඳි වරන්නාහට තුන්යමක් පමණවූ රාත්‍රියද ශ්‍රාන්තවැ ගියාහට සතරගවුවක් පමණවූ යොදන ද කල්පනාවශයෙන් දික් වැ වැටහෙයි, සත් තිස් බොධපාක්ෂිකධර්මයන් නොදන්නාවූ අඥානජනයනට වනාහි සංසාරය තමාගේ ධර්මතාවශයෙන් මැ දිගයැ යනු භාව යි.

—කුම්බුදූපසලානිකදුග්ගතසෙවකස්ස වත්ථු—

2. වරං චෙ නාධිගච්ඡෙය්‍ය සෙය්‍යං සදිසමත්තනො
එකචරියං දළ්හං කයිරා නත්ථි බාලෙ සහායතා. 61

3. පුත්තා මත්ථි ධනම්මත්ථි ඉති බාලො විහඤ්ඤති
අත්තා හි අත්තනො නත්ථි කුතො පුත්තා කුතො ධනං. 62

4. යො බාලො මඤ්ඤති බාල්‍යං පණ්ඩිතො වාපි තෙන සො
බාලො ච පණ්ඩිතමානී ස වෙ බාලොති වුච්චති. 63

---

## 5—2.

2. වරං, (තමා හා සහවාසයට තිසි කල්‍යාණමිත්‍රයකු) සොයන්නාවූ මහණ තෙමෙ; සෙය්‍යං, (ශීලසමාධිප්‍රඥාගුණයෙන් තමහට අධිකවූ හෝ; සදිසං, තමා හා සදෘශ වූ හෝ කල්‍යාණමිත්‍රයකු; චෙ, ඉදින්; නාධිගච්ඡෙය්‍ය, නොලද්දේ වී නම්; එකචරියං, එකාචරියාව(සතරඉරියව්වෙහිම)හුදකලාවැ විසීම; දළ්හං කයිරා, තරකරන්නේයි; (කුමක්හෙයින්දයත්?) බාලෙ, මෙලෝ පරලෝ, වැඩ අවැඩ නොදන්නා) අඥනයා කෙරෙහි; සහායතා, (චුල්ලසීලයැ මජ්ඣිමසීලයැ මහාසීලයැ දශකථාවස්තුහුයැ තෙලෙස් ධුතගුණයැ විදර්ශනා ඥ සතරමඟ සතරඵලයැ ත්‍රිවිද්‍යායැ ෂඩභිඥයැ යන මේ) සහායතා තොමෝ; නත්ථි, යම්හෙයකින් නැත් ද එහෙයිනි.

**~මහාකස්සපත්ථෙරස්සධිවිහාරිකවත්ථු~**

## 5—3.

3. මෙ, මාගේ; පුත්තා අත්ථි, (රූපයෞවනබලපරාක්‍රම සම්පන්නාවූ) දරුවෝ ඇති; මෙ, මාගේ; ධනං අත්ථි, (රන් රිදී මුතු මැණික් ආදි) ධන ඇතැයි; ඉති, මෙසේ; බාලො, නුවණනැත්තේ; විහඤ්ඤති, (පුත්‍රතෘෂ්ණායෙන්ද ධනතෘෂ්ණායෙන්ද) තස්නෙයැ (දුකට පැමිණෙන්නෙයැ);අත්තා හි අත්තනො නත්ථි,(තගවා උලා හඳවා පලඳවා කවා පොවා නොඑක්පරිද්දෙන් පොෂණය කළ) ආත්මය පවා යම්හෙයකින් තමහට නැත්ද; (හෙවත්: සුව එලවන්නටවත් දුක් එලවන්නටවත් නොපොහොසත්ද එහෙයින්;) පුත්තා, පුත්‍රයෝ; කුතො, කොයින්ද, ධනං, ධන; කුතො, කොයින්ද; (සුව එලවන්නටවත් දුක් එලවන්නටවත් කැල මැ අසමර්ථයහ සී සේ සි.)

**~ආනන්දසෙට්ඨිවත්ථු~**

## 5—4.

4. යො, යම් පුද්ගලයෙක්; බාලො, තෙමෙ අපණ්ඩිත වූයේ; බාල්‍යං, තමාගෙ බාලභාවය; මඤ්ඤති, (මම බාලයෙමි යි තමා

5. යාවජීවම්පි වෙ බාලො පණ්ඩිතං පයිරුපාසති
න සො ධම්මං විජානාති දබ්බී සූපරසං යථා. 64

6. මුහුත්තමපි වෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති
ඛිප්පං ධම්මං විජානාති ජිව්හා සූපරසං යථා. 65

---

නුවණනැතිබව) දනීද; තෙන, ඒ කාරණයෙන් (තමා බාලබව
දන්නා කාරණයෙන්); සො, ඒ (පුද්ගල තෙමෙ); පණ්ඩිතො වාපි,
පණ්ඩිත හෝ වන්නෙයෑ පණ්ඩිත සමාන හෝ වන්නේයි; (කුමක්
හෙයින්දයත්? එ තෙමෙ තමා බාලබව දන්නේ අතික් නුවණැත්
තන්හු කරු එළැඹෙන්නෙ ය භජනය පයිරුපාසනයකරන්නේ
පණ්ඩිතවූ ඔහු විසින් පණ්ඩිතභාවය පිණිස අවවාද අනුශාසනා
කරනුලබන්නේ ඔහුගේ අවවාද පිළිගෙනැ පණ්ඩිත හෝ වන්
නෙයෑ පණ්ඩිතසමාන හෝ වන්නේයි;) බාලො ච,(යම්) බාලයෙක්
වනාහි; පණ්ඩිතමානී,(තෙමේ බාල වූයේ මැ මා හා සම බහුශ්‍රැත
යෙක් ධර්‍මකථිකයෙක් විනයධරයෙක් ඇත්දැයි) පණ්ඩිතමානී
වේද (තමා පණ්ඩිත කොට සිතාද); සො, ඒ (පුද්ගල තෙමෙ); වෙ;
එකාන්තයෙන්; බාලො ඉති වුච්චති, බාලයයි මැ කියනු ලැබේ.

## ගණ්ඨිභෙදකචොරානං වත්ථු

### 5—5.

5. බාලො, අඥනවූ පුද්ගල තෙමෙ; යාවජීවම්පි, දිවිපම
ණිනුදු; වෙ, ඉදින්; පණ්ඩිතං පයිරුපාසති, නුවණැත්තන් කරු
එළැඹෙන්නේ වි නමුදු; සො, හෙ තෙමෙ; ධම්මං න විජානාති,
(මේ බුඩවචනයැයි කියාවත් බුඩවචන නම් මෙතෙකැයි කියාවත්
මෙසේ) පර්‍ය්‍යාප්තිධර්‍මය ද (මේ චාරයෑ මේ විහාරයෑ මේ ආචා
රයෑ මේ සාවද්‍යයෑ මේ අනවද්‍යයෑ මේ සෙවිතව්‍යයෑ මේ අසෙවි
තව්‍යයෑ මේ පිළිපැද්දැ යුතුයෑ මේ පසක්කට යුතුයැයි මෙසේ
ප්‍රතිපත්තිධර්‍මය ද නො දන්නේයි; (කුමක්මෙන්ද යත්?) දබ්බී
සූපරසං යථා, (ගෙවී කෙටිවැයනතෙක් නොඑක් සූපව්‍යඤ්ජන
යන් හා සංසර්ගයට පැමිණ ද) ලුණු ඇඹුල් යුතු කුළු ආදියෑ රස
නොදන්නා සැන්ද මෙනි.

## උදායිත්ථෙරවත්ථු

### 5—6.

6. විඤ්ඤූ, පණ්ඩිත (පුරුෂ තෙමෙ;) වෙ, ඉදින්; මුහුත්තං
අපි, ඇසිල්ලකුදු; පණ්ඩිතං පයිරුපාසති,(බුඩාදි) නුවණැත්තන්
කරු එළැඹේ දූ; (හෙ තොමෙ ඒ ප්‍රාඥයන් කෙරෙහි උද්ග්‍රහණ

7. චරන්ති බාලා දුම්මෙධා අමිත්තෙනෙව අත්තනා
කරොන්තා පාපකං කම්මං යං හොති කටුකප්ඵලං. 66

8. න තං කම්මං කතං සාධු යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛො රොදං විපාකං පටිසෙවති. 67

9. තඤ්ච කම්මං කතං සාධු යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනො විපාකං පටිසෙවති. 68

---

පරිප්‍රශ්නාදිය කෙරෙමින්;) ධම්මං, ත්‍රිපිටක බුද්ධවචනයයි කියන ලද පර්‍යාප්තිධර්මය ද චාරවිහාරාදී ප්‍රතිපත්තිධර්මය ද කර්මස්ථානානුයොගයෙන් ලොකොත්තරධර්මය ද; ඛිප්පං, වහා මැ; විජානාති දන්නේයි; (කුමක් මෙන් දූ යත්?) සූපරසං, මුවෙහි තුබූ විගස මැ) සූපව්‍යඤ්ජනයෙහි (ලුණු ඇඹුල් ආදී) රස දන්නාවූ; ජිව්හා යථා (ඛිඥනාධිෂ්ඨිත වූ) ජිව්හාප්‍රසාදය මෙනි.

### පාථෙය්‍යකභික්ඛූනං වත්ථු

### 5—7.

7. බාලා, මෙලෝ පරලෝ වැඩ අවැඩ නොදන්නාවූ; දුම්මෙධා, අඥාන සත්වයෝ; යං, යම් අකුශලකර්මයෙක්, කටුකප්ඵලං හොති! කර්කශවූ විපාක ඇත්තේ වේ ද; තං පාපකං කම්මං කරොන්තා, ඒ අකුශලකර්මය කෙරෙමින්; අමිත්තෙන ඉව, තමහට සතුරකු වැනිවූ; අත්තනා; ආත්මයෙන් යුක්ත වැ; චරන්ති, ඇවිදිනාහුයි; (සතරඉරියවුවෙහි මැ අකුසල්කෙරෙමින් පවත්නාහ යී සේයි.)

### සුප්පබුද්ධකුට්ඨිවත්ථු

### 5—8.

8. යං කත්වා, (නරකාදි අපායොත්පත්ති සාධක වූ ප්‍රාණවධාදි) යම් අකුශලකර්මයක් කොට; අනුතප්පති, (සත්ව තෙමෙ සිහි කළ කෙණෙහි පශ්චාත්තාපයෙන්) තැවේ ද; යස්ස, යම් අකුශලකර්මයක්හුගේ; විපාකං, අනිෂ්ටවිපාකය; අස්සුමුඛො රොදං, කඳුලෙන් තෙත්මුහුණුඇති වැ හඬමින්; පටිසෙවති, අනුභව කෙරේද; තං කම්මං, එබඳුවූ ඒ අකුශලකර්මය; කතං, කරන ලද්දේ; න සාධු, නො මැනැවි.

### කස්සකවත්ථු

### 5—9.

9. යං කත්වා, (දිව්‍යමනුෂ්‍යසම්පත්ති නිර්වාණසම්පත්ති නිපද වන්නට සමර්ථ වූ සුඛදායක වූ) යම් කුශලකර්මයක් කොට; නානු

---

1. භද්දවග්ගියවත්ථු—අට්ඨකථා.

10. මධුවා මඤ්ඤති බාලො යාව පාපං න පච්චති
යදා ච පච්චති පාපං අථ බාලො දුක්ඛං නිගච්ඡති. 69

11. මාසෙ මාසෙ කුසග්ගෙන බාලො භුඤ්ජෙථ භොජනං
න සො සඞ්ඛතධම්මානං කලං අග්ඝති සොළසිං. 70

---

නප්පති,(සබ්බ තෙමෙ මෙලොව ද පරලොව ද පශ්චාත්තාපයෙන්) නො තැවේද; යස්ස, යම් කුශලකර්‍මයක්හුගේ; විපාකං, ඉෂ්ට විපාකය; පතීතො, මෙලොව ද ප්‍රීතිවෙගයෙන් පිනා ගියේ; සුමනො,(සෞමනස්‍යවෙගයෙන්) සුන්දර වූ සිත් ඇත්තේ; පටිසෙවති, (ආයතිභවයෙහි දු ප්‍රීතිසෞමනස්‍යයෙන් යුක්ත වැ) අනුභව කෙරේ ද; තං කම්මං; එබඳුවූ ඒ කුශලකර්‍මය; කතං, කරන ලද්දේ; සාධු, මැනැවි.

### සුමනමාලාකාරවත්ථු

5—10.

10. පාපං,(අඥානයා විසින් කරනලද) අකුශලකර්‍මය; යාව, යම් තාක්කල්; න පච්චති,(දෘෂ්ටධර්‍මවේද්‍ය වැ මෙලොවැ මැ හෝ උපපද්‍යවේද්‍ය වැ අපරාපර්‍ය්‍යවේද්‍ය වැ පරලොවැ හෝ) විපාක නොදේ ද; තාව, ඒ තාක්කල්; බාලො, අඥාන තෙමෙ; මධු ඉව මඤ්ඤති, (පාපකර්‍මය) මී (අනුභව කිරීමක්) මෙන් (මිහිරි කොට) සිතන්නෙයැ; යදා ච, යම් කලෙක වනාහි; පාපං,(බාලයා විසින් කරන ලද) අකුශලකර්‍මය; පච්චති,(මෙලොව අත් පා කන් නාසා කැපීම් ආදි විසින් නොඑක් කම්කටුල් කරනු ලබන්නාහට වත් පරලොව නරකාදිසතරඅපායෙහි ඉපැද මහදුක් විඳිනාහට වත්) විපාක දේ ද; අථ, එකල්හි; බාලො, (දුශ්චරිතසම්බන්ධි වැ විසූ) අඥාන තෙමෙ; දුක්ඛං, (බලවත් කායික චෛතසික) දුඃඛයට; නිගච්ඡති, පැමිණෙන්නේයි.

### උප්පලවණ්ණාථෙරීවත්ථු

5—11.

11. බාලො,(නොහොත් තපස් කරන) අඥාන (පුද්ගල තෙමෙ); මාසෙ මාසෙ, මසක් මසක් සම්ප්‍රාප්තවූ කල්හි හෙවත්: මසෙක මසෙක පාසා එකවරෙකැ; කුසග්ගෙන, තණ අගින් (ගෙනැ); භොජනං භුඤ්ජෙථ, (තෙල් මී සකුරු ආදි) භොජනය අනුභව කරන්නේවේ ද; සො, ඒ පුද්ගලතෙමෙ; සඞ්ඛාතධම්මානං, පිරිසිඳැ දන්නාලද චතුරාර්‍ය්‍යසත්‍ය ධර්‍මයන් ඇති ක්ෂීණාශ්‍රවයන්ගේ; සොළසිං කලං න අග්ඝති, සොළොස්වන කලාවට ද නොපැමිණෙන්නේයි-අපරිඥාතධර්‍මයන් ඇති ශීලාදිගුණයෙන් පරිබා

12. නහි පාපං කතං කම්මං සජ්ජු ඛීරංව මුච්චති
ඩහන්තං බාලමන්වෙති භස්මච්ඡන්නොව පාවකො. 7/

---

හිර වූ තීර්ථායතනයෙහි පැවිදිවූ කොහොන්තපස් කරන අඥාන පුද්ගලතෙමෙ අහර අනුභව කළහොත් මාගේ තපස් බිඳියෙයි එහෙයින් ව්‍යාහභක්ෂණය කොට ශීලපරිපූරණය කෙරෙමියි අන්‍ධ බාලලොකයා වඤ්චා කොට අහර නොවළඳ මහජනයා විසින් යාවඤ්ඤකරනුලදුවැ තොපට අනුග්‍රහ කරනු පිණිස මුත් මට අහරින් කම් නැති වැළි ගෙනෙවයි උපස්ථායකයන් විසින් එළවන ලද තෙල් මී සකුරු ආදියෙන් කිසිවක් තණඅගින් ගෙනැ මස කට එකවරෙකැ දිවඅග පහරවා සෙසු අහරක් නොවළඳන්නේ හෝ වේ ද අවෙලකයන් වැළැඳියයුතු වෙලාව ඉකුත්වැගියේයැයි වෙලායෙහි කුකුස් කොට හෝ අවෙලකව්‍රතයට නුසුදුසු පරිද්දෙන් උපනැයි ආහාරයෙහි කුකුස් කොට හෝ අහර නොවළඳන්නේ වේද මෙසේ මොහු කෂ්ටව්‍රතසමාදානය කොට හවුරුදු සියයක් පිරූ තපසෙහි එල පරිඥාතධර්මයන් ඇති ක්ෂීණාශ්‍රවයනට වෙලායෙහි කුකුස් කොට හෝ එකදවසක් අහර නොවැළඳීමෙන් උපන් කුශලචෙතනාවගේ සොළොස්වන කලාවද නො අගනේයැ යනු භාවයි.

-ජම්බුකාජීවිකවත්ථු-

5—12.

12. කතං, (සත්ත්වයා විසින්) කරනලද; පාපං කම්මං, අකුශල කර්මය තෙමෙ; සජ්ජු, එකෙණෙහි මැ හෙවත්: අකුසල් කළ විගස මැ; ඛීරං ඉව, (දෙනගෙ තනයෙන් දෝනාලද කෙණෙහි මැ මිදී නොයන) කිරිමෙන්; න මුච්චති, නොපෙරළෙන්නේයි;-විපාක නො දෙන්නේ මැ යි; (ඇඹුලක් නොහරනාතෙක් දෝනා ලද විගස මැ මිදී නොයන කිරිමෙන් කරනලද අකුශලකර්මය ද පෙර කළ අකුශලකර්මයෙන් උපන් ස්කන්ධයන් ධරමින් සිටියදී අපායෙහි නොඋපදවන්නෙයැ, කාලවිපත්ති ගතිවිපත්ති ආදියට පැමිණැ කාලාන්තරයෙකින් විපාක දෙන්නෙයැ, එසේ විපාකදෙන්නේද;) තං බාලං, ඒ අඥානයා; භස්මච්ඡන්නො පාවකො ඉව, හළුයෙන් වැසුණු සාලඟුරුරැස්හු මෙන්; ඩහං, (දෙවන තුන්වන අත් බැව නරකාදියෙහි උපන්නහු) දවමින්; අන්වෙති, අනු වැ යන්නේ යි.

-අහිපෙතවත්ථු-

13. යාවදෙව අනත්ථාය ඤත්තං බාලස්ස ජායති
හන්ති බාලස්ස සුක්කංසං මුද්ධමස්ස විපාතයං. 72

14. අසතං භාවනමිච්ඡෙය්‍ය පුරෙක්ඛාරං ච භික්ඛුසු
ආවාසෙසු ච ඉස්සරියං පූජා පරකුලෙසු ච. 73

## 5—13.

13. බාලස්ස, බාලයා විසින්; ඤත්තං, දන්නාලද ශිල්පය; (නොහොත්: බොහෝදෙනා කෙරෙහි ප්‍රකටවූ බාලයාගේ ඉසුරු බව;) යාවදෙව අනත්ථාය, බාලයාහට අවැඩ පිණිස මැ; ජායති, වන්නේයි; බාලස්ස, බාලයාගේ; මුද්ධං, ප්‍රඥා නමැති සිරස; විපාතයං, පළමින්; සුක්කංසං, (ඔහුගේ) කුසලකොට්ඨාසය; හන්ති, නසන්නේ සි.-.බාලයා තමා විසින් දන්නාලද ශිල්පය නිසා ද පැමිණෙනලද ඉසුරු නිසා ද තමහට අවැඩ මැ කරන්නේ යැයි සේයි.

### සට්ඨිකූටපෙතවත්ථු

## 5—14.

14. අසතං භාවනං ඉච්ඡෙය්‍ය, (අඥාන මහණ තෙමෙ අපගේ තෙරුන්වහන්සේ ධ්‍යානලාභි සේක සෝවාන් සෙදෑගැමි අනාගැමි රහත්සේකැයි තමා සතන්හි නොඋපන් මහද්ගත ලොකොත්තරධර්මයන් අරභයා මහාජනයා විසින් කරන සම්භාවනාව කැමැතිවන්නේයි, නොහොත්: ශ්‍රද්ධාදි ගුණරහිතවූයේමැ අපගේ තෙරුන්වහන්සේ ශ්‍රද්ධාසම්පන්නසේක ශීලසම්පන්නසේක බහුශ්‍රැතසේක යනාදීන්) අසද්ගුණහෙතුයෙන් ජනයා කරන සම්භාවනා කැමැති වන්නෙයැ; භික්ඛුසු,. භික්ෂූන් කෙරෙහි හෙවත්: භික්ෂූන් විසින්; පුරෙක්ඛාරං ච, (පැන පිළිවිසීම් ආදිය කෙරෙමින් විහාරයෙහි සියලු භික්ෂූහු මා මැ පිරිවරා විසූ නම් යෙහෙකැයි ඉච්ඡාචාරයෙහි සිටැ) භික්ෂූන් පිරිවැරීම ද කැමැති වන්නෙයැ; ආවාසෙසු,(සාංඝික) ආවාසයෙහි; ඉස්සරියං ච, ඉසුරු බව ද; (හෙවත්: වෙහෙර මැද පිහිටි වාසල් ඇති වැ තුබූ මනා සෙනසුන් තමහට ද තමා තැකූ නිසිවූවන්ට ද පමුණුවා වෙහෙරපසත වාසල් නැති වැ තුබූ කසළ බොහෝ සෙනසුන් ද යකුන් ඇති සොපද්‍රව සෙනසුන් ද ආගන්තුකභික්ෂූන්ට පමුණුවා මා මුත් අනික් කවුරුදැයි මෙසේ ආවාසයෙහි ඉසුරුබව ද කැමැති වන්නෙයැ;) පරකුලෙසු, (මවු පිය මල් බෑ බුහුන් ඇ

15. මමෙව කතමඤඤනතු ගිහී පබබජිතා උභො
මමෙව අතිවසා අසසු කිචචාකිචෙචසු කිසමිචි
ඉති බාලසස සඞකපෙපා ඉචඡාමානො ච වඩ්ඪති. 74

16. අඤඤා හි ලාභූපනිසා අඤඤා නිබබානගාමිනී
එවමෙතං අභිඤඤාය භිකඛු බුඞසස සාවකො
සකකාරං නාභිනනෙදයා විවෙක මනුබ්‍රෑහයෙ.ති. 75

—බාලවගෙගා පඤචමො.—

නැකම් නැති) අන් උපාසකකුලයෙහි; පූජා ච, චතුර්විධප්‍රත්‍යය පූජාව ද; (මට මැ කෙරෙත්වයි අන් හට නො කෙරෙත්වයි කියා;) ඉච්ඡති, කැමැති වන්නේ යි.

15. ගිහී, ගිහිමිනිස්සු ද; පබබජිතා, පැවිජිවූවෝ ද යන; උභො, දෙදෙන මැ; මමෙව කතමඤඤනතු, (මෙ පොහෝගෙය මෙ බණගෙය මෙ භොජනශාලාව අපගෙ තෙරුන්වහන්සේ විසින් කරනලද යි විහාරයෙහි සියලු නවකර්මාන්ත) මා විසින් මැ කරනලද්දූ කොට සිතත්වයි කියා ද; කිසමිචි කිචචාකිචෙචසු, කිසි කුදු මහත් කටයුත්තෙක්හි; මමෙව අතිවසා අසසු, (ගිහි පැවිජි දෙපක්‍ෂයෙහි මැ ඇත්තෝ) මා මැ අනු වැ පැවැතුම් ඇති වෙත්වයි; (මා වශගයෙහි පවතිත්වයි මා විචාරා මුත් මට නො කියා කිසි කුදු මහත් කටයුත්තක් නො කෙරෙත්වයි කියා ද;) ඉති, මෙසේ; බාලසස, බාලයාහට; සඞකපෙපා, විතර්කය; (උපපජ්ජති, උපදනේ වේ ද ඔහට විදර්ශනාමාර්ගඵලයෝ නොව ඩන හ; හුදෙක්:) ඉචඡා, (සදෙර උපදනා කාමතෘෂ්ණාදි අවතු රුසියක් පමණ) තෘෂ්ණා ද; මානො ච, ("සෙයාසස සෙයොහමසමි" යනාදීන් උපදනා නවවිධ) මානය ද; වඩ්ඪති, (චන්ද්‍රොද යෙහි ඔදවැඩි මුහුද මෙන්) වඩනේයි.

—සුධමමතෙථරවතථු—

5—15.

16. ලාභූපනිසා, ලාභඋපදවන්නාවූ ප්‍රතිපත්ති තොමෝ; අඤඤා හි, අනිකක් මෙයැ; නිබබානගාමිනී, නිවනට පමුණුවන් නා වූ ප්‍රතිපත්ති තොමෝ; අඤඤා හි, අනිකක් මෙයැ; (ලාභ උපද වනු කැමැති මහණහු විසින් කායවඞකාදි මඳ අකුශලකර්මයන් කටයුතු බැවින් ලාභ උපදවන පිළිවෙත් තොමෝ අනිකක් මෙයැ නිර්වාණගාමිනී පිළිවෙත් පුරන මහණහු විසින් කාය වඞකාදිය දුරු කොට අනාඛ වැ අන්‍යායාමෙන්, නොබිහිරි වැ බිහිරි

1. නිධීනංව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං
නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ
තාදිසං භජමානස්ස සෙය්‍යො හොති න පාපියො. 76

---

මෙන්, නොගොළු වැ ගොළුවාමෙන්, අඥයි වැ අඥයාවී වැ විසියැ යුතු බැවින් නිවනට පමුණුවන පිළිවෙත් නොමො අතිකාක් මෙයැ සී·සේසි;) එවං මෙසේ; එතං, මේ (ලොභොත්පාදකවූ ද නිර්‍වාණප්‍රාපකවූ ද) කාරණය; අභිඤ්ඤාය, විශෙෂයෙන් දැන; බුද්ධස්ස සාවකො, සම්‍යක්සම්බුද්ධයන්ගේ ශ්‍රාවක වූ; භික්ඛු, මහණ තෙමෙ; සක්කාරං නාභිනන්දෙය්‍ය, (අධර්‍මයෙන් උපදවන චතුර්විධප්‍රත්‍යයසඞ්ඛ්‍යාත) සත්කාරය නො ඉවසන්නේයැ; විවෙකං, (කායවිවෙකාදි ත්‍රිවිධ) විවෙකය; අනුබ්‍රෑහයෙ, වඩන්නේසි—ගණසඞ්ගණිකායෙන් දුරු වැ එකීභාවය යි කියනලද කායවිවෙකය ද කෙලශසඞ්ගණිකායෙන් දුරු වැ අෂ්ටසමාපත්ති යයි කියනලද චිත්තවිවෙකය ද සංස්කාරසඞ්ගණිකායෙන් දුරු වැ නිර්‍වාණයයි කියනලද උපධිවිවෙකය ද උපදවා වසන්නෙයැ සී සේසි—

—වනවාසිතිස්සථෙරවත්ථු—

## —බාලවග්ගො පඤ්චමො—

### 6—1.

1. වජ්ජදස්සිනං, (මේ අසාරුප්‍යයෙන් මේ වරදින් මොහු සහමැදූ නිගන්මි කර බාවමි යි රන්ධ්‍රගවෙෂී නො වැ නො දත් දෙය උගන්වමි දත් දෙය තර කරවමි යන අනුග්‍රහබුද්ධියෙන් පුද්ගලයාගේ) වරද දක්නා සුලුවූ; නිග්ගය්හවාදිං, (සායිකවාව සික වූ කිසි නොසරුප් දෙයක් දුටු ඇසූ කල වරදට සුදුසු පරිද්දෙන් තර්ජනයකොට නිග්‍රයප්‍රණාමනය කොට දඬුවම් කරවා සහරමින් තෙරු භික්මවමින්) නිග්‍රහ කොට බණන්නා වූ; මෙධාවිං, ධර්‍මෞජඃප්‍රඥයයි කියනලද විදශීනා ඥානයෙන් යුක්තවූ; යං, යම් කල්‍යාණමිත්‍රයකු; නිධීනං පවත්තාරං ඉව, (නොඑක් රන් රුවන් පිරුණු) මහා නිධාන සැළ තුබූ තැන් කියන්නක්හු වැනි කොට; පස්සෙ, දක්නේවේ ද; තාදිසං පණ්ඩිතං, එබඳුවූ ප්‍රාඥයා; භජෙ, සෙවුනෙයැ; තාදිසං භජමානස්ස, එබඳු පණ්ඩිතයා සෙවුනාහට; සෙය්‍යො හොති, (මෙලොව ද පරලොවද) ශ්‍රෙයස් මැ වැඩ මැ වන්නෙයැ; න පාපියො, අවැඩෙක් නො වන්නේයි.

—රාධථෙරවත්ථු—

2. ඔවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ
සතං හි සො පියො හොති අසතං හොති අප්පියො. 77

3. න භජෙ පාපකෙ මිත්තෙ න භජෙ පුරිසාධමෙ
භජේථ මිත්තෙ කල්‍යාණෙ භජේථ පුරිසුත්තමෙ. 78

---

## 6—2.

2. ඔවදෙය්‍ය, (යම් කල්‍යාණමිත්‍රයෙක් අන්තෙවාසිකසද්ධිවිහාරිකාදීන් අතුරෙහි යම් කිසිවක්හට උපන් වස්තුයෙහි) අවවාද කෙරේද; අනුසාසෙය්‍ය, (අනුත්පන්නාවස්තුයෙහි හිත වැ අයශයෙකුදු වන්නේයැයි අනාගතය පැ) අනුශාසනාකෙරේද; නොහොත්: ඔවදෙය්‍ය, සම්මුඛයෙහි අවවාද කෙරේද; අනුසාසෙය්‍ය, අසම්මුඛයෙහි දූතයෙකු හෝ අස්නක් හෝ යවා අනුශාසනා කෙරේද; නොහොත්: ඔවදෙය්‍ය, එකවරෙක කියන්නේ අවවාද කෙරේද; අනුසාසෙය්‍ය, නැවැත නැවැත කියන්නේ අනුශාසනා කෙරේද; අසබ්භා ච නිවාරයෙ, අකුශල ධර්මයෙන් වළකාද (හෙවත්: කුශලධර්මයෙහි පිහිටුවාද); සො, (මෙබඳු) ඒ (කල්‍යාණමිත්‍ර වූ පුද්ගල තෙමේ; සතං, බුද්ධාදිසත්පුරුෂයනට; පියො හොති, ප්‍රිය වන්නේයැ; අසතං, (ජිවිකාපී වැ පැවිජි වූ) අසත්පුරුෂයනට; අප්පියො හොති, අප්‍රිය වන්නේ යි.

## අස්සජිපුනබ්බසුකානං වත්ථු

## 6—3.

3. පාපකෙ මිත්තෙ, (කායදුශ්චරිතාදි අකුශලකර්මයෙහි ඇලුණු) පාපමිත්‍රයන්; න භජෙ, නො සෙවුනෙයැ (භජනය පයිරුපාසනය නොකරන්නෙයැ); පුරිසාධමෙ, (උමං බිඳීම් මං පැහැරීම් ආදි අකෘත්‍යයෙහි යොදන ගිහියැ එක්විසි අනෙස්නෙහි අස්ථානයෙහි යොදන ප්‍රව්‍රජිතයෝයැ යන මේ)අධමපුරුෂයන්; න භජෙ, නො සෙවුනෙයැ (භජනය පයිරුපාසනය නො කරන්නෙයැ); කල්‍යාණෙ මිත්තෙ, (බුදු පසේබුදු බුදුසව්වෝයැ කායසුචරිතාදි කුශලකර්මයෙහි ඇලුණු සෙසු සත්පුරුෂයෝයැ යන මේ)කල්‍යාණමිත්‍රයන්; භජේථ, සෙවුනෙයැ(භජනය පයිරුපාසනය කරන්නෙයැ); පුරිසුත්තමෙ, (කායදුශ්චරිතාදියෙන් දුරු වැ දැහැමින් සෙමින් ජීවත් වන ගිහියැ එක්විසි අනෙස්නෙන් දුරු වැ පිණ්ඩපාතචරියාදියෙන් ජීවත් වන ප්‍රව්‍රජිතයෝයැ යන මේ) උත්තම පුරුෂයන්; භජේථ, සෙවුනෙ යැ (භජනයැ පයිරුපාසනය කරන්නේ යි.)

## ඡන්නත්ථෙරවත්ථු

4. ධම්මපීති සුඛං සෙති විප්පසන්නෙන චෙතසා
අරියප්පවෙදිතෙ ධම්මෙ සදා රමති පණ්ඩිතො. 79

5. උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති පණ්ඩිතා. 80

6. සෙලො යථා එකඝනො වාතෙන න සමීරති
එවං නින්දාපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා. 81

---

## 6—4.

4. ධම්මපීති, (නවලොකොත්තරධර්මය නාමකායයෙන් ස්පර්ශනය කෙරෙමින් ආලම්බනකරණවශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් පරිඤ්ඤපහාණසච්ඡිකිරියාභාවනාවසයෙන් දුඃඛාදිචතුරාර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙමින්) ධර්මය බොන්නාවූ හෙවත්: නවලොවුතුරුදහම්රස වළඳන්නාවූ මහණ තෙමෙ; සුඛං සෙති, සුවසේ (සතරඉරියවුවෙන්) වසන්නේයි; පණ්ඩිතො, ප්‍රාඥ වූ මහණ තෙමෙ; විප්පසන්නෙන චෙතසා, විශෙෂයෙන් ප්‍රසන්න වූ (නොකැළඹුණු නිරුපක්ලෙශ වූ) සිතින් යුක්ත වැ; අරියප්පවෙදිතෙ ධම්මෙ, බුද්ධාදිආර්‍ය්‍යයන් විසින් දන්නාලද්දාවූ සතිපට්ඨානාදි ප්‍රභෙද ඇති සත්තිස් බොධිපාක්ෂික ධර්මයෙහි; සදා, හැමකල්හි මැ; රමති, ඇලෙන්නේයි.

### මහාකප්පිනත්ථෙරවත්ථු

## 6—5.

5. නෙත්තිකා, දියඑළෙවෝ (කෙත් ආදියට දිය ගෙනැ යන්නාහු); උදකං, (සිත්පිත්නැති) දිය; නයන්ති, (ඇළ බිඳැගෙනැ වෙහෙලි තබාගෙනැ පිහිලි පටවාගෙනැ තමන් කැමැති තැනකට) ගෙනැ යන්නාහ; උසුකාරා, හීවඩුවෝ; තෙජනං, (සිත්පිත් නැති) හීදඬු; නමයන්ති, (තවා හැදූ මැඩැ තමන් කැමැති ලෙසට) නමන්නාහ; තච්ඡකා, වඩුවෝ; දාරුං, (සිත්පිත්නැති) දඬු; නමයන්ති, (නිම්වළලු ආදීන් පිණිස වක් කොට ද ඉදි කොට ද සෑසෑ තමන් තමන් කැමැතිලෙසට) නමන්නාහ; පණ්ඩිතා, නුවණැත්තාහු; අත්තානං, (තමන්ගේ) සිත; දමයන්ති, (සතර මග සතරඵලයට පැමිණීමෙන්) දමනය කරන්නාහු යි.

### පණ්ඩිතසාමණෙරවත්ථු

## 6—6.

6. එකඝනො, (රන්ධ්‍රයක් පටලයක් නැති වැ ගැසුණු හෙයින්) එකඝන වූ; සෙලො, (පාංශුපණීත මිශ්‍රපණීත නො වූ)

7. යථාපි රහදො ගම්භීරො විප්පසන්නො අනාවිලො
එවං ධම්මානි සුත්වාන විප්පසීදන්ති පණ්ඩිතා.

8. සබ්බත්ථ වෙ සප්පුරිසා වජන්ති න කාමකාමා ලපයන්ති සන්තො
සුඛෙන ඵුට්ඨා අථවා දුඛෙන න උච්චාවචං පණ්ඩිතා දස්සයන්ති.

---

ශෛලපර්වතය තෙමේ; වාතෙන, (සතරදිගින් හමන ප්‍රචණ්ඩ) වාතයෙන්; යථා න සමීරති, යම්සේ කම්පා නො වේ ද (නො සැලේද); එවං, එපරිද්දෙන් මැ; පණ්ඩිතා, නුවණැත්තාහු; නින්‍දා පසංසාසු, නින්‍දා ප්‍රශංසා දෙක්හි; (හෙවත්: ලාභයැ අලාභයැ අයසයැ යසයැ නින්‍දායැ පසංසායැ සුඛයැ දුක්ඛයැ යන අෂ්ට ලොකධර්මයෙහි අනුරොධ විරොධයක් උන්නතාවනතියක් නැතිහෙයින්;) න සමිඤ්ජන්ති, කම්පා නොවන්නාහුයි;-නො සැලෙන්නාහුයි.

### ලකුණ්ටකභද්දියත්ථෙරවත්ථු.

### 6—7.

7. ගම්භීරො, ගැඹුරුවූ; රහදො, මහමුහුද; (හෙවත්: සුවාසූ දහසක් යොදුන් ගැඹුරුඇති මහමුහුද යට මස්කැස්බන් විසින් චලිතවූ සතලිස්දහසක් යොදුන් තැන් ද මත්තෙහි පවනින් කම්පිත වූ සතලිස්දහසක් යොදුන් තැන් ද හැර මධ්‍යයෙහි නිශ්චල වූ සාරදහසක් යොදුන් ගැඹුරු ඇති සාගර ජලය;) යථා පි, යම්සේ; විප්පසන්නො, (අනාකූල වූ බැවින්) විශෙෂයෙන් ප්‍රසන්න ද; අනාවිලො, (මඩ නැති බැවින් හා නිශ්චල බැවින් හා) නොකැලඹිණිද; එවං, එපරිද්දෙන් මැ; ධම්මානි සුත්වාන, (බුදුන්ගේ දෙශනා) ධර්මයන් අසා; (ශ්‍රොතආපත්තිමාර්ගාදියට පැමිණීම්වශයෙන් නිරුපක්ලෙශ වූ සිත් ඇති බවට පැමිණෙන්නාවූ;) පණ්ඩිතා, නුවණැත්තාහු; විප්පසීදන්ති, විශෙෂයෙන් මැ ප්‍රසන්න වන්නාහුයි.

### කාණමාතුවත්ථු.

### 6—8.

8. සප්පුරිසා, (ශීලාදිගුණයොගයෙන් ප්‍රශස්ත වූ) උත්තම පුරුෂයෝ; වෙ, එකාන්තයෙන්; සබ්බත්ථ, (ස්කන්ධධාත්වායතනාදි) සියලු ධර්මයෙහි ඡන්දරාගය; වජන්ති, (අර්හත්මාර්ගඥානයෙන්) දුරු කරන්නාහ හෙවත්: නසන්නාහ; සන්තො, (ඒ) සත්පුරුෂයෝ; කාමකාමා, වස්තුකාමයන් කැමැති වැ (හෙවත්: සතරපසය එළවා ගන්නා කැමැති වැ); න ලපයන්ති, (ඉච්ඡාචාරයෙහි සිටැ

9. න අත්තහෙතු න පරස්ස හෙතු
න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං
න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො
ස සීලවා පඤ්ඤවා ධම්මිකො සියා. 84

10. අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති. 85

---

කිමෙක් ද? උපාසකයෙනි! තොපට සුව ද? රොග දුක් නැත් ද? තොපගෙ අඹුදරුවනට වහල් සරකාට සුවද? රොග දුක් නැත්ද? යනාදීන් උපාසකවරුන් සිත් ගන්නා තෙපුල්) නො කියන්නාහ; සුඛෙන ඵුට්ඨා, සුවයෙන් වළඳනාලද්දාවූ ද; අථවා, නො හොත්; දුඛෙන ඵුට්ඨා; දුඃඛයෙන් වළඳනාලද්දාවූ ද (හෙවත්: අෂ්ටලොකධර්මයෙන් වළඳනාලද්දාවූ); පණ්ඩිතා, නුවණැත්තෝ, උච්චාවචං, (උපාසකජනයාගේ ගුණාගුණ කිම් වශයෙන්) උච්චවූ ද නීචවූ ද ආකාරයක්; න දස්සයන්ති, නොදක්වන්නාහුයි.

## විසාඛාදීනං දෙසවුත්තපඤ්චසතගිහිකානං වත්ථු

### 6—9.

9. න අත්තහෙතු, (පණ්ඩිතපුරුෂ තෙමෙ) තමා හෙතු කොටැ ගෙනැ ද (හෙවත්: තමා පිණිස ද පවු නොකරන්නෙයැ); න පරස්සහෙතු, මෙරමා හෙතු කොට ගෙනැ ද (හෙවත්: අනුන් පිණිස ද පවු නොකරන්නෙ යැ); පුත්තං, (පවුකම් කිරීමෙන් ලැබියැ යුතු) පුතකු දු; න ඉච්ඡෙ, නො කැමැති වන්නෙයැ; ධනං, (පවුකම් කිරීමෙන් ලැබියැ යුතු) ධනය ද; න ඉච්ඡෙ, නො කැමැති වන්නෙයැ; රට්ඨං, (පවුකම් කිරීමෙන් ලැබියයුතු) රටක් ද; න ඉච්ඡෙ, නො කැමැති වන්නෙයැ; අධම්මෙන, අධර්මයෙන්; අත්තනො, තමහට (ලැබියැයුතු); සමිද්ධිං, සමෘද්ධිය; න ඉච්ඡෙය්‍ය; යමෙක් නො කැමැති වේද; සො, හෙ තෙමෙ; සීලවා, සිල්වත් නමුදු වන්නෙයැ; පඤ්ඤවා, ප්‍රඥාවත් නමුදු වන්නෙයැ; ධම්මිකො සියා, ධාර්මික නමුදු වන්නේයි.

## ධම්මිකත්ථෙරවත්ථු

### 6—10.

10. මනුස්සෙසු, මනුෂ්‍යයන් කෙරෙහි; යෙ ජනා, යම් ජනකෙනෙක්; පාරගාමිනො, පාරයයි කියනලද නිර්වාණයට යනසුල්ලෝ ද; තෙ, ඒ ජනයෝ; අප්පකා, ස්වල්පයහ හෙවත්: මඳ දෙනෙක; අථ, නැවැතැ; ඉතරා, ඔවුන් කෙරෙන් අන්‍යවූ

11. යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො.
තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං. 86

12. කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො
ඔකා අනොකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං. 87

13. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො
පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො. 88

---

(නිවනට නොයන සුලුවූ); අයං පජා, මේ ප්‍රජා තොමෝ; (හෙවත්: මේ සත්‍වසමූහයා වූ කලී;) තීරමෙව, සක්කායතීරයට මැ හෙවත්: මෙතෙරට මැ; අනුධාවති, දිවන්නේයි; (එතෙරට යන්නාවුනට වඩා මෙතෙරට එන්නෝ මැ බොහෝ වූහ යී සේයි.)

11. යෙ ච ඛො, යම් පණ්ඩිත ජනකෙනෙක් වනාහි; සම්මදක්ඛාතෙ, (නිවනට පමුණුවන සේ) මනා කොට දෙසනලද්දා වූ; ධම්මෙ, දෙශනාධර්මයෙහි; ධම්මානුවත්තිනො, (ඒ ධර්මය අසා එයට අනුරූප වූ පිළිවෙත් පුරා මාර්ගඵලප්‍රත්‍යක්ෂකිරීමෙන්) ධර්මය අනුවැ පවතිත් ද; තෙ ජනා, ඒ පණ්ඩිතයෝ; මච්චුධෙය්‍යං, ක්ලේශමාරයාහට වාසස්ථාන වූ හෙවත්: ක්ලේශමාරයාගේ ආඥ පවත්නා වූ; සුදුත්තරං, වෙසෙසින් මැ එතරවියැ නොහැක්කා වූ (ත්‍රෛභූමකවෘත්තය ඉක්මැ); පාරං, (නිර්වාණ යයි කියනලද) පාරයට; එස්සන්ති, පැමිණෙන්නාහුයි.

ධම්මසවනවත්ථු

6—11.

12. පණ්ඩිතො, නුවණැති මහණ තෙමේ; කණ්හං ධම්මං විප්පහාය, (කායදුශ්චරිතාදි) අකුශලධර්මය දුරැ කොට; ඔකා, ආලයෙන් නික්මැ; (හෙවත්: ආලයසඞ්ඛ්‍යාත ගිහිගෙන් නික්මැ); අනොකං ආගම්ම, ගෙනැති ප්‍රව්‍රජ්‍යාවට පැමිණැ නොහොත්: නිරාලයයි කියනලද නිර්වාණය පිණිස; (හෙවත්: ඒ නිර්වාණය ප්‍රාර්ථනා කරන්නේ;) සුක්කං භාවෙථ, (කායසුචරිතාදිභෙද ඇති) කුශලධර්මය අභිනිෂ්ක්‍රමණයෙහි පටන් අර්හත්මාර්ගාධිගමය දක්වා වඩන්නේයි; යත්ථ විවෙකෙ, නිර්වාණ යයි කියනලද යම් උපධිවිවේකයෙක්හි; දූරමං, (මේ සත්‍වයන් විසින්) අභිරමණය කරන්නට නොපිළිවන් ද–

13. තත්‍ර, (මේ ලෞකිකමහාජනයා විසින් සිත් ඇලවන්නට නොපිළිවන්වූ) ඒ නිර්වාණයෙහි; අභිරතිං, ඇල්ම; ඉච්ඡෙය්‍ය, කැමැති වන්නේයැ; පණ්ඩිතො, නුවණැති මහණ තෙමේ;

14. යෙසං සම්බොධිඅඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං
ආදානපටිනිස්සග්ගෙ අනුපාදාය යෙ රතා
ඛීණාසවා ජුතීමන්තො තෙ ලොකෙ පරිනිබ්බුතාති. 89

### පණ්ඩිතවග්ගො ඡට්ඨො.

1. ගතද්ධිනො විසොකස්ස විප්පමුත්තස්ස සබ්බධි
සබ්බගන්ථප්පහීණස්ස පරිළාහො න විජ්ජති. 90

---

කාමෙ, වස්තුකාමක්ලේශකාමයන්; හිත්වා, දුරු කොට (හෙවත්: සිතින් පහ කොට); අකිඤ්චනො, රාගාදික්ලේශපළිබෝධ රහිත වූ යේ නොහොත්: පුත්‍රදාරදාසිදාසගවමහිෂධනධාන්‍යාදි පළිබෝධයක් නැත්තේ; චිත්තක්ලේසෙහි, චිත්තසන්තානය ක්ලේසන හෙයින් චිත්තක්ලේශ නම් වූ කාමච්ඡන්දාදිපඤ්චනීවරණයන් කෙරෙන්; අත්තානං, තමා හෙවත්: තමාගේ සිත; පරියොදපෙය්‍ය, මනා කොට දෑවූ රත්රනක් මෙන් නිර්මලකරන්නේයි.

14. යෙසං, යම් ක්ෂීණාශ්‍රව කෙනෙකුන්ගේ; චිත්තං, සිත; සම්බොධිඅඞ්ගෙසු, සප්තබෝධ්‍යඞ්ගධර්මයන් විෂයෙහි නොහොත්: සප්තත්‍රිංශද්බෝධපාක්ෂිකධර්මයන් විෂයෙහි; සම්මා, මනා කොට නයහෙයින් කාරණහෙයින්; සුභාවිතං, මනා කොට වඩන ලද ද; අනුපාදාය, (කාමොපාදානාදි චතුරුපාදානයන් අතුරෙන් කිසි උපාදානයක් මමය මාගේ යැයි) නො ගෙනැ; ආදානපටිනිස්සග්ගෙ, ආදානයයි කියනලද ග්‍රහණයට ප්‍රතිපක්ෂවූ හෙවත්: ග්‍රහණයක් නැත්තාවූ නිර්වාණයෙහි; යෙ, යම් ක්ෂීණාශ්‍රවකෙනෙක්; රතා, ඇලුණාහුද; ජුතීමන්තො, අනුභාවවත්වූ (හෙවත් ඥානානුභාව ඇති); තෙ ඛීණාසවා, (ක්ෂීණවූ චතුරාශ්‍රව ඇති) ඒ ආර්යයෝ; ලොකෙ, (ස්කන්ධධාත්වායතනාදි) ලෝකයෙහි; පරිනිබ්බුතා, පිරිනිවියො නම් වෙත්—අර්හත්ඵලයට පැමිණි තැන් පටන් ක්ලේශවෘත්තය ක්ෂය කළ හෙයින් සඋපාදිශේෂ නිර්වාණධාතුයෙන් ද චරිමචිත්තනිරොධයෙන් ස්කන්ධවෘත්තය ක්ෂය කළ හෙයින් අනුපාදිශේෂනිර්වාණධාතුයෙන් දැයි මෙසේ ද්විවිධ පරිනිර්වාණයෙන් පිරිනිවියාහු නිරුපාදන වූ ප්‍රදීපයක් මෙන් අප්‍රඥප්තික බවට හෙවත්: නම් නැතිබවට පැමිණෙන්නාහ යි සේයි—

### ආගන්තුකපඤ්චසතභික්ඛූනං වත්ථු.

## පණ්ඩිතවග්ගො ඡට්ඨො

### 7—1.

1. ගතද්ධිනො, (සසර නමැති කතරමඟ ඉක්මැ ගියහෙයින්) ගතද්ධි වූ (හෙවත්: ගොස් නිමවනලද සංසාරමාර්ග ඇති); විසො

2. උය්‍යුඤ්ජන්ති සතීමන්තො න නිකෙතෙ රමන්ති තෙ
හංසාව පල්ලලං හිත්වා ඔකමොකං ජහන්ති තෙ. 91

---

තස්ස, (වට්ටමූලක වූ ශොකය අනාගාමිමාර්ගයෙන් මැ ප්‍රහීණ කළහෙයින්) නිශොකවූ; සබ්බධි, සකන්ධධාත්වායතනාදිප්‍රභෙද ඇති සියලු ධර්මයෙහි (නො ඇලී); විප්පමුත්තස්ස, (එයින්) මුක්තවූ; සබ්බගන්ථප්පහීණස්ස, (අභිධ්‍යාකායග්‍රන්ථාදි) සියලු ග්‍රන්ථයන් ප්‍රහීණ කළාවූ ක්ෂීණාශ්‍රවයාහට; පරිළාහො, චෛතසික පරිදාහයෙක්; න විජ්ජති, නැත්තේයි.

## ජීවකපඤ්හවත්ථු

### 7—2.

2. සතීමන්තො, ස්මෘතිසම්පන්නාවූ ක්ෂීණාශ්‍රවයෝ; උය්‍යුඤ්ජන්ති, (තමන්විසින් ප්‍රතිවෙධකරනලද ලොකොත්තර ගුණයෙහි ද ධ්‍යානවිදර්ශනාදියෙහි ද ආවජ්ජන සමාපජ්ජන උත්ථාන අධිෂ්ඨාන පච්චවෙක්ඛන වසයෙන්) යෙදෙන්නාහ-ඝටනය ව්‍යායාමය කරන්නාහ; තෙ, ඒ ක්ෂීණාශ්‍රවයො; නිකෙතෙ, ආලයෙහි; න රමන්ති, නොඇලෙන්නාහ; ඔවුනට පඤ්චකාමසඞ්ඛ්‍යාත) ආලයෙහි ද ගිහිගෙය සි කියනලද ආලයෙහිද අභිරතියෙක් නම් නැති;) තෙ, ඒ ක්ෂීණාශ්‍රවයෝ; පල්ලලං හිත්වා, (ගොදුරු ගත් විලැ ආලයක් නො කොට නිරපෙක්ෂ වැ ඒ) විල හැර පියා යන්නාවූ; හංසා ඉව, හංසයන්මෙන්; (හෙවත්: හංස පිලව කාරණ්ඩව බකබලාකාදිපක්ෂීන් ගොචරසම්පන්නා වූ පියුම් විලෙකැ ගොචරග්‍රහණය කොට ඒ ඒ අත යන කල මේ මාගේ දියයැ මාගේ මඩයැ මාගේ පියුමයැ මාගේ උපුලයැ මාගේ තණයැයි ඒ විලැ කිසිවෙකැ ආලයක් නො කොට නිර පෙක්ෂ වැ ම ඒ විල හැර අහසට නැගී කෙළිමින් ඒ ඒ තැනට යන්නවුන් මෙන්;) ඔකමොකං, ආලයක් ආලයක් පාසා; ජහන්ති, හරනාහුයි; (හෙවත්: සියලු ආලයන් හරනාහුයි)—ක්ෂීණාශ්‍රවයෝ යම්කිසි තෙනෙකැ වසන්නාහු ද කුලෙහි වත් ගෙණෙහි වත් අලග්න වැ මැ වෙසෙති, එයින් අතික් තෙනෙකට යන්නාහු ද මේ මාගේ විහාරයැ මේ මාගේ පිරිවෙනයැ මේ මාගේ උපාසකවරුයැ යි විහාරාදියෙහි ආලය නො කොට පක්ෂීන්මෙන් නිරපෙක්ෂ වැ මැ යන්නාහ යි සේ යි.

## මහාකස්සපත්ථෙරවත්ථු

සන්නිචයො නත්ථි යෙ පරිඤ්ඤාතභොජනා
තො අනිමිත්තො ච විමොක්ඛො යස්ස ගොචරො
සෙව සකුන්තානං ගති තෙසං දුරන්නයා. 92

සවා පරික්ඛීණා ආහාරෙ ච අනිස්සිතො
ඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො යස්ස ගොචරො
සෙව සකුන්තානං පදං තස්ස දුරන්නයං. 93

---

යම් ක්ෂීණාශ්‍රව කෙනෙකුන්ට; සන්නිචයො නත්ථි, සඞ්ඛ්‍යාත කර්මසන්නිචයෙක් වත් චීවරාදි චතුර්විධ චයෙක් වත් නැත් ද; යෙ, යම් ක්ෂීණාශ්‍රව කෙ ඤ්ඤාතභොජනා, පිරිසිඳ දන්නාලද ආහාර ඇත් හවත්: යාගුභක්තාදීන්ගේ ධාර්මිකාධාර්මිකභාවය කියනලද ඤාතපරිඤ්ඤාය, ආහාරයෙහි ප්‍රතිකූල කියනලද තීරණපරිඤ්ඤාය, කබලීකාරාහාරයෙහි ණය යි කියනලද පහාණපරිඤ්ඤාය, යන මේ ත්‍රිවිධ යන් පිරිසිඳ දන්නාලද ඛජ්ජභොජ්ජලෙය්‍යපෙය්‍ය ර්විධආහාර ඇත්තාහු ද; සුඤ්ඤතො අනිමිත්තො ච රාගාදියෙන් ශූන්‍යහෙයින් ද ඔවුන් කෙරෙන් විමුක්ත සුඤ්ඤතවිමොක්ඛ නම් වූ ද රාගාදි නිමිත්තරහිත ඔවුන් කෙරෙන් විමුක්තහෙයින් ද අනිමිත්ත ම් වූ ද රාගාදිප්‍රණිධිරහිත හෙයින්ද ඔවුන් කෙරෙන් හෙයින් ද අප්පණිහිතවිමොක්ඛ නම් වූ ද නිර්වාණය ස, යී සේයි; යෙසං, (ඵලසමාපත්තිවශයෙන් නිවන් නාට වසන්නාවූ) යම් ක්ෂීණාශ්‍රව කෙනෙකුන්ට; රමුණුවේ ද; තෙසං, ඒ ක්ෂීණාශ්‍රවයන්ගේ; ගති, වූ උත්පත්තිගති තොමෝ; ආකාසෙ සකුන්තානං යෙහි පක්ෂීන් ගියමග මෙන්; දුරන්නයා නො යි.

## බෙලට්ඨිසීසත්ථෙරවත්ථු

7—4

ස, යම් ක්ෂීණාශ්‍රවයක්හට; ආසවා, කාමාශ්‍රවාදි චතු පරික්ඛීණා, ක්ෂය වූහු ද; ආහාරෙ ච, කබලීකාරා ; අනිස්සිතො, තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් යමෙක් නො ඤ්ඤතො අනිමිත්තො ච විමොක්ඛො, රාගාදියෙන් න් ද ඔවුන් කෙරෙන් විමුක්තහෙයින් ද සුඤ්ඤත

5. යස්සින්ද්‍රියානි සමථං ගතානි අස්සා යථා සාරථිනා සුදන්තා
පහීණමානස්ස අනාසවස්ස දෙවාපි තස්ස පිහයන්ති තාදිනො.

6. පඨවිසමො නො විරුජ්ඣති ඉන්දඛීලූපමො තාදි සුබ්බතො
රහදෙව අපෙතකද්දමො සංසාරා න භවන්ති තාදිනො.

---

විමොක්ඛ නම් වූ ද රාගාදිනිමිත්තරහිත හෙයින් ද ඔවුන් කෙරෙන් විමුක්තහෙයින් ද අනිමිත්තවිමොක්ඛ නම් වූ ද රාගාදි ප්‍රණිධි රහිත හෙයින් ද එයින් විමුක්තහෙයින් ද අප්පණිහිත විමොක්ඛ නම් වූ ද නිර්වාණය; යස්ස, (ඵලසමාපත්තිවශයෙන් නිවන් අරමුණු කොට වසන්නාවූ) යම් ක්‍ෂීණාශ්‍රාවයක්හට; ගොචරො, අරමුණු වේ ද; තස්ස, ඒ ක්‍ෂීණාශ්‍රවයාගේ; පදං, පිය; ආකාසෙ සකුන්තානං ඉව, ආකාශයෙහි පක්‍ෂීන්ගේ පිය මෙන්; දුරන්නයං, නොදත හැක්කේයි–යම්සේ අහස යන පක්‍ෂීන්ගේ පියක් නොදක්ක හැකි ද මෙතැන පයින් ඇක්මැ ගියෝයැ මෙතැන ළෙන් පැහැරැ ගියෝයැ මෙතැන හිසින් පැහැරැ ගියෝයැ මෙතැන පියායෙන් පැහැරැ ගියෝ යයි දක්නට නොපිළිවන් ද එසේ මැ මෙබඳු මහණහුගේ පිය ද නරක පියෙන් ගියේයැ තිරිසන්යොන්පියෙන් ගියේයැ යනාදීන් ගියපිය දක්නට නො පිළිවනැ යී සේයි.

## –අනුරුද්ධත්ථෙරවත්ථු–

7—5.

5. යස්ස, යම් ක්‍ෂීණාශ්‍රවයක් හුගේ; ඉන්ද්‍රියානි, චක්‍ෂුරාදි සඉඳුරෝ; සාරථිනා, දක්‍ෂවූ රථාචාර්‍ය්‍යයක්හු විසින්; සුදන්ත මනා කොට දමනලද; අස්සා යථා, ආජානෙය අශ්වයන් මෙන්; සමථං ගතානි, සමථයට ගියෝ ද; (මනා කොට දමුණාහු ද නිපොපිබවට පැමිණියෝ ද;) පහීනමානස්ස, ("සෙය්‍යස්ස සෙ ය්‍යො හමස්මි" යනාදි වශයෙන් ප්‍රවෘත්ත වූ නවවිධ මානය ඉක්මැගියහෙයින් [1])ප්‍රහීණ වූ මන්ඇති; අනාසවස්ස, (චතුරා ශ්‍රවයන්ගේ අභාවයෙන්) ආශ්‍රවරහිත වූ; තාදිනො, (අෂ්ටලොක ධර්මයෙහි අනුරොධවිරොධරහිත හෙයින්) තාදී වූ; තස්ස, ඒ ක්‍ෂීණාශ්‍රාවයාගේ දැක්ම; දෙවාපි, දෙවියෝ ද මිනිස්සු ද; පිහ යන්ති, පතන්නාහුයි–කැමති වන්නාහු යි.

## –මහාකච්චායනත්ථෙරවත්ථු

7 6.

6. පඨවිසමො, (ශුචි වූ මාලාගන්ධාදීන්ගේ නිඃක්‍ෂෙපයෙහි ද අශුචි වූ මූත්‍රපුරීෂාදීන්ගේ නිඃක්‍ෂෙපයෙහි ද අනුරොධ

---

1 ඉක්මැ සිටිහෙයින්.

7. සන්තං තස්ස මනං හොති සන්තා වාචා ච කම්ම ච
සම්මදඤ්ඤා විමුත්තස්ස උපසන්තස්ස තාදිනො. 96

විරොධරහිත වූ මහපොළොව මෙන් උපකාරාපකාරීන් කෙරෙහි අනුරොධවිරොධරහිත හෙයින්) පොළොව හා සමවූ; ඉන්දඛීලූපමො, (මලමූත්‍රාදියෙන් කෙලෙසා අසත්කාර කරන්නවුන් කෙරෙහි ද මාලාගන්ධාදියෙන් පූජා සත්කාර කරන්නවුන් කෙරෙහි ද ප්‍රතිඝානුනය වර්ජිත වූ නුවරදොර හිඳුවනලද එෂිකාස්තම්භයක් මෙන් චතුර්විධප්‍රත්‍යයෙන් සත්කාරකරන්නවුන් කෙරෙහි ද නොකරන්නවුන් කෙරෙහි ද අනුනයප්‍රතිඝරහිත වැ සම අදහස් ඇති බැවින්) එෂිකාස්තම්භයක් බඳුවූ; තාදී, (අෂ්ට ලොකධර්මයෙන් අකම්ප්‍ය හෙයින්) තාදීවූ; සුබ්බතො, සුන්දරවූ ධුතාඞ්ගව්‍රත ඇති යම් ක්ෂීණාශ්‍රවයෙක්; නො විරුජ්ඣති, (ජාත්‍යාදියෙන් සටා ආක්‍රොශ කරන්නහුටවත් අතින් පයින් දණ්ඩෙන් සැතින් පහරන්නහුටවත්) විරුඬ නොවේද හෙවත්: නොකිපේද; අපෙතකද්දමො, පහවූ මඩඇති; රහදෙ ඉව, විලක් මෙන් ප්‍රසන්නවේ ද; (හෙවත්: මඩ නැති පහන් සිහිල් දිය පිරුණු ගැඹුරු මහවිලක්මෙන් රාගාදි කෙලෙස් මඩ නැතිබැවින් ප්‍රසන්නවේ ද;) තාදිනො, (අෂ්ටලොකධර්මයෙහි) නිර්විකාර හෙයින් තාදී වූ ඒ ක්ෂීණාශ්‍රවයහට; සංසාරා න භවන්ති, (සුගති දුර්ගති යෙහි ච්‍යුතිප්‍රතිසන්ධිවශයෙන් සංසරණයක් නැති හෙයින්) සංසාරයෝ නොවන්නාහුයි.

## සාරිපුත්තත්ථෙරවත්ථු

7—7.

7. සම්මා, මනා කොට (නය හෙයින් කාරණ හෙයින්); අඤ්ඤාය, (චතුරාර්‍ය්‍යසත්‍යයන්) දැන; විමුත්තස්ස, (තදඞ්ගවිමුක්ත්‍යාදිපඤ්චවිධවිමුක්තියෙන්)විශෙෂයෙන් මුක්ත වූ; තාදිනො, අෂ්ටලොකධර්මයෙහි අකම්ප්‍යවූ; තස්ස, ඒ ක්ෂීණාශ්‍රවයාගේ; මනං, චිත්තය; සන්තං හොති, (අභිධ්‍යාදි ත්‍රිවිධමනොදුශ්චරිතයෙන් දුරු හෙයින්) ශාන්ත මැ වන්නේය - සන්හුන්නේ මැ නිවීගියේ මැ වන්නේය; වාචා ච සන්තා හොති, (මෘෂාවාදාදි චතුර්විධවාග්දුශ්චරිතරහිත හෙයින්) වාචා ද ශාන්ත වන්නීය-සන්හිඳී මැ නිවී මැ පවතින්නීය; කම්මං ච සන්තං හොති, (ප්‍රාණඝාතාදි ත්‍රිවිධකායදුශ්චරිතයෙන්දුරු වූ හෙයින්) කායකර්මය ද ශාන්ත මැ වන්නේය-සන්හිඳී මැ නිවී මැ පවත්නේයි.

## කොසම්බවාසි තිස්සත්ථෙර සාමණෙරවත්ථු

8. අස්සද්ධො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදො ච යො නරො
හතාවකාසො වන්තාසො ස වෙ උත්තමපොරිසො.

9. ගාමෙ වා යදිවාරඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ
යත්ථ අරහන්තො විහරන්ති තං භූමිං රාමණෙය්‍යකං.

10. රමණීයානි අරඤ්ඤානි යත්ථ න රමතී ජනො
වීතරාගා රමෙස්සන්ති න තෙ කාමගවෙසිනො ති.

~අරහන්තවග්ගො සත්තමො~

---

7—8.

8. යො නරො, යම් පුද්ගලයෙක්; අස්සද්ධො, (තමා විසින් ප්‍රතිවෙධ කරනලද ධ්‍යානවිදර්ශනාමාර්ගඵලාදි ලෞකික ලොකොත්තර ගුණධර්මයන් තමා මැ පසක් කොට දත් හෙයින්) අනුන්ගේ බසින් නො අදහා ද නොහොත්: බුදුන් විනා අන්‍ය ශාස්තෘවක්හු කෙරේ ඇදහිලි නැත්තේද; අකතඤ්ඤූ ච, (දිව්‍යබ්‍රහ්මාදි කිසිවක්හු විසින් නොකරනලද හෙයින් අකත නම් වූ) නිර්වාණය ආලම්බනකරණ වශයෙන් ප්‍රත්‍යක්ෂ කොට දත්ද; සන්ධිච්ඡෙදො ච, වෘත්තසන්ධිය ද සංස්කාරසන්ධියද සිඳපි ද; හතාවකාසො, (කුශලාකුශලකර්මසංඛ්‍යාතප්‍රතිසන්ධිබීජය ක්ෂීණහෙයින් නස්තලද) ප්‍රතිසන්ධ්‍යාවකාශ ඇත්තේ ද; වන්තාසො, (චතුර්විධආර්‍ය්‍යමාර්ගඥානමුඛයෙන්) වමනය කරනලද කාම තෘෂ්ණාදි සියලු ආශා ඇත්තේ ද; සො, ඒ පුද්ගලතෙමෙ; වෙ, ඒකාන්තයෙන්; උත්තමපොරිසො, (ප්‍රතිවෙධකරනලද නවලොකොත්තරධර්ම ඇති හෙයින් සකල ලොකයහට අග්‍රදක්ෂිණ්‍යනුයි) උත්තමපුරුෂනම් වේ.

~සාරිපුත්තත්ථෙරස්ස පඤ්හවිස්සජ්ජනවත්ථු~

7—9.

9. ගාමෙ වා, ගමෙක හෝ; යදි, නොහොත්; අරඤ්ඤෙ වා, අරණ්‍යයෙකැහෝ; නින්නෙ වා, වළතැනෙකැහෝ; යදි, නොහොත්, ථලෙ වා, ගොඩතැනෙකැ හෝ; යත්ථ, යම් තැනෙක්හි; අරහන්තො විහරන්ති, රහත්හු වාසයකෙරෙත්ද; තං භූමිං; ඒ භූමිප්‍රදෙශය; රාමණෙය්‍යකං, රමණීයයි-සිත්කලුයි.

~ඛදිරවනියරෙවතත්ථෙරවත්ථු~

7—10.

10. අරඤ්ඤානි, (සුපුෂ්පිත තරුවනෂණ්ඩ මණ්ඩිතවූ නිර්මල ශුචිශීතල සලිල සම්පන්න වූ) මහා අරණ්‍යයෝ; රමණීයානි, රම

1. සහස්සමපි චෙ වාචා අනත්ථපදසංහිතා
එකං අත්ථපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති. 100

2. සහස්සමපි චෙ ගාථා අනත්ථපදසංහිතා
එකං ගාථාපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති. 101

---

ණියහ—සිත්ඇලවන්නාහ; යත්ථ යම් මහාඅරණ්‍යයෙක්හි; ජනො, (වස්තු කාම ක්ලෙශකාමයන් සොයන සුලුවූ) ලෞකික මහාජනතෙමෙ; න රමති, (පුල්පියුම් වෙනෙහි නො ඇලෙන නිලමැස්සන් මෙන්) නොඇලේ ද; (මේ මහා අරණ්‍යයෙහි හුදකලා වැ වසන්නාවූ මට සිංහව්‍යාඝ්‍රයන් විසින් යක්ෂ රාක්ෂස යන් විසින් දිඝීජාතීන් විසින් සොරුන් සතුරන් විසින් ජීවි තාන්තරාය ද වන්නේයයි භය මැ උපදවා ද එසේවූ අරණ්‍යයෙහි;) වීතරාගා, විගතවූ කාමරාග රූපරාග අරූපරාග ඇති ක්ෂීණාශ්‍රව යෝ; රමෙස්සන්ති, (පුල්පියුමට බට බමරුන් මෙන් ප්‍රීතිමත් වැ) ඇලෙන්නාහුයි; (කුමක් හෙයින්දැ යත්?) තෙ, ඒ ක්ෂීණාශ්‍ර වයෝ; න කාමගවෙසිනො, යම්හෙයකින් වස්තුකාමක්ලෙශකාම යන් සොයන සුල්ලෝ නොවෙත් ද එහෙයිනි.

### අඤ්ඤතරාය ඉත්ථියා වත්ථු

## අරහන්තවග්ගො සත්තමො

### 8—1.

1. අනත්ථපදසංහිතා, (නිර්වාණ ප්‍රකාශනොවූ ආකාශ වර්ණනා පර්වතවර්ණනා වනවර්ණනා පුරවර්ණනාදි වූ) අනර්ථ පදයෙන් යුක්ත වූ නොහොත්: අවැඩකොටසින් යුක්ත වූ; වාචා, වාචාවෝ හෙවත්: තෙපුල්හු; චෙ, ඉදින්; සහස්සං අපි, දහසෙක්වූනමුදු-ඔහු උත්තම නොවෙති; යං සුත්වා, (පඤ්චස්කන්ධ ද්වාදශායතනාදි වූ) යම් එක අර්ථපදයකුදු අසා; උපසම්මති, (පුද්ගල තෙමෙ රාගාදික්ලෙශව්‍යපශමයෙන්) සන්හිඳේ ද; එසේ වූ; එකං අත්ථපදං, (නිර්වාණප්‍රතිසංයුක්ත වූ ස්කන්ධධාත්වායතනාදීන් ප්‍රකාශ කරන්නාවූ) අර්ථසාධක එකපදයකුදු; සෙය්‍යො, උත්තමයි.

### තම්බදාඨිකචොරඝාතකවත්ථු

### 8—2.

2. අනත්ථපදසංහිතා, (නිර්වාණ ප්‍රකාශක නොවූ ආකාශ වර්ණනා පර්වතවර්ණනා වනවර්ණනා පුරවර්ණනාදි වූ)අනර්ථ පදයෙන් යුක්තවූ නොහොත්: අවැඩ කොටසින් යුක්ත වූ; ගාථා, ගාථාවෝ; චෙ, ඉදින්; සහස්සං අපි, දහසෙක් වූ නමුදු-ඔහු

3. යො වෙ [1] ගාථාසතං භාසෙ අනත්ථපදසංහිතා
එකං ධම්මපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති. 102

4. යො සහස්සං සහස්සෙන සඞ්ගාමෙ මානුසෙ ජිනෙ
එකඤ්ච ජෙය්‍ය අත්තානං ස වෙ සඞ්ගාමජුත්තමො. 103

---

උත්තම නොවෙති; යං සුත්වා, (අප්පමාදෙ අමතපදං" යනාදි වූ නිර්වාණ ප්‍රකාශක වූ) යම් එක ගාථා පදයකුදු අසා; උප සම්මති, (පුද්ගල තෙමෙ රාගාදිකෙලශව්‍යපශමයෙන්) සන් හිඳේ ද එසේ වූ; එකං ගාථාපදං, එක ගාථාපදයකුදු; සෙය්‍යො උත්තමයි.

## දාරුචීරියත්ථෙරවත්ථු

### 8—3.

3. යො, යම් පුද්ගලයෙක් තෙමෙ; වෙ, ඉදින්; අනත්ථපද සංහිතා, (ආකාශවර්ණනාදි) අනර්ථපදයෙන් යුක්තවූ නො හොත්: අවැඩ කොටසින් යුක්ත වූ; ගාථාසතං භාසෙ, ගාථා සියයක් කියේනමුදු-ඒ ගාථාවෝ උත්තම නොවෙති; යං සුත්වා, යම් එක ධර්මපදයකුදු අසා; උපසම්මති, (පුද්ගල තෙමෙ රාගා දිකෙලශව්‍යපශමයෙන්) සන්හිඳේ ද එසේ වූ; එකං ධම්මපදං, ("අනභිජ්ඣා පරිබ්බාජකා ධම්මපදං අව්‍යාපාදෙ පරිබ්බාජකා ධම්මපදං" යනාදි වූ අර්ථසාධකවූ සකන්ධධාත්වායතනාදි ප්‍රති සංයුක්ත වූ) එක ධර්මපදයකුදු; සෙය්‍යො, උත්තමයි.

4 යො, යම් සංග්‍රාමයොධයෙක්; සහස්සෙන, දහසෙකින් ගුණනලද; සහස්සං මානුසෙ, මිනිසුන් දහසක් හෙවත්: දශ ලක්‍ෂයක් පමණ මිනිසුන්; සඞ්ගාමෙ, එක මැ යුද්ධයෙකැ; ජිනෙ, දිනුයේ වී නමුත්; (හෙතෙමෙ ජයලද්දේ නමුදු නො වෙයි උත්තමයොධ නමුදු නො වේ; වැලි ජයලද්දේ නමුදු උත්තම යොධ නමුදු කවරේද යත්?) යො, යමෙක් (වනාහි); එකං, එක මැ; අත්තානං, ආත්මය හෙවත්: තමා මැ; ජෙය්‍ය, (රාත්‍රිස්ථාන දිවාස්ථානයෙහිආධ්‍යාත්මික වූ කර්මස්ථානසම්මර්ශනය කරන්නේ තමාගේසන්තානයෙහි ලොභාදීකෙලශයන් දිනීමෙන්) දිනුයේ වේ ද; සො, හෙතෙමෙ; වෙ, එකාන්තයෙන්; සඞ්ගාමජුත්තමො, සංග්‍රාම ජිත්නට හෙවත්: යුද්ධයෙහි දිනුවවුනට උත්තමයොධ නම් වේ.

## කුණ්ඩලකෙසිත්ථෙරවත්ථු

---

1 යො ච' ඉති අට්ඨකථා.

5. අත්තා හවෙ ජිතං සෙය්‍යො යා චායං ඉතරා පජා
අත්තදන්තස්ස පොසස්ස නිච්චං සඤ්ඤතචාරිනො. 104

6. නෙව දෙවො න ගන්ධබ්බො න මාරො සහ බ්‍රහ්මුනා
ජිතං අපජිතං කයිරා තථාරූපස්ස ජන්තුනො. 105

7. මාසෙ මාසෙ සහස්සෙන යො යජෙථ සතං සමං
එකං ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ
සායෙව පූජනා සෙය්‍යො යං චෙ වස්සසතං හුතං. 106

---

## 8—4.

5. අත්තා, ආත්මය තෙමෙ; ජිතං, දනනලද්දේ; (හෙවත්: තමාගේ චිත්තසන්තානයෙහි උපන් රාගාදිකෙලශයන් දිනීම් වශයෙන් පරදවනලද්දේ;) හවෙ, එකාන්තයෙන්; සෙය්‍යො, උත්තමයි; යාචායං ඉතරා පජා, යම් මේ අන්‍ය වූ ප්‍රජාවක්(හෙවත්: යම් මේ සෙසු සත්ත්වසමූහයක් දූකෙළීමෙන් හෝ ධන හරණයෙන් හෝ යුධ කිරීමෙන් හෝ බලාභිභවනයෙන් හෝ යමක්හු විසින්) දනනලදද (ඔහුගේ ඒ දිනීම උත්තම නොවෙයි [1] කුමක් හෙයින් ද යත්); අත්තදන්තස්ස (නිකෙලෙස් හෙයින්) ආත්ම දමනය කළාවූ; නිච්චං, සතතයෙන්; සඤ්ඤතචාරිනො, (කයින් වචසින්) සංයත වූ පැවැතුම් ඇති; පොසස්ස, පුරුෂයාගේ දිනීම නො දිනුවා නො කොට හැකිද එහෙයිනි.

6. තථාරූපස්ස, එබඳු වූ (හෙවත්: ආත්මදමනය කළා වූ සතතයෙන් කායවාක්සංයම ඇති); ජන්තුනො, පුද්ගලයාගේ; ජිතං, කෙලෙස් දිනීම; දෙවො, සක්‍රාදිදෙවියෙක්; නෙව අපජිතං කයිරා, නොදිනුවා නො මැ කොට හෙන්නේය; න ගන්ධබ්බො, (තිම්බරුනාරදාදි) ගන්ධර්වයෙක් නොදිනුවා නො කොට හෙන්නේය; බ්‍රහ්මුනා සහ, මහාබ්‍රාහ්මයා හා සමඟ; මාරො, වශවර්ති මාරයා ද; න, නොදිනුවා නො කොට හෙන්නේයි— කිසිවක්හු විසින් ධනහරණාදියෙන් පරදවනලද එකෙක් පක්ෂබල ලදින් නැවත තෙමේ ඔහු පරදවා පියා ද එලෙස මොහු විසින් පරදවනලද කෙලශයන් නැවත උපදවන්නට ශක්‍ර බ්‍රහ්මාදිහු ද නොපොහොසත්හ යනු භාවයි.

### — අනත්ථපූජකබ්‍රාහ්මණවත්ථු —

## 8—5.

7. මාසෙ මාසෙ, මසක් මසක් පාසා; සහස්සෙන, දහසක් වියදම්කිරීමෙන්; සතං සමං, හවුරුදු සියයක් මුළුල්ලෙහි; යො, යමෙක් තෙමෙ; යජෙථ, ලෞකිකමහජනයහට දන් දුන්නේ වේ ද; යො ච, යමෙක් වනාහි; භාවිතත්තානං, ශීලාදි ගුණ

---

1. නොවන්නේයි; මූ.

8. යො ච වස්සසතං ජන්තු අග්ගිං පරිචරෙ වනෙ
එකඤ්ච භාවිතත්තානං මුහුත්තමපි පූජයෙ
සායෙව පූජනා සෙය්‍යො යඤ්චෙ වස්සසතං හුතං.

9 යං කිඤ්චි යිට්ඨං ච හුතං ච ලොකෙ
සංවච්ඡරං යජෙථ [1] පුඤ්ඤපෙඛො
සබ්බම්පි තං න චතුභාගමෙති
අභිවාදනා උජ්ජුගතෙසු සෙය්‍යො. 108

---

වශයෙන්) වඩනලද සිත් ඇති; එකං, එක මැ ආර්‍යයක්හු; (හෙවත්: යටත්පිරිසෙයින් සෝවානක්හු උඩත් පිරිසෙයින් ක්ෂීණාශ්‍රවයක්හු;) මුහුත්තමපි, ඇසිල්ලෙකුදු; පූජයෙ, (ගෙදෙරට පැමිණියහු දැකැ බත්කෙනෙස්සක් පමණ හඹුසරලුවක් පමණ දීමෙන් හෝ පෙරුන්කඩක් පමණ වූ ද කඩපොල්ලක් දීමෙන් හෝ) පිදුයේ වේ ද; ච, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක් මුළුල්ලෙහි දෙනලද; යං හුතං, යම් දනයෙක් ඇද්ද එයට වඩා; සායෙව පූජනා, ඇසිල්ලෙක ද ආර්‍යයනට කරන ලද්දවූ ඒ ප්‍රත්‍යය පූජාව ම; සෙය්‍යො, උත්තමයි.

## සාරිපුත්තත්ථෙරස්ස මාතුලබ්‍රාහ්මණස්ස වත්ථු

8—6.

8. යො ජන්තු, යම් පුරුෂයෙක්; වනෙ, වෙනෙහි වැස; (හෙවත්: නිෂ්ප්‍රපඤ්චපරිග්‍රහණය පිණිස වනයට වැද ඒ වෙනෙහි දී;) ච, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක් මුළුල්ලෙහි; අග්ගිං පරිචරෙ, (ක්ෂීරපායාසඝෘතමධුසක්කරාදිසිඤ්චනයෙන් සිදහතු සුත් සාල් ගිතෙණ ආදි යාගද්‍රව්‍ය ගින්නෙහි බහාලා) වහ්නිපූජාව කෙළේ වේ ද; යො ච, යම් පුරුෂයෙක් වනාහි; භාවිතත්තානං, (ශීලාදිගුණවශයෙන්) වඩනලද සිත් ඇති; එකං, (සෝවාන් ආදි) එකආර්‍යපුද්ගලයක්හු; මුහුත්තමපි, ඇසිල්ලෙකුදු; පූජයෙ, (ගෙදෙරට පැමිණියහු දැකැ බත් කෙණෙස්සක් හඹුසරලුවක් පමණ දීමෙන් හෝ පෙරුන්කඩක් පමණ වූ ද කඩ පොල්ලක් දීමෙන් හෝ) පිදුයේ වේ ද; වස්සසතං, හවුරුදු සියයක් මුළුල්ලෙහි කරනලද; යං හුතං, යම් වහ්නිපූජාවෙක් ඇද්ද ඒ වහ්නිපූජාවට වඩා; සායෙව පූජනා, (ඇසිල්ලෙක ද ආර්‍යයන්ට කරනලද) ඒ ප්‍රත්‍යය පූජාවම; සෙය්‍යො, උත්තමයි.

## සාරිපුත්තත්ථෙරස්ස භාගිනෙය්‍යවත්ථු

8—7.

9. ලොකෙ, මේ සත්වලොකයෙහි; පුඤ්ඤපෙඛො, පින් කිරීමෙහි අපෙක්ෂා ඇති පුරුෂ තෙමේ; යං කිඤ්චි යිට්ඨං වා,

---

1. පුඤ්ඤපෙක්ඛො.

10\. අභිවාදනසීලිස්ස නිච්චං වඩ්ඪාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති ආයුවණ්ණො සුඛං බලං. 109

11\. යො ච වස්සසතං ජීවෙ දුස්සීලො අසමාහිතො
එකාහං ජීවිතං සෙය්‍යො සීලවන්තස්ස ඣායිනො. 110

---

මඟුල්දවස් ආදියෙහි දියයුතුවූ යම්කිසි ක්ෂුද්‍ර දානවස්තුවක් හෝ; හුතං වා, (කර්මඵල අදහා සකස් කොට සරහා දෙනලද) අමුතු මහදානක්හෝ; සංවච්ඡරං, හවුරුද්දක් මුළුල්ලෙහි; යජෙථ, (මුළුසක්වළ ලෞකික් මහජනයහට නිරන්තරයෙන්) දුන්නේ වී නමුදු; තං සබ්බම්පි, ඒ සියලු දානය මැ; චතුභාගං න එති, (ඍජුගත වූ ශ්‍රොත ආපන්නාදි අය්‍යීයන් කෙරෙහි පහන් සිතින් කය නමා වඳනහුගේ එකවටෙක පැවැති කුශල චෙතනාව) සතර භාගයක් කළ කල එයින් එක් භාගයකුදු නො අගනේ යැ (එහෙයින්); උජ්ජුගතෙසු, (කායවඞ්කාදිරහිතහෙයින්) ඍජු බවට පැමිණි සොවාන් සෙදගැමි අනගැමි රහත්නට පහන් සිතින් කයනමා කරනලද; අභිවාදනා, වන්දනාව මැ; සෙය්‍යො, උත්තමයි.

—සාරිපුත්තත්ථෙරස්ස සහායකබ්‍රාහ්මණවත්ථු—

8—8.

10\. අභිවාදනසීලිස්ස, සිල්වතුන් එක්වන් වඳනාසුලු වූ; නිච්චං, සතතයෙන්; වඩ්ඪාපචායිනො, ගුණවෘද්ධයන් පුදනසුලු වූ හෙවත්: එමැ වන්දනක්‍රියායෙන් සතතයෙන් පුදන සුලු වූ පුද්ගලයහට; ආයු වණ්ණො සුඛං බලං, ආයුෂයැ ශරීරවර්ණයැ කායිකචෛතසික සුවයැ කායබලඥානබල යැ යන; චත්තාරො ධම්මා, (මේ) සතර ගුණයෝ; වඩ්ඪන්ති, වඩනාහුයි.

—දීඝායුකුමාරස්ස [1] වත්ථු—

8—9.

11\. දුස්සීලො, (සීලසමාදානයක් නැතිහෙයින්) දුශ්ශීල වූ; අසමාහිතො,(උපචාරසමාධිඅර්පණාසමාධියෙන්) සමාහිත නොවූ; යො, යම් පුද්ගලයෙක්; ච, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක්; ජීවෙ, ජීවත් වී නමුදු ඔහුගේ ජීවත්වීමට වඩා; සීලවන්තස්ස, (චතුපාරිශුද්ධිසීලයෙන් සමන්විත හෙයින්) සිල්වත් වූ; ඣායිනො, (ආලම්බනොපනිධ්‍යානලක්ෂණොපනිධ්‍යානයෙන් ධ්‍යායී වූ හෙවත්: ශමථවිදර්ශනාභාවනායෙහි නියුක්ත වූ භික්ෂුහුගේ; එකාහං, එක දවසකුදු; ජීවිතං, ජීවත්වීම; සෙය්‍යො, උත්තමයි.

—සංකිච්චසාමණෙරවත්ථු—

---

1 ආයුවඩ්ඪනකුමාරස්ස—ඇතැම්.

12. යො චෙ වස්සසතං ජීවෙ දුප්පඤ්ඤො අසමාහිතො
එකාහං ජීවිතං සෙය්‍යො පඤ්ඤවන්තස්ස ඣායිනො. 111

13. යොචෙ වස්සසතං ජීවෙ කුසීතො හීනවීරියො
එකාහං ජීවිතං සෙය්‍යො විරියමාරභතො දළ්හං. 112

14. යො චෙ වස්සසතං ජීවෙ අපස්සං උදයව්‍යයං
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො උදයව්‍යයං. 113

---

## 8—10.

12. දුප්පඤ්ඤො, (ශමථවිදර්ශනාප්‍රඥායෑ මාර්ගඵල ප්‍රඥායෑ යන ලෞකික ලොකොත්තර ප්‍රඥයෙන් යුක්ත නොවන හෙයින්) ප්‍රඥ නැත්තාවූ; අසමාහිතො, (උපචාරසමාධිඅර්පණාසමාධියෙන්) සමාහිතනොවූ; යො, යම් පුද්ගලයෙක්; චෙ, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක්; ජීවෙ, ජීවත් වී නමුදු ඔහුගේ ජීවත්විමට වඩා; පඤ්ඤවන්තස්ස, ශමථවිදර්ශනාප්‍රඥයෙන් ද මාර්ගඵලප්‍රඥයෙන් ද යුක්තවූ; ඣායිනො, ශමථවිදර්ශනාභාවනායෙහි නියුක්ත වූ භික්ෂු හුගේ; එකාහං, එක දවසකුදු; ජීවිතං, ජීවත්විම; සෙය්‍යො උත්තමයි.

ඛාණුකොණ්ඩඤ්ඤත්ථෙරවත්ථු

## 8—11.

13. කුසීතො, කුසීත වූ (හෙවත්: වත්පිළිවෙත්පිරීමෙහි හැදෑරීම් පිරිවීමෙහි) මැළි වූ; හීනවීරියො, කායිකචෛතසික වීර්‍යය නැත්තාවූ; යො, යම් පුද්ගලයෙක්; චෙ, ඉදින්; වස්ස සතං, හවුරුදු සියයක්; ජීවෙ, ජීවත් වී නමුදු ඔහුගේ ජීවත් වීමට වඩා; දළ්හං, දැඩි කොට; විරියං, කායිකචෛතසිකවීර්‍යය; ආරභතො, වඩන භික්ෂුහුගේ; එකාහං, එක දවසකුදු; ජීවිතං, ජීවත්වීම; සෙය්‍යො, උත්තමයි.

සප්පදාසත්ථෙර වත්ථු

## 8—12.

14. උදයව්‍යයං, (පඤ්චස්කන්ධයන්ගේ) උදාවිය; අපස්සං, නො දක්නාවූ; (හෙවත්: "අවිජ්ජාසමුදයා රූපසමුදයො" යනාදි පස් විසි ආකාරයෙන් පඤ්චස්කන්ධයන්ගේ උදය ද; "අවිජ්ජානිරොධා රූපනිරොධො" යනාදි පස්විසි ආකාරයෙන් පඤ්චස්කන්ධයන්ගේ ව්‍යය ද නො දක්නා වූ;) යො, යම් පුද්ගලයෙක්; චෙ, ඉදින් වස්ස සතං, හවුරුදු සියයක්; ජීවෙ, ජීවත්වීනමුදු (ඔහුගේ ජීවත්

15. යො චෙ වස්සසතං ජීවෙ අපස්සං අමතං පදං
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො අමතං පදං. 114

16. යො චෙ වස්සසතං ජීවෙ අපස්සං ධම්මමුත්තමං
එකාහං ජීවිතං සෙය්‍යො පස්සතො ධම්මමුත්තමං ති. 115

### සහස්සවග්ගො අට්ඨමො

1. අභිත්ථරෙථ කල්‍යාණෙ පාපා චිත්තං නිවාරයෙ
දන්ධං හි කරොතො පුඤ්ඤං පාපස්මිං රමතී මනො. 116

---

වීමට වඩා); උදයව්‍යයං පස්සතො, (පඤ්චස්කන්ධයන්ගේ) උදයව්‍යය (ඥානචක්ෂුසින්) දක්නා භික්ෂුහුගේ; එකාහං, එක දවසකුදු; ජීවිතං ජීවත්වීම; සෙය්‍යො, උත්තමයි.

### පටාචාරථෙරියා වත්ථු

**8—13.**

15. අමතං පදං, මරණ රහිතවූ කොට්ඨාසය (හෙවත්: අමෘත මහා නිර්වාණය); අපස්සං, නො දක්නා වූ; යො යම් පුද්ගලයෙක්; චෙ, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක්; ජීවෙ, ජීවත් වී නමුදු (ඔහුගේ ජීවත්වීමට වඩා); අමතං පදං, අමෘතමහානිර්වාණය; පස්සතො, (ඥානචක්ෂුසින්) දක්නා පුද්ගලයාගේ; එකාහං, එක දවසකුදු; ජීවිතං ජීවත්වීම; සෙය්‍යො, උත්තමයි.

### කිසාගොතමියා වත්ථු

**8—14.**

16. උත්තමං ධම්මං, උත්තම වූ (නවලොකොත්තර) ධර්මය; අපස්සං, (නුවණැසින්) නො දක්නා වූ; යො යම් පුද්ගලයෙක්; චෙ, ඉදින්; වස්සසතං, හවුරුදු සියයක්; ජීවෙ, ජීවත් වී නමුදු (ඔහුගේ ජීවත්වීමට වඩා); උත්තමං ධම්මං, උත්තම වූ (නවලොකොත්තර) ධර්මය; පස්සතො, (නුවණැසින්) දක්නා පුද්ගලයාගේ; එකාහං, එක දවසකුදු; ජීවිතං, ජීවත්වීම; සෙය්‍යො උත්තමයි.

### බහුපුත්තිකථෙරියා වත්ථු

## සහස්සවග්ගො අට්ඨමො

**9—1.**

1. කල්‍යාණෙ, දානශීලාදි සුචරිතධර්මවිෂයෙහි; අභිත්ථරෙථ, යුහුසුලු වන්නෙයැ; (ගෘහස්ථයා විසින් ලාබත් දීම් ආදි වූ කිසි

2. පාපං චෙ පුරිසො කයිරා න තං කයිරා පුනප්පුනං
න තම්හි ඡන්දං කයිරාථ දුක්ඛො පාපස්ස උච්චයො. 117

---

පින්කමක් කෙරෙමියි සිතක් උපන්කල ඒ සිත මසුරුමල ආදි යෙන් මඩනා ලද්දුව පසු නොබස්නා තෙක් අන්නට අවසරයක් නොදී "අහං පුරෙ අහං පුරෙ"යි වහවහා මැ කටයුත්තේයැ ප්‍රව්‍රජිතයා විසින් ඇදුරුවත් තෙරවත් ආගන්තුකවත් ගිලන්වත් ආදිය කරන්නහු විසින් අන්නට අවසරයක් නො දී "අහං පුරෙ අහං පුරෙ"යි වහවහා මැ කටයුත්තේයැයි සේයි;) පාපා, (කායදුශ්චරිතාදි) අකුශලකර්මයෙන් (නොහොත්: අකුශල චිත්තොත්පාදයෙන්); චිත්තං, සිත; (හෙවත්: නොඑක් තැනින් වැදූ ගොයම් කන කුළුගොනකු මෙන් නොරැක්කැ හැකි වූ විසභාග අරමුණට දිවනහෙයින් තුන්දුසිරිත් නොවැළැක්කියැ හැකි වූ මේ කුළුසිත;) නිවාරයෙ, වළකාන්නේයි; (කුමක් හෙයින්ද යත්?) පුඤ්ඤං, දානාදිකුශලකර්මය; (යම් හෙයකින්) දන්ධං, දන්ධ වැ; (හෙවත්: දෙම් දෝ හෝ කෙරෙම් දෝ හෝ නො කෙරෙම් දෝ හෝ කොටපියැහෙම් දෝ හෝ නොකොටපියැ හෙම් දෝ හෝ යි මෙසේ ලැසි ගෙනැ;) කරොතො, කරන්නහු ගේ; මනො, සිත; පාපස්මිං, (මසුරුමල ආදි) අකුශලයෙහි; රමති, ඇලේ ද එහෙයිනි.

⁓චූලෙකසාටකබ්‍රාහ්මණස්ස වත්ථු⁓

9—2.

2. පුරිසො, පුරුෂ තෙමෙ; චෙ, ඉදින්; පාපං, (ප්‍රාණ වධාදි) අකුශලකර්මයක්; කයිරා, (ප්‍රමාදදෝෂයකින් වත් අසත් සමවායෙකින් වත් එකවරෙක) කොටපූයේ වී නමුත්; තං, ඒ (අකුශලකර්මය); පුනප්පුනං, නැවත නැවත; න කයිරා, නොක රන්නේයි; (නොදැනැ සාලහුරු මැඩැගත් එකක්හු වහා පය හැරා ගන්නා සේ එකෙණෙහි මැ ප්‍රත්‍යවෙක්ෂා කොට මෙ වැනි ලාමක ක්‍රියා කිරීම තාගේ ජාත්‍යාදියට නුසුදුසුයැ යි සලකා ඒ පාපය නොකරන්නේයැයි;) තම්හි, ඒ අකුශලයෙහි; ඡන්දං, ආලයක් (රුචියක්); න කයිරාථ, නොකරන්නේයි; (කුමක් හෙයින්ද යත්?) පාපස්ස, (ප්‍රාණවධාදි) අකුශලකර්මයාගේ; උච්ච යො, රැස්කිරීම; දුක්ඛො, (මෙලොව ද පරලොව ද කායචිත්ත දුක්ඛය එලවන හෙයින් දුකි⁓අකුසල් රැස් කිරීම නම් යම් හෙයකින් මෙලොව ද පරලොවද දුකට කාරණ යැ එහෙයින් දුකැයි සේයි.

⁓සෙය්‍යසකත්ථෙරවත්ථු⁓

3. පුඤ්ඤං චෙ පුරිසො කයිරා කයිරාථෙනං පුනප්පුනං
තම්හි ඡන්දං කයිරාථ සුඛො පුඤ්ඤස්ස උච්චයො. 118

4. පාපො පි පස්සති භද්‍රං යාව පාපං න පච්චති
යදා ච පච්චති පාපං අථ පාපො පාපානි පස්සති. 119

---

## 9—3.

3. පුරිසො, පුරුෂ තෙමේ; චෙ, ඉදින්; පුඤ්ඤං, (දානාදි එක්තරා) කුශලකර්මයක්; කයිරා, එක වරෙක ද කෙළේ වී නම්; එතං, ඒ (කුශලකර්මය); පුනප්පුනං නැවත නැවත ද; කයිරාථ, කරන්නේයි; (එක්වරෙකැ මා විසින් පින්කමෙක් කරනලද එපමණෙක් සෑහෙන්නේ වේදැයි පසුනොබැසැ නැවත නැවත ද පින්කම් කටයුත්තේමයැ;) තම්හි, ඒ කුශලයෙහි; ඡන්දං, ආලය (රුචිය); කයිරාථ, කරන්නේයි; (පින්කම් නොකරන වේලෙහිද ඒ කුශලයෙහි ඡන්දය රුචිය උත්සාහය කරන්නේයි; කුමක් හෙයින් ද යත්?) පුඤ්ඤස්ස, (දානශීලාදි) කුශලයාගේ; උච්චයො, රැස් කිරීම; සුඛො, (යම්හෙයකින් ස්වර්ග මොක්ෂ සම්පත්තියට කාරණ ද එහෙයින්) සුවයි.

### ලාජදෙවධීතාය වත්ථු

## 9—4.

4. යාව, යම්තාක්කල්; පාපං,(පුරුෂයා විසින් කරනලද) අකුශල කර්මය; න පච්චති, (මෙලොව හෝ පරලොව හෝ) විපාක නොදේද; [තාව, ඒතාක්කල්]; පාපොපි, (කායදුශ්චරිතාදි පාප කර්මයෙන්) සමන්විත වූ පුද්ගල ද; භද්‍රං, යහපත; පස්සති, දක්නෙයැ, පාපිපුද්ගල ද පූර්වජන්මයෙහි කරනලද සුචරිතබලයෙන් වැඩ දක්නේයැ සුවවිඳින්නේමයැ යි සේයි;) යදා ච, යම් කලෙක වනාහි; පාපං, (ඔහුවිසින් කරනලද) පාපකර්මය; පච්චති, (දෘෂ්ටධර්මවෙද්‍ය වැ එ මැ ජන්මයෙහි හෝ උපපද්‍යවෙද්‍ය වැ අපරාපර්‍ය්‍යායවෙද්‍ය වැ පරලොව හෝ) විපාක දේ ද; අථ, එකල්හි; පාපො, පවුකම්කළ පුද්ගල තෙමෙ; පාපානි පස්සති, (මෙලොවැ නොඑක් වධබන්ධනාදියට ද පරලොවැ අපායදුඃඛයට ද භාජනවීමෙන්) පාපඵලයන් දක්නේයි—තමා කළ අකුශලයෙහි විපාක වූ නොඑක් කායිකචෛතසික දුක් දක්නේයැ යී සේයි.

5. භද්‍රො පි පස්සති පාපං යාව භද්‍රං න පච්චති
යදා ච පච්චති භද්‍රං අථ භද්‍රො භද්‍රානි පස්සති. 120

6. මාප්පමඤ්ඤෙථ පාපස්ස න මන්තං ආගමිස්සති
උදබින්දු නිපාතෙන උදකුම්භො පි පූරති
පූරති බාලො පාපස්ස ථොකථොකම්පි ආචිනං. 121

---

5. යාව, යම්තාක්කල්; භද්‍රං, (පුරුෂයා විසින් කරනලද) කුශලකර්මය; න පච්චති, මෙලොවැ හෝ පරලොවැ හෝ විපාක නොදේ ද; තාව, ඒතාක්කල්; භද්‍රො පි, කායසුචරිතාදි කුශල කර්මයෙන් සමන්විතවූ පුද්ගලද; පාපං, (අකුශලවිපාක වූ) අවැඩ; පස්සති, පූර්ජන්මයෙහි කරනලද දුශ්චරිතබලයෙන්) දක්නෙයැ (දුක්විඳින්නේයැ යී සේයි); යදා ච, යම් කලෙකැවිනාහි; භද්‍රං, ඔහු විසින් කරනලද) සුචරිතය; පච්චති, දෘෂ්ටධර්මවේද්‍ය වැ මේ ලොවම හෝ උපපද්‍යවේද්‍ය වැ අපරාපර්‍යායවේද්‍ය වැ පරලොවැ හෝ) විපාක දේ ද; අථ, එකල්හි; භද්‍රො, කුශලකාරී වූ සත්පුරුෂ තෙමෙ; භද්‍රානි පස්සති, (මෙලොවැ ලාභසත්කාරාදි සුව ද පරලොවැ දිව්‍යසම්පත්ති ආදි සුවද අනුභව කරන්නේ) භද්‍රවූ ඉෂ්ටවිපාකයන් දක්නේයි—ආයුවර්ණසුඛබලප්‍රතිභානගවම්භිෂද්‍යසි දෘසධනධාන්‍යාදි සමෘද්ධියට පැමිණැසුව විඳිනේ යැ යී සේයි.

—අනාථපිණ්ඩිකසෙට්ඨිවත්ථු—

9—5.

6. පාපස්ස, (ප්‍රාණවධාදි) අකුශලකර්මයට; මාප්පමඤ්ඤෙථ, අවඥ නො කරන්නේයි; නොහොත්: පාපස්ස (ප්‍රාණවධාදි) අකුශලකර්මය; අප්පං, ස්වල්පයයි; මාමඤ්ඤෙථ, නාහමක් සිතන් නේයි; තං, ඒ ස්වල්පමාත්‍ර වූ අකුශලකර්මය; මං, මා කරා; නාග මිස්සති, (විපාකදීම් වශයෙන්) නො එන්නේයැයි; මාප්පම ඤ්ඤෙථ, අවඥ නොකරන්නේයි; (මා විසින් කරනලද මේ පාප කර්මය ස්වල්පමාත්‍ර වුව එනම් කවර කලෙක මට විපාක දේදැයි අකුශලකර්මය ස්වල්පමයි අවඥ නොකරන්නේ යැ යී සේයි;) (කුමක්හෙයින් ද යත්?) උදබින්දුනිපාතෙන, (නිරන්තරයෙන් එකෙකි) දියබින්දුවක්හුගේ හිමෙන්; උදකුම්භො පි (වැසිවස් නාකල අබවසා උඩු බලා තබනලද විවෘත වූ මුඛ ඇති සටවාරි ආදි)කුම්භකාරභාජනය; පූර්ති, (යම්සේ ක්‍රම ක්‍රමයෙන්)පිරීයේද (එපරිද්දෙන් මැ); ථොකථොකම්පි, මඳමඳ කොටද; ආචිනං, පවු රැස්කරන්නාවූ; බාලො, අඥන තෙමෙ; පාපස්ස, (කායදුශ්ච රිතාදි) පාපකර්මය; පූරති, (ක්‍රමක්‍රමයෙන්) පුරන්නේයි.

—අසඤ්ඤතපරික්ඛාරභික්ඛුස්ස වත්ථු—

7. මාප්පමඤ්ඤෙථ පුඤ්ඤස්ස න මන්තං ආගමිස්සති
උදබින්දු නිපාතෙන උදකුම්භොපි පූරති
පූරති ධීරො පුඤ්ඤස්ස ථොකථොකම්පි ආචිනං. 122

8. වාණිජොව භයං මග්ගං අප්පසත්ථො මහද්ධනො
විසං ජීවිතුකාමොව පාපානි පරිවජ්ජයෙ. 123

---

9—6.

7. පුඤ්ඤස්ස, (දානශීලාදි) කුශලකර්මයට; මාප්පමඤ්ඤෙථ, අවඥ නොකරන්නෙයැ; නොහොත්: පුඤ්ඤස්ස, (දානශීලාදි) කුශලකර්මය; අප්පං, ස්වල්පයයි; මා මඤ්ඤෙථ, නහමක් සිතන්නේයි; තං, ඒ ස්වල්පමාත්‍ර වූ කුශලකර්මය; මං, මා කරා; නාගමිස්සති, (විපාකාදීම් වශයෙන්) නො එන්නේයයි; මාප්පමඤ්ඤෙථ, අවඥ නො කරන්නේ යි; (මවිසින් කරනලද මේ කුශලධර්මය ස්වල්පමාත්‍ර වුව එනම් කවරකලෙකැ මට විපාක දේ දැයි කුශල කර්මය ස්වල්පයැයි අවඥ නොකරන්නේයි කුමක්හෙයින් දූ යත්?) උදබින්දුනිපාතෙන, (නිරන්තරයෙන් එකෙකි) දිය බින්දුවක්හුගේ හිමෙන්; උදකුම්භොපි, (වැසිවස්නා කල අබවසැ උඩුබලා තබනලද විවෘත වූ මුව ඇති ඝටවාටිආදි) කුම්භකාරභාජනය; පූරති, (යම්සේ ක්‍රමක්‍රමයෙන්) පිරීයේ ද එපරිද්දෙන් මැ; ථොකථොකම්පි, මඳ මඳ කොට ද; ආචිනං, කුශලකර්මය රැස්කරන්නාවූ; ධීරො, ප්‍රාඥ තෙමෙ; පුඤ්ඤස්ස, (දානශීලාදි) කුශලකර්මය; පූරති, ක්‍රමක්‍රමයෙන් පුරන්නේයි.

බිලාලපාදකසෙට්ඨි වත්ථු

9—7.

8. භයං මග්ගං, (සොරුන් සිටිහෙයින්) භය කටයුතුවූ මග (මළහන්නාවූ); අප්පසත්ථො, කැටුව යන සාත්තුයකු නැති; මහද්ධනො, බොහෝ ධනඇති; වාණිජො ඉව, වෙළඳක්හු මෙන්ද; විසං, හලාහල විසයක් දුරු කරන්නාවූ; ජීවිතුකාමො, ඉව, ජීවත් වනු කැමැති එකක්හු මෙන්ද; පාපානි පරිවජ්ජයෙ, අකුශල කර්මයන් දුරුකරන්නේයි—අකුශලකර්මයෝ නම් සොරුන් සිටි මඟක්මෙන් හලාහලවිසයක්මෙන් සොපද්‍රවයහ සාදීනවයහ යි සලකා නුවණැති පුද්ගලතෙමෙ ස්වල්පද වූ අකුශලය දුරින් දුරු කරන්නේයි සේයි.

මහාධනවාණිජ වත්ථු

9. පාණිම්හි චෙ වණො නාස්ස හරෙය්‍ය පාණිනා විසං
නාබ්බණං විසමන්වෙති නත්ථි පාපං අකුබ්බතො. 124

10. යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස
තමෙව බාලං පච්චෙති පාපං සුඛුමො රජො පටිවාතංව ඛිත්තො. 12

11. ගබ්භමෙකෙ උප්පජ්ජන්ති නිරයං පාපකම්මිනො.
සග්ගං සුගතිනො යන්ති පරිනිබ්බන්ති අනාසවා. 126

---

9—8.

9. පාණිම්හි, අත්ලෙහි; චෙ, ඉදින්, වණො නාස්ස, ව්‍රණයෙක් නොවීනම්; පාණිනා, අත්ලෙන්; විසං, විෂය; හරෙය්‍ය, ගන්නේයි (හෙවත්: ගන්නට පොහොසත් වන්නේයි);(කුමක්හෙයින් ද යත්?) අබ්බණං, අත්ලෙහි ව්‍රණයක් නැත්තහු; විසං, ස්ථාවර ජඞ්ගමවශයෙන් විප්‍රකාරවූ මැ විෂය; න අන්වෙති, අනුව නො යන්නේයි (යම්සේ අත්ලෙ ව්‍රණයක් නැත්තහු අතින් ගත් විෂය ඔහු ශරීරයෙහි ව්‍යාප්ත නොවේද එසේම); අකුබ්බතො, කායාදි ද්වාරත්‍රයෙන් පවු නොකරන්නාහට; පාපං නත්ථි, ශර චාපාදිය එළවා දුනද අකුශල චෙතනා රහිත හෙයින් සිඩවන අකුශලකර්මයෙක් නැති.

කුක්කුටමිත්තවත්ථු

9—9.

10. අප්පදුට්ඨස්ස, (තමහටවත් සියලු සතුන්ටවත්) අදුෂ්ට වූ; (හෙවත්: නිරපරාධවූ එහෙයින් මැ සියලු සතුන් කෙරෙහි මෛත්‍රී පරවූ නොකැලඹුණු සිත් ඇත්තාවූ;) සුද්ධස්ස, (නිරපරාධවූ සිත් ඇති හෙයින්) පිරිසුදුවූ; අනඞ්ගණස්ස, නිකෙලශිවූ;[1] නරස්ස පොසස්ස, නරය පුරුෂය යි කියනලද සත්ත්වය හට; යො, යම් පුද්ගලයෙක්; දුස්සති, දුෂ්ටවේද; (අතින් පයින් දණ්ඩෙන් සැතින් පැහැරීම් ආදියෙන් අපරාධ කෙරේද); පාපං, (ඔහුවිසින් කරන ලද) ඒ පාපකර්ම තෙමෙ; පටිවාතං ඛිත්තො, උඩුසුලඟට දමන ලද; සුඛුමො රජො ඉව, සියුම් රජසක් මෙන්; තමෙව බාලං, (නිරපරාධයන්ට අපරාධකළාවූ) එම අඥානයා කරා; පච්චෙති, (මෙලොවැ හෝ පරලොවැ නරකාදියෙහි හෝ) විපාක දුක් දෙමින් පැමිණෙන්නේයි.

කොකසුනඛලුද්දක වත්ථු

9—10.

11. එකෙ, සමහර සත්ත්වකෙනෙක්; ගබ්භං, මනුෂ්‍ය ගර්භයෙහි (හෙවත්: මවුකුසැ); උප්පජ්ජන්ති, උපදනාහ; පාපකම්මිනො,

---

1. නිඃක්ලෙශ්වූ.

12. න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජතී සො ජගතිප්පදෙසො යත්ථට්ඨිතො මුච්චෙය්‍ය පාපකම්මා.|2

13. න අන්තලික්ඛෙ න සමුද්ද මජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසො යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චූ.|2

### පාපවග්ගො නවමො.

---

පවුකම්කළ සත්ත්වයෝ නිරයං, නරකයෙහි; උපපජ්ජන්ති, උපදිනාහ; සුගතිනො, (පින්කම්කළහෙයින්) සුන්දරවූ ගති ඇති සත්ත්වයෝ; සග්ගං යන්ති, දෙව්ලොවට යන්නාහ; අනාසවා, ක්ෂීණවූ චතුරාශ්‍රවයන්ඇති රහත්හු; පරිනිබ්බන්ති, නිරුපධිශෙෂ නිර්වාණ ධාතුයෙන් උපලක්ෂිතවූ පිරිනිවෙන්නාහුයි.

### මණිකාරකුලූපගතිස්සත්ථෙරවත්ථු.

### 9—11.

12. යත්ථට්ඨිතො, යම් තැනෙක සිටියාවූ සත්ත්වතෙමෙ; පාපකම්මා, (තමාවිසින් කරනලද) පාපකර්මයෙන්; මුච්චෙය්‍ය, විපාකදුක් අනුභව නොකොට මිදීයේද; සො ජගතිප්පදෙසො, කෙසගක් පමණවූ ද එසේවූ භූමිප්‍රදෙශයෙක්; න විජ්ජති, නැත්තේය; (හුදෙක් පෘථිවිතලයෙහි මතු නැත්තේ නොවෙයි;) න අන්තලික්ඛෙ, ආකාසයෙහිදු පාපකර්මයෙන් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයෙක් නැත්තේය; න සමුද්දමජ්ඣෙ, සමුද්‍රමධ්‍යයෙහිදු පාපකර්මයෙන් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයෙක් නැත්තෙය; න පබ්බතානං විවරං පවිස්ස, පර්වතයන්ගේ විවරයට වැද ද පාපකර්මයෙන් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයෙක් නැත්තේයි.

### තිණ්ණං භික්ඛූනං වත්ථු.

### 9—12.

13. යත්ථට්ඨිතං, යම්තැනෙක්හි සිටි සත්ත්වයා; මච්චු, මරණතෙමෙ; නප්පසහෙථ, අභිභවනය නොකෙරේද (හෙවත්: මැඩනොපියාද); සො ජගතිප්පදෙසො, කෙසගක් පමණවූද එසේවූ භූමිප්‍රදෙශයෙක්; නවිජ්ජති, නැත්තේය; (හුදෙක් පෘථිවිතලයෙහි මතු නැත්තේ නොවෙයි;) න අන්තලික්ඛෙ, ආකාසයෙහිදු මරණින් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයෙක් නැත; න සමුද්දමජ්ඣෙ, සමුද්‍ර මධ්‍යයෙහිදු මරණින් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයෙක් නැත; න පබ්බතානං විවරං පවිස්ස, පර්වතයන්ගේ විවරයට වැදද මරණින් මිදෙන්නට සුදුසු ප්‍රදෙශයෙක් නැත්තේයි.

### සුප්පබුද්ධසක්කස්ස වත්ථු.

## පාපවග්ගො නවමො

1. සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ. 129
2. සබ්බෙ තසන්ති දණ්ඩස්ස සබ්බෙසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ. 130

---

**10—1.**

1. සබ්බෙ, (කෙසරසිංහයන් හා ආජානෙය හස්ත්‍යශ්වයන් හා ක්ෂීණාශ්‍රවයන් තබා) සෙසු සියලු සත්ත්වයෝම; දණ්ඩස්ස, වධ බන්ධනාදි කායදණ්ඩනයට; තසන්ති, ත්‍රස්තවෙති; සබ්බෙ, සියලු සත්ත්වයෝම; මච්චුනො භායන්ති, මරණයට බිති; (මෙහි ක්ෂීණාශ්‍රවයෝ සත්කායදෘෂ්ටිය සුප්‍රහීණ හෙයින් රූපාරූපධර්මයන්ගේ භඞ්ගමාත්‍රයක් තබා අනික් මියන සතකු නොදක්නා හෙයින් මරණයෙහි භය නොකෙරෙති. කෙසරසිංහයන් හා ආජානෙය හස්තීන් හා ආජානෙය අශ්වයෝ සත්කාය දෘෂ්ටිය බලවත් හෙයින් තමන්ට ප්‍රතිපක්ෂ සත්ත්වයකු නොදක්නාහු අහඞ්කාර පරවශ ව මරණයෙහි භය නොකෙරෙත්;) අත්තානං උපමං කත්වා, තමා උපමා කොට; හෙවත්: මම යම්සේ දණ්ඩනයට බිම්ද එසේම සියලු සත්ත්වයෝද දණ්ඩනයට බිති මම යම්සේ මරණයට බිම්ද එසේම සියලු සත්ත්වයොද මරණයට බිති මෙසේ තමා උපමා කොට;) නහනෙය්‍ය, (නුවණැති පුරුෂතෙමෙ කිසි සතකුහු අතින් පයින් දණ්ඩෙන් සැතින්) නොමරන්නේය; න ඝාතයෙ, අනුන් ලවාද නොමරවන්නේයි.

ඡබ්බග්ගියානං වත්ථු

**10—2.**

2. සබ්බෙ, (කෙසර සිංහයන් හා ආජානෙය හස්ත්‍යශ්වයන් හා ක්ෂීණාශ්‍රවයන් තබා සෙසු සියලු සත්ත්වයෝම; දණ්ඩස්ස, වධ බන්ධනාදි කායදණ්ඩනයට; තසන්ති, ත්‍රස්තවෙති; සබ්බෙසං, ක්ෂීණාශ්‍රවයන් තබා සෙසු සියලු සත්ත්වයන්ටම; ජීවිතං, ජීවිතය; පියං, ප්‍රියය; (ක්ෂීණාශ්‍රවයෝ වනාහි,

"නාභිනන්දාමි මරණං නාභිනන්දාමි ජීවිතං,
කාලඤ්ච පතිකඞ්ඛාමි නිබ්බිසං භතකො යථා"[1] යි

උදන් අනන හෙයින් ජීවිතයෙහිද මරණයෙහිද උපෙක්ෂකම වෙත්;) අත්තානං උපමං කත්වා, තමා උපමා කොට; (හෙවත්: මම යම්සේ දණ්ඩනයට බිම්ද එසේම සියලු සත්ත්වයෝද දණ්ඩනයට බිති මාගේ ජීවිතය මට යම්සේ ප්‍රියද එසේම සියලු සතුන්ගේ ජීවිතයද ඔවුනොවුන්ට ප්‍රිය යි. මෙසේ තමා උපමා කොට;)

---

1 "වෙතනං භතකො යථා" ඉතිදෙවපුත්තසංයුත්තට්ඨකථා.

3. සුඛකාමානි භූතානි යො දණ්ඩෙන විහිංසති
අත්තනො සුඛමෙසානො පෙච්ච සො න ලභතෙ සුඛං. 131

4. සුඛකාමානි භූතානි යො දණ්ඩෙන න හිංසති
අත්තනො සුඛමෙසානො පෙච්ච සො ලභතෙ සුඛං. 132

5. මාවොච ඵරුසං කඤ්චි වුත්තා පටිවදෙය්‍යු තං
දුක්ඛා හි සාරම්භකථා පටිදණ්ඩා ඵුසෙය්‍යු තං. 133

---

නහනෙය්‍ය, (නුවණැති පුරුෂ තෙමෙ කිසිසතක්හු අතින් පයින් දණ්ඩෙන් සැතින්) නොමරන්නේය; න ඝාතයෙ, අනුන් ලවාද නො මරවන්නේයි.

### ඡබ්බග්ගියානං වත්ථු

### 10—3.

3. යො, යම් පුද්ගලයෙක්; අත්තනො සුඛමෙසානො, (අනුන් තළා මරා අනුන් ගැත්තකොට ගෙන) තමහට සුව කැමතිවූයේ; සුඛකාමානි භූතානි, කායික චෛතසික සුවකැමැති සත්ත්වයන්; දණ්ඩෙන, වාගදණ්ඩ ධනදණ්ඩ කායදණ්ඩයෙන්; විහිංසති, පෙළාද (දුකට පමුණුවාද); සො, ඒ පුද්ගල තෙමෙ; පෙච්ච, පරලොව; සුඛං න ලභතෙ, දිව්‍ය මනුෂ්‍ය සුවද නිවන් සුවද නොලබන්නේයි.

4. යො, යම් පුද්ගලයෙක්; අත්තනො සුඛමෙසානො, තමහට සුවකැමතිවූයේ; සුඛකාමානි භූතානි, කායික චෛතසික සුව කැමති සත්ත්වයන්; දණ්ඩෙන, වාගදණ්ඩ ධනදණ්ඩ කායදණ්ඩයෙන්; න හිංසති, නොපෙළාද (දුකට නොපමුණුවාද); සො, ඒ පුද්ගලතෙමෙ; පෙච්ච, පරලොව; සුඛං ලභතෙ, දිව්‍ය මනුෂ්‍ය සුවද නිවන් සුවද ලබන්නේයි.

### සම්බහුලානං කුමාරකානං වත්ථු

### 10—.

5. කඤ්චි, කිසි එකද පුද්ගලයක්හට; ඵරුසං, පරුෂ වචනයක්; මා අවොච, නහමක් කිය;(කුමක් හෙයින්ද යත්?)වුත්තා,තාවිසින් පරෙස් තෙපුල් කියනලද්දවූ අන්හු; තං, තට; පටිවදෙය්‍යුං, නැවැත පෙරළා පරෙස් තෙපුල් බණනන්නාහුයි; හි, යම් හෙයකින්; සාරම්භකථා,(කරණොත්තරකරණ කීමයයි කියනලද)යුගග්‍රාහ කථා තොම; දුක්ඛා, දුක්ද (හෙවත්: දුකට කාරණද එහෙයින්);පටිදණ්ඩා, කායදණ්ඩාදි ප්‍රතිදණ්ඩයෝ; තං, තා; ඵුසෙය්‍යුං, ස්පර්ශකරන්නාහුය; තාකරා පැමිණෙන්නාහුයි.

6. සචෙ නෙරෙසි අත්තානං කංසො උපහතො යථා
එස පත්තොසි නිබ්බානං සාරම්භො තෙ න විජ්ජති. 134

7. යථා දණ්ඩෙන ගොපාලො ගාවො පාචෙති ගොචරං
එවං ජරා ච මච්චූ ච ආයුං පාචෙන්ති පාණිනං. 135

8. අථ පාපානි කම්මානි කරං බාලො න බුජ්ඣති
සෙහි කම්මෙහි දුම්මෙධො අග්ගිදඩ්ඪොව තප්පති. 136

---

6. සචෙ, ඉදින්; උපහතො, වටින් කඩා හරනලද; කංසො යථා, ලොහොතලියක් මෙන්; අත්තානං, තාගේ සිත; න ඊරෙසි, නිශ්චලකරන්නට පොහොසත් වීනම් (හෙවත්: තා නිශ්ශබ්ද කොළෙහි නම් එසේ කල්හි); එසො (ත්වං), (මේ පිළිවෙත පුරන්නාවූ) ඒ තෝ; නිබ්බානං පත්තො අසි, (දැන් නිවනට නොපැමිණියද) නිවනට පැමිණියානම් වෙයි (එසේ කල්හි); තෙ, තට; සාරම්භො නවිජ්ජති, (දුශ්ශීලයෙම් මමද තොසිද දුශ්ශීලයෙහිය යනාදින් කියන) යුගග්‍රාහය නොවන්නේයි.

—කුණ්ඩධානත්ථෙරවත්ථු—

**10—5.**

7. යථා, යම්සේ; ගොපාලො, ගොපල්ලු තෙමෙ; දණ්ඩෙන, දණ්ඩෙන් පැහැර පැහැර; ගාවො, ගෙරින්; ගොචරං, ගොචර භූමියට (හෙවත්: තණ බිමට); පාචෙති, පමුණුවාද (ගෙන යේද); එවං, එපරිද්දෙන්ම; ජරා ච, (ප්‍රකට ජරාද අප්‍රකට ජරාද යන) විවිධ ජරාද; මච්චු ච, (සන්තති විච්ඡෙදය යන) මරණද (යනමොහු දෙදෙන); පාණීනං, ප්‍රාණීන්ගේ; ආයුං, ජීවිතෙන්ද්‍රියය; පාචෙන්ති, ක්ෂයට පමුණුවන්නාහුයි.

—විසාඛාදීනං උපාසිකානං උපොසථකම්මවත්ථු—

**10—6.**

8. අථ, ඒ මතු නොවෙයි; (අඥාන තෙමෙ හුදෙක් පවුකම් කරන්නේ මතු නොවෙ වැළි අතික් කිමෙක් ද යත්?) පාපානි කම්මානි කරං, ප්‍රාණවධාදි පවු කම් කරන්නාවූ; බාලො, අඥාන තෙමෙ; න බුජ්ඣති, (මාවිසින් කරනලද මේ පාපකර්මයාගේ මෙසේවූ අනිෂ්ටවිපාකයෙක් ඇතැයි) නොදන්නේයි (නොසල කන්නේයි); දුම්මෙධො, ඒ නුවණ නැත්තේ; සෙහි කම්මෙහි, ස්වකීයවූ පාපකර්මයෙන් (නරකයෙහි උපන්නේ); අග්ගිදඩ්ඪොව, ගින්නෙන් දහනලද්දක්හු මෙන්; තප්පති, (කායික චෛතසික සන්තාපයෙන්) තැවෙන්නේයි.

—අජගරපෙතවත්ථු—

9. යො දණ්ඩෙන අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දුස්සති
දසන්නමඤ්ඤතරං ඨානං ඛිප්පමෙව නිගච්ඡති. 137

10. වෙදනං ඵරුසං ජානිං සරීරස්ස ච භෙදනං
ගරුකං වා පි ආබාධං චිත්තක්ඛෙපං ච පාපුණෙ. 138

11. රාජතො වා උපස්සග්ගං අබ්භක්ඛානං ච දාරුණං
පරික්ඛයං ච ඤාතීනං භොගානං ච පභඞ්ගුරං.[1] 139

---

9. අදණ්ඩෙසු, (කායදණ්ඩ ධනදණ්ඩ වාගදණ්ඩ රහිතවූ හෙයින්ම) දණ්ඩනයට නොනිසිවූ; අප්පදුට්ඨෙසු, (තමහටවත් අනුන්ටවත්) අද්‍රොහිවූ (එහෙයින්ම සියලු සතුන් කෙරෙහි මෛත්‍රීපර වූ) ක්ෂීණාශ්‍රවයන් විෂයෙහි; යො, යම් පුද්ගලයෙක් තෙමෙ; දණ්ඩෙන, කායදණ්ඩාදි දණ්ඩයෙන්; දුස්සති, අපරාධ කෙරේද; සො, හෙතෙමෙ; දසන්නං දසවිධවූ දුඃඛ කාරණයන් අතුරෙන්; අඤ්ඤතරං ඨානං, එක්තරා දුඃඛ කාරණයකට; ඛිප්පං එව, වහාම; නිගච්ඡති, පැමිණෙන්නේයි; හේ කවරේදයත්?

10. ඵරුසං, කර්කශවූ; වෙදනං, (අත්පා බිඳීම් ආදියෙන් හෝ චක්ඛුරොග සොතරොගාදියෙන් හෝ උපන්) බලවත් ශරීර වෙදනාවකට හෝ; ජානිං, (මහනැව් නැසීම් නිධාන අපවත්වීම් ආදි වූ) මහත් අර්ථහානියකට හෝ; සරීරස්සච භෙදනං, (අත්පා කැපීම් බිඳීම් ඔළුපැළීම් ආදිවූ) ශරීර භෙදයකට හෝ; අපි, නැවැත; ගරුකං ආබාධං වා, (කාශශ්වාසාතිසාරසොථොදර කුෂ්ඨ ගණ්ඩ කිලාස ශොෂාදි) බලවත් රෝග දුකට හෝ; (කාණ කුණිඛජපීඨසප්පි ආදිබවට හෝ;) චිත්තක්ඛෙපං වා, යක්ෂොන්මාදයට පිත්තොන්මාදයට හෝ; පාපුණෙ, පැමිණෙන්නේ යි.

11 රාජතො, රජුන්කෙරෙන්වන්නාවූ; උපස්සග්ගං වා, (සෙනෙවිරත් ධන සිටු ආදි තනතුරු උදුරා ගැන්මෙන් ධන වොලො ගැන්මෙන්) උපද්‍රවයකට හෝ; දාරුණං, දරුණුවූ; අබ්භක්ඛානං වා, (අසෝතැන උමන්බුන්නේ මං පහළයේ මිනීමැරුයේ අසෝ රාජපරාධය කෙලෙහි නොවෙදැයි නුදුටු නොඇසු නොකී නොබිණූ නොකළ නොපිළිබඳ බලවත්) අභ්‍යාඛ්‍යානයට හෝ; ඤාතීනං පරික්ඛයං වා, (තමාගේ සුවදුකබැඳී පිහිටවන්නට නිසි) වැඩිසිටි නෑයන්ගේ විනාශයට හෝ; භොගානං පභඞ්ගුරං[1] වා, (රත්රන් අඟුරු වීමයැ මුතු කප්ඇට වීමයැ කහවණු කැට කැබිලිති වීමයැ වහල් සරක් නැතිවීමයැ යනාදිවූ) භොග විනාශයකට හෝ; පැමිණෙන්නේයි.

---

1. පභඞ්ගුනං, ඇ.නැ.ම.

12. අථ වස්ස අගාරානි අග්ගි ඩහති පාවකො
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සොපපජ්ජති.[1] 140

13. න නග්ගචරියා න ජටා න පඞ්කා
නානාසකා ථණ්ඩිලසායිකා වා
රජො ච ජල්ලං උක්කුටිකප්පධානං
සොධෙන්ති මච්චං අවිතිණ්ණකඞ්ඛං. 141

---

12. අථවා, නොහොත්; අස්ස, ඒ පාපී පුද්ගලයාගේ; අගාරානි, වාසාගාරයන් (හෙවත්: ඔහුගේ ගෙය); පාවකො, පාවක යන නම්ඇති; අග්ගි, ගිනි තෙමේ; ඩහති, (හවුරුද්දකට දෙතුන්වරෙක) දවන්නේය; (අතික් දවන කෙනෙකුන් නැත්නම් සෙනගිනි හෝ ලැව්ගිනි හෝ දවන්නේය); සො දුප්පඤ්ඤො, (නිරපරාධයන්ට අපරාධ කළාවූ) ඒ අඥාන පුද්ගල තෙමේ; කායස්ස භෙදා, ජීවිතෙන්ද්‍රියොපච්ඡෙදයෙන් මත්තෙහි; නිරයං උපපජ්ජති, (මෙලොවැ මේ දසවිධ දුක්ඛකාරණයන් අතුරෙන් එක්තරා දුක්ඛකාරණයකට පැමිණ පරලොව ඒකාන්තයෙන්) නරකයෙහි උපදනේ යි.

මහාමොග්ගල්ලානත්ථෙරවත්ථු.

10—8.

13. අවිතිණ්ණකඞ්ඛං, (පුබ්බන්තාපරන්තාදි අටතන්හි උපදනා අෂ්ට වස්තුකවූ ශඞ්කාව නො ඉක්මුණු හෙයින්) එතර නොවූ කාඞ්ක්‍ෂා මහ වතුරු ඇති; මච්චං, පෘථග්ජන සත්ත්වයා; නග්ගචරියා, (අචෙලකව්‍රත සමාදානයෙන්) නග්නව ඇවිද කරන තපස්හුද; න සොධෙන්ති, සුඩනොකරන්නාහ (ලොකනිස්සරණයයි කියනලද නිර්වාණයට නොපමුණුවන්නාහ); ජටා, ජටාවෝද (හෙවත්: ජටා ධැරීම්හුද); න සොධෙන්ති, සුඩනොකරන්නාහ; පඞ්කා, දන්තමලධාරණය ඇඟ මඩ ගැල්වීමය යන මොහුද; න සොධෙන්ති, සුඩනොකරන්නාහ; අනාසකා, අහර නොවළඳා කරන තපස්හුද; න සොධෙන්ති, සුඩනොකරන්නාහ; ථණ්ඩිලසායිකා වා, භූමිශය්‍යාවෝද (හෙවත්: අජව්‍රත ගොව්‍රත සමාදානයෙන් බිමහෙව කරන තපස්හුද); න සොධෙන්ති, සුඩනොකරන්නාහ; රජොජල්ලං ච, ආගන්තුක රජස්දූරීම නොනහා වෙර දූලි ඉසිලීම යන මෙද; උක්කුටිකප්පධානං, උක්කුටිකයෙන් ම හිඳ ඇවිද කරන තපස්හුද යන මොහුද; න සොධෙන්ති, සත්ත්වයා සුඩ නොකරන්නාහුයි; නිවනට නො පමුණුවන්නාහු යි.

බහුභණ්ඩිකත්ථෙරවත්ථු.

---

1. උපපජ්ජති, ඈ.තැ.ම.

14. අලඞ්කතො චෙපි සමං චරෙය්‍ය
සන්තො දන්තො නියතො බ්‍රහ්මචාරී
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
සො බ්‍රාහ්මණො සො සමණො ස භික්ඛු. 142

15. හිරී නිසෙධො පුරිසො කොචි ලොකස්මිං විජ්ජති.
යො නිද්දං අප්පබොධති අස්සො භද්‍රො කසාමිව. 143

---

### 10—9.

14. අලඞ්කතො අපි, වස්ත්‍රාභරණයෙන් සැරහුණු පුද්ගලද; චෙ, ඉදින්; සමං චරෙය්‍ය, (කායවිෂමාදියෙන් දුරුව) කායසමාධි සංයමයෙහි යෙදී පවතීද; සන්තො, (රාගාදි කෙලෙසුන් සන්හුන් බැවින්) ශාන්තද; දන්තො, ඉන්ද්‍රිය දමනයෙන් දැමුණේවීද; නියතො, චතුර්විධ මාර්ගනියමයෙන් නියමකරනලද ("සත්තක්ඛත්තු පරමතා" ආදි බැව් ඇත්තේවේද); බ්‍රහ්මචාරී, ශ්‍රෙෂ්ඨ වූ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යා මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තේ වේද; සබ්බෙසු භූතෙසු, සියලු සතුන් කෙරෙහි; දණ්ඩං, කායදණ්ඩාදි දණ්ඩය; නිධාය, බහාතබා (දුරුකොට වෙසේද); සො, (මෙබඳු ගුණයෙන් යුක්තවූ) ඒ ක්ෂීණාශ්‍රව තෙමේ; බ්‍රාහ්මණො, (සන්තානයෙන් බාහිතවූ පාපයන් ඇතිබැවින්) බ්‍රාහ්මණයයිද කියයුතුය; සො හෙතෙමේ; සමණො, (සමිතවූ පාපයන් ඇතිබැවින්) ශ්‍රමණයයිද කියයුතුය; සො, හෙතෙමේ; භික්ඛු, (භින්නවූ කෙලශයන් ඇතිබැවින්) භික්ෂුයයිද; කියයුතුවේ.

### සන්තතිමහාමත්තස්ස වත්ථු

### 10—10.

15. කසා, සැමිටිය වලහන්නාවූ (හෙවත්: මමත් සැමිටියෙන් පහරණ ලැබෙම්දැයි තමා ඇඟ සැමිටිය ගසාලිය නොදෙන්නා වූ); භද්‍රො අස්සො ඉව, ශික්ෂිතවූ උත්තම අශ්වයක්හු මෙන්; යො, යම් මහණෙක් තෙමේ; නිද්දං, නිද්‍රාව (තමා සතන්හි උපන් කාමවිතර්කාදි අකුශලවිතර්කය); අප්පබොධති, තමා සන්තානයෙන් පහකෙරේද (හෙවත්: අකුශලවිතර්කයෙහි ආදීනව දනීද); හිරී නිසෙධො, (මාවැනි ජාතිගොත්‍ර සම්පන්න ඥාතවෘද්ධ වයොවෘද්ධ බහුශ්‍රැත ශ්‍රද්ධාසම්පන්න කුලපුත්‍රයක්හට අකුශල විතර්ක විශගවීම තරම්දැයි මෙසේ)පපායෙහි ලජ්ජායෙන් කාම විතර්කාදි අකුශල විතර්කයන් දුරුකරන්නාවූ; පුරිසො, පුරුෂයෙක්තෙමේ; ලොකස්මිං, සත්ත්වලොකයෙහි; කොචි, කිසිවෙක්මැ; විජ්ජති, ඇත්තේයි; සුලභ නොවන්නේයි.

16. අස්සො යථා භද්‍රො කසානිවිට්ඨො ආතාපිනො සංවෙගිනො භවාථ
සද්ධාය සීලෙන ච විරියෙන ච සමාධිනා ධම්මවිනිච්ඡයෙන ච
සම්පන්නවිජ්ජාචරණා පතිස්සතා පහස්සථ දුක්ඛමිදං අනප්පකං.

17. උදකං හි නයන්ති නෙත්තිකා උසුකාරා නමයන්ති තෙජනං
දාරුං නමයන්ති තච්ඡකා අත්තානං දමයන්ති සුබ්බතාති. 14

## දණ්ඩවග්ගො දසමො.

---

16. කසානිවිට්ඨො, (කිසි ප්‍රමාද හෙතුයෙකින්) සැමිටියෙන් පහරණලද; භද්‍රො අස්සො යථා, (මමත් සැමිටියෙන් පහරණලදිම්දැයි එතැන් පටන් අප්‍රමාදව වියඹිකරන්නාවූ) සුශික්ෂිතවූ උත්තම අශ්වයක්හුමෙන්; ආතාපිනො භවාථ, වියඹිවත් වව; සංවෙගිනො භවාථ, සංසාරයෙහි උද්වෙග බහුල වව (මෙසේ වසන්නාවූ තෙපි); සද්ධාය; ලෞකික ලොකොත්තර වශයෙන් ද්විවිධවූ ශ්‍රද්ධාවෙන්ද; සීලෙනච, චතුපාරිශුද්ධිශීලයෙන්ද; විරියෙනච, (වත්පිළිවෙත් පුරන හදුරන පිරිවහන) කායික වියඹියෙන්ද; කෙලෙසුන් තවන චෛතසික වියඹියෙන්ද; සමාධිනා (රූපාරූප අෂ්ටසමාපත්ති සඞ්ඛ්‍යාත) සමාධියෙන්ද; ධම්මවිනිච්ඡයෙනච, (කාරණාකාරණ දැන්ම ලකුණුකොට ඇති) ධර්මවිනිශ්චයෙන්ද (හෙවත්: විදර්ශනා ප්‍රඥායෙන්ද සමන්විතව); සම්පන්නවිජ්ජාචරණා,(ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යාවන්ගේ ද පසළොස්චරණ ධර්මයන්ගේද සමෘද්ධිය හෙතුකොට ගෙන) සම්පූර්ණවූ විද්‍යාචරණ ඇතිව; පතිස්සතා, (සියලු කුදු මහත් කටයුත්තෙහි එළඹසිටි සිහි ඇති බැවින්) සමෘති සම්පන්නව; අනප්පකං, අනල්පවූ (ඉතා බොහෝවූ); ඉදං දුක්ඛං, මේ සංසාර දුඃඛය; පහස්සථ, දුරුකරව්.

### පිලොතිකත්ථෙරවත්ථු

### 10—11.

17. නෙත්තිකා, දියඑවෝ (කෙත්වත් ආදියට දිය ගෙනයන්නාහු); උදකං, සිත්පිත් නැති දිය; නයන්ති, (ඇල බැඳ පිහිළි පටවාගෙන වෙහෙලි නගාගෙන තමන් කැමති තැනකට) ගෙනයන්නාහ; උසුකාරා, හී වඩුවෝ; තෙජනං, සිත්පිත් නැති හීදඬු; නමයන්ති, තවා හැද හැර මැඩ තමන් කැමැති ලෙසට නමන්නාහ; තච්ඡකා, වඩුවෝ; දාරුං, සිත්පිත් නැති දඬු; නමයන්ති,(නිම්වලලු ආදීන් පිණිස වක්කොට ද ඉදිකොට ද සැස තමන් කැමති ලෙස)නමන්නාහ; සුබ්බතා, සුවසේ අවවාද අනුශාසනා කොට හැකි සුවචයෝ; අත්තානං, ආත්මය; දමයන්ති, දමනයකරන්නාහුයි; තමන්ගේ සිත දමනය කොට රහත්ඵලයට පැමිණෙන්නාහුයි.

### සුඛසාමණෙරවත්ථු

## දණ්ඩවග්ගො දසමො

1. කො නු හාසො කිමානන්දො නිච්චං පජ්ජලිතෙ සති
අන්ධකාරෙන ඔනද්ධා පදීපං න ගවෙසථ. 146

2. පස්ස චිත්තකතං බිම්බං අරුකායං සමුස්සිතං
ආතුරං බහුසඞ්කප්පං යස්ස නත්ථි ධුවං ඨිති. 147

3. පරිජිණ්ණමිදං රූපං රොගනිඩ්ඩං පභඞ්ගුරං[1]
භිජ්ජති පූතිසන්දෙහො මරණන්තං හි ජීවිතං. 148

---

## 11—1.

1. නිච්චං, සතතයෙන්; පජ්ජලිතෙ සති, මේ ලොකසන්නිවාසය රාගාදි එකොළොස් ගින්නෙන් ඇවිලගෙන දිලියෙන කල්හි; හාසො, තොප හැමදෙනගට සොම්නසෙක් වත්; ආනන්දො, සතුටෙක් වත්; කො නු, කවරේද; අන්ධකාරෙන, (දුක්ඛාදි අටතැන්හි උපදනා සම්මොහයයි කියනලද) අවිද්‍යාන්ධකාරයෙන්; ඔනද්ධා, වළඳනාලද්දාවූ තෙපි; පදීපං, (ඒ මොහාන්ධකාරය නසන පිණිස මාර්ග ඵල ප්‍රඥායයි කියනලද) ප්‍රදීපය; කිං න ගවෙසථ, කුමට නො සොයව්ද.

### විසාඛාය සහායිකානං වත්ථු

## 11—2.

2. යස්ස, යම් මේ ශරීරයක්හුගේ; ධුවං ඨිති නත්ථි, නිත්‍යවූ පැවැත්මෙක් නැද්ද (එකාන්තයෙන් නස්නා සුලුද විසිරෙන සුලුද); අරුකායං, (නවමහාවණමුඛයන්ගේ වශයෙන් ව්‍රණස්වභාවවූ) ව්‍රණසමූහ වූ; සමුස්සිතං, තුන්සියයක් ඇටින් ගළපා සිටුවනලද්දාවූ; ආතුරං, (හැමකල්හිම කැවීමෙන් පෙවීමෙන් නැගැවීමෙන් ඉළීමෙන් ඉරියවු පෙළීම් ආදියෙන් පරිහරණ කටයුතුහෙයින්) සතතයෙන් ගිලන්වූ; බහුසඞ්කප්පං, බොහෝ දෙනාවිසින් සුභය සුචියයි කල්පනා කරනලද්දාවූ; චිත්තකතං, (වස්ත්‍රාභරණ මාලා ගන්ධාදියෙන් සරහා) විසිතුරු කරන ලද්දාවූ; බිම්බං, මේ ශරීරය (මේ මෘතකලෙබරය); පස්සං, අසුචි දුගඳ පිළිකුල්සේබල.

### සිරිමාය වත්ථු

## 11—3.

3. ඉදං රූපං, (භගිනිය තීගෙ ශරීරයයි කියනලද) මේ රූපය තෙමෙ; පරිජිණ්ණං, (මහලුව ගිය හෙයින් ඉතා ජීර්ණව ගියේ)ජරායෙන්· ඉතා දූදුරුව ගියේ; (හෙද වැළිත්) රොගනිඩ්ඩං, (නොයෙක් රොගයන්ට වාසස්ථාන බැවින්) රොගයට කැදැල්ලක්[2] බඳුය; පභඞ්ගුරං[1] වහා නස්නා සුලුය; පූතිසන්දෙහො, (රන්වන්

---

1. පභඞ්ගුනං. ඇතැම්. 2. කැදැල්ලක්.

4. යානිමානි අපත්ථානි අලාපූනෙව සාරදෙ
කාපොතකානි අට්ඨීනි තානි දිස්වාන කා රති. 149

5. අට්ඨීනං නගරං කතං මංසලොහිතලෙපනං
යත්ථ ජරා ච මච්චු ච මානො මක්ඛො ච ඔහිතො. 150

6. ජීරන්ති වෙ රාජරථා සුචිත්තා අථො සරීරම්පි ජරං උපෙති
සතඤ්ච ධම්මො න ජරං උපෙති සන්තො හවෙ සබ්භි පවෙදයන්ති. 151

---

වූවද නවදොරින් සතතයෙන් වැගෙන) කුණුවූ මේ කය තෙමේ; භිජ්ජති, නොබෝ කලකින් බිඳෙන්නේයි; (කුමක් හෙයින්ද යත්?) ජීවිතං, සියලුසතුන්ගේ ජීවිතය තෙමේ; හි, යම් හෙයකින්; මරණන්තං, මරණයමැ අන්තකොට ඇත්තේද; එහෙයින් වහා බිඳෙන්නේයි.

## උත්තරත්ථෙරියා වත්ථු

### 11—4.

4. සාරදෙ, ශරත්කාලයෙහි; අපත්ථානි, ඒ ඒ තන්හි දමන ලද්දාවූ; අලාපූනි ඉව, ලබුවැනිවූ; කාපොතකානි, කොබෝවන් පැහැ ඇත්තාවූ; යානි ඉමානි අට්ඨීනි, යම් මේ මිනිඇට කෙනෙක් ඇත්ද; තානි දිස්වාන, ඒ මිනී ඇට දැක; කා රති; කවරනම් කාම රතියක් තොපට වන්නීද—සරත්කල ඒ ඒ තැනැ දමනලද ලබුවැනිවූ මේ මිනිඇට දැකැ දැකැ ස්වල්පමාත්‍රවූ කාමරතියක් ඉපදවීම තොපට සුදුසුදැයි සේ යි.

## අධිමානිකභික්ඛූනං වත්ථු

### 11—5.

5. යත්ථ, යම්තැනෙක්හි; ජරා ච, ස්කන්ධපරිපාකලක්ෂණවූ ජරාද; මච්චු ච, ස්කන්ධභෙදලක්ෂණවූ මරණද; මානො ච, ("සෙය්‍යස්ස සෙය්‍යොහමස්මි" යනාදි ජාත්‍යාදිය නිසා උපදනාවූ උන්නතිලක්ෂණවූ)නවවිධ මානයද; මක්ඛො ච, (මෙරමාවිසින් කරනලද උපකාර මැකීම ලකුණුකොට ඇති) මක්ඛකෙලෙස්ද; ඔහිතො, පිහිටුවනලදද (හෙවත්: පටවනලදද); මංසලොහිත ලෙපනං, මසින් හා ලෙහෙයෙන් ගල්වනලද; නගරං, නුවරෙක් (හෙවත්: කොටුගෙයක්); අට්ඨීනං, ඇටින්; කතං, කරනලදී; (තුන් සියයක් ඇටපිහිටුවා නවසියයක්නහරවැලින් වෙළා කරනලදී)

## ජනපදකල්‍යාණිරූපනන්දාථෙරියා වත්ථු

### 11—6.

6. සුචිත්තා, (මුතුමැණික්ඈ සත්රුවනින්ද සෙසු රථාලඞ්කාර යෙන්ද විශෙෂයෙන්) විසිතුරු කරනලද්දාවූ; රාජරථා, රජුන්

7. අප්පස්සුතායං පුරිසො බලිවද්දොව ජීරති
මංසානි තස්ස වඩ්ඪන්ති පඤ්ඤා තස්ස න වඩ්ඪති. 152

8. අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං. 153

---

ගේ මඟුල්රථයෝද; වෙ, ඒකාන්තයෙන්; ජීරන්ති, ජරාවට පැමිණෙති (මහලු වැ දිරති); අථො, නැවත; සරීරම්පි, (කවා පොවා නහවා උළා හඳවා පලඳවා නො එක්ලෙස පරිහරණය කරන ලද්දාවූ) මේ ශරීරය ද; ජරං උපෙති, (වයස් මිහිකිරීමෙන් ඛාණ්ඩිත්‍යාදියට පැමිණෙමින්) ජරාවට එළඹෙයි; සතං ච ධම්මො, බුද්ධාදී සත්පුරුෂයන්ගේ නවලොකොත්තරධර්මය වනාහි; ජරං න උපෙති, ජරාවට නොපැමිණෙන්නේයි; සන්තො, බුද්ධාදි සත්පුරුෂයෝ; සබ්භි, සත්පුරුෂයන් හා සමග; හවෙ, ඒකාන්තයෙන්; පවෙදයන්ති, බණන්නාහුයි.

### මල්ලිකාදෙවියා වත්ථු.

### 11 –7.

7. අප්පස්සුතො, (මූලපණ්ණාසාදි එක් දෙපණ්ණාසයක් හෝ එක් දෙවගක් හෝ යටත්පිරිසෙයින් එක් දෙසූත්‍රයක් හෝ නුඋගුණු බැවින් අල්පශ්‍රැතවූ; අයං පුරිසො, මේ පුරුෂතෙමෙ (හෙවත්: මෙබඳු කුසීත මහණතෙමෙ); බලිවද්දො ඉව, (මවටවත් පියාටවත් සෙසු නෑයනටවත් කිසි ප්‍රයොජනයක් පිණිස නුඋගුණුකුරු නිරර්ථක වැ මෙ මුහුකුරන) ගොනකුමෙන්; ජීරති, (උපාධ්‍යාය වතක් ආචාර්ය්‍ය වතක් ආගන්තුක වතක් ගිලන් වතක් නො කොට භාවනායෙක නොයෙදී නිරර්ථක වැ මෙ) මුහුකුරන්නෙයැ; තස්ස, ඒ මහණුට; මංසානි වඩ්ඪන්ති, (සියට ගොණියට නොනිසියයි වල හැරපූ පාබුන් ගොන් මාල්ලකු වල මැ කා ඇවිද මස්වැඩි තර වැ ගියමෙන් ආචාර්ය්‍ය උපාධ්‍යායාදීන් විසින් හරනාලදු වැ සඞ්ඝයාට උපන් සතරපසය අනුභවකොට වමනවිරෙචනාදීයෙන් කායපොෂණයෙහි නියුක්තයහට) ශරීරමාංශයෝ මැ වඩනාහ; තස්ස, ඔහට; පඤ්ඤා, (ලෞකිකවූද ලොකොත්තරවූද) ප්‍රඥතොමෝ; න වඩ්ඪති, මඳකුදු නොවඩනීයි; (වෙනෙහි ගස් තුරු ලිය ආදීන් වඩනාමෙන් සදෙර නිසා පවත්නා තෘෂ්ණා මානාදි කෙලශයෝ මැ වඩනාහුයි.)

### ලාලුදායිත්ථෙරවත්ථු.

### 11—8.

8. පුනප්පුනං ජාති, භවයෙහි නැවත නැවත උත්පත්ති තොමෝ; දුක්ඛා, යම්හෙයකින් දුක්ද; (නොහොත්:) ජාති, මේ ජාති

9. ගහකාරක දිට්ඨො සි පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසඞ්ඛිතං
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා. 154

10. අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං
ජිණ්ණකොඤ්චාව ඣායන්ති ඛීණමච්ඡෙව පල්ලලෙ. 155

---

තොමො; පුනප්පුනං, නැවත නැවත එළැඹෙන්නාහට; දුක්ඛා, (ජරා ව්‍යාධි මරණ මිශ්‍රහෙයින්) යම් හෙයකින් දුක්ද (හෙද වැළිත් තෘෂ්ණාවඩුකිහු නුදුටුතෙක් කල්හි නොනවතිද එහෙයින්); ගහකාරකං ගවෙසන්තො, මේ ආත්මභාවසඞ්ඛ්‍යාත ගෙය කරන්නාවූ තෘෂ්ණා නමැති වඩුවා සොයන්නාවූ මම (යම් නුවණකින් ඔහු දක්නට පිළිවන්වේද ඒ බොධිඥානාධිගමය පිණිස දීපඞ්කරපාද මූලයෙහි කරනලද අභිනීහාරය ඇත්තෙම් මෙතෙක් කල් මුළුල්ලෙහි); අනෙකජාතිසංසාරං, නොඑක් ජාතිකොටි ශතසහස්‍රයයි කියනලද සංසාරවට්ටයෙහි; අනිබ්බිසං, ඒ බොධිඥානය නොලබන්නෙම් මැ; සන්ධාවිස්සං, ච්‍යුතිප්‍රතිසන්ධිවශයෙන් නැවත නැවත ඇවිද්දෙමි.

9. ගහකාරක, ආත්මභාවසඞ්ඛ්‍යාතවූ මේ ගෙය කරන්නාවූ තෘෂ්ණානමැති වඩුව; 'දිට්ඨො' අසි, (සර්වඥතාඥානය ප්‍රතිවෙධ කරන්නාවූ මාවිසින්) තො දැන් දක්නාලද්දේ විහි; පුන, නැවත; ගෙහං, ආත්මභාවසඞ්ඛ්‍යාතවූ ගෙයක්; න කාහසි, මට නො කරන්නෙහිය; තෙ, තාගේ; සබ්බා ඵාසුකා, සෙසු සියලු කෙලෙස්නමැති පරාළයෝ (හෙවත්: සියලු ගෘහොපකරණයෝ තාක්); භග්ගා, (සර්වඥතාඥානය ප්‍රතිවෙධ කරන්නාවූ මාවිසින්) බිඳපියනලදහ; ගහකූටං, තාවිසින් කරනලද මේ ආත්මභාව සඞ්ඛ්‍යාතවූ ගෘහයාගේ අවිද්‍යා නැමැති කැණිමඬල; විසංඛිතං, (අර්හන්මාර්ගඥාන නැමැති පොරෙවින් පළා) විසුරුවා පියනලද; චිත්තං, (දැන් මාගේ) සිත; විසංඛාරගතං, (ආලම්බනකරණ වශයෙන්) නිර්වාණයට වන; තණ්හානං ඛයං, මම ද කාම තෘෂ්ණාදීන්ගේ ක්ෂයයයි කියනලද අර්හත්ඵලයට; අජ්ඣගා, පැමිණියෙම් වීමි.

—ආනන්දත්ථෙරස්ස උදානගාථාවත්ථු—

11—9.

10. බ්‍රහ්මචරියං අචරිත්වා, (ප්‍රව්‍රජ්‍යාවට යොග්‍ය වූ තරුණ වයස පැවිදිවැගෙන) බඹසරවස් නොවැස; යොබ්බනෙ, නූපන් භොග උපදවන්නටද උපන් භොග රක්නට ද යොග්‍යවූ) යෞවන වයස; ධනං අලද්ධා, කෘෂිවණික්කර්මාන්තාදියෙන් ලැබිය හැකි වූ) ධනය ලැබනොගෙන ප්‍රමාද වැ විසූ අඥනජනයෝ; ඛීණමච්ඡෙ පල්ලලෙ, දියසුන්හෙයින් මසුන් නැති විලෙක මඬ

11. අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනෙ ධනං
සෙන්ති චාපාතිඛීණාව පුරාණානි අනුත්ථුනං ති. 156

### ජරාවග්ගො එකාදසමො

1. අත්තානං චෙ පියං ජඤ්ඤා රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තිණ්ණමඤ්ඤතරං යාමං පටිජග්ගෙය්‍ය පණ්ඩිතො. 157

---

පිට හිඳැනැවෙන්නා වූ; ජිණ්ණකොඤ්චා ඉව, (ගොදුරු ඇති විල කට නැගී යන බලනැති පත්වගුළු) මහලුකොස්ලිහිණියන් මෙන්; අවක්ඛායන්ති, තැවෙන්නාහුයි.

11. බ්‍රහ්මචරියං අචරිත්වා, (ප්‍රව්‍රජ්‍යාවට යොග්‍ය වූ තරුණ වයස පැවිදිවැගෙන) බඹසරවස් නොවැස; යොබ්බනෙ, (නූපන් භොග උපදවන්නට ද උපන් භොග රක්නට ද යොග්‍ය වූ) යෞවන වයස; ධනං අලද්ධා (කෘෂිවණික්කර්මාන්තාදියෙන්) ලැබිබ හැකි ධනය ලැබනොගෙන ප්‍රමාද වැ විසූ අඥාන ජනයෝ; චාපා, දුන්නෙන්; අතිඛීණා ඉව, හරනාලද ශර මෙන්; (හෙවත්: දුන්නෙන් විදුනා ලදුවැ වලැ හුණු ශර වේයනට බත් වැ හුණු තැනැ මැ තිබී දිරා නස්නා මෙන්;) පුරාණානි අනුත්ථුනං, (පෙර මෙසේ කෑම්හ මෙසේ පූම්හ මෙසේ ඇන්දම්හ පැලැන්දම්හ යනාදීන්) පෙර වුන් සුවසැපතට සොස්මින්; සෙන්ති, හොවිත්.

### මහාධනසෙට්ඨිපුත්තවත්ථු

## ජරාවග්ගො එකාදසමො

### 12—1.

1. චෙ, ඉදින්; අත්තානං, ආත්මය; පියං ජඤ්ඤා, තමහට ප්‍රියයැයි දන්නේ වී නම්; නං, ඒ (ආත්මය); සුරක්ඛිතං රක්ඛෙය්‍ය, (තුන්වයස මැ) සුරක්ෂිත කොට රක්නේයි; (යමෙක් තමා රක්මි මතුමහල්තෙලෙහි සුපිහිත වූ දොර කවුළු ඇති ගබගෙට වැද සම්පන්නාවූ ආරක්ෂා ඇති වැ වසන්නේ ද පණිවා ආදී අකුශල යෙහි යෙදිණි නම් හේ තමා රක්නේ නම් නොවේ, යමෙක් වනාහි රුක්මුල් ආදී නිරාරක්ෂාස්ථානයෙකැ වසන්නේ ද පණිවා ආදී අකුසලින් දුරු වැ දානශීලාදි සුචරිතයෙහි යෙදිණි නම් හේ තමා රක්නේ නම් වේ;) එහෙයින්; පණ්ඩිතො, ප්‍රාඥ වූ පුරුෂ තෙමෙ; තිණ්ණමඤ්ඤතරං යාමං, තුන්වයසින් එක්තරා වයසෙක; පටිජග්ගෙය්‍ය, අකුසලින් දුරු කොට ආත්මය රක්නේයි.

### බොධිරාජකුමාරවත්ථු

2. අත්තානමෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ
අථඤ්ඤමනුසාසෙය්‍ය න කිලිස්සෙය්‍ය පණ්ඩිතො. 158

3. අත්තානං චෙ තථා කයිරා යථඤ්ඤමනුසාසති
සුදන්තො වත දමෙථ අත්තා හි කිර දුද්දමො. 159

4. අත්තාහි අත්තනො නාථො කො හි නාථො පරො සියා
අත්තනාව සුදන්තෙන නාථං ලභති දුල්ලභං. 160

---

## 12—2.

2. පඨමං, පළමුකොට; අත්තානං එව, තමා මැ; පතිරූපෙ නිවෙසයෙ; සුදුසු ගුණයෙක්හි පිහිටුවන්නෙයැ; (යමෙක් අපිස් බැව් ආදී ගුණයෙකින් හෝ අරිවස් පිළිවෙත් ආදියෙකින් හෝ අන්නට අවවාද කරනු කැමැති වේ ද ඔහුවිසින් පළමු කොට ඒ ගුණයෙහි පිහිටියයුතුයැ යී සේයි;)අථ, ඉක්බිත්තෙන්; අඤ්ඤං, අනිකක්හට; අනුසාසෙය්‍ය, (තමා පිහිටි ගුණයෙන්) අනුශාසනා කරන්නෙයැ; පණ්ඩිතො, මෙසේ කරන්නා වූ ප්‍රඥ තෙමෙ; න කිලිස්සෙය්‍ය, නොකෙලෙසෙන්නේයි හෙවත්: නො තැවෙන්නේයි—තමා පළමු කොට සුදුසු ගුණයෙහි පිළිවෙතෙහි නො පිහිටා පරහට අවවාද කරන මහණ අනුන්ගෙන් නිඳා ලබන හෙයින් කෙලෙස්නා නම් වෙයි සුදුසු ගුණයෙහි පිළිවෙතෙහි පිහිටා සිටැ පරහට අවවාද කරන මහණ අනුන්ගෙන් ප්‍රශංසා ලබන හෙයින් නො කෙලෙසෙන්නේ නම් වෙ යී සේයි.

### —උපනන්දසක්‍යපුත්තවත්ථු—

## 12—3.

3. අඤ්ඤං, අනිකකුට; යථා අනුසාසති, (පෙරයමැ අලුයමැ සක්මන්කටයුතුයැ පස්නීවරණයන් කෙරෙන් සිත පිරිසුදු කට යුතුයැ යනාදීන්) යම් ලෙසක අනුශාසනා කෙරේ ද; අත්තානං, තමාද; චෙ, ඉදින්; තථා කයිරා, එසේ මැ පිළිවෙත් සරුකරන්නේ වී නම්; වත, එකාන්තයෙන්; සුදන්තො, තෙමේ මනා වැ දූමුණෙ; දමෙථ, අනුන් දමන්නේයැ; හි, යම් හෙයකින්; අත්තා, (මේ) ආත්මය(නම්); දුද්දමො කිර, දමනය නො කොට හැකි ද හෙවත්: ආත්ම දමනය නම් උගහට ද; (එහෙයින් යම් ලෙසකින් ආත්මය දමනලද්දේ මනා කොට දමනලද්දේනම් වේ ද එලෙස දූමියයුතුයි.)

### —පධානිකතිස්සත්ථෙරවත්ථු—

## 12—4.

4. අත්තනො, තමහට; අත්තා හි, ආත්මය මැ; නාථො, පිහිට වන්නේයැ; පරො, අන්‍ය වූ; කො හි, කවරෙක් නම්; නාථො සියා, තමහට පිහිට වන්නෙද (තමහට පිහිට නම් තෙමේ මෙයැ අනික් කවරෙක් තමහට පිහිට වේදූ යී සේයි); සුදන්තෙන,

5\. අත්තනාව කතං පාපං අත්තජං අත්තසම්භවං
අභිමත්ථති දුම්මෙධං වජිරං වස්මමයං මණිං. 161

6\. යස්ස අච්චන්තදුස්සීල්‍යං මාලුවාසාලම්වොත්තතං
කරෙති සො තථාත්තානං යථා නං ඉච්ඡතී දිසො. 162

---

ෂඩින්ද්‍රියදමනයෙන් මනාකොට දමුණා වූ; අත්තනා එව, තමා විසින් මැ; දුල්ලභං, පරමදුල්ලභ වූ; නාථං, අගිත්ඵලයයි කියන ලද ප්‍රතිෂ්ඨාව; ලභති, ලබන්නේයි.

## කුමාරකස්සපත්ථෙරස්ස මාතුයා වත්ථු

### 12—5.

5\. අත්තජං, තමා කෙරෙන් මැ ජනිත වූ; අත්තසම්භවං, තමා කෙරෙන් මැ උපන්නා වූ; අත්තනා එව කතං, තමා විසින් මැ කරනලද්දවූ; පාපං, (ප්‍රාණවධාදි) අකුශලකර්මය තෙමෙ; අස්මමයං මණිං, පාෂාණමය වූ මැණික (විදූ සිදුරු විසිදුරු කොට අපරිභොග කරන්නාවූ); වජිරං ඉව, පහණමයවූ වදුරමෙන්; දුම්මෙධං, පාපකාරිවූ ඒ අඥනයා, අභිමත්ථති, මඩනේයි–සතර අපායෙහි ගලා දුක්දෙන්නේයි–යම්සේ පහණමය වූ පහණින් මැ උපන් වදුර තමහට උත්පත්තිස්ථාන වූ පහණ මිණිය කා සිදුරු විසිදුරු කොට කඩකඩ කොට අපරිභොග කෙරේ ද එසේ මැ තමා කෙරෙන් මැ උපන් අකුශලකර්මය ඒ පාපකාරී වූ අඥනයා සතර අපායෙහි ගලා නසන්නේයැ යනු භාවයි.

## මහාකාලඋපාසකස්ස වත්ථු

### 12—6.

6\. යස්ස, යම් පුද්ගලයක්හුගේ; අච්චන්තදුස්සීල්‍යං, එකාන්ත යෙන් මැ දුශ්ශීලභාවය; සාලං මාලුවා ඉව, සල්රුකක් වැළැඳැ ගෙනැ සිටි මාලුවාලියයක් මෙන්; ඔත්තතං, ඒ දුශ්ශීලයා වැළැඳැ ගෙනැ සිටියේ වේ ද; දිසො, එක්තරු එකක්හුගේ සතුරෙක්; නං, ඒ තමාගේ සතුරාට; යථා ඉච්ඡති, යම්සේ අනර්ථයක් කොට පියනු කැමැති වේ ද; සො, ඒ දුශ්ශීල පුද්ගල ද; අත්තානං, තමහට; තථා කරෙති, එසේ මැ අනර්ථ කරන්නේයි–යම් ගෘහස්ථයෙක් උපන්තැන්පටන් දශඅකුශලකර්මපථය කෙරේ ද යම් ප්‍රව්‍රජිතයෙක් උපසම්පන්න වූ දවස් පටන් ගරුකාපත්ති යට අවදී ද එසේ වූ දුශශීලයාගේ නොඑක් ජාතියෙහි පුරුදු කොට ආ සඳෙර උපන් තෘෂ්ණායයි කියනලද ඒ දුශශීලභාවය සල්රුකක් වැළැඳැ සිටි මාලුවාලියය වැසි වස්නා කල ගොටුසේ උඩු බලා සිටි මාලුවා පත් පුරාගත් දියබරින් ඒ සල්රුක බිඳැ සුනු විසුනු කරන්නා මෙන් දුශශීලපුද්ගලයා සුගතියෙන් චුත කොට සතරඅපායෙහි හෙළා සතුරකු මෙන් අනර්ථ කරන්නෙයැ යනු භාවයි.

## දෙවදත්තවත්ථු

7 සුකරානි අසාධූනි අත්තනො අහිතානි ච
යං වෙ හිතං ච සාධුං ච තං වෙ පරමදුක්කරං.

8 යො සාසනං අරහතං අරියානං ධම්මජීවිනං
පටික්කොසති දුම්මෙධො දිට්ඨිං නිස්සාය පාපිකං
ඵලානි කට්ඨකස්සෙව අත්තඝඤ්ඤාය ඵල්ලති.

9 අත්තනාව කතං පාපං අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති
සුද්ධිඅසුද්ධිපච්චත්තං නාඤ්ඤො අඤ්ඤං විසොධයෙ.

---

## 12—7.

7. අසාධූනි, යම් කර්මකෙනෙක් සාවද්‍යහෙයින් අසාධුහු ද; අත්තනො අහිතානි ච, (කරනලද්දෑහු ද අපායසාධක බැවින්) තමහට අහිතයෝ ද (එසේ වූ අකුශලකර්මයෝ); සුකරානි, (වළ තැනට ගෙනැයන දියමෙන්) සුවසේ කටහැක්කාහුයි; යං, යම් කර්මයෙක් කරනලද්දේ; හිතං ච, සුගතිසාධක බැවින් තමහට හිතද; සාධු ච, නිරවද්‍ය බැවින් සාධු ද; තං, ඒ(කුශලකර්මය);පරම දුක්කරං, (පැදුම්දෙසට නතු මහගඟක් පෙරළා පැළදෙසට නතු කිරීමක් මෙන්) අතිදුෂ්කරයි-කරන්නට ඉතාමත් නො පිළිවනි.

### සඞ්ඝභෙදපරිසක්කනවත්ථු

## 12—8.

8. යො දුම්මෙධො, යම් අඥාන පුද්ගලයෙක්; පාපිකං දිට්ඨිං නිස්සාය, (තමහට වන ලාභසත්කාරහානියෙහි භයින්) ලාමක වූ දෘෂ්ටිය නිසා; අරහතං, නිකෙලෙස් වූ; ධම්මජීවිනං, දැහැමින් ජීවත්වන සුලු වූ; අරියානං, බුද්ධාදී ආර්‍ය්‍යයන්ගේ; සාසනං, අනුශාසනාව; පටික්කොසති, වළකා ද (ඔහුගේ ඒ පටික්කොසනයද ලාමක වූ ඒ දෘෂ්ටිය ද); කට්ඨකස්ස ඵලානි ඉව, හුණගස්හුගේ පලගැන්ම මෙන්; අත්තඝඤ්ඤාය, ආත්මවධය පිණිස හෙවත්: තමහට විනාශය පිණිස; ඵල්ලති, පල ගන්නේයි හෙවත්: නිපදනේයි.

### කාළත්ථෙරවත්ථු

## 12—9.

9. අත්තනා එව, යමක්හු තමා විසින් මැ; පාපං, අකුශල කර්මයෙක්; කතං, කරනලද්දේ වේද (හෙතෙම සතරඅපායෙහි ඉපැද දුක් අනුභවකරන්නේ); අත්තනා එව, තෙමේ මැ; සංකිලිස්සති, වෙසෙසින් කෙලෙසෙන්නේයි(හෙවත්: තැවෙන්නේයි);

10 අත්තදත්ථං පරත්ථෙන බහුනාපි න හපායෙ
අත්තදත්ථමභිඤ්ඤාය සදත්ථපසුතො සියා ති.

### අත්තවග්ගො ද්වාදසමො

---

අත්තනා, යමක්හු තමා විසින්; පාපං, අකුශලකර්මයෙක්; අකතං, නො කරනලද්දේවේ ද; (හෙතෙමෙ සුගතියට යන්නෙ ද අගතියට නො යන්නෙද;) අත්තනා එව, තෙමේ මැ; විසුජ්ඣති, විශුද්ධ වන්නේයි; සුද්ධි, (කුශලකර්මසඞ්ඛ්‍යාත වූ) ශුද්ධිය ද; අසුද්ධි, (අකුශල කර්ම සඞ්ඛ්‍යාත වූ) අශුද්ධිය ද; පච්චත්තං, (කුශලාකුශලකර්මයන් කළාවූ සත්වයන්) තමතමන්හට මැ වන්නේයැ; (හෙවත්: ඒ ඒ සත්වයන්ට මැ විපාක දෙන්නේයැ එහෙයින්;) අඤ්ඤො, අනික් පුද්ගලයෙක්; අඤ්ඤං, අනික් පුද්ගලයක්හු; න විසොධයෙ, ශුද්ධ කරන්නේ නො වේ.

### චූලකාල උපාසකවත්ථු

**12—10.**

10. බහුනාපි, බොහෝ ද වූ; පරත්ථෙන, පරාර්ථයට වඩා අත්ථදත්ථං, ආත්මාර්ථය; න හාපයෙ, නො පිරිහෙළන්නේයැ; අත්තදත්ථං, අර්හත්ඵල සඞ්ඛ්‍යාත වූ ආත්මාර්ථය; අභිඤ්ඤාය, (මට ආත්මාර්ථ නම් මෙ මෙයයි) විශිෂ්ට වූ ඥානයෙන් දැනැ; සදත්ථපසුතො සියා, (අර්හත්ඵලාධිගමයයි කියනලද) ස්වාර්ථයෙහි යුක්ත ප්‍රයුක්ත වන්නේයි.— මම ස්වාර්ථය කරන්නෙම් වෙම්දැයි චෛත්‍යය පටිසඞ්ඛරණාදි සංස්කෘතය ද ආචාර්යවත් උපාධ්‍යායවත් ආගන්තුකවත් ගිලන්වත් ආදි වතාවතුදු නො පිරිහෙළියයුතුයැ, ආභිසමාචාරිකවත් නුපුරා ආදිබ්‍රහ්මචරියය පුරන්නේයැ යනු නැත, ආභිසමාචාරිකවත් පුරන මහණ මැ ආර්යඵලාදියට පැමිණෙන්නේයැ, එහෙයින් ආභිසමාචාරිකවත් පිරිම ද ස්වාර්ථ නම් වෙයි, යම් මහණෙක් වනාහි අතිශයෙන් වඩනා ලද විදර්ශනා ඇතිවැ අද අද මැ රහත්ඵල පසක්කෙරේමියි ප්‍රතිවෙධය ප්‍රාර්ථනා සොරෙමින් වෙසේ ද ඔහු විසින් උපාධ්‍යායවත් ආදිය නො පිරිහෙළා ද ආත්මාර්ථයෙහි මැ නියුක්තවියැ යුතුයැ යනු භාවයි.—

### අත්තදත්ථත්ථෙරවත්ථු

## අත්තවග්ගො ද්වාදසමො

1. හීනං ධම්මං න සෙවෙය්‍ය පමාදෙන න සංවසෙ
මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය න සියා ලොකවඩ්ඪනො. 167

2. උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච. 168

3. ධම්මං චරෙ සුචරිතං න තං දුච්චරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච. 169

---

1. හීනං ධම්මං, (හීනසත්ත්වයන් විසින් සෙවියයුතු බැවින් ද හීනවූ නරකාදියෙහි උපදවන හෙයින් ද) හීනවූ රූපාදි පඤ්ච කාම ගුණධර්මය; න සෙවෙය්‍ය, නො සෙවුනෙයැ; පමාදෙන (කුශලධර්මවිෂයෙහි ස්මෘතිවිප්‍රවාසයයි කියනලද) ප්‍රමාදය හා; න සංවසෙ, එක් ව නො වසන්නෙයැ (හෙවත්: ප්‍රමාදය ද නො සෙවුනෙයැ); මිච්ඡාදිට්ඨිං න සෙවෙය්‍ය, අනිත්‍යාදියට විරුඬ වූ ශාශ්වතොච්ඡෙද දෘෂ්ටිය ද නො සෙවුනෙයැ; ලොකවඩ්ඪනො න සියා, (මෙසේ යථොක්ත වූ අකෘත්‍යය නොකිරීමෙන්) ලොකවර්ධනය නොවන්නේයි-සසර නො වඩන්නේ යැ යී සේයි.

අඤ්ඤතරදහරභික්ඛුස්ස වත්ථු.

13—2.

2. උත්තිට්ඨෙ, භික්ෂාටනයෙහි (හෙවත්: ගෙපිළිවෙළින් දෙර දෙරසිටැ සිහා ලැබියයුතු කොණ්ඩසි අහරෙහි); නප්පමජ්ජෙය්‍ය, (පිණ්ඩචාරික වත නොපිරිහෙළා ගෙපිළිවෙළ නො ඉක්මවා දෙර දෙර සිටැ බික්සිඟන බැවින්) නොපමාවන්නෙයැ; ධම්මං, එමැ භික්ෂාචර්‍ය්‍යාධර්මය; සුචරිතං චරෙ, (එක්විසි අනෙස්නෙන් දුර වැ සපදානචරියායෙන්) සකස් කොට පුරුදුකරන්නෙයැ; ධම්මචාරී, භික්ෂාචර්‍ය්‍යාධර්මයෙහි මනා වැ පවත්නා සුලු මහණ; අස්මිං ලොකෙ, මෙ ලොව්හි ද; පරම්හි ච, පරලොව්හි ද; සුඛං සෙති, (සතරඉරියව්වෙහි මැ) සුවසේ වසන්නේයි.

3. ධම්මං, භික්ෂාචර්‍ය්‍යාධර්මය; සුචරිතං චරෙ, (එක්විසි අනෙස්නෙන් දුරු වැ ගෙපිළිවෙළ නො ඉක්මවා දෙරදෙර සිටැ පිඬුසිඟීමෙන්) මනාකොට පුරන්නේයි; තං, ඒ භික්ෂාචර්‍ය්‍යා ධර්මය; දුච්චරිතං න චරෙ, (වෙසියගොචරාදි අගොචරයෙහි හැසිරීම්වසයෙන්) නපුරු කොට නුපුරන්නේයි; ධම්මචාරී, භික්ෂාචර්‍ය්‍යාධර්මයෙහි මනා වැ පවත්නා සුලු මහණ; අස්මිං ලොකෙ, මෙ ලෙව්හි ද; පරම්හි ච, පරලෙව්හි ද; සුඛං සෙති, සතරඉරියව්වෙහි මැ සුවසේ වසන්නේයි.

සුද්ධොදනවත්ථු.

4. යථා බුබ්බුලකං පස්සෙ යථා පස්සෙ මරීචිකං
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති. 170

5. එථ පස්සථිමං ලොකං චිත්තං රාජරථූපමං
යත්ථ බාලා විසීදන්ති නත්ථි සඞ්ගො විජානතං. 171

6. යො ච පුබ්බෙ පමජ්ජිත්වා පච්ඡා සො නප්පමජ්ජති
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා. 172

---

**13—3.**

4. බුබ්බුලකං, දියබුබුලක්; යථා පස්සෙ, (ඉපදලා වහා නස්නේ යයි ද තුච්ඡය අසාරයයි ද) යම්සේ බලා ද; මරීචිකං, (පවතින් කම්පිත වූ හිරුරැස යයි කියනලද) මිරිඟු; යථා පස්සෙ, (ගන්නට නො හිසියයි) යම්සේ බලා ද; එවං, එපරිද්දෙන් මැ; ලොකං, (ස්කන්ධායතනධාතුසඞ්ඛ්‍යාත) ලොකය; අවෙක්ඛන්තං, (ඉපදලා වහා නස්නේය. තුච්ඡය අසාරය ආත්මආත්මීයභාව යෙන් ගන්නට නො හිසියයි) නුවණැසින් බලන්නා වූ මහණු; මච්චුරාජා, මරණරජ තෙමෙ; න පස්සති, (තමහට අවිෂයවූ නිවන් පුරයට ගියහෙයින්) නොදක්නේයි.

**පඤ්චසතවිපස්සකභික්ඛූනං වත්ථු**

**13—4.**

5. යත්ථ, යම් ආත්මභාවයෙක්හි; බාලා, අඥානජනයො; විසීදන්ති, තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් ගැලෙත්ද; විජානතං, නුවණැත්තවුන්ට; සඞ්ගො නත්ථි, (යම් ආත්මභාවයෙක්හි රාගසඞ්ගාදි කිසි)සඞ්ගයෙක් නැත්ද; චිත්තං,(රන්රිදී මුතු මැණික් ආදි සත් රුවනින්) විසිතුරු වූ; රාජරථූපමං, රාජරථයක් වැනි වූ;(හෙවත්; රජදරුවන් නැඟෙන මඟුල්රථයක් මෙන් වස්ත්‍රාභරණාදියෙන් විසිතුරුකරනලද); ඉමං ලොකං, ස්කන්ධාදි ලොකයයි කියනලද මේ ආත්මභාවය; එථ, මෙහි එව්; පස්සථ, බලව්.

**අභයරාජකුමාරවත්ථු**

**13—5.**

6. යො, යම්පුද්ගලයෙක්; පුබ්බෙ, පූර්වභාගයෙහි; පමජ්ජිත්වා ච, (වත්පිළිවෙත් පිරීමෙන් හෝ බණ හැදෑරීම් ආදියෙන් හෝ යොනිසොමනස්කාරයෙහි) ප්‍රමාද්ව ද; සො, හෙ තෙමෙ; පච්ඡා, පසුව; නප්පමජ්ජති, (මාර්ගඵල සුවයෙන් දවස් යවන්නේ යොනි සොමනස්කාරයෙහි) නො පමා වේ ද; සො, ඒ පුද්ගල තෙමෙ; අබ්භා මුත්තො, වලාපටලයෙකින් මුක්ත වූ; චන්දිමා ඉව, පූර්ණ

7. යස්ස පාපං කතං කම්මං කුසලෙන පිපීයති
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමා. 173

8. අන්ධභූතො අයං ලොකො තනුකෙත්ථ විපස්සති
සකුන්තො ජාලමුත්තොව අප්පො සග්ගාය ගච්ඡති. 174

9. හංසා ආදිච්චපථෙ යන්ති ආකාසෙ යන්ති ඉද්ධියා
නීයන්ති ධීරා ලොකම්හා ජෙත්වා මාරං සවාහිනිං. 175

---

චන්ද්‍රයා අවකාශලොකය බබුළුවන්නාක්මෙන්; ඉමං ලොකං, (ස්කන්ධාදිසඞ්ඛ්‍යාත වූ) මේ ලොකය; පභාසෙති, (ඥානාලොකයෙන් බබුළුවන්නේයි.

### සම්මුඤ්ජනිත්ථෙරවත්ථු.

**13—6.**

7. යස්ස, යම් පුද්ගලයක්හු විසින්; කතං, කරනලද; පාපං කම්මං, (ප්‍රාණවධාදි) අකුශලකර්මය; කුසලෙන, (අර්හත්මාර්ගචිත්ත සම්ප්‍රයුක්ත චෙතනා යයි කියනලද) කුශලයෙන්; පිපීයති, පිහියේද හෙවත්: මුවාවයේද; සො, ඒ පුද්ගල තෙමෙ; අබ්භා මුත්තො, වලාපටලයකින් මුක්ත වූ; චන්දිමා ඉව, පූර්ණචන්ද්‍රයා අවකාශ ලොකය බබුළුවන්නා මෙන්; ඉමං ලොකං, ස්කන්ධාදිසඞ්ඛ්‍යාත වූ මේ ලොකය; පභාසෙති, ඥානාලොකයෙන් බබළුවන්නේයි.

### අඞ්ගුලිමාලත්ථෙරවත්ථු.

**13—7.**

8. අයං ලොකො, මේ ලෞකික මහාජනතෙමෙ; අන්ධභූතො, නුවණැස්නැති හෙයින් අන්ධවූයේය) දෙඇස් නැත්තේය; එත්ථ, මේ මහාජනයා අතුරෙහි; තනුකො, ස්වල්ප වූ සත්වයෙක් මැ; විපස්සති, අනිත්‍යාදිවශයෙන් ස්කන්ධපඤ්චකය දක්නෙයැ; ජාලමුත්තො සකුන්තො ඉව, (දක්ෂ වූ ලිහිණිවැද්දකු විසින් දමනලද) දැලට හසු වැ එයින් මිදී පලා යන වටුවකු මෙන් මාරජාලයෙන් වසනලද සත්වයන් අතුරෙන්); අප්පො, ස්වල්ප වූ කිසි සත්වයෙක් මැ; සග්ගාය ගච්ඡති, (සුෂ්ඨුඅග්‍රහෙයින් ස්වර්ගයයි කියනලද සුගතියට ද නිර්වාණයට ද යන්නේයි.

### පෙසකාරධීතුවත්ථු.

**13—8**

9. හංසා, මේ හංසයෝ; ආදිච්චපථෙ යන්ති, සූර්‍ය්‍යමාර්ගයෙහි (හෙවත් ආකාශයෙහි)යෙති; ආකාසෙ යන්ති ඉද්ධියා,(සුභාවිත වූ

10. එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො
විතිණ්ණපරලොකස්ස නත්ථි පාපං අකාරියං. 176

11. න වෙ කදරියා දෙවලොකං වජන්ති
බාලා හවෙ නප්පසංසන්ති දානං
ධීරො ච දානං අනුමොදමානො
තෙනෙව සො හොති සුඛී පරත්ථ. 177

---

සතර ඍද්ධිපාදයන් ඇති යොගීහු) ඍද්ධියෙන් ආකාශයෙහි යෙති; (යම්සේ මේ හංසයෝ කර්මවිපාකජඍද්ධියෙන් ආකාශයෙහි යෙත්ද එසේමැ සුභාවිතවූ ඡන්දඍද්ධිපාදාදි චතුර්විධ ඍද්ධිපාදභාවනාඇති ක්ෂීණාශ්‍රවයෝ භාවනාමය ඍද්ධියෙන් ආකාශයෙහි යෙති යි සේයි;) ධීරා, (හෙතුසම්පන්නවූ කෘතාධිකාර) ප්‍රාඥයෝ; සවාහිනිං මාරං ජෙත්වා, ("කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති" යනාදින් දක්වනලද) මාරසෙනාව සහිත වූ වශවර්තිමාරයා පරදවා; ලොකම්හා, සංසාරවට්ටයයි කියනලද මේ ලොකයෙන්; නීයන්ති, නික්මෙන්නාහුයි හෙවත්: නිවනට පැමිණෙන්නාහුයි.

## තිංසභික්ඛූනං වත්ථු

### 13—9.

10. එකං ධම්මං අතීතස්ස, එක මැ වාක්‍යසත්‍යධර්මය ඉක්මුණාවූ; මුසාවාදිස්ස, (දසබසකින් එකබසකුදු සැබෑ නො වන හෙයින්) බොරු බොහෝකොට කියන සුලු වූ; විතිණ්ණපරලොකස්ස, (දිව්‍යමනුෂ්‍යසම්පත්තියට ද නිර්වාණසම්පත්තියට ද හිමි නොවන හෙයින්) හරනාලද පරලෝ ඇති; ජන්තුනො, මෙබඳු සත්වයා විසින්; අකාරියං, නො කට හැකිවූ; පාපං, අකුශලයෙක් නම්; නත්ථි, නැති.

## චිඤ්චමාණවිකාවත්ථු

### 13—10.

11. කදරියා, තදමසුරු සත්වයෝ; වෙ, ඒකාන්තයෙන්; දෙවලොකං, දෙව්ලොවට; න වජන්ති, නො යන්නාහ; බාලා, මෙලෝ පරලෝ වැඩ අවැඩ නො දන්නා අඥානජනයෝ; හවෙ, ඒකාන්තයෙන්; දානං,(අනුන් විසින් දෙනලද) දානයට; නප්පසංසන්ති, කළ සේ යහපතැයි ප්‍රශංසාවක් නො කරන්නාහ; දානං, (අනුන් විසින් දෙනලද දානය; අනුමොදමානො අනුමොදන් වන්නාවූ; ධීරො, ප්‍රාඥ වූ; සො, ඒ පුරුෂ වනාහි; තෙනෙව, ඒ දානානුමොදනාමය වූ කුශලකර්මයෙන්; පරත්ථ, පරලොවැ;

12. පථව්‍යා එකරජ්ජෙන සග්ගස්ස ගමනෙන වා
සබ්බලොකාධිපච්චෙන සොතාපත්තිඵලං වරං ති. 178

--ලොකවග්ගො තෙරසමො.--

1. යස්ස ජිතං නාවජීයති ජිතමස්ස නො යාති කොචි ලොකෙ
තම්බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ. 179

---

සුඛී හොති, (දිව්‍යසම්පත්ති අනුභව කරන්නේ කායිකචෛතසික සුඛයෙන්) සුඛිත වන්නේයි; සුවයට පැමිණෙන්නේයි.

--අසදිසදානවත්ථු--

**13—11.**

12. පථව්‍යා, මුළුපොළොව; එකරජ්ජෙන, එකරාජ්‍යයට ද වඩා; (හෙවත්: දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතර මහා ද්වීපයෙන් හොබනාවූ මුළුසක්වළ ගබ ආධිපත්‍යය කරන සක්විතිරජහුගේ ඓශ්වර්‍ය්‍යයට ද වඩා; සග්ගස්ස ගමනෙන වා, (චාතුර්මහාරාජිකාදි සවිසිවැදෑරුම් වූ) ස්වර්ගයට යාමට ද වඩා; සබ්බලොකාධිපච්චෙන, (නාග සුපර්ණ වෛමානික ප්‍රෙතයන් හා සමඟ) සියලු මේ ලොකයෙහි ආධිපත්‍යය ට ද වඩා; සොතාපත්තිඵලං වරං, සෝවාන්ඵලය මැ උත්තමයි.--යම් හෙයකින් මෙතෙක් තන්හි ආධිපත්‍යය කොට ද සත්ත්වතෙමෙ නරකාදියෙන් නො මිදුණේ මෙ වේද සෝවන් පුහුල් වනාහි පියනලද අපාය දොරඇති බැවින් සඊ දුඊල ද අටවන භවයෙහි නො උපදිද එහෙයින් සකලලොකයෙහි ආධිපත්‍යයට ද වඩා සොවාන් ඵලය මැ උතුමැ යී සේයි.--

--කාලනාමස්ස අනාථපිණ්ඩිකපුත්තස්ස වත්ථු--

## --ලොකවග්ගො තෙරසමො--

**14—1.**

1. යස්ස, යම් සම්‍යක්සම්බුද්ධයක්හු විසින්; ජිතං, ඒ ඒ මාර්‍ගයෙන් දිනනලද රාගාදිකෙලශජාතය; නාවජීයති, (නැවත නො උපදනා හෙයින්) නපුරැ කොට දිනනලද්ද නම් නො වේද හෙවත්: නො දිනුවා නම් නොවේද; අස්ස, ඒ සම්‍යක් සම්බුද්ධයා විසින්; ජිතං, ඒ ඒ මාර්‍ගයෙන් දිනනලද රාගාදිකෙලශ ජාතයා; ලොකෙ, ලොකයෙහි; කොචි, කිසිඑකද කෙලශ යෙක්; නො යාති, අනුවැ නොයේ ද හෙවත් පස්සෙහි ලුහු

2. යස්ස ජලිනී විසත්තිකා තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවෙ
තං බුද්ධමනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ. 180

3. යෙ ඣානපසුතා ධීරා නෙක්ඛම්මූපසමෙ රතා
දෙවාපි තෙසං පිහයන්ති සම්බුද්ධානං සතීමතං. 181

---

බැඳගෙන නො යෙ ද; අනන්තගොචරං, (අනන්තාලම්බන වූ සර්‍වඥතාඥනවශයෙන්) අපරියන්ත වූ ගොචර ඇති; අපදං, (භවත්‍රයෙහි පරිභ්‍රමණයට කාරණවූ රාගාපදාදීන් අතුරෙන්) එක ද පදයක් නැත්තා වූ; තං බුද්ධං, ඒ සම්‍යක්සම්බුද්ධයා; කෙන පදෙන, කවර පදයෙකින් නොහොත්: කවර කාරණයෙකින්; නෙස්සථ, ගෙනැ යවු ද? තොපගේ වශගයට පමුණුවවූද.

2. ජලිනී, හිවත වළඳන අර්ථයෙන් දැලක් වැනි හෙයින් ජලිනී නම් වූ; විසත්තිකා, රූපාදි පඤ්චාලම්බනයෙහි ආසක්ත විසක්තවන හෙයින් විසත්තිකා නම් වූ; තණ්හා, රූපතෘෂ්ණාදි වූ තෘෂ්ණා තොමෝ; යස්ස, යම් සම්‍යක්සම්බුද්ධයක්හු; කුහිඤ්චි නෙතවෙ, කිසි භවයෙක්හි පමුණුවන්නට; නත්ථි, නැත්ද(හෙවත්: සම්‍යක්සම්බුද්ධයන් කිසි භවයකට ගෙනැ යන්නට නිසි තෘෂ්ණාවක් නම් නැත්ද;) අනන්තගොචරං, (අනන්තාලම්බන වූ සර්‍වඥතාඥනවශයෙන්) අපර්‍යන්ත වූ ගොචර ඇති; අපදං, (භවත්‍රයෙහි පරිභ්‍රමණයට කාරණ වූ රාගපදාදීන් අතුරෙන්) එක ද පදයක් නැත්තා වූ; තං බුද්ධං, ඒ සම්‍යක්සම්බුද්ධයා; කෙන පදෙන, කවර පදයෙකින් නොහොත්: කවර කාරණයෙකින්; නෙස්සථ, ගෙනැ යෙව් දැ? තොපගේ වශගයට පමුණුවවු දැ.

### මාරධිතරානං වත්ථු

### 14—2.

3. යෙ ධීරා, යම් ප්‍රාඥකෙනෙක්; ඣානපසුතා (ආලම්බනො පනිධ්‍යානලක්ෂණොපනිධ්‍යාන වශයෙන් ද්විප්‍රකාර වූ) ධ්‍යානයෙහි (ආවජ්ජන සමාපජ්ජන අධිෂ්ඨාන වුට්ඨාන පච්චවෙක්ඛන වශයෙන්) යුක්තප්‍රයුක්තයෝ ද හෙවත්: සමථවිදර්ශනා භාවනා දෙක්හි නියුක්තයෝ ද; නෙක්ඛම්මූපසමෙ රතා, (ක්ලෙශව්‍යුපශමනය නිර්‍වාණය යන මේ) නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණාහු ද; සතිමතං, ස්මෘතිමත් වූ; තෙසං සම්බුද්ධානං, ඒ සම්‍යක්සම්බුද්ධ වරයන්ට; දෙවාපි, දෙවියෝ ද මිනිස්සු ද; පිහයන්ති, කැමැති වෙත්; (ඇපිත් බුදුවුමෝ නම් යෙහෙකැයි බුදු බව කැමැතිවන්නාහු ප්‍රාර්ථනා කෙරෙත්).

### යමකපාටිහාරියවත්ථු

4. කිච්ඡො මනුස්සපටිලාභො කිච්ඡං මච්චානජීවිතං
කිච්ඡං සද්ධම්මසවනං කිච්ඡො බුඩානං උප්පාදෙ. 182

5. සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා
සචිත්තපරියොදපනං එතං බුඩානසාසනං. 183

6. ඛන්ති පරමං තපො තිතික්ඛා
නිබ්බානං පරමං වදන්ති බුඩා
නහි පබ්බජිතො පරූපඝාතී
සමණො හොති පරං විහෙඨයන්තො. 184

---

## 14—3.

4. මනුස්සපටිලාභො, මිනිසත්බව පිළිලැබීම නම්; කිච්ඡො, මහද්ව්‍යායාමයෙන් මහත්කුශලයෙන් පිළිලැබිය යුතුබැවින් කෘච්ඡ්‍රය) දුලීභය; මච්චානං, සත්වයන්ගේ; ජීවිතං, ජීවිතය (හෙවත්: සත්වයන්ගේ ජීවිකාව ද); කිච්ඡං, (නිරන්තරයෙන් කෘෂිවණික්කර්මාන්තාදී කොට ජීවිකාව කරන බැවින් ද සවල්ප කාලයක් පවත්නා බැවින් ද කෘච්ඡ්‍රය) දුක; සද්ධම්මසවනං, සද්ධම්මශ්‍රවණය ද; කිච්ඡං, (නොඑක් කප්කෙළසුවහසකිනුත් ධර්මදේශකපුද්ගලයෙකු දුලීභ හෙයින්) කෘච්ඡ්‍රය දුලීභය; බුඩානං උප්පාදෙ, සම්‍යක්සම්බුඩවරයන්ගේ ඉපදීම ද; කිච්ඡො, කෘච්ඡ්‍රය— මහද්ව්‍යායාමයෙන් අභිනීහාරය සමෘඬවන බැවින් ද සමෘඬ වූ අභිනීහාර ඇති මහාපුරුෂයක්හුගේ උත්පත්තිය ද නොඑක් කප්කෙළ සුවහසෙක්හිදු දුලීභ බැවින් කෘච්ඡ්‍රය-දුලීභයි.

### —එරකපත්තනාගරාජවත්ථු—

## 14—1.

5. සබ්බපාපස්ස අකරණං, (කායාදිවාරත්‍රයෙන් සිඬවන්නා වූ ප්‍රාණවධාදි) සියලු අකුශලකර්මයාගේ නොකිරීම ද; කුසලස්ස උපසම්පදා, (ගේ හැර මහණ වූ තැන් පටන් රහත්ඵලයට පැමිණෙන තැන් දක්වා) සියලු ලෞකිකලොකොත්තරකුශලයාගේ ඉපදවීම ද උපදවනලද කුශලයාගේ වැඩීම ද; සචිත්තපරියොදපනං, පඤ්චනීවරණයන් කෙරෙන් තමාගේ සිත පිරිසුදු කිරීම ද යන; එතං, මේ සියල්ල; බුඩානං, සියලු බුදුවරයන්ගේ; සාසනං, අනුශාසනායි හෙවත්: අවවාදයි.

6. තිතික්ඛා ඛන්ති, (පරෙපකාරපරාපවාද ඉවැසීමය යන යම් මේ) අධිවාසනා ක්‍ෂාන්තියෙක් ඇත්ද හෝ තොමෝ; පරමං තපො, (ශීලාදිගුණධර්මයනට ප්‍රතිපක්‍ෂ වූ අකුශලධර්මයන් තවන හෙයින් මේ ශාසනයෙහි) උත්තම වූ තපසෙක; බුඩා, සියලු බුඩ

7. අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්තඤ්ච සයනාසනං
අධිචිත්තෙ ච ආයොගො එතං බුද්ධාන සාසනං. 185

8. න කහාපණවස්සෙන තිත්ති කාමෙසු විජ්ජති
අප්පස්සාදා දුඛා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතො. 186

---

ප්‍රත්‍යෙකබුද්ධඅනුබුද්ධයෝ; නිබ්බානං, ශාන්තිලක්ෂණ වූ නිර්වාණය; පරමං වදන්ති, (ශාන්තප්‍රණීතාදී සර්වාකාරයෙන්) උත්තමයයි කියති; පරූපඝාතී, පරහට හිංසාකරනසුලු වූයේ හෙවත්: අනුන් දිවි නසනසුලු වූයේ; පබ්බජිතො න හොති, (**"පබ්බාජයන්තො මලං තස්මා පබ්බජිතොති වුච්චති"** යන ප්‍රව්‍රජිත ලක්ෂණ නැති හෙයින්) පැවිදි නම් නො වෙයි; පරං විහෙඨයන්තො, (පාණිප්‍රහාරාදියෙන්) පරහට වෙහෙස දෙන්නේ ද; සමණො න හොති (**"සමිතත්තා හි පාපානං සමණොති පවුච්චති"** යන ශ්‍රමණ ලක්ෂණ නැති හෙයින්) මහණ නම් නො වන්නේයි.

6. අනූපවාදො, (ජාත්‍යාදීන් පරහට ආක්‍රොශාදිවශයෙන් වචසින්) උපවාදයක් නො කිරීම ද; අනූපඝාතො, (පාණිප්‍රහාරාදිවශයෙන් පරහට කයින්) උපඝාතයක් නො කිරීම ද; පාතිමොක්ඛෙ, ප්‍රාතිමොක්ෂ සංවරශීලයෙහි; සංවරො ච, සංවරය ද හෙවත්: රක්ෂාව ද; භත්තස්මිං, ආහාරයෙහි; මත්තඤ්ඤුතා ච, මාත්‍රඥ බවද; (හෙවත්: අහරපිරියෙස්නෙහි ද පිළිගැන්මෙහි ද වැළඳීමෙහි ද පරහට දීමෙහි ද පමණ දන්නා බව ද නොහොත්: ධැමින් සෙමෙන් උපන් සතරපසය පස්විකා වළඳකරන බව ද;) පන්තඤ්ච සයනාසනං, ජනවිවික්ත වූ ප්‍රාන්තශයනාසනයෙහි අභිරතිය ද හෙවත්: ගමට දුරු වූ ගැඹුරුවල්හි වූ සෙනස්නෙහි ඇල්ම ද; අධිචිත්තෙ, රූපාරූප අෂ්ටසමාපත්තියෙහි; ආයොගො ච, සතතයෙන් යෙදීම ද යන; එතං, මේ සියල්ල; බුද්ධානං, සියලු බුදුවරයන්ගේ; සාසනං, අනුශාසනායි-අවවාදයි.

## ආනන්දත්ථෙරවත්ථු

### 14—5.

8. කහාපණවස්සෙන, කාර්ෂාපණවර්ෂයෙනුදු (හෙවත්: ආකාශය බලා අපොළොපු කල දොළොස් යොදනක් තන්හි හිණු මසක් පමණ වස්නා සත්රුවන් වැස්සෙනුදු); කාමෙසු, වස්තුකාම ක්ලෙශකාමයෙහි; තිත්ති, තෘප්ති තොමෝ; න විජ්ජති, නො වන්නීය; කාමා, වස්තුකාමක්ලෙශකාමයෝ; අප්පස්සාදා, (ස්වප්නයෙන් දූ පැණක් මෙන්) ආස්වාද රහිතයහ; දුඛා, දුක්ඛස්කන්ධ

9. අපි දිබ්බෙසු කාමෙසු රතිං සො නාධිගච්ඡති
තණ්හක්ඛයරතො හොති සම්මාසම්බුද්ධසාවකො. 187

10. බහුං වෙ සරණං යන්ති පබ්බතානි වනානි ච
ආරාමරුක්ඛචෛත්‍යානි මනුස්සා භයතජ්ජිතා. 188

11. නෙතං ඛො සරණං ඛෙමං නෙතං සරණමුත්තමං
නෙතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති. 189

---

සූත්‍රයෙහි ආ දුක්ඛයන්ගේ වශයෙන්) බොහෝ දුක් ඇත්තාහ; පණ්ඩිතො, නුවණැති මහණතෙමේ; ඉති විඤ්ඤාය, (කාමයෝ ආස්වාදරහිතයහ බොහෝ දුක් ඇත්තාහ යි) මෙසේ දැන-

9. දිබ්බෙසු කාමෙසු අපි, (මානුසක කාමයන් තබා) දිව්‍ය වූ පඤ්චකාමයෙහි ද; සො, ඒ (නුවණැති මහණ තෙමෙ); රතිං, ඇල්මකට; නාධිගච්ඡති, නො පැමිණෙන්නේය; සම්මාසම්බුද්ධසාවකො, සම්‍යක්සම්බුද්ධයාගෙ ශ්‍රාවක වූ නුවණැතිමහණතෙමෙ; තණ්හක්ඛයරතො හොති, තෘෂ්ණාවගෙ ක්ෂයාන්තයෙහි උපන් හෙයින් තණ්හක්ඛය නම් වූ අර්හත්ඵලයෙහි ද තෘෂ්ණාක්ෂයට නිමිත්තහෙයින් තණ්හක්ඛය නම් වූ නිර්වාණයෙහි ද අභිරත වන්නේ යි-ඒ පතමින් කැමැති වෙමින් වසන්නේ යි.

## අනභිරත භික්ඛුස්ස වත්ථු

11—6.

10. භයතජ්ජිතා, රාජභයාදි ඒ ඒ භයින් තැතිගත්; බහු මනුස්සා, බොහෝ මිනිස්සු; නොහොත්: භයතජ්ජිතා, රාජභයාදි ඒ ඒ භයින් තැතිගත්; මනුස්සා, මිනිස්සු; බහු, බොහෝ වූ; පබ්බතානි, (ඉසිගිලි වෙපුල්ල වෙභාරාදි)පර්වතයන් ද; වනානි ච; (සුභගවන මහාවන ගොසිඞ්ගසාලවනාදි) වනයන් ද; ආරාම, වෙළුවන ජීවකම්බවනාදි) ආරාමයන් ද; රුක්ඛචෛත්‍යානි, (උදයනචෛත්‍ය ගොතමකචෛත්‍යාදි)චෛත්‍යවෘක්ෂයන් ද; වෙ, එකාන්තයෙන්; සරණං යන්ති,(ඒ ඒ භයින් මිදෙනු කැමැත්තාහු ද පුත්‍රලාභාදිය පතන්නා හුද මොහු අපට ශරණයහයි) ශරණ යන්නාහ-සරණකොට සලකන්නාහ.

11. එතං සරණං, මෙකියනලද සියලු සරණය මැ; ඛෙමං න ක්ෂෙම නොවෙයි-නිරුපද්‍රව නිර්භය නො වෙයි; එතං සරණං, මෙකියනලද සියලු සරණය මැ; න උත්තමං, (මේ නිසා එක ද සත්ත්වයෙක්හු ජාතිජරාමරණින් නො මිදෙන හෙයින්) උත්තම ද

12

12. යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගතො
චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති. 190

13 දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං 191

14. එතං ඛො සරණං ඛෙමං එතං සරණමුත්තමං
එතං සරණමාගම්ම සබ්බ දුක්ඛා පමුච්චති. 192

---

නො වෙයි; එතං සරණං ආගම්ම, මෙකියනලද පර්වතාදිශරණයට පැමිණ; සබ්බදුක්ඛා, සියලු සංසාරදුක්ඛයෙන්; න මුච්චති, (සත්ව තෙමෙ කිසිකලෙකත්) නො මිදෙන්නේයි.

12. යො ච; යම් ගෘහස්ථයෙක් වත් ප්‍රව්‍රජිතයෙක් වත්; බුද්ධං ච, (සර්වධර්මයන් සර්වාකාරයෙන් මනාකොට දත්) සම්‍යක් සම්බුද්ධයා ද; ධම්මං ච, (ස්වාඛ්‍යාතාදිගුණොපෙතනෛර්‍යාණික) සද්ධර්මය ද; සඞ්ඝං ච; (සුප්‍රතිපන්නතාදි ගුණගණාඞ්ගසංගත) අෂ්ටාර්‍ය්‍යපුද්ගලසඞ්ඝයා ද; සරණං ගතො, සරණ ගියේ ද,(භවත්: මේ රත්නත්‍රය මැ මට සරණය යි මාර්ගාගතශරණගමන වශයෙන් සරණ යයි ගත්තේ වේ ද;) චත්තාරි අරියසච්චානි, චතුරාර්‍ය්‍ය සත්‍යයන්; සම්මා,මනාකොට; පඤ්ඤාය පස්සති,විදර්ශනාඥානචක්ෂු සින් දක්නේවේ ද.

13. දුක්ඛං, (ත්‍රෛභූමකවෘත්තසඞ්ඛ්‍යාත) දුඃඛසත්‍යය ද; දුක්ඛසමුප්පාදං,(ඒ දුඃඛසත්‍යය උපදවන්නා වූ තෘෂ්ණා සඞ්ඛ්‍යාත) සමුදයසත්‍යය ද; දුක්ඛස්ස, ඒ දුඃඛසත්‍යයාගේ; අතික්කමං ච, ඉක්මීමට කාරණ වූ නිර්වාණසඞ්ඛ්‍යාත නිරොධසත්‍යය ද; දුක්ඛූප සමගාමිනං, දුක්ඛනිරොධයට පමුණුවන්නා වූ; අරියං, උත්තමවූ; අට්ඨඞ්ගිකං මග්ගං ච, සම්‍යග්දෘෂ්ට්‍යාදි අෂ්ටාඞ්ගික මාර්ගසඞ්ඛ්‍යාත මාර්ගසත්‍යය ද මනාකොට නුවණැසින් දක්නේ වේ ද.[1]

14. එතං ඛො සරණං, (රත්නත්‍රය ශරණ නාමය චතුරාර්‍ය්‍ය සත්‍යයන් මනාකොට දක්මය යන)මේ සරණය;ඛෙමං, ක්ෂෙමය- නිර්භයය;එතං සරණං, මේ කියනලද සරණය; උත්තමං, (සර්ව දුක්ඛනිශ්ශරණයට කාරණ හෙයින්) උත්තමය; එතං සරණං ආගම්ම, මේ සරණය ට පැමිණ; සබ්බදුක්ඛා පමුච්චති, සත්ව තෙමෙ සියලු සංසාර දුක්ඛයෙන් මිදෙන්නේයි.

**කොසලරජ්ජුරුවන් පුරොහිත අග්ගිදත්ත බ්‍රාහ්මණවස්තු.**

---

1 දක්නේවේද-මු.

15. දුල්ලභො පුරිසාජඤ්ඤො න සො සබ්බත්ථ ජායති
යත්ථ සො ජායති ධීරො තං කුලං සුඛමෙධති. 193

16. සුඛො බුද්ධානං උප්පාදො සුඛා සද්ධම්මදෙසනා
සුඛා සඞ්ඝස්ස සාමග්ගී සමග්ගානං තපො සුඛො. 194

---

## 14—7.

15. පුරිසාජඤ්ඤො, පුරුෂාජානෙය වූ හෙවත්: උත්තමපුරුෂ වූ සම්‍යක්සම්බුද්ධ තෙමෙ; දුල්ලභො, දුර්ලභය (හස්ත්‍යාජානෙයාදීන් මෙන් සුලභ නො වන්නේය); සො, ඒ පුරුෂාජානෙය වූ සම්‍යක් සම්බුද්ධ තෙමෙ; සබ්බත්ථ න ජායති, (ප්‍රත්‍යන්තදෙශයෙහි ද නීච කුලයෙහි ද නූපදනා හෙයින්) හැමතැන්හි මැ උපදනේ නො වෙයි; (මධ්‍යදෙශයෙහි මැ උපදනේයි එහිදු මහාජනයා විසින් වැන්ද පිදියයුතු වූ ලොකසම්මත වූ ක්‍ෂත්‍රියබ්‍රාහ්මණකුලයෙහි මැ උපදනේය එසේ උපදනා වූද;) සො ධීරො, ඒ ප්‍රාඥවූ සම්‍යක් සම්බුද්ධ තෙමෙ; යත්ථ ජායති, යම් යම් ක්‍ෂත්‍රියබ්‍රාහ්මණකුලයෙකැ උපදනේ වේ ද; තං කුලං, ඒ කුලය; සුඛං එධති, සුවයට පැමිණෙන්නේයි-සැපතින් වැඩෙන්නේයි

ආනන්දත්ථෙරස්ස පුච්ඡිතපඤ්හවත්ථු.

## 14—8.

16. බුද්ධානං, සම්‍යක් සම්බුද්ධවරයන්ගේ; උප්පාදො, ඉපැද්ම; සුඛො, සුවයැ; (යම් හෙයකින් බුදුවරයෝ ලොකයෙහි උපදනාහු නම් සත්‍වයෝ ජාතිකාන්තාරාදියෙන් එතර කොට නිවන්පුර යෙහි පිහිටුවත්ද එහෙයින් ඔවුන්ගේ ලොකයෙහි ඉපැද්ම ලොවී ලොවුතුරු සුවයට කාරණහෙයින් සුවයැ;) සද්ධම්මදෙසනා, සද්ධර්ම දෙශනා ද; සුඛා, සුවයැ; (යම්හෙයකින් සද්ධර්මශ්‍රවණයට පැමිණි සත්‍වයෝ ජාතිජරාමරණින් මිදෙත්ද එහෙයින් සද්ධර්මදෙශනාද සුවයට කාරණ හෙයින් සුවයැ;) සඞ්ඝස්ස, සඞ්ඝයාගෙ; සාමග්ගී, සමගබැව් වූ එක්සිත් බැව්; සුඛා, සුවයැ; (යම්හෙයකින් සඞ්ඝයා ගෙ සමඟබව සියලු දෙවුම්නිසුන්ට හිත පිණිස සුව පිණිස වැටේ ද එහෙයින් සඞ්ඝයාගෙ සාමග්‍රිය සුවයැ;) සමග්ගානං, සමඟ වූ භික්‍ෂූන්ගෙ; තපො, තපස ද; සුඛො, සුවයි; (යම්හෙය කින් භික්‍ෂූන්ගෙ සමඟබව බුද්ධවචනය උගන්නට ද ධුතඞ්ග පරිහරණය කරන්නට ද මහණධම් කරන්නට ද පිළිවන්ද එහෙයින් සුවයැ යී සේයි.)

සම්බහුලානං භික්ඛූනං වත්ථු.

17. පූජාරහෙ පූජයතෙ බුද්ධෙ යදි ව සාවකෙ
පපඤ්චසමතික්කන්තෙ තිණ්ණසොකපරිද්දවෙ. 195

18. තෙ තාදිසෙ පූජයතො නිබ්බුතෙ අකුතොභයෙ
න සක්කා පුඤ්ඤං සඞ්ඛාතුං ඉමෙත්තමිති කෙනචි. 196

### බුද්ධවග්ගො චුද්දසමො.

### පඨමකභාණවාරං.

1. සුසුඛං වත ජීවාම වෙරිනෙසු අවෙරිනො
වෙරිනෙසු මනුස්සෙසු විහරාම අවෙරිනො. 197

---

## 14—9.

17. පූජාරහෙ, පූජාර්හ වූ (හෙවත්: ප්‍රත්‍යයපූජාවට ද ප්‍රතිපත්තිපූජාවට ද සුදුසු වූ); පපඤ්චසමතික්කන්තෙ, තෘෂ්ණාප්‍රපඤ්චය දෘෂ්ටිප්‍රපඤ්චය මානප්‍රපඤ්චය යන ත්‍රිවිධප්‍රපඤ්චයන් මනා කොට ඉක්මුණා වූ; තිණ්ණසොකපරිද්දවෙ, ඉක්මුණා වූ ශොකපරිදෙව ඇති (හෙවත්: ශොකපරිදෙවදුඃඛයෙන් එතර වැ ගියා වූ); බුද්ධෙ, බුදු පසේබුදුන් ද; යදි වා, නොහොත්; සාවකෙ, බුදුසවුවන් ද; පූජයතෙ, වන්දනමානනාදියෙන් ද චතුර්විධප්‍රත්‍යයෙන් ද යමෙක් පුදද.

18. නිබ්බුතෙ, රාගාදි කෙලෙස්ගිනි නිවීමෙන් නිවිසිත් ඇති; අකුතොභයෙ, කිසි භයකින් වත් අරමුණකින් වත් භය නැත්තා වූ; තාදිසෙ, එබඳු වූ හෙවත්: මෙකියනලද ගුණයෙන් යුක්තවූ; තෙ, ඒ බුදුපසේබුදු සවුවන්; පූජයතො, (ධ්‍රියමාන[1] කල්හි ද පිරිනිවිකල්හි ද) පුදන්නහුගේ; පුඤ්ඤං, පින්කම්; ඉමං එත්තං ඉති, මේ මෙතෙකැයි; සඞ්ඛාතුං, ගණන්නට; (හෙවත්: බුද්ධාදීන් පුදන්නහුගේ කුශල විපාකය ගණන්නට වත් කිරන්නට වත් මනන්නට වත්;) කෙනචි අපි, (දිව්‍යබ්‍රහ්මාදි) කිසි පුද්ගලයකු විසිනුදු; න සක්කා, නොපිළිවනි.

### කස්සපදසබලස්ස සුවණ්ණචෙතියවත්ථු.

### බුද්ධවග්ගො චුද්දසමො.

### පඨමකභාණවාරං.

---

## 15—1.

1. වෙරිනෙසු, මනුස්සෙසු, (ප්‍රාණවධාදි පඤ්චවිධවෛරයෙන්) වෛරීවූ මනුෂ්‍යයන් අතුරෙහි; අවෙරිනො, (දුශ්චරිතවෛරයෙන්) අවෛරි වූ ඇපි; මනුස්සෙසු, මනුෂ්‍යයන්; වෙරිනෙසු, පඤ්චවිධදුශ්චරිතවෛරයෙන්) වෛරී වැ පවත්නාකල්හි; අවෙරිනො විහරාම, (දුශ්චරිතවෛරයෙන්) අවෛරී වැ වසමෝ ද (එසේ වූ ඇපි); වත, එකාන්තයෙන්; සුසුඛං ජීවාම, ඉතා සුවසේ ජීවත්වමු.

---

1 ජීවමාන-මූ.

2\. සුසුඛං වත ජීවාම ආතුරෙසු අනාතුරා
ආතුරෙසු මනුස්සෙසු විහරාම අනාතුරා. 198

3\. සුසුඛං වත ජීවාම උස්සුකෙසු අනුස්සුකා
උස්සුකෙසු මනුස්සෙසු විහරාම අනුස්සුකා. 199

4\. සුසුඛං වත ජීවාම යෙසං නො නත්ථි කිඤ්චනං
පීතිභක්ඛා භවිස්සාම දෙවා ආභස්සරා යථා. 200

5\. ජයං වෙරං පසවති දුක්ඛං සෙති පරාජිතො
උපසන්තො සුඛං සෙති හිත්වා ජයපරාජයං. 201

---

2. ආතුරෙසු මනුස්සෙසු,(ක්ලේශව්‍යාධියෙන්) ආතුරවූ මනුෂ්‍යයන් අතුරෙහි; අනාතුරා, (ක්ලේශව්‍යාධියෙන්) ආතුර නො වැ පවත්නා වූ ඇපි; මනුස්සෙසු, මනුෂ්‍යයන්; ආතුරෙසු,(ක්ලේශව්‍යාධියෙන්) ආතුරවැ පවත්නාකල්හි; අනාතුරා විහරාම,(ක්ලේශව්‍යාධියෙන්)ආතුර නො වැ වසමෝ ද (එසේ වූ ඇපි);වත, ඒකාන්තයෙන්; සුසුඛං ජීවාම; ඉතා සුවසේ ජීවත්වමු.

3. උස්සුකෙසු මනුස්සෙසු,පඤ්චකාමගුණපරියෙසනයෙහි උත්සාහවත් වූ මනුෂ්‍යයන් අතුරෙහි; අනුස්සුකා, පඤ්චකාමගුණපරියෙසනයෙහි නිරුත්සාහ වූ ඇපි; මනුස්සෙසු, මනුෂ්‍යයන්; උස්සුකෙසු, පඤ්චකාමගුණපරියෙසනයෙහි උත්සාහවත් වැ පවත්නා කල්හි ද;අනුස්සුකා විහරාම, පඤ්චකාමගුණපරියෙසනයෙහි නිරුත්සාහ වැ වසමෝ ද(එසේ වූ ඇපි); වත, ඒකාන්තයෙන්; සුසුඛං ජීවාම, ඉතා සුවසේ ජීවත්වමු.

### ඤාතකානං කලහවූපසමනවත්ථු

### 15—2.

4. යෙසං නො, යම් බඳු වූ අපට; කිඤ්චනං නත්ථි, (සත්වයන් මඩනා අර්ථයෙන් කිඤ්චන නම් වූ) රාගාදි කිසි පලිබොධයෙක් නැත්ද (එසේවූ ඇපි); වත, ඒකාන්තයෙන්; සුසුඛං ජීවාම, ඉතා සුවසේ ජීවත් වමු; ආභස්සරා දෙවා යථා, ආභස්සර බ්‍රහ්මයන් මෙන්; පීතිභක්ඛා භවිස්සාම, ප්‍රීතිය මැ අහරකොට ඇත්තමෝ වමු-ප්‍රීතිය මැ අනුභවකොට වසම්හ යී සේයි.

### මාරයස වත්ථු

### 15—3.

5. ජයං, මෙරමා දිනන්නේ (හෙවත්: දූ කෙළිමෙන් සටන් කිරීමෙන් යුක්ති බිඳීම් ආදියෙන් අනුන් පරදවන්නේ); වෛරං

6. නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො කලි
නත්ථිඛන්ධාදිසා දුක්ඛා නත්ථි සන්තිපරං සුඛං. 202

7. ජිඝච්ඡා පරමා රොගා සඞ්ඛාරපරමා දුඛා
එතං ඤත්වා යථාභූතං නිබ්බානං පරමං සුඛං. 203

---

පසවති, වෛර උපදවයි (වෛරීන් ඇති කෙරෙයි); පරාජිතො, අනුන් විසින් පරදවනලද්දේ; දුක්ඛං සෙති, (කවර දවසෙක සතුරු පිටි දක්නගෙම්ද්දෙහෝ යි සිතන්නේ සතරඉරියව්වෙහිමැ) දුකසේ වසන්නේයැ; උපසන්තො, සන්හුන් රාගාදිකෙලෙශයන් ඇති ක්ෂීණාශ්‍රව තෙමේ; ජය පරාජයං හිත්වා, ජයපරාජය දෙක මැ හැර; සුඛං සෙති, (සතර ඉරියව්වෙහි මැ) සුවසේ වසන්නේයි.

### කොසලරඤ්ඤො පරාජයස්ස වත්ථු

### 15—4.

6. රාගසමො අග්ගි, රාගය හා සම වූ ගින්නෙක්; නත්ථි, නැති; (දුමක් වත් ගිනිසිළක් වත් සාලගුරක් වත් නො දක්වා ඇතුළත්හි මැ සිටැ සතුන් දවා හළුම්වක්[1] කරන්නට සමර්ථ වූ අනික් ගින්නක් නැතිහෙයින් රාග ගින්න හා සමවූ අනික් ගින්නෙක් නැති;) දොසසමො කලි, වෙෂය හා සම වූ අපරාධයෙක්; නත්ථි, නැති; (වෙෂයාගේ අනිවරණාවස්ථාවක් නැති හෙයින් සියුම් වැ උපන් වෙෂය නිසා ධ්‍යානාභිඥයෙන් පිරිහෙන හෙයින් වෙෂය හා සම වූ අනික් අපරාධයෙක් නැති;) ඛන්ධාදිසා දුක්ඛා, පඤ්ච ස්කන්ධයන් හා සම වූ දුක්ඛයෙනෙක්; නත්ථි, නැති; (පරිහරණය කරනලද්දුම වූ ස්කන්ධයෝ යම්සේ දුක්හු ද එසේ වූ අනික් දුක්ඛ කෙනෙක් නැති;) සන්තිපරං සුඛං, නිර්වාණයට වැඩි අනික් සුවයෙක් නම්; නත්ථි නැති; (සෙසු සුව සුව නම් මෙ වෙයි පරම, සුව නම් නො වෙයි, නිර්වාණය වූ කලි සියලු සුවයට වඩා උත්තම සුවයක් හෙයින් පරම සුව නම් වෙ යී සේයි.

### අඤ්ඤතරකුලදාරිකාය වත්ථු

### 15—5.

7. රොගා, (අටඅනූවක් පමණ වූ සියලු) රොගයෝ ජිඝච්ඡා පරමා, ජිගච්ඡාව උතුම් කොට ඇත්තාහ; (සෙසු රොගයො තාක් එකවරෙක පිළියම් කළ කල නස්නාහු හෝ වෙති යැපී යන්නාහු හෝ වෙති-සාදුක් නමැති රොගය වූ කලි සතතයෙන් මැ

---

1. හසම-මු.

8. ආරොග්‍යපරමා ලාභා සන්තුට්ඨිපරමං ධනං
විස්සාසපරමා ඤාති නිබ්බානං පරමං සුඛං. 204

9. පවිවෙකරසං පීත්වා රසං උපසමස්ස ච [1]
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිබං. 205

---

පිළියම් කට යුතු බැවින් සෙසු රොගයනට වඩා උත්තම රොග නම් වෙයි;) දුඛා, සියලු කායිකචෛතසිකදුඃඛයෝ තාක්; සංඛාර පරමා, පඤ්චස්කන්ධයන් ප්‍රධාන කොට ඇත්තාහ; එතං, (සාදුක් හා සමවූ රොගයෙක් නැත ස්කන්ධපරිහරණය හා සම වූ අතික් දුකෙක් නැත යන) මේ දෙක; යථාභූතං ඤත්වා, වූ පරිද්දෙන් දැනැ (ප්‍රාඥයෝ නිවන් පසක් කෙරෙති එහෙයින්); නිබ්බානං, නිර්‍වාණය තෙම; පරමං සුඛං, (ස්කන්ධපරිහරණයයි කියනලද දුක් නැති හෙයින් උත්තම වූ සුවයෙකි.

## අඤ්ඤතර උපාසකස්ස වත්ථු.
### 15—6.

8. ලාභා, සියලු ලාභයො තාක්; ආරොග්‍යපරමා, නිරොගිබව ප්‍රධාන කොට ඇත්තාහ-(රොගීහු ලද ලාභයෝ ද ලාභ නම් නොවෙත්නුයි) නිරොගි බව මැ උත්තම ලාභ නම් වෙයි; ධනං, ධනය තෙම; සන්තුට්ඨිපරමං, සන්තුෂ්ටිය ප්‍රධාන කොට ඇත් තේයැ (යම් ධනයෙක් තමා විසින් ලබනලද ද යම් ධනයෙක් තමා සතුද එයින් මැ සතුටුවනබව සෙසු ධනයට වඩා උතුම් ධන යෙක;) ඤාති, නෑයෝ නම්; විස්සාසපරමා, විශ්වාසය ප්‍රධාන කොට ඇත්තාහ; (මවු පියෝද යමකු හා විශ්වාස නැත් නම් හෙතෙමෙ නොනෑමෙයැ යමෙක් වනාහි නො නෑවුවද විස්වස් වී නම් හේ උතුම් නෑය;) නිබ්බානං, නිර්‍වාණය; පරමං සුඛං, උතුම් වූ සුවයෙකි; (යම්හෙයකින් නිවන් හා සම වූ සුවයෙක් නැත්ද එහෙයින් නිර්‍වාණය උතුම් සුවයෙකි.)

## පසෙනදිකොසලස්ස වත්ථු.
### 15—7.

9. පවිවෙකරසං, කායචිත්තවිවෙකයෙන් උපන් සුඛසොම නස්සයයි කියනලද රසය ද; උපසමස්ස ච [1] රසං, ක්ලෙශව්‍යුප ශමයයි කියනලද නිර්‍වාණයාගේ රසය ද; පීත්වා, බී-(දුඃඛසත්‍යය පරිජ්ඤනාදීන් කෙරෙමින් ආලම්බනකරණයෙන් ද ප්‍රත්‍යක්ෂ

---

1 උපසමෙස්ස ච.

10. සාහු[1] දස්සනමරියානං සන්නිවාසො සදා සුඛො
අදස්සනෙන බාලානං නිච්චමෙව සුඛී සියා. 206

11. බාලසඞ්ගතචාරීහි දීඝමද්ධාන සොචති
දුක්ඛො බාලෙහි සංවාසො අමිත්තෙනෙව සබ්බදා
ධීරො ච සුඛසංවාසො ඤාතීනංව සමාගමො. 207

---

කරණයෙන් ද) අනුභව කොට; ධම්මපීතිරසං පිබං, නවලොකොත්තර ධර්මවශයෙන් උපන් ප්‍රීතිරසය බොන්නාවූ ක්‍ෂීණාශ්‍රව මහණ තෙම; නිද්දරො හොති, (මේ උභයරසපානයෙන් රාග දරථාදීන් නැති හෙයින්) පීඩා රහිත ද වන්නේ යැ; නිප්පාපො හොති, නිෂ්පාප ද වන්නේ යි.

## අඤ්ඤතරහික්ඛුස්ස වත්ථු

## 15—8.

10. අරියානං, බුද්ධාදිආර්‍යයන්ගේ; දස්සනං, දැක්ම; සාහු,[1] මැනැවි; (බුදු පසේබුදු බුදුසව්වග යන සත්පුරුෂයන් මසැසින් දැක්ම ද නුවණැසින් දැක්ම ද යහපත-හුදෙක් දර්‍ශනය මතු නො වෙයි;) සන්නිවාසො, ඔවුන් හා සමඟ එකතැන විසීම ද (ඔවුන් වැදැ පුදා ගැන්ම ද වතාවත් කොට ගැන්ම ද); සදා, හැමකල්හි මැ; සුඛො, සුවය; බාලානං, (මෙලෝපරලෝ වැඩ නොදන්නා වූ) අඥානයන්ගේ; අදස්සනෙන, නො දැක්ම හෙතු කොට ගෙනැ; නිච්චං එව, සතතයෙන් මැ; සුඛී සියා, සත්වතෙමෙ සුඛිත වන්නේයැ.

11. හි, එසේ මැයි; බාලසංගතචාරී, බාලයන් හා එක් වැ ඇවිදිනා සුලු වූ යේ; දීඝං අද්ධානං, දීර්ඝකාලයක්; සොචති, ශොක කරන්නේයි;(බාලයා හා යහළු වූ යේ උමං බිඳිනට වරෙ මං පහරනට වරෙ යනාදීන් ඒ ඒ නො කටයුත්තෙහි යොදනලද්දුව ඔහු හා සමඟ ඒ ඒ වරද කරන්නේ මෙලොවැ අත් පා කැපීම් ආදියට ද පරලොවැ නරක දුක් ආදියට ද පැමිණැ බොහෝ කලක් සොස්නේයි;) බාලෙහි සංවාසො, බාලයන් හා එක් වැ විසීම; අමිත්තෙන ඉව, (කඩුගත් අත් ඇති) පසමිතුරකු හා සමඟ වාසයක් මෙන්; සබ්බදා, හැමකල්හි මැ; දුක්ඛො, දුක; ධීරො ච, ප්‍රාඥ වනාහි; ඤාතීනං සමාගමො ඉව, (ප්‍රිය වූ) නෑයන්ගේ සමාගමයක් මෙන්; සුඛසංවාසො, සුව වූ සහවාසය ඇත්තේය.

---

1 සාධු.

12. තස්මා හි, ධීරඤ්ච පඤ්ඤඤ්ච බහුස්සුතඤ්ච
ධොරය්හසීලං වතවන්තමාරියං
තං තාදිසං සප්පුරිසං සුමෙධං
භජෙථ නක්ඛත්තපථංව චන්දිමා'ති. 208

—සුඛවග්ගො පණ්ණරසමො.—

1. අයොගෙ යුඤ්ජමත්තානං යොගස්මිඤ්ච අයොජයං
අත්ථං හිත්වා පියග්ගාහී පිහෙතත්තානුයොගිනං. 209

---

12. තස්මා හි, එහෙයින් (හෙවත්: යම්හෙයකින් නුවණනැත්තවුන් හා සහවාසය දුක් ද නුවණැත්තවුන් හා සහවාසය සුව ද එහෙයින්);–ධීරං ච,(ධෘතිසම්පන්නවූ)ධීරයා ද;පඤ්ඤං ච,(ලෞකික ලොකොත්තරප්‍රඥයෙන් යුක්ත වූ) ප්‍රාඥයා ද; බහුස්සුතං ච, (ආගමාධිගමසම්පන්නවූ)බහුශ්‍රැතයා ද; ධොරය්හසීලං,(රහත්ඵලයට පමුණුවන ප්‍රතිපත්තිධුරය උසුලනසුලුබැවින්) ධුරවහන ශීලය ද; වතවන්තං, (ශීලව්‍රතයෙන් ද ධුතාඞ්ගව්‍රතයෙන් ද යුක්ත වූ) ව්‍රතසම්පන්නයා ද; ආරියං, (කෙලෙසුන් කෙරෙන් දුරු වූ) ආර්‍ය්‍යයා ද යන; සුමෙධං, සුන්දර වූ ප්‍රඥ ඇති; තාදිසං, එබඳු වූ; තං සප්පුරිසං, ඒ සත්පුරුෂයා; නක්ඛත්තපථං චන්දිමා ඉව, (නිර්මල වූ) අකාශපථය සෙවුනා වූ චන්ද්‍රයා මෙන්; භජෙථ, සෙවුනේ යි.

—සක්කදෙවරාජවත්ථු.—

## —සුඛවග්ගො පණ්ණරසමො—

### 16—1.

1. අත්තානං, තමා; අයොගෙ, (නො යෙදියැයුතු වූ වෙසිය ගොචරාදි ෂඩ්විධඅගොචරසෙවනයයි කියනලද) අයොනිසොමනසිකාරයෙහි; යුඤ්ජං,යෙදෙන්නා වූ ද; යොගස්මිං,(කියනලද) අයොනිසොමනසිකාරයෙහි; අයොජයං ච, නො යෙදෙන්නා වූද පුද්ගලතෙමෙ; අත්ථං හිත්වා, (පැවිදිවූතැන් පටන් හික්මියැයුතු වූ අධිශීලාදිශික්ෂාත්‍රයසංඛ්‍යාත)අර්ථය හැරපියා; පියග්ගාහී, (පඤ්චකාමගුණයයි කියනලද)ප්‍රියය මැ ගන්නාසුලු වූයේ; අත්තානුයොගිනං, ආත්මාර්ථයෙහි යෙදුණහු; පිහෙති, පතන්නේයි; (තමාගේ විප්‍රතිපත්තිය හෙතුකොට ගෙනැ ශාසනයෙන් චුතවැ ගිහිභාවයට පැමිණියේ පසු වැ යම්කෙනෙක් ආත්මාර්ථයෙහි යෙදී ශීලාදිගුණසම්පාදනයකොට දෙවිමිනිසුන්ගෙන් පූජාසත්කාර ලැබෙත් ද ඔවුන් දැකැ: මමත් මෙබඳුවිම් නම් යෙහෙකැ යි මෙසේ ඔවුන් පතන්නේයි, කැමැතිවන්නෙයැ යී සේයි.)

2. මා පියෙහි සමාගඤ්ජී අප්පියෙහි කුදාචනං
පියානං අදස්සනං දුක්ඛං අප්පියානඤ්ච දස්සනං. 210

3. තස්මා පියං න කයිරාථ පියාපායො හි පාපකො
ගන්ථා තෙසං න විජ්ජන්ති යෙසං නත්ථි පියාප්පියං. 211

4 පියතො ජායතී සොකො පියතො ජායතී භයං
පියතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං. 212

---

2. පියෙහි, ප්‍රිය වූ පුත්‍රදාරදාසිදාසගවමහිෂාදි සත්ත්වයන් හා ද ස්වර්ණරජතමණිමුක්තාදිසංස්කාරයන් හා ද; අප්පියෙහි, අප්‍රිය යන් හා ද; කුදාචනං, කිසිකලෙක්හිදු (හෙවත්: එකවරෙක ද); මා සමාගඤ්ජී, (තෘෂ්ණාසංඛ්‍යාතවශයෙන්) සමාගමය නො කරන් නේයි; (කුමක් පිණිස ද යත්?) පියානං, ප්‍රියවූ සත්ත්වයන්ගේ ද සංස්කාරයන්ගේ ද; අදස්සනං, (වියොගවශයෙන්) නො දැක්ම; දුක්ඛං, දුක; අප්පියානං, අප්‍රිය වූ සත්ත්වයන්ගේ ද අප්‍රියවස්තුව කගේ ද අප්‍රිය සංස්කාරයන්ගේ ද; දස්සනං,(සමීපයට එළඹීම් වශ යෙන්) දැක්ම ද; දුක්ඛං, දුකි.

3. තස්මා, එහෙයින් (යම්හෙයකින් ප්‍රියයන්ගේ නො දැක්ම ද අප්‍රියයන්ගේ දැක්ම ද යන දෙක මැ දුක්ද එහෙයින්); පියං න කයිරාථ, (කිසිසත්ත්වයකුවත් සංස්කාරයක් වත්) ප්‍රිය නො කරන්නේයි; හි, එසේ මැ යි; පියාපායො, ප්‍රියවූ සත්ත්වයන්ගේ ද සංස්කාරයන්ගේ ද වියොගය; පාපකො, ලාමකයි; යෙසං, යම් ක්ෂීණාශ්‍රවකෙනෙකුන්ට; පියාප්පියං නත්ථි, ප්‍රියවස්තුයෙකුදු අප්‍රිය වස්තුයෙකුදු නැත්ද; තෙසං, ඔවුන්ට; ගන්ථා න විජ්ජන්ති, අභි ධ්‍යාකායග්‍රන්ථාදි චතුර්විධකායග්‍රන්ථයෝ ද නැත්තාහු යි; (යම් කෙනෙකුන්ට ප්‍රියවස්තුවෙක්නැත්ද ඔවුනට අභිධ්‍යාකායග්‍රන්ථය ප්‍රහීණ වෙයි, යම්කෙනෙකුන්ට අප්‍රියවස්තුවෙක් නැත් ද ඔවුනට ව්‍යාපාදකායග්‍රන්ථය ප්‍රහීණවෙයි, ඔවුන් දෙදෙන ප්‍රහීණවූ කල්හි ඉතිරි දෙදෙන මැ ප්‍රහීණ වෙති, එහෙයින් කිසි වස්තුවක් තමහට ප්‍රිය ද අප්‍රිය ද නො කට යුතුයැ යනු භාවයි.)

—තිණ්ණං භික්ඛූනං වත්ථු—

16—2.

4. සොකො, (සංසාරවට්ටය මුල්කොට ඇති) යම් කිසි ශොක යෙක් උපදනේ වේ ද[1] හෙතෙමෙ; පියතො ජායති, ප්‍රියවූ මැ සත්ත්වයකු වත් සංස්කාරයක්වත් නිසා උපදනේයැ; භයං, (එසේමැ

---

1 වේ නම්

5. පෙමතො ජායතී සොකො පෙමතො ජායති භයං
පෙමතො විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං. 213

6. රතියා ජායතී සොකො රතියා ජායතී භයං
රතියා විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං. 214

---

සංසාරවට්ටය මූල් කොට ඇති) යම්කිසිභයෙක් උපදනේ වේද හෙ තෙමෙ; පියතො ජායති, ප්‍රිය වූ සත්වයකුවත් සංස්කාර යක්වත් නිසා උපදනේයැ (එහෙයින්); පියතො විප්පමුත්තස්ස, ප්‍රියවස්තුයෙන් මුක්ත වූ සිත් ඇත්තාහට; සොකො නත්ථි, (කිසි) ශොකයෙක් නැත;භයං, භය තෙමෙ; කුතො,කොයින් මෙවේදූ? (ප්‍රිය වස්තූන් නිසා උපදනා භයෙක් කැළ මැ නැතැ යී සේයි.)

## අඤ්ඤතරකුටුම්බිකස්ස වත්ථු

### 16—3.

5. සොකො, (සංසාරවට්ටය මූල්කොටඇති යම් කිසි) ශොක යෙක් උපදනේ වේ ද හෙ තෙමෙ; පෙමතො ජායති, (පුත්‍රදාර දීන් කෙරෙහි කළ) ප්‍රේමය නිසා මැ උපදනේයැ; භයං, එසේ මැ සංසාරවට්ටය මූල්කොට ඇති යම්කිසි) භයෙක් උපදනේ වේ ද හෙතෙමෙ; පෙමතො ජායති, (පුත්‍රදාරාදීන් කෙරෙහි කළ) ප්‍රේමයනිසා මැ උපදනේය (එහෙයින්); පෙමතො විප්ප මුත්තස්ස, (පුත්‍රදාරාදීන් කෙරෙහි කළ) ප්‍රේමයෙන් මුක්තවූ සිත් ඇත්තාහට; සොකො නත්ථි, කිසි ශොකයෙක් නැත; භයං, භයතෙමෙ; කුතො, කොයින් මෙ වේ දූ? (ප්‍රේමයනිසා උපදනා භයෙක් කැල මැ නැතැ යී සේයි.)

## විසාඛාය වත්ථු

### 16—4.

6. සොකො, (සංසාරවට්ටය මූල්කොට ඇති යම්කිසි) ශොක යෙක් උපදනේ වේ ද හෙතෙමෙ; රතියා ජායති,(පඤ්චකාමගුණ) රතිය නිසා උපදනේයැ; භයං, (එසේ මැ සංසාරවට්ටය මූල් කොට ඇති යම් කිසි)භයෙක් උපදනේ වේ ද හෙතෙමෙ; රතියා ජායතී,(පඤ්චකාමගුණ)රතිය නිසා උපදනේයැ(එහෙයින්);රතියා විප්පමුත්තස්ස, (පඤ්චකාමගුණ) රතියෙන් මුක්ත වූ සිත්ඇත්තා හට; සොකො නත්ථි, (යම්කිසි) ශොකයෙක් නැත; භයං, භය තෙමෙ; කුතො, කොයින් මෙ වේ දූ? (පඤ්චකාමගුණරතිය නිසා උපදනා භයෙක් තෙමෙ කැල මැ නැතැ යී සේයි.)

## ලිච්ඡවීනං වත්ථු

7. කාමතො ජායතී සොකො කාමතො ජායතී භයං
කාමතො විප්පමුත්තස්ස නත්‍ථි සොකො කුතො භයං. 215

8. තණ්හාය ජායතී සොකො තණ්හාය ජායතී භයං
තණ්හාය විප්පමුත්තස්ස නත්‍ථි සොකො කුතො භයං. 216

9. සීලදස්සනසම්පන්නං ධම්මට්ඨං සච්චවෙදිනං
අත්තනො කම්ම කුබ්බානං තං ජනො කුරුතෙ පියං. 217

---

1‍6—5.

7. සොකො, (සංසාරවට්ටය මුල්කොට ඇති යම්කිසි) ශොක යෙක් උපදනේ වේ ද හෙතෙමෙ; කාමතො ජායති, (වස්තුකාම යෑ ක්ලෙශකාමයෑ යන මේ ද්විප්‍රකාර වූ)කාමය නිසා මැ උපදනේයෑ; භයං, (එසේමැ සංසාරවට්ටය මූල්කොට ඇති යම්කිසි) භයෙක් උපදනේ වේ ද හෙතෙමෙ; කාමතො ජායති, (වස්තුකාමයෑ ක්ලෙශකාමයෑ යන මේ ද්විප්‍රකාර වූ)කාමය නිසා මැ උපදනේයෑ (එහෙයින්);කාමතො විප්පමුත්තස්ස, වස්තුකාමක්ලෙශකාමයෙන් මුක්තවූ සිත් ඇත්තාහට; සොකො නත්‍ථි, (යම්කිසි) ශොකයෙක් නැත; භයං, භයතෙමෙ; කුතො, කොයින් මෙ වේ දෑ, (වස්තුකාම ක්ලෙශකාමය නිසා උපදනා භයෙක් කැල මැ නැතෑ යී සේයි )

—අනිත්ථිගන්ධකුමාරස්ස වත්ථු—

16—6.

8. සොකො, (සංසාරවට්ටය මූල්කොට ඇති යම් කිසි) ශොක යෙක් උපදනේ වේ ද හෙතෙමෙ; තණ්හාය ජායති, (සදෙර උප දනා)කාමතෘෂ්ණාව නිසා මැ උපදනේයෑ;භයං,(එසේ මැ සංසාර වට්ටය මූල්කොට ඇති යම් කිසි) භයෙක් උපදනේ වේ ද හෙ තෙම; තණ්හාය ජායති, (සදෙර උපදනා) කාමතෘෂ්ණාව නිසා මැ උපදනේයෑ (එහෙයින්); තණ්හාය විප්පමුත්තස්ස, තෘෂ්ණා යෙන් මුක්ත වූ සිත් ඇත්තාහට; සොකො නත්‍ථි, ශොකයෙක් නැත; භයං, භය තෙමෙ; කුතො කොයින් මෙ වේද? (කාම තෘෂ්ණාව නිසා උපදනා භයෙක් කැල මැ නැතෑ යී සේයි.)

—අඤ්ඤතරබ්‍රාහ්මණස්ස වත්ථු—

16—7.

9. සීලදස්සනසම්පන්නං, චතුපාරිසුද්ධිසීලයෙන් ද මාර්ගඵල සම්ප්‍රයුක්ත වූ සම්‍යග්දෘෂ්ටියෙන් ද යුක්තවූ; ධම්මට්ඨං, නවලොකොත්තර ධර්මයෙහි පිහිටියා වූ; (හෙවත්: [1]පසක් කරනලද නවලොවුතුරු

---

1. එහෙවත් නිවත්-මූ.

10. ඡන්‍දජාතො අනක්ඛාතෙ මනසා ච ඵුටො සියා
කාමෙසු ච අප්පටිබද්ධචිත්තො උද්ධං සොතොති වුච්චති. 210
11 චිරප්පවාසිං පුරිසං දූරතො සොත්ථිමාගතං
ඤාති මිත්තා සුහජ්ජා ච අභිනන්‍දන්ති ආගතං. 211

'ද්ගම් ඇති;)සච්චවෙදිනං, (චතුරාර්‍ය්‍යසත්‍යයන් පරිඥාප්‍රහාණාදි සොළොස්[1] ආකාරයෙන් පසක්කළහෙයින් සත්‍යඥානයෙන්) සත්‍යවෙදී වූ; අත්තනො කම්මං කුබ්බානං, (ත්‍රිවිධශික්‍ෂාපූරණයයි කියනලද) තමාගේ කාර්‍ය්‍යය කරන්නා වූ; තං, ඒ (ක්‍ෂීණාශ්‍රව පුද්ගලයා); ජනො, ලෞකිකමහාජනතෙමේ; පියං කුරුතෙ, ප්‍රියකරන්නේ යි; (ඔහු දක්නා වඳනා කැමැතිවන්නෙයැ, චතුර්විධ ප්‍රත්‍යයපූජයෙන් පුදනු[2] කැමැතිවන්නේ යි.)

## පඤ්චසකදාගාමි... වත්ථු.

### 16—8.

10. අනක්ඛාතෙ, නිර්වාණයෙහි; (හෙවත්: අසුවල්හු විසින් කරනලදැයි කියාවත් නීලයැ පීතයැ දීර්ඝයැ හ්‍රස්වයැ වෘත්තයැ චතුරශ්‍රයැ යි කියාවත් නොකියනලදහෙයින් අනක්ඛාතනම් වූ නිර්වාණයෙහි;) ඡන්‍දජාතො, (ශ්‍රම්මහණෙක් කත්තුකම්‍යතාවශයෙන්)උපන්ඡන්‍දය ඇත්තේ ද; (හෙවත්: නිවන්පසක්කිරීමෙහි බලවත්උත්සාහයට පැමිණියේ වේද;) මනසා ච ඵුටො සියා,(යට තුන්මග තුන්ඵල) සිතින් පිරුණේත් වේ ද; කාමෙසු ච අප්පටිබද්ධචිත්තො, අනාගාමිමාර්ගයාගෙ වශයෙන්) රූපාදිපඤ්චකාම යෙහි ද නො ඇලුණු සිත් ඇත්තේ වේ ද;උද්ධං සොතොති වුච්චති, (මෙසේ වූ මහණතෙමෙ අවිහයෙහි ඉපැද එතැන් පටන් ප්‍රතිසන්ධිවශයෙන්[3] අකනිෂ්ඨබ්‍රහ්මලොකයට යන්නේ උඩුබලාපැවැති ප්‍රතිසන්ධිශ්‍රොතස් ඇති හෙයින්) උද්ධංසොතයැ යි කියනු ලැබේ.

## අනාගාමිත්ථෙරස්ස වත්ථු.

### 16—9.

11. චිරප්පවාසිං පුරිසං, බොහෝකලක් විදෙශයට ගියා වූ පුරුෂයෙකු; දූරතො, දුරුරටකින්; සොත්ථිං ආගතං, (වෙළෙඳම් හෝ රාජසෙවය හෝ කොට ලබනලදලාභඇති වැ සමෘද්ධ වූ කාර්‍ය්‍යඇති වැ නිරුපද්‍රව වැ) සුවසේ ආවහු දැක;ඤාති,නෑයො ද; මිත්තා, (දුටුඅඳුනන) මිත්‍රයෝ ද; සුහජ්ජා ච, (ලෙ ඇති)

1. දෙළොස්-මූ.  2. පූජකරනු.  3. අකනිෂ්ඨකනම්.

12. තථෙව කතපුඤ්ඤම්පි අස්මා ලොකා පරං ගතං
පුඤ්ඤානි පතිගණ්හන්ති පියං ඤාතීව ආගතං ති. 220

පියවග්ගො සොළසමො.

1. කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සඤ්ඤොජනං සබ්බමතික්කමෙය්‍ය
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිඤ්චනං නානුපතන්ති දුක්ඛා. 221

---

යගළුවෝද; ආගතං, ඔහුගේ ඊමට; අභිනන්දන්ති, යම්සේ සතුටු වෙත්ද; (හෙවත්: ආබව යගපත යනාදී වූ ප්‍රියවචනයෙන් ද සිපගැන්මෙන් ද දෙහොත් නගා වැඳීමෙන් ද නො එක් පඬුරු එලවීමෙන් ද යම්සේ සාදර කෙරෙත්ද.)

12. තථා එව, එපරිද්දෙන් මැ; කතපුඤ්ඤම්පි, (දානශීලාදි වශයෙන්) කරනලද පින්කම් ඇති පුරුෂයා ද; අස්මා ලොකා, මෙලොවින්(මියැ);පරං ගතං, පරලොවට ගියාහු; පුඤ්ඤානි,(මවු පිය තන්හි සිටියා වූ[1] ඔහු විසින් කරනලද) කුශලයෝ; ආගතං පියං, (දුර සිටැ)ආ ප්‍රිය නෑයක්හු පිළිගන්නා වූ; ඤාතී ඉව, සෙසු නෑයන් මෙන්; පතිගණ්හන්ති, (දිව්‍ය වූ ආයුවර්ණසුඛයශආධිපත්‍යයැ දිව්‍ය වූ රූපශබ්දගන්‍ධරසස්පෘෂ්ටව්‍යයැ යනමේ දස වැදෑරුම් වූ පඬුරු ගෙනැ අවුත්) පිළිගන්නාහු සි.

නන්දියවත්‍ථු.

## පියවග්ගො සොළසමො.

### 17—1.

1. කොධං, (යම්කිසි ක්‍රොධකාරණයෙකින් උපන් සපීප්‍රකාරවූ මැ) ක්‍රොධය; ජහෙ, දුරුකරන්නෙයැ; මානං, (නවවිධ වූ) මානය; විප්පජහෙය්‍ය, විශෙෂයෙන් මැ පහකරන්නෙයැ; සබ්බං සඤ්ඤොජනං, (කාමරාගසංයොජනාදි) සියලු (දශවිධ) සංයොජනය; අතික්කමෙය්‍ය, ඉක්මෙන්නෙයැ; නාමරූපස්මිං, නාමරූප දෙක්හි;අසජ්ජමානං,(මාගේ රූපයැ මාගේ වෙදනායැ යනාදීන්) ඇලුම් නොකරන්නාවූ; අකිඤ්චනං, (රාගාදිකෙලෙස් නැති හෙයින්) අකිඤ්චනවූ; තං, ඒ (පුද්ගලයා); දුක්ඛා, (කායික චෛතසික) දුඃඛයෝ; නානුපතන්ති, අනු වැ නො පවත්නාහු යි.

රොහිණීයා වත්‍ථු.

---

1. පිහිටියාවූ-

2. යො වෙ උප්පතිතං කොධං රථං භන්තං ව ධාරයෙ
තමහං සාරථිං බ්‍රෑමි රස්මිග්ගාහො ඉතරො ජනො. 222

3. අක්කොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ
ජිනෙ කදරියං දානෙන සච්චෙන අලිකවාදිනං. 223

4. සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය දජ්ජාප්පස්මිම්පි[1] යාචිතො
එතෙහි තීහි ඨානෙහි ගච්ඡෙ දෙවානසන්තිකෙ 224

---

17 – 2.

2. යො, යම් පුද්ගලයෙක් තෙමෙ; වෙ, එකාන්තයෙන්; උප්පතිතං කොධං, (යම්කිසි ක්‍රොධකාරණයෙකින්) උපන්නා වූ ක්‍රොධය; භන්තං රථං ඉව, භ්‍රාන්තවූ රථයක් මෙන්; (හෙවත්: අතිවෙගයෙන් දිවන්නා වූ රථයක් වළකා තමා කැමැතිතැනට මෙහෙයනදක්ෂරථාචාය්‍යීයකු මෙන්;) ධාරයෙ,නිගනී ද-වළකා ද; තං, ඒ (පුද්ගලයා); අහං, මම; සාරථිං බ්‍රෑමි, රථාචාය්‍යීයායි කියමි; ඉතරො ජනො, (රජයුවරජආදීන්ගේ) අන්‍ය වූ සාරථිජන තෙමෙ; රස්මිග්ගාහො, රශ්මිග්‍රාහකනම්වෙයි හෙවත්: රැහැණ ගන්නාතම්වෙයි,(උත්තමරථාචාය්‍යීතම් නොවෙ යී සේ යි.

අඤ්ඤතරභික්ඛුස්ස වත්ථු.

17—3.

3. කොධං, ක්‍රොධී පුද්ගලයා; අක්කොධෙන, ක්‍රොධ නොකිරීමෙන්;ජිනෙ, දිනන්නේයැ; අසාධුං, අසාධු පුද්ගලයා හෙවත්: ගුණනපුරු තැනැත්තහු; සාධුනා, සාධුගුණයෙන්; ජිනෙ, දිනන්නේයැ; කදරියං, තදමසුරුපුද්ගලයා; දානෙන, (තමා සතුදෙය දීමෙන්; ජිනෙ, දිනන්නේයැ; අලිකවාදිනං, බොරුකියනසුලු පුද්ගලයා; සච්චෙන, සැබෑකිමෙන්; ජිනෙ, දිනන්නේ යි.

උත්තරය වත්ථු.

17—4.

4. සච්චං භණෙ,සත්‍යවචනයක් මැ කියන්නේයැ;න කුජ්ඣෙය්‍ය, පරහට නොකිපෙන්නේයැ; යාචිතො, ඉල්වනලද්දේ; (හෙවත්: සිල්වතුන් අවුත් ගෙදෙරසිටිකල්හි සිල්වත්හු මට දෙවයි නො ඉල්වන්නාහුද "උද්දිස්ස අරියා තිට්ඨන්ති එසා අරියාන යාචනා" යනු හෙයින් බිකඋදෙසා දොරදොරසිටිනාබැවින් අර්‍ථහෙයින් ඉල්වන්නෝනම් මෙ වෙත් නුයි යාචිතො යි කියන ලදි;) අප්පස්මිම්පි, (දෙයධර්‍මය) ස්වල්පකල්හිදු; දජ්ජා, (එයින් මඳදෙයකුදු) දෙන්නේය; එතෙහි තීහි ඨානෙහි, (බොරු

---

1. අප්පස්මිම්පි-ඇතැම්,

5. අහිංසකා යෙ මුනයො නිච්චං කායෙන සංවුතා
තෙ යන්ති අච්චුතං ඨානං යත්ථ ගන්ත්වා න සොචරෙ. 225

6. සදා ජාගරමානානං අහොරත්තානුසික්ඛිනං[1]
නිබ්බානං අධිමුත්තානං අත්ථං ගච්ඡන්ති ආසවා. 226

7. පොරාණමෙතං අතුල නෙතං අජ්ජතනාමිව
නින්දන්ති තුණ්හිමාසීනං නින්දන්ති බහුභාණිනං
මිතභාණිනම්පි නින්දන්ති නත්ථි ලොකෙ අනින්දිතො. 227

---

නො කීමයැ ක්‍රොධනොකිරීමයැ මඳින් මඳක් දීමයැ යන මෙ තුන්කාරණයෙන්; දෙවානං සන්තිකෙ, දෙවියන්සමීපයට (හෙවත්: දෙව්ලොවට;) ගච්ඡෙ, (ප්‍රතිසන්ධිවශයෙන්) යන්නේයි- දෙව්ලොවැ උපදනේ යි සේ සී.

### මහාමොග්ගල්ලානත්ථෙරස්ස පඤ්හපුච්ඡිතවත්ථු

**17—5.**

5. යෙ මුනයො, (මෞනෙයප්‍රතිපදායෙන් මාර්ගඵලයට පැමිණියාවූ) යම් අශෛක්ෂමුනිකෙනෙක් හෙවත්: යම් ක්ෂීණාශ්‍රව කෙනෙක්; අහිංසකා, අනුන්ට හිංසාවක් නො කෙරෙත්ද; නිච්චං, සතතයෙන්; කායෙන සංවුතා, කයින් සංවෘතයෝද (හෙවත්: තුන්දෙර සංවරයෙන් යුක්තයෝ ද); තෙ, ඒ අශෛක්ෂමුනිහු; යත්ථ ගන්ත්වා, යම් තැනෙකට ගොස්; න සොචරෙ, සත්වයෝ ශොකනොකෙරෙත්ද; අච්චුතං, ච්‍යුතිරහිත වූ; තං ඨානං(අමෘත මහානිර්වාණසඞ්ඛ්‍යාත වූ) ඒ ස්ථානයට; යන්ති, (ආලම්බනකරණ වශයෙන්) පැමිණෙන්නාහු යි.

### සාකෙතකබ්‍රාහ්මණවත්ථු

**17—6.**

6. සදා, හැමකල්හි මැ; ජාගරමානානං, (කෙලශනිද්‍රායෙන්) නොනිදන්නාවූ; අහොරත්තං, දිවාරාත්‍රියෙහි; අනුසික්ඛිනං, (ත්‍රිවිධශික්ෂායෙහි) හික්මෙන්නා වූ; නිබ්බානං අධිමුත්තානං, කෙලශපරිනිර්වාණයෙහි ඇලුණා වූ යොගාවචරයනට; ආසවා, කාමාශ්‍රවාදිචතුරාශ්‍රවයෝ; අත්ථං ගච්ඡන්ති, නැස්මට යන්නාහුයි.

### පුණ්ණාය වත්ථු

**17—7.**

7. අතුල. අතුලය; එතං, (නින්දනයැ පසංසනයැ යන) මේ; පොරාණං පුරාතන යැ; එතං, මේ; න අජ්ජතනං ඉව, අද වූ දෙයෙක් මෙන් නො වෙයි-දූන්වූ දෙයෙක් නොවෙයි සේයි;

---

1, සික්ඛතං-ඇතැම්.

8. න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති
එකන්තං නින්දිතො පොසො එකන්තං වා පසංසිතො. 228

9. යඤ්චෙ විඤ්ඤූ පසංසන්ති අනුවිච්ච සුවෙ සුවෙ
අච්ඡිද්දවුත්තිං මෙධාවිං පඤ්ඤාසීලසමාහිතං. 229

10. නෙක්ඛං ජම්බොනදස්සෙව කො තං නින්දිතුමරහති
දෙවාපි නං පසංසන්ති බ්‍රහ්මුනාපි පසංසිතො. 230

---

තුණ්හිමාසීනං අපි, තුෂ්ණීම්භූත ව හුන්නහුට ද; නින්දන්ති, (මේ ගොළුවකුමෙන් බිහිරකුමෙන් කිසිවක් නොදන්නකුමෙන් මූවෙන් නොබැණ මැ වැදූ හුන්නේය යි) නින්දා කෙරෙති; බහුභාණිනං අපි, බොහෝකොට බණනසුල්ලහට ද; නින්දන්ති, (මේ සුළඟින් සැලෙනමාල්ලමක්මෙන් කරකරයා දෙඩා මැ යෙයි මූගේ කථාපරියන්තයෙක් නැති-මේ කිමෙක්දැයි) නින්දාකෙරෙති; මිතභාණිනම්පි, මඳකොට බණනසුල්ලහට ද; නින්දන්ති, (මේ තමාගේබස රත්රන් මසුරන්කොට සිතයි එක් දෙබසක් කියාලා එතෙකින් මූයෙන්නොබිණී යයි) නින්දාකෙරෙති (එහෙයින්); ලොකෙ, මේ සත්වලොකයෙහි; අනින්දිතො, (සර්වප්‍රකාර යෙන්) අනින්දිතසතෙක් නම්; නත්ථි, නැති.

8. එකන්තං, එකාන්තයෙන්; නින්දිතො පොසො, නින්දාකරන ලදපුරුෂයෙක් හෝ; එකන්තං, එකාන්තයෙන්; පසංසිතො වා, ප්‍රශංසාකරනලදපුරුෂයෙක් හෝ; න චාහු, (අතීතයෙහි ද) නොවීය; න ච භවිස්සති, (අනාගතයෙහි ද) නොවන්නේයි; එතරහි ච,(දැන්)වර්තමානකාලයෙහි ද; න විජ්ජති, නැත්තේයි.

9. චෙ, ඉදින්; විඤ්ඤූ, (බාලයන්ගේනින්දාව ද ප්‍රශංසාව ද අප්‍රමාණබැවින්) විඥයෝ; සුවෙ සුවෙ, දවස දවස; අනුවිච්ච, විමසා (නින්දාවටද ප්‍රශංසාවට ද කාරණය දැන); යං, යමක්හට; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්ද; අච්ඡිද්දවුත්තිං, අච්ඡිද්‍ර වූ ශික්ෂා යෙහි පවත්නා වූ නොහොත්: අච්ඡිද්‍ර වූ ජීවිතවෘත්තිඇත්තා වූ; මෙධාවිං,ධර්මෞජඃප්‍රඥාසංඛ්‍යාත වූ විදර්ශනාඥානයෙන් සමන්විත වූ; පඤ්ඤාසීලසමාහිතං, ලෞකිකලොකොත්තරප්‍රඥායෙන් ද චතුපාරිසුද්ධිසීලයෙන් ද සමන්විත වූ; තං, ඔහු-

10. ජම්බොනදස්ස නෙක්ඛං ඉව, ජම්බූනදකනකපුඤ්ජය කටමෙන්; තං, ඒ මහණුව; නින්දිතුං, නින්දාකරන්නට; කො අරහති, කවරෙක් සුදුසුද; තං, ඒ මහණුට; දෙවාපි, දෙවියෝ ද නුවණැති මිනිස්සු ද; පසංසන්ති, ප්‍රශංසාකෙරෙති; බ්‍රහ්මුනාපි, (දෙවුමිනිසුන් තබා දසදහසක්සක්වළපවත්නා ආනුභාවඇති) මහාබ්‍රහ්මයා විසිනුදු; පසංසිතො,ප්‍රසංසා කරනලද්දේ මෙ වේ.

— අතුලඋපාසකස්ස වත්ථු —

11. කායප්පකොපං රක්ඛෙය්‍ය කායෙන සංවුතො සියා
කායදුච්චරිතං හිත්වා කායෙන සුචරිතං චරෙ. 231

12. වචීපකොපං රක්ඛෙය්‍ය වාචාය සංවුතො සියා
වචීදුච්චරිතං හිත්වා වාචාය සුචරිතං චරෙ. 232

13. මනොපකොපං රක්ඛෙය්‍ය මනසා සංවුතො සියා
මනොදුච්චරිතං හිත්වා මනසා සුචරිතං චරෙ 233

14. කායෙන සංවුතා ධීරා අථො වාචාය සංවුතා
මනසා සංවුතා ධීරා තෙ වෙ සුපරිසංවුතාති. 234

කොධවග්ගො සත්තරසමො.

---

## 17—8.

11. කායප්පකොපං රක්ඛෙය්‍ය, (ප්‍රාණවධාදි ත්‍රිවිධ) කාය දුශ්චරිතය රක්නෙයෑ හෙවත්: ත්‍රිවිධකායදුශ්චරිතයෙන් දුරුවන් නේයෑ; කායෙන සංවුතො සියා, කායද්වාරයෙන් දුශ්චරිත ප්‍රවෙශය වළකා පිහිතවූ කායද්වාරය ඇතිවන්නේයෑ; කාය දුච්චරිතං හිත්වා, කායද්වාරයෙන් සිඬවන ත්‍රිවිධදුශ්චරිතය දුරු කොට; කායෙන සුචරිතං චරෙ, කායද්වාරයෙන් සුචරිතය පුරන්නේයි.

12. වචීපකොපං රක්ඛෙය්‍ය, (මෘෂාවාදාදි චතුර්විධ) වාග්දුශ්චරිතය රක්නේයෑ හෙවත්: චතුර්විධ වාග්දුශ්චරිතයෙන් දුරු වන් නේයෑ; වාචාය සංවුතො සියා, වාග්ද්වාරයෙන් දුශ්චරිතප්‍රවෙශය වළකා පිහිතවූ වාග්ද්වාරය ඇතිවන්නේයෑ; වචීදුච්චරිතං හිත්වා, වාග්ද්වාරයෙන් සිඬ වන චතුර්විධදුශ්චරිතය දුරු කොට; වාචාය සුචරිතං චරෙ, වාග්ද්වාරයෙන් සුචරිතය පුරන්නේයි.

13. මනොපකොපං රක්ඛෙය්‍ය, (අභිධ්‍යාදි ත්‍රිවිධ) මනොදුශ්චරිතය රක්නේයෑ හෙවත්: ත්‍රිවිධ මනොදුශ්චරිතයෙන් දුරුවන් නේයෑ; මනසා සංවුතො සියා, මනොද්වාරයෙන් දුශ්චරිත ප්‍රවෙශය වළකා පිහිත වූ මනොද්වාර ඇතිවන්නේයෑ; මනො දුච්චරිතං හිත්වා, මනොද්වාරයෙන් සිඬවන ත්‍රිවිධදුශ්චරිතය දුරු කොට; මනසා සුචරිතං චරෙ, මනොද්වාරයෙන් සුචරිතය පුරන්නේයි.

14. යෙධීරා, යම් ප්‍රාඥකෙනෙක්; කායෙන සංවුතා, (ප්‍රාණ වධාදීන් නො කරන්නාහු) කායද්වාරයෙන් සංවෘතයෝ ද- සුපිහිත වූ කායද්වාර ඇත්තෝ ද; අථො, නැවත; වාචාය සංවුතා,

1. පණ්ඩුපලාසොව දානිසි යමපුරිසාපි ච තං උපට්ඨිතා
උය්‍යොගමුඛෙ ච තිට්ඨසි පාථෙය්‍යම්පි ච තෙ න විජ්ජති. 235

2. සො කරොහි දීපමත්තනො ඛිප්පං වායම පණ්ඩිතො භව
නිද්ධන්තමලො අනඞ්ගණො දිබ්බං අරියභූමිමෙහිසි. 236

---

(මෘෂාවාදාදිය නො කියන්නාහු) වාග්ද්වාරයෙන් සංවෘතයෝ ද-සුපිහිත වූ වාග්ද්වාරඇත්තෝ ද; මනසා සංවුතා, (අභිධ්‍යාදීන් නොඋපදවන්නාහු මනොද්වාරයෙන් සංවෘතයෝ ද-සුපිහිත වූ මනොද්වාරඇත්තෝ ද; තෙ ධීරා, ඒ ප්‍රාඥයෝ; වෙ, ඒකාන්ත යෙන්; සුපරිසංවුතා, මනාකොට රක්ෂිතගොපිත වූ පිහිත වූ තුන්දොර ඇත්තාහුයි.

ඡබ්බග්ගියභික්ඛූනං වත්ථු.

## කොධවග්ගො සත්තරසමො

### 18—1.

1. ඉදානි, දැන්; පණ්ඩුපලාසො ඉව අසි, පැසී විලික්ෂ වැ බිමැ හෙන්නට සිටි පරණලාපතක් මෙන් විහි; යමපුරිසාපි ච තං උපට්ඨිතා, යමදූතයෝ ද තට එළැඹ සිටියාහ හෙවත්: මරණ තට එළැඹ සිටියෙහි යැ; උය්‍යොගමුඛෙ ච තිට්ඨසි, විනාශමුඛයෙහි ද පහරිනාමුඛයෙහි ද සිටියෙහියැ; තෙ, තට; පාථෙය්‍යම්පි ච, මාර්ගෝපකරණයෙකුදු; න විජ්ජති, නැති; (ගමනිමිනිසුන්ගේ පූපාපූපලුණු පුලුපු සාල්බත් ආදි වූ මාර්ගෝපකරණමෙන් පරලොවයන්නා වූ තට සපයාතුබූ කුසල්නැමැති මාර්ගෝපකරණයෙක් ද නැති.)

2. සො (ත්වං), හේතෝ; අත්තනො, තමහට; දීපං කරොහි, ප්‍රතිෂ්ඨාවක් කර; (නැව බුන්කල්හි පිහිටවන දිවයිනක් මෙන් තට කුසල්නැමැති පිහිටක් කරන්නෙහි දූ;) ඛිප්පං වායම, වහාමැ වීර්‍ය්‍යකර; පණ්ඩිතො භව, (තට කුසල්නැමැති පිහිටකිරීමෙහි නුවණැති ච (අඥබාල නො ව); නිද්ධන්තමලො, (රාගාදීන් සන්තානයෙන් පහකළබැවින් නසනලද) රාගාදිමල ඇත්තෙහි; අනඞ්ගණො, (එහෙයින් මැ රාගාදි) අඞ්ගණරහිත වූ යෙහි; දිබ්බං, දිව්‍යානුභාවයෙන් යුක්ත වූ නොහොත්: ශොභාමත් වූ; අරියභූමිං, ආර්‍ය්‍යයනට වාසස්ථාන වූ ශුද්ධාවාසභූමියට; එහිසි, පැමිණෙන්නෙහියි.

3. උපනීතවයො ච දානි සි සම්පයාතොසි යමස්ස සන්තිකෙ[1]
වාසොපි ච තෙ නත්‍ථි අන්තරා පාථෙය්‍යම්පි ච තෙ නවිජ්ජති 237

4. සො කරොහි දීපමත්තනො ඛිප්පං වායම පණ්ඩිතො භව
නිද්ධන්තමලො අනඞ්ගණො න පුන ජාතිජරං උපෙහිසි. 238

5. අනුපුබ්බෙන මෙධාවී ථොකථොකං ඛණෙ ඛණෙ
කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො. 239

---

3. ඉදානි, දැන්; උපනීතවයො ච අසි, ගියාවූ වයස් ඇත්තෙහි ද විහි(තුන්වයස මැ ඉක්මැ මරණමුඛයෙහි සිටියෙහි); යමස්ස සන්තිකෙ සම්පයාතො අසි, යමයාසම්පයට (හෙවත්: මරණමුඛයට) පැමිණියෙ විහි (මරුමුවට යන්නට සැරැහී සිටියෙ විහි);තෙ, තට; අන්තරා, අතුරෙහි; වාසොපි ච නත්‍ථි, වාසයකුදු නැත (යම්සේ මඟ යන්නාහු අතරමඟ ලැගැලැගැ යෙත්ද එසේ මැ පරලොවට යන්නාවූ තට අතරමඟ ලැග්මෙකුදු නැත); තෙ, තට; පාථෙය්‍යම්පි ච න විජ්ජති, මාගෝපකරණයෙකුදු නැත; (ගමන්යන මිනිස්සු යම්සේ මාගෝපකරණ සපයා ගනිත්ද පර ලොව යන්නා වූ තා විසින් එලෙස සපයාගත් කුශල සඞ්ඛ්‍යාත මාගෝපකරණයෙකුදු නැත.)

4. සො (ත්වං), ගේ තෝ; අත්තනො, තමහට; [2] දීපං කරොහි, පිහිටක් කරන්නෙහිදු;ඛිප්පං වායම, වහා මැ වීය්‍යී කර;පණ්ඩිතො, භව, (කුසල්කිරීමෙහි) නුවණැති ව (අන්‍ධබාල නොව); නිද්ධන්තමලො, (රාගාදීන් සන්තානයෙන් පහකළ බැවින්) නසනලද රාගාදිමලඇත්තෙහි; අනඞ්ගණො, (එහෙයින් මැ රාගාදි) අඞ්ගණරහිතවූයෙහි; පුන, නැවත; ජාතිජරං, ජාතිජරාව්‍යාධි මරණයට; න උපෙහිසි, නො එළඹෙන්නෙහි යි.

**ගොඝාතකපුත්තවත්‍ථු.**

**18—2.**

5. අනුපුබ්බෙන, පිළිවෙළින්; මෙධාවී, (ධම්මෞජඃ ප්‍රඥයෙන් සමන්විත වූ) ප්‍රාඥතෙමෙ; ඛණෙ ඛණෙ, ක්ෂණක්ෂණයෙහි (ලද ලද අවකාශයෙහි);ථොක ථොකං, මඳමඳකොට (හෙවත්: මඳින් මඳින් කුසල් කරන්නේ); රජතස්ස, සවණීයාගේ ආගන්තුක වූ කෘත්‍රිම දොෂය දවන්නා වූ; කම්මාරො ඉව, සවණීකාරයකු මෙන් (නැවත නැවත තවතවා තළතළා ක්‍රමක්‍රමයෙන් සවණීයාගේ දොෂය පහකරන්නා වූ සවණීකාරයකුමෙන්); අත්තනො, තමාගේ; මලං, රාගාදිමලය; නිද්ධමෙ, දුරුකරන්නේ යි.

**අඤ්ඤතරබ්‍රාහ්මණවත්‍ථු.**

---

1. සන්තිකං, 2. තව.

6. අයසාව මලං සමුට්ඨිතං තදුට්ඨාය තමෙව ඛාදති
එවං අතිධොන[1] චාරිනං සකකම්මානි නයන්ති දුග්ගතිං. 240

7. අසජ්ඣායමලා මන්තා අනුට්ඨානමලා ඝරා
මලං වණ්ණස්ස කොසජ්ජං පමාදො රක්ඛතො මලං. 241

---

18—3.

6. අයසාව, යකඩින් මැ; සමුට්ඨිතං, නැංගා වූ; මලං, මලය; තදුට්ඨාය, එයින් මැ නැගී; තමෙව, එ මැ යකඩ; ඛාදති, යම්සේ කා ද; එවං, එසේ මැ; අතිධොන[1] චාරිනං, සතරපසය පස්විකා පරිභොගකරන ප්‍රඥයෙන් ඉක්මුණුහු හෙවත්: සතරපසය නො පස්විකා වළඳකරනමහණු; සකකම්මානි, සවකීය වූ ඒ පාප කර්මයෝ (හෙවත්: තමාසතන්හි උපන්නා වූ තෘෂ්ණාසඞ්ඛ්‍යාත අකුශලකර්මයෝ); දුග්ගතිං නයන්ති, (ඔහු) දුගතියට පමුණු වන්නාහුයි.

—තිස්සත්ථෙරවත්ථු—

18—4.

7. මන්තා, හදුරනලද ශාස්ත්‍රයෝ; අසජ්ඣායමලා; නො පිරි වීම මලකොට ඇත්තාහ; (හදාළබණවත් ශාස්ත්‍රවත් නො පිරි වීමෙන් අනුයොගය නො කිරීමෙන් නස්නේ හෝයැ නිරන්තර රවැ නොවැටහෙන්නේ හෝයැ;) ඝරා, ගෘහයෝ; අනුට්ඨානමලා, අනුට්ඨාන-වීර්‍ය්‍ය නො කිරීම මලකොට ඇත්තාහ (පුරුෂයා වීර්‍ය්‍යකොට සුන්බුන්තැන් තරනොකිරීමෙන් ගෙය නස්නෙයැ) නොහොත්: ඝරා, ගෘහවාසීහු; අනුට්ඨානමලා, කෘෂිවණික්කර්මාන්තාදියෙහි වීර්‍ය්‍යනොකිරීම මලකොට ඇත්තාහ; වණ්ණස්ස, ශරීරවර්ණයට; කොසජ්ජං, කුසීත බව; මලං, මලය; (කුසීත බැවින් නැහැවීම් හිස්දෙවීම් ආදිය නොකිරීම ශරීරවර්ණයට කිලිටෙක; රක්ඛතො, කෙත්වත්ගවසරක් ආදි යම්කිසිවක් රක්නාහට; පමාදො, ප්‍රමාදවීම; මලං, මලය—ගොයම් රක්නහු ප්‍රමාදවශයෙන් නිදියදී කෙළියදී හූරු කුරුලු ගෙරිම්වුන් ආදීන් විසින් නොඑක් අලෙයිවනහෙයින් ද ගවයන් රක්නහු ප්‍රමාද වැ නිදියදී කෙළියදී ගවයන් දියෙන් නැසියනහෙයින් ද දිවියන් කාපියනහෙයින් ද සොරුන් ගෙනැයනහෙයින් ද අනුන්ගේ හැල්කෙත්ආදිය කෑමෙන් නස්නාහෙයින් තමා ද නොඑක් දඬමුඹු ආදියට පැමිණෙන බැවින් ද රක්නහුට ප්‍රමාදය කිලිටෙක.

—ලාලුදායිත්ථෙරවත්ථු—

---

1. "අතිධොත"

8\. මලිත්ථියා දුච්චරිතං මච්ඡෙරං දදතො මලං
මලා වෙ පාපකා ධම්මා අස්මිං ලොකෙ පරම්හි ච. 242

9\. තතො මලා මලතරං අවිජ්ජාපරමං මලං
එතං මලං පහන්ත්වාන නිම්මලා හොථ භික්ඛවො. 243

10\. සුජීවං අහිරිකෙන කාකසූරෙන ධංසිනා
පක්ඛන්දිනා පගබ්භෙන සඞ්කිලිට්ඨෙන ජීවිතං. 244

---

**18 - 5.**

8\. ඉත්ථියා, ස්ත්‍රියට; දුච්චරිතං, දුශ්චරිතය- ධූර්තවීම; මලං, මලයෑ; (ධූර්ත වූ ස්ත්‍රිය ස්වාමියා ද ගෙන් නෙරපියන්නේයෑ මවු පියෝ ද කුලාචාර නැත්තියයි ඇසින් දක්නාත් නොකැමැතිවැ ගෙන් නෙරපියන්නාහ එහෙයින් ධූර්තවීම ස්ත්‍රියට කිලිටෙක;) දදතො, දන්දෙන්නාහට; මච්ඡෙරං මසුරුසිත; මලං, මලය; (කුඹුරු සානාකල ලාබත් ආදිය දෙමි සිතාත් පසුවැ ගොයම් නිපන් කල මසුරුමලයෙන් මඩනාලද්දු වැ දනචෙතනා පමණ කුදු නූපදවන්නේය දිව්‍යමනුෂ්‍යසම්පත්තීන්ද නිර්වාණසම්පත්තීන් ද පිරිහෙන්නේය. එහෙයින්) දන් දෙන්නහුට මසුරුසිත කිලිටෙක; පාපකා ධම්මා, අකුශලධර්මයෝ; අස්මිං ලොකෙ, මෙලොව ද; පරම්හි ච, පරලොව ද; වෙ, එකාන්තයෙන්; මලා, මලයෝයි.

9\. භික්ඛවෙ, මහණෙනි; තතො මලා, ඒ සියලුමලට වඩා; මලතරං, අධිකතරමලයක් තොපට කියමි; අවිජ්ජා, (දුක්ඛාදි අටතැන්හි පැවැත්තා වූ අඥාන යයි කියනලද) අවිද්‍යා තොමෝ; පරමං මලං, උත්තම වූ මලයෙක; එතං මලං පහන්ත්වාන, මේ අවිද්‍යානමැති මලය අර්හත්මාර්ගඥානයෙන් ප්‍රහීණකොට; නිම්මලා හොථ, නිර්මලවව්.

අඤ්ඤතරකුලපුත්තස්ස වත්ථු

**18—6.**

10\. අහිරිකෙන, පාපයෙහි හිරිඔතප් නැත්තා වූ; කාකසූරෙන, ගසා කෑමෙහි සුරුකවුඩුවකු වැනිවූ; ධංසිනා; අනුන්ගේ ගුණමකුවූ; පක්ඛන්දිනා, එගෙන් එගෙට දිවන සුලුවූ; පගබ්භෙන, කායපාගබ්භියාදීන් යුක්තහෙයින් බුහුටි වූ; සංකිලිට්ඨෙන, සකිලිටුවූ ආජීවඇතිමහණහුවිසින්; ජීවිතං, ජීවත්වීම; සුජීවං, සුවසේ කටහැක්කේයි.

11. ගිරිමතා ච දුජ්ජීවං නිච්චං සුචිගවෙසිනා
අලීනෙනපපගබ්භෙන සුධාජීවෙන පස්සතා. 245

12. යො පාණ මතිපාතෙති මුසාවාදඤ්ච භාසති
ලොකෙ අදින්නං ආදියති පරදාරඤ්ච ගච්ඡති. 246

13. සුරාමෙරයපානඤ්ච යො නරො අනුයුඤ්ජති
ඉධෙවමෙසො ලොකස්මිං මූලං ඛණති අත්තනො. 247

---

11. හිරීමතා ච, පාපයෙහි හිරිඔතප් ඇත්තා වූ; නිච්චං, සතතයෙන්; සුචිගවෙසිනා, සුචි වූ කායකර්මාදිය සොයන සුලු වූ; අලීනෙන, ජීවිතවෘත්තියෙහි නො ඇලුණා වූ; අප්පගබ්භෙන, කායප්‍රගල්භාදිගිතවූ; සුධාජීවෙන, (එක්විසි අනෙස්නෙන් දුරුවූ ගෙපිළිවෙළින් පිඩු සිඟා ඇවිද ජීවත්වනහෙයින්) පිරිසුදු වූ ආජීව ඇති; පස්සතා, එ මැ පිරිසිදු වූ ආජීවය සාරකොට දක්නාවූ ලජ්ජී මහණුවිසින්; දුජ්ජීවං-ජීවත්වීම දුකි, ඒ රූක්‍ෂ ජීවිකායෙන් ජීවත්වන්නේ නම්වේ.

**සාරිපුත්තත්ථෙරස්ස සද්ධිවිහාරිකවත්ථු.**

**18—7.**

12. යො, යම්පුද්ගලයෙක්; පාණං අතිපාතෙති, යම්කිසි සතක්හු(සාහත්ථිකාදි සපියෝ අතුරෙන් එක්තරා පියොවෙකින්) ජීවිතෙන්ද්‍රියයෙන් චුතකෙරේ ද; මුසාවාදං ච භාසති, (මෙරමා හට වනවැඩ නසන්නාවූ) අභූතඤ්කබොරුකියා ද; ලොකෙ, මේ සත්ත්වලොකයෙහි; අදින්නං,(වස්තුස්වාමිහු විසින් කයින් හෝ වචසින් හෝ නොදෙනලද)පරසන්තකවස්තුව; ආදියති,(ථෙය්‍යා වහාරාදි පස්විසිඅවහාරයෙන් එක්තරා අවහාරයකින්) සොරා ගනී ද; පරදාරං ච ගච්ඡති, අනුන්විසින් රක්‍ෂිත ගොපිත වූ ස්ත්‍රීන්කරා යේද.

13. යො නරො, යම්පුරුෂයෙක්; සුරාමෙරයපානං ච, රහමෙර පීමෙහි ද; අනුයුඤ්ජති, නැවත නැවත යෙදේද; එසො, මෙබඳු පුද්ගලතෙමෙ; ඉධ එව ලොකස්මිං, පරලෝ තබා, මෙලොවදී මැ; අත්තනො මූලං ඛණති, තමාගේ ප්‍රතිෂ්ඨා මූලය කණන්නේයි-ග්‍රාමක්‍ෂෙත්‍රවස්තුදාසිදාසගවමහිෂධනධාන්‍යාදි යම් ප්‍රතිෂ්ඨාමූලයෙකින් පිහිටාද එසේ වූ ප්‍රතිෂ්ඨාමූලය කෘෂි වණික්කර්මාන්තාදි සුදුස්සෙහි නොයොදා උකස්තිබීමෙන් විකිණීමෙන් වෛශ්‍යාවනට දීමෙන් ඒ වියදම් කොට රාපීමෙන් මස්කෑමෙන් තමා කලවරදට දඬදීමෙන් නාසාපියා අනාථවැ අශරණ වැ බැගෑ වැ ඇවිදින්නේය යී සේයි.

14. එවංභො පුරිස ජානාහි පාපධම්මා අසඤ්ඤතා
මා තං ලොභො අධම්මො ච චිරං දුක්ඛාය රන්ධයුං 248

15. දදාති වෙ යථාසද්ධං යථා[1] පසාදනං ජනො
තත්ථ සො මඞ්කු යො හොති[2] පරෙසං පානභොජනෙ
න සො දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති. 249

16. යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං
ස වෙ දිවා වා රත්තිං වා සමාධිං අධිගච්ඡති. 250

---

14. භො පුරිස, (පඤ්චදෞශශීල්‍යකර්මයෙහි නියුක්තවූ) භවත් පුරුෂය; පාපධම්මා; (ලාමක වූ) අකුශලධර්මයෝ අසංයතා, නො වැළැකියැ හැක්කාහයි; එවං ජානාහි, මෙසේ දනු; ලොභා, විෂම වූ ලොභය ද; අධම්මො ච, ද්වේෂය ද යන මේ අකුශලමූල යෝ දෙදෙන; තං, තා; චිරං, බොහෝ කලක්; දුක්ඛාය, (නරකාදි) දුකට; මාරන්ධයුං, නහමක් පවතිත් වා-නහමක් පමුණුවත්වා.

### පඤ්චඋපාසකානං වත්ථු

### 18—8.

15. ජනො,)රූක්ෂ වූ ද ප්‍රණීත වූද යම් කිසිවක් දෙන්නාවූ) ජනතෙමෙ; යථාසද්ධං,(තමාගේ) ශ්‍රද්ධාවට අනුරූපපරිද්දෙන්;යථා පසාදනං, (ස්ථවිර නවක මධ්‍යමාදීන් කෙරෙහි උපන් තමාගේ ප්‍රසාදයට අනුරූපපරිද්දෙන්; පරෙසං, අනුන්ට; දදාති, දෙන් නේයැ; තත්ථ පානභොජනෙ, ඒ පානභොජනයෙහි; යොසො, යම් ඒ මහණෙක්; මඞ්කු හොති, (මා විසින් මඳදූයෙක් ලබන ලද රූක්ෂදූයෙක් ලබනලදූයි) දෞර්මනස් වේද; සො, ඒ මහණ තෙමෙ; වෙ, ඒකාන්තයෙන්; දිවා වා, දවහලෙක වත්; රත්තිං වා, රැයෙක වත්; සමාධිං, උපචාරසමාධිඅර්පණාසමාධියකටවත් මාර්ග සමාධිඵලසමාධියකටවත්; න අධිගච්ඡති,නො පැමිණෙන්නේයි.

16. යස්ස ච, යම් මහණෙකුවිසින් වනාහි; එතං, (මඞ්කුභාව යයි කියනලද) අකුශලය; සමුච්ඡින්නං, මනාකොට සිඳිනලද ද; මූලඝච්චං සමූහතං, අවිද්‍යාතෘෂ්ණානැමැති කෙලශමූලය අනාගාමි මාර්ගයෙන් මනාකොට නසනලද ද;] සො, ඒ (මහණතෙම); වෙ, ඒකාන්තයෙන්; දිවා වා, දවහල් වත්; රත්තිං වා, රාත්‍රියෙහි වත්; සමාධිං, උපචාරසමාධිඅර්පණාසමාධියට ද මාර්ගසමාධි ඵල සමාධියට ද; අධිගච්ඡති, පැමිණෙන්නේයි.

### තිස්සදහරවත්ථු

---

1 යථා. 2 "තස්ස සො මඞ්කුභාවං එං" මුද්‍රිතඨකථා.

17. නත්ථි රාගසමො අග්ගි නත්ථි දොසසමො ගහො
නත්ථි මොහසමං ජාලං නත්ථි තණ්හාසමා නදී. 251

18. සුදස්සං වජ්ජං අඤ්ඤෙසං අත්තනො පන දුද්දසං
පරෙසං හි සො වජ්ජානි ඔපුණාති යථා භුසං
අත්තනො පන ඡාදෙති කලිංව කිතවා සඨො. 252

---

## 18—9.

17. රාගසමො අග්ගි, රාගයහා සමගින්නෙක්; නත්ථි, නැත (දුම්වත් ගිනිසිලුවත් සාලඟුරුවත් නො දක්වා ඇතුලත්හිමැ සිට සතුන් දවා හලුකරන්නට සමර්ථ වූ අතික් ගින්නෙක් නැති හෙයින් රාගය හා සමගින්නෙක් නැත); දොසසමො ගහො, ද්වෙෂය හා සමවූ ගැන්මෙක්; නත්ථි, නැත; (යක්ෂරාක්ෂසයන්ගේ ගැන්ම කිඹුලුන් මෝරුන්ගේ ගැන්ම සිංහව්‍යාඝ්‍රයන්ගේ ගැන්ම යනාදිගැනුම්හු තාක් එකජාතියෙක මැ දුක්දෙන්නාහ ද්වෙෂ නැමැතිගැන්ම වනාහි එලෙස ගන්නේ නොවෙයිනුයි ද්වෙෂයහා සමවූ ගැන්මෙක් නැත;) මොහසමං ජාලං, (සතුන් හාත්පසින් බඳනා වළඳනා කාරණයෙන්) මොහසමවූ දැලෙක්; නත්ථි, නැත; තණ්හාසමානදී, තෘෂ්ණාව හා සමවූ ගඬගාවක්; නත්ථි, නැත; (ගඬගා යමුනා ආදි සෙසු ගඬගාවන්ගේ පිරුණුකලෙකුදු අඩු කලෙකුදු වියලිකලෙකුදු පැනෙන්නේය තෘෂ්ණාව පිරුණු කලෙක්වත් වියලිකලෙක්වත් නැතිහෙයින් හැමකල්හිමැ ඌනව පැණේනුයි නොපිරෙනඅර්ථයෙන් තෘෂ්ණාව හා සම වූ ගඬගාවක්නම් නැති;)

~පඤ්චඋපාසකවත්ථු~

## 18—10.

18. අඤ්ඤෙසං, අනුන්ගේ; වජ්ජං, අනුමාත්‍රවූ වරද; සුදස්සං, සුවසේ දක්කහැක්ක; අත්තනො පන, තමාගේවූකලි මහත් වර දද; දුද්දසං, නොපැනෙන්නේය; සො, ඒ (අනුන්ගේ වරද සොයනපුද්ගලතෙමෙ); පරෙසං හි වජ්ජානි, (ස්වල්පවූද)අනුන්ගේ දොෂයන්; භුසං යථා,(උස්තැනෙකසිට)රොඩු බොල් පොළන්නාවූ එකක්හුමෙන්; ඔපුණාති, පොළන්නේය–තහා පාන්නේය; අත්තනො පන, තමාගේ වූ කලි; (මහත්වරදද පැටිකරන්නේයි–වළහන්නේයි;) කුමක්මෙන්දැ යත්? කිතවා, කොළ පැළලි ආදි යෙන්; කලිං, ශරීරය (මුවාකරන්නාවූ); සඨො ඉව, ලිහිණි වැද්දා මෙනි.

~මේණ්ඩකසෙට්ඨිවත්ථු~

19. පරවජ්ජානුපස්සිස්ස නිච්චං උජ්ඣානසඤ්ඤිනො
ආසවා තස්ස වඩ්ඪන්ති ආරා සො ආසවක්ඛයා. 253

20. ආකාසෙ පදං නත්ථි සමණො නත්ථි බාහිරෙ
පපඤ්චාභිරතා පජා නිප්පපඤ්චා තථාගතා 254

21. ආකාසෙ පදං නත්ථි සමනො නත්ථි බාහිරෙ
සඞ්ඛාර සස්සතා නත්ථි නත්ථි බුද්ධානං ඉඤ්ජිතංති. 255

මලවග්ගො අට්ඨාරසමො.

---

## 18—11.

19. පරවජ්ජානුපස්සිස්ස, අනුන්ගේ වරදදක්නා සුලුවූ; නිච්චං, සතතයෙන්; උජ්ඣානසඤ්ඤිනො, (අනුන්ගේ රන්ධ්‍රගවෙසී බැවින්) උජ්ඣානසංඥීහට උදහන සුලුවූ; තස්ස, ඒ මහණුට; ආසවා වඩ්ඪන්ති, (කාමාදි) ආශ්‍රවයෝ වඩනාහ; (ධ්‍යානාදීන් අතුරෙන් එකධර්මයෙක් නො වඩනෙයැ එහෙයින්;) සො, ඒ මහණතෙමෙ; ආසවක්ඛයා, රහත්ඵලයෙන්; ආරා, දුරැයි.

උජ්ඣාන සඤ්ඤිථෙරවත්ථු.

## 18—12.

20. ආකාසෙ, ආකාශයෙහි; පදං නත්ථි, (මේ පියයැ මෙබඳු වර්ණයෙක් ඇත්තෙයැ මෙබඳුසටහනෙක් ඇත්තෙයයි පැණවියයුතු) පියයෙක් නැත; බාහිරෙ, බාහිර සස්නෙහි; සමණො නත්ථි, මාර්ගඵලස්ථමහණෙක්නම් නැත; පජා; මේ සත්වලෝක සඞ්ඛ්‍යාත වූ ප්‍රජාතොමෝ; පපඤ්චාභිරතා, තෘෂ්ණාමානදෘෂ්ටි ප්‍රපඤ්චයෙහි ඇලුණු; තථාගතා, සර්වඥවරයෝ; නිප්පපඤ්චා, (බොධිමූලයෙහිදීමැ සියලුප්‍රපඤ්චයන් ප්‍රහීණකළහෙයින්) නිෂ්ප්‍රපඤ්ච යෝයි ප්‍රපඤ්චරහිතයෝයි.

21. ආකාසෙ පදං නත්ථි, ආකාශයෙහි (මේ පියයැ මෙබඳු වර්ණයෙක් ඇත්තෙයැ මෙබඳු සටහනෙක් ඇත්තෙය යි පැණ වියයුතු) පියයෙක් නැත; බාහිරෙ, බාහිරසස්නෙහි; සමණො නත්ථි, මාර්ගඵලස්ථමහණෙක්නම් නැත; සස්සතා, ශාශ්වතවූ (හෙවත්: නිත්‍ය වැ පවත්නා වූ); සඞ්ඛාරා නත්ථි, පඤ්චස්කන්ධ කෙනෙක්නම් නැත; බුද්ධානං, සම්‍යක්සම්බුද්ධවරයන්ට; ඉඤ්ජිතං නත්ථි, (තෘෂ්ණාමානදෘෂ්ටිප්‍රපඤ්චයන් අතුරෙහියම් ඉඤ්ජිතයක් නිසා සංස්කාරයෝ ශාශ්වතයයි ගනිත්ද එසේ වූ) එක ද ඉඤ්ජිතයෙක් නැති.

සුභද්දපරිබ්බාජකවත්ථු.

මලවග්ගො අට්ඨාරසමො

1. න තෙන හොති ධම්මට්ඨො යෙනත්ථං සහසා නයෙ
යො ච අත්ථං අනත්ථඤ්ච උභො නිච්ඡෙය්‍ය පණ්ඩිතො. 256
2. අසාහසෙන ධම්මෙන සමෙන නයතී පරෙ
ධම්මස්ස ගුත්තො මෙධාවී ධම්මට්ඨොති පවුච්චති. 257
3. න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති
ඛෙමී අවෙරී අභයො පණ්ඩිතොති පවුච්චති. 258

---

## 19—1.

1. යෙන, යම්කාරණයෙකින්; අත්ථං, විනිශ්චයකටයුතු වූ අර්ථය (හෙවත්: විනිශ්චයකොට දතයුතු වූ ජයපරාජය); සහසා නයෙ, ඡන්දාගතිආදියෙහි පිහිටා සාහසයෙන්-මෘෂාවාදයෙන් විනිශ්චයකෙරේද බොරුකීමෙන් ජයපරාජයට පමුණුවා ද; තෙන, එපමණකාරණයෙකින්; ධම්මට්ඨො න හොති, (රජුන් විසින් විනිශ්චයධර්මයෙහි සිටුවනලද්දේද) විනිශ්චයධර්මයෙහි පිහිටියා නම් නොවෙයි; පණ්ඩිතො, නුවණැත්තා වූ; යො ච, යමෙක් වනාහි; අත්ථං, විනිශ්චයකටයුතු වූ භූත වූ කාරණය ද; අනත්ථං ච, අභූත වූ කාරණය ද යන; උභො, දෙක; නිච්ඡෙය්‍ය, නිශ්චය කෙරේද (හෙවත්: නියමකොට කියාද);

2. අසාහසෙන, අසාහසයෙන්-නිබොරුතෙපුලෙන්; ධම්මෙන, විනිශ්චයධර්මයෙන්; සමෙන, අපරාධ වූ පරිද්දෙන්; පරෙ, අනුන්; නයති, ජයපරාජයට පමුණුවා ද; ධම්මස්ස, විනිශ්චය ධර්මයාවිසින්; ගුත්තො, රක්නාලද්දා වූ; මෙධාවී, නුවණැතිපුරුෂතෙමෙ; ධම්මට්ඨො ඉති, විනිශ්චයධර්මයෙහි පිහිටියේ යැයි; පවුච්චති, කියනුලැබේ.

-විනිච්ඡයමහාමච්චවත්ථු-

## 19—2.

3. යාවතා, යම්පමණකාරණයෙකින්; බහුභාසති, (සඟමැද්ද ආදියෙහි අත්තුක්කංසනපරවම්භනවශයෙන්) බොහෝකොට බෙණේ ද; තෙන, ඒ කාරණයෙන්; පණ්ඩිතො න හොති, පණ්ඩිත නම් නොවෙයි; ඛෙමී, (යමෙක්වනාහි තෙමේ) ක්ෂෙමී වේ ද; අවෙරී, (පඤ්චදුශ්චරිතවෛරයන් නැතිහෙයින්) වෛර නැත්තේ ද; අභයො, (පඤ්චවෛරයන් කෙරෙන්) භයනැත්තේ ද නොහොත්: අනුන් නොබවා ද හෙතෙමෙ; පණ්ඩිතො ඉති පවුච්චති, පණ්ඩිතයයි කියනුලැබේ.

-ඡබ්බග්ගියභික්ඛුවත්ථු-

4. න තාවතා ධම්මධරො යාවතා බහුභාසති
යො ච අප්පම්පි සුත්වාන ධම්මං කායෙන පස්සති
ස වෙ ධම්මධරො හොති යො ධම්මං නප්පමජ්ජති. 259

5. න තෙන ථෙරො හොති යෙනස්ස පලිතං සිරො
පරිපක්කො වයො තස්ස මොඝජිණ්ණොති වුච්චති. 260

6. යම්හි සච්චඤ්ච ධම්මො ච අහිංසා සඤ්ඤමො දමො
ස වෙ වන්තමලො ධීරො ථෙරො ඉති පවුච්චති. 261

---

## 19—3.

4. යාවතා, (බණ හැදෑරීම් පිරිවීම් දෙසීම් ආදි) යම් පමණ කාරණයෙකින්; බහුභාසති, බොහෝ කොට බෙණේ ද; තාවතා, එපමණකාරණයෙකින්; ධම්මධරො න, ධර්මධරනම් නොවෙයි- වංශානුරක්ෂකනමුදු ප්‍රවෙණිපාලකනමුදු නොවෙයි; යො ච, යමෙක් වනාහි; අප්පම්පි සුත්වාන, මඳදෙයකුදු අසා (ධර්මය දැනැ අර්ථය දැනැ ධර්මානුධර්මයට පැමිණැ); කායෙන, නාමකායයෙන් (දුක්ඛාදීන් පිරිසිඳැ දත්තේ) චතුස්සත්‍යධර්මයන්; පස්සති, දකී ද; සො, ඒ මහණතෙමෙ; වෙ, ඒකාන්තයෙන්; ධම්මධරො හොති, ධර්මධර නම් වෙයි; යො, යම් මහණෙක්; ධම්මං, චතුස්සත්‍ය ධර්මයෙහි; නප්පමජ්ජති, වඩනලද වීර්‍ය්‍ය ඇතිවැ අද අද මැ රහත්ඵලය ගනිමි යි ප්‍රතිවෙධය කැමැතිවෙමින් වෙසේ ද හෙද ධර්මධරනම් වේ.

### එකුදානඛීණාසවථෙරවත්ථු.

## 19—4.

5. යෙන, යම් වයොවෘද්ධකාරණයෙකින්, අස්ස, ඔහුගේ; සිරො, හිස; පලිතං හොති, පලිත වේ ද-හිස නරවැ යේ ද; තෙන, ඒ නරනැඟිකාරණයෙන්; ථෙරො න හොති, ස්ථවිරනම් නො වෙයි; තස්ස, ඔහුගේ; වයො, වයස; පරිපක්කො හොති, පරිපාකයට මුහුකළුබවට පැමිණියේ වෙයි; මොඝජිණ්ණොති වුච්චති, (හෙතෙමෙ ඇතුළත්හි ශීලාදිස්ථවිරකරණධර්මයන් නැතිහෙයින්) තුච්ඡජීර්ණයයි කියනු ලැබේ.

6. යම්හි, යම්පුද්ගලයකු කෙරෙහි වනාහි; සච්චං ච, (සොළොස් ආකාරයෙකින් ප්‍රතිවෙධකරනලදහෙයින්) සත්‍යය ද; ධම්මො ච, ප්‍රඥයෙන් ප්‍රතිවෙධකරනලදහෙයින්) නවලොකොත්තර)ධර්මය ද; අහිංසා, (කිසිවක්හට හිංසා නොකිරීමෙන්) අහිංසා ද (හෙවත්: මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා ද); සඤ්ඤමො, (කායවාක්) සංයමය ද (හෙවත්: ප්‍රාතිමොක්ෂසංවර

7. න වාක්කරණමත්තෙන වණ්ණපොක්ඛරතාය වා
සාධුරූපො නරො හොති ඉස්සුකී මච්ඡරී සඨො. 262

8. යස්ස චෙතං සමුච්ඡින්නං මූලඝච්චං සමූහතං
ස වන්තදොසො මෙධාවී සාධුරූපොති වුච්චති. 263

9. න මුණ්ඩකෙන සමණො අබ්බතො[1] අලිකම්භණං
ඉච්ඡාලොභසමාපන්නො සමණො කිං භවිස්සති. 264

---

ශීලය ද;) දමො, ඉන්‍ද්‍රියදමනයයි කියනලද ඉන්‍ද්‍රියසංවරශීලයද යන මෙ කියනලද ගුණ ඇත්ද; වන්තමලො, අර්හත්මාර්ගඥාන මුඛයෙන් වමනයකරනලද රාගාදිමලඇති; ධීරො, ධෘති සම්පන්න වූ; සො, ඒ (මහණතෙමෙ;) ථෙරො ඉති පවුච්චති, (ශාසනයෙහි ස්ථිරභාවයකරන්නාවූ මේ ගුණධර්මයෙන් යුක්ත හෙයින්) ස්ථවිර යයි කියනු ලැබේ;

## ලකුණ්ඨක භද්දියත්ථෙර වත්ථු

## 19—5.

7. වාක්කරණමත්තෙන, (ජින්නස්වරභින්නස්වරගද්ගදස්වර කාකස්වර නොවැ ගම්භීරතාදිවශයෙන්) ලක්‍ෂණසම්පන්නතෙපුල් ඇති පමණෙකින් හෝ; වණ්ණපොක්ඛරතාය වා, ශරීරවර්ණය යහපත්බැවින් හෝ; ඉස්සුකී, පරලාභාදියෙහිර්ෂ්‍යාසිත්ඇති; මච්ඡරී, ආවාසමාත්සර්‍ය්‍යාදිපඤ්චවිධමාත්සර්‍ය්‍යයෙන් සමන්විත වූ; සඨො, (කෛරාටිකපක්‍ෂය භජනයකිරීමෙන්) වඤ්චක වූ; නරො, නරතෙමෙ; සාධුරූපො න හොති, සාධු වූ ස්වරූපඇත්තේ නොවෙයි.

8. යස්ස, යමෙක්හු විසින් වනාහි; එතං, මේ (ඊර්ෂ්‍යාදිදොෂ ජාතය); සමුච්ඡින්නං, මනාකොට සිඳිනාලද ද; මූලඝච්චං සමූහතං, අවිද්‍යාතෘෂ්ණාදිකෙලශමූලය හා සමග අර්හත මාර්ගඥානයෙන් නසනලද ද; වන්තදොසො, අර්හත්මාර්ගඥානයෙන් නසනලද ඊර්ෂ්‍යාදිදොෂඇති; මෙධාවී, ධර්මෞජඃ ප්‍රඥායෙන් යුක්ත වූ; සො, ඒ පුද්ගලතෙමෙ; සාධුරූපොති වුච්චති, සාධුස්වරූපඇත්තේ යයි කියනුලැබේ.

## සම්බහුලානං භික්ඛූනං වත්ථු

## 19—6.

9 අබ්බතො, ශීලව්‍රතධුතාඞ්ගව්‍රතයෙන් විරහිත වූ; අලිකම්භණං, බොරුකියන්නා වූ පුද්ගලතෙමෙ; මුණ්ඩකෙන,

---

1. අබ්බූතො,

10. යො ච සමෙති පාපානි අණුං ථූලානි සබ්බසො
සමිතත්තා හි පාපානං සමණො ති පවුච්චති. 265

11. න තෙන භික්ඛු හොති යාවතා භික්ඛතෙ පරෙ
විස්සං ධම්මං සමාදාය භික්ඛු හොති න තාවතා. 266

12. යොධ පුඤ්ඤඤ්ච පාපඤ්ච බාහෙත්වා බ්‍රහ්මචරියවා
සඞ්ඛාය ලොකෙ චරති ස වෙ භික්ඛූති වුච්චති. 267

---

හිසමුඩුපමණෙකින්; සමණො න, ශ්‍රමණනම් නොවෙයි; ඉච්ඡාලොභසමාපන්නො, අසම්ප්‍රාප්ත අරමුණෙහි ඉච්ඡායෙන් ද සම්ප්‍රාප්තඅරමුණෙහි ගෙධවශයෙන් ද සමන්විත වූ යේ; කිං සමණො භවිස්සති, කෙසේනම් ශ්‍රමණවේ දැ? ඒ මහණනම් නොවෙයි සේයි.

10. යො ච, යමෙක් වනාහි; අණුං ථූලානි, අණු වූ ද මහත් වූ ද; පාපානි, අකුශලයන්; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; සමෙති, අර්හත්මාර්ගඥානයෙන් සමුච්ඡෙද කෙරේ ද; පාපානං, අකුශලයන්; සමිතත්තා හි, සන්හිඳුවනලදබව හෙතුකොට ගෙනැ; සමණො ති පවුච්චති, ශ්‍රමණ යයි කියනු ලැබේ.

හත්ථකවත්ථු

19—7.

11. යාවතා, යම්පමණෙකින්; පරෙ භික්ඛතෙ, අනුන් සිඟා ද (හෙවත්: යම් කාරණයෙකින් අනුන්ගේ දොරදොරසිට සිඟා ද); තෙන, ඒ කාරණයෙන්; භික්ඛු න හොති, භික්ෂුනම් නොවෙයි; විස්සං ධම්මං සමාදාය, විෂම වූ පාපධර්මය සමාදන් වැ; නොහොත්: දුර්ගන්ධවහනයකරන්නා වූ කායකර්මාදිධර්මය සමාදන් වැ වසන්නේ; තාවතා, එපමණෙකින් (හෙවත්: දොරදොර සිටැ සිඟන පමණෙකින්); භික්ඛු න හොති, භික්ෂු නම් නොවේ.

12 ඉධ, මේ ශාසනයෙහි; යො, යම් මහණෙක්; පුඤ්ඤං ච කුශලය ද; පාපං ච අකුශලය ද යන මෙ දෙක මැ; බාහෙත්වා, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යායෙන් දුරැකොට; බ්‍රහ්මචරියවා, මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යායෙන් යුක්ත වේ ද; ලොකෙ, ස්කන්ධාදිලොකයෙහි සර්වධර්මයන්; සංඛාය, නුවණින් සලකා; චරති, හැසිරේ ද; (හෙවත්: මොහු ආධ්‍යාත්මික වූ ස්කන්ධයෝයැ මොහු බාහිරවූ ස්කන්ධයෝයැ යි සියලුධර්මයන් දැනැ වෙසේ ද;) සො, හෙතෙමෙ; වෙ, ඒකාන්තයෙන්; භික්ඛූති වුච්චති, (මාර්ගඥානයෙන් භින්න වූ සකලක්ලෙශයන් ඇතිහෙයින්) භික්ෂුය යි කියනු ලැබේ.

අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු.

13. න මොනෙන මුනී හොති මූළ්හරූපො අවිද්දසු
යො ච තුලංව පග්ගය්හ වරමාදය පණ්ඩිතො. 268

14. පාපානි පරිවජ්ජෙති සමුනී තෙන සො මුනී.
යො මුනාති උභො ලොකෙ මුනී තෙන පවුච්චති. 269

15. න තෙන අරියො හොති යෙන පාණානි හිංසති
අහිංසා සබ්බපාණානං අරියොති පවුච්චති. 270

---

## 19—8.

13. මූළ්හරූපො, මූඪ වූ තුච්ඡ වූ ස්වරූපඇති; අවිද්දසු, අඥාන පුද්ගලතෙමෙ; මොනෙන, තූෂ්ණීම්භූතවීමෙන් මියෙන් නො බැණෑ හුන් පමණෙකින්; මුනි න හොති, මුනිනම් නොවෙයි; පණ්ඩිතො, ප්‍රාඥ වූ; යො ච, යම්කිසි පුද්ගලයෙක් වනාහි; තුලං ඉව පග්ගය්හ, ඉදිතුලාවක් ගෙනෑ සිටිඑකක්හු මෙන් (හෙවත්: තරාදියක් ගෙනෑ කිරන්නටසිටි එකක්හු මෙන්;) වරමාදය, ගතයුතු වූ උතුම්දෙය ගෙනෑ වෙසේ ද;-(යම්සේ තරාදියක් ගෙනෑ කිරියෑයුතුදෙය කිරන්නා වූ පුරුෂතෙමෙ වැඩිදෙය හැරපියා අඩුදෙය බහාලා කිරා ද එපරිද්දෙන් මෑ හැරියෑ යුතු අකුසල් හැරපියා ගතයුතු වූ කුසල් පුරන්නේ ශීලසමාධි ප්‍රඥාවිමුක්තිවිමුක්තිඥානදර්ශන යයි කියනලද උත්තම වූ කුශල ධර්මය ගෙනෑ.)

14. පාපානි පරිවජ්ජෙති, (දුරුකටයුතු වූ) අකුශලයන් දුරු කෙරේ ද; සො, හෙතෙමේ; මුනි, මුනි නම් වෙ යි; කුමක් හෙයින් ද යත්? සො, හෙතෙමෙ; තෙන, ඒ යටකියනලදකාරණයෙන්; මුනි, මුනිනම් වෙ යි (ඒ එසේමැයි); යො, යමෙක් තෙමෙ; උභො ලොකෙ, ආධ්‍යාත්මිකබාහ්‍ය වූ ස්කන්ධාදිඋභයලොකයන්; මුනාති, (මොහු ආධ්‍යාත්මික වූ ස්කන්ධයහ මොහු බාහ්‍යවූ ස්කන්ධයහ යි මේ උභයලොකයන් තරාදියට නගා කිරන්නක්හු මෙන්) නුවණින් පිරිසිඳෑ දනී ද; තෙන ඒ කාරණයෙන්; සො, හෙතෙ මෙ; මුනිපවුච්චති, මුනි යයි කියනු ලැබේ.

තිත්ථිය වත්ථු

## 19—9.

15. යෙන, යම්කාරණයෙකින්; පාණානි හිංසති, ප්‍රාණීන් නසා ද-ප්‍රාණීන්ට හිංසා කෙරේද;තෙන, ඒ කාරණයෙන්; අරියො න හොති, ආර්‍ය්‍යනම් නො වෙයි; සබ්බපාණානං, සියලු

16. න සීලබ්බතමත්තේන බාහුසච්චේන වා පුන
අථ වා සමාධිලාභේන විවිච්චසයනේන වා. 271

17. ඵුසාමි නෙක්ඛම්මසුඛං අපුථුජ්ජනසේවිතං
භික්ඛු විස්සාසමාපාදි අප්පත්තො ආසවක්ඛයං ති. 272

ධම්මට්ඨවග්ගො එකූනවීසතිමො

---

සත්ත්වයන්ට; අහිංසා,(පාණිප්‍රහාරාදියෙන්)හිංසා නො කිරීම හෙතු කොටගෙනැ-(මෛත්‍රීභාවනා ආදියෙහි පිහිටි බැවින්-හිංසායෙන් දුරුවැ සිටිබැවින්); අරියොති පවුච්චති, ආර්‍ය්‍ය යයි කියනු ලැබේ.

බාලිසිකවත්ථු

19—10.

16. සීලබ්බතමත්තේන, චතුපාරිශුද්ධිශීලමාත්‍රයෙකින් හෝ තෙලෙස්ධුතගුණමාත්‍රයෙකින් හෝ; පුන, නැවත; බාහුසච්චේන වා, ත්‍රිපිටකධරමාත්‍රයෙකින් හෝ; අථ වා, නොහොත්; සමාධිලාභේන, (සවිතර්කසවිචාරසමාධියැ අවිතර්කවිචාරමාත්‍රසමාධියැ අවිතර්කඅවිචාරසමාධියැ යන) ත්‍රිවිධසමාධිලාභයෙන් හෝ හෙවත්: රූපාරූපඅෂ්ටසමාපත්තිලාභී පමණෙකින් හෝ; විවිච්චසයනේනවා, විවික්තශය්‍යායෙන් හෝ; (හෙවත්: ගණසංගණිකායෙන් වෙන් වැ කායවිවේකයෙන් යුක්ත වැ විසීම්පමණෙකින් හෝ;)

17. අපුථුජ්ජනසේවිතං, පෘථග්ජනයන් විසින් නො සෙවුනා ලද; නෙක්ඛම්මසුඛං, නෛෂ්ක්‍රම්‍යසුඛය (හෙවත්: අනාගාමිඵලසුවය); ඵුසාමි, නාමකායයෙන් ස්පර්ශකෙරෙමියි හෝ; භික්ඛු, මහණ; ආසවක්ඛයං අප්පත්තො, අර්හත්ඵලයට නොපැමිණියා වූ තෝ; විස්සාසං, භවයෙහි විශ්වාසයට; මාපාදි, නහමක් පැමිණ-(හෙවත්: මහණ අනාගාමි ඵලයට පැමිණියා වූ ද තෝ ඉදින් රහත්ඵලයට නො පැමිණියෙහි වී නම් ශීලසමාධ්‍යාදි ගුණයෙන් යුක්ත වූ මට භවය ලුහුඬුව ගියේ වේ දැයි භවයෙහි විශ්වාසයක් නො කර! යම්සේ ස්වල්පවූ ද ගූථය දුර්ගන්ධ ද එසේමැ ස්වල්පවූ ද භවය දුක්ඛයැ යනු භාවයි.

සම්බහුලානං භික්ඛූනං වත්ථු

ධම්මට්ඨවග්ගො එකූනවීසතිමො

1. මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො සච්චානං චතුරො පදා
විරාගො සෙට්ඨො ධම්මානං ද්විපදානඤ්ච චක්ඛුමා. 273

2. එසොව මග්ගො නත්ථඤ්ඤො දස්සනස්ස විසුද්ධියා
එතම්හි තුම්හෙ පටිපජ්ජථ මාරස්සෙතං පමොහනං.[1] 274

3. එතම්හි තුම්හෙ පටිපන්නා දුක්ඛස්සන්තං කරිස්සථ
අක්ඛාතො වෙ මයා මග්ගො අඤ්ඤාය සල්ලසන්ථනං. 275

---

## 20—1.

1. මග්ගානං, (ජඞ්ඝමාර්ගශකටමාර්ගවාෂ්ටිදෘෂ්ටිගතමාර්ගාදි) මාර්ගයන් අතුරෙන්; අට්ඨඞ්ගිකො මග්ගො, (සම්‍යග්දෘෂ්ට්‍යාදි) අෂ්ටාංගාර්‍ය්‍යමාර්ගය; සෙට්ඨො, (මිථ්‍යාදෘෂ්ට්‍යාදි අෂ්ටමිථ්‍යාමාර්ගයන් ප්‍රහීණකරනබැවිනුදු නිර්වාණය අරමුණුකෙරෙමින් චතුසත්‍ය යෙහි දුඃඛපරිඥනාදිකෘත්‍ය සාධකබැවිනුදු)ශ්‍රෙෂ්ඨයැ-උත්තමයැ; සච්චානං, (වාක්සත්‍යයැ සංවෘතිසත්‍යයැ දෘෂ්ටිසත්‍යයැ පරමාර්ථ සත්‍යයැ යන මේ) සත්‍යයන් අතුරෙන්; චතුරො පදා, දුඃඛ සත්‍යයැ සමුදයසත්‍යයැ නිරොධසත්‍යයැ මාර්ගසත්‍යයැ යන මේ සත්‍යපදයෝ සතරදෙනා; සෙට්ඨො,(තථ අවිතථ යනාදි සත්‍යාර්ථ යෙන්) ශ්‍රෙෂ්ඨයහ; ධම්මානං,(ප්‍රත්‍යයසමුත්පන්න වූ ද අසමුත්පන්න වූ ද සියලු) ධර්මයන් අතුරෙන්; විරාගො, (නිර්වාණසංඛ්‍යාත වූ) විරාගධර්මය; සෙට්ඨො, ශ්‍රෙෂ්ඨය; ද්විපදානං, (දිව්‍යමනුෂ්‍යාදිප්‍රභෙද ඇති සියලු)ද්විපදසත්වයන්ට; චක්ඛුමා, බුදුඇස් ආදි පස්ඇස් ඇති තථාගත තෙමෙ; සෙට්ඨො, ශ්‍රෙෂ්ඨ යි.

2. දස්සනස්ස, (මාර්ගඵලසංඛ්‍යාත) දර්ශනයාගේ; විසුද්ධියා, විශුද්ධිය පිණිස;එසො එව මග්ගො,(යම් මාර්ගයෙක් මාවිසින් උත්තමයැයි කියනලදද) මෙ මැ මගයැ;අඤ්ඤො නත්ථි, අනික් මඟෙක් නැති; (මාර්ගඵලසංඛ්‍යාතදර්ශනයාගේ විශුද්ධියට උපායනම් මේ මගය අනික් උපායෙක් නැතැයි සේයි;) තුම්හෙ, තෙපි; එතම්හි මේ මාර්ගයෙහි මැ; පටිපජ්ජථ, පිළිපදුව; එතං, මේ අෂ්ටාඞ්ගික මාර්ගය; මාරස්ස පමොහනං, මාරයා මුළා කරන්නේයි; ("කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති" යනාදින් දක්වනලද කෙලෙස් නමැති මාරසේනාව හා සහිත වූ දිව්‍යපුත්‍රමාරයා වඤ්චා කරන්නේ යි සේයි.)

3. එතම්හි පටිපන්නා, මේ අෂ්ටාඞ්ගිකමාර්ගයට පිළිපන්නා වූ; තුම්හෙ, තෙපි; දුක්ඛස්ස, සියලු වෘත්තදුඃඛය; අන්තං කරිස්සථ,

---

1. මාරසෙනප්පමද්දනං.

4. තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා
පටිපන්නා පමොක්ඛන්ති ඣායිනො මාරබන්ධනා. 276

5. සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා. 277

---

අනන්තකරච්-ක්ෂය කොට පියච්; සල්ලසත්තනං, සියලු රාගාදිශල්‍යයන් මඩනා වූ නොහොත්: රාගාදි උල් උදුරන්නා වූ මේ ආර්‍ය්‍යමාර්ගය; අඤ්ඤාය, (අනුශ්‍රවානුමානාදියක් නැතිව ප්‍රත්‍යක්ෂ ඥානයෙන් මැ) දැන; මග්ගො, (නිවනට පමුණුවන්නා වූ මේ) ආර්‍ය්‍යමාර්ගය; වෙ, එකාන්තයෙන්; මයා, මාවිසින්; අක්ඛාතො, කියනලද.

4. තුම්හෙහි, (මහණෙනි දූන්) තොපවිසින්; ආතප්පං, (කෙලෙසුන් තවනහෙයින් ආතප්පය යි කියනලද)සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යය;කිච්චං,(ඒ ආර්‍ය්‍යමාර්ගාධිගමය පිණිස)කටයුතුයි;තථාගතා, සර්‍වඥවරයෝ; අක්ඛාතාරො, නිවනට පමුණුවනමඟ හුදක් කියන්නාහු මෙ වෙති;(අත අල්වා ගෙනැ නිවනට පමුණුවන්නාහු නොවෙති;) පටිපන්නා, (තථාගතයන් විසින් කියනලෙස) පිළිපන්නා වූ; ඣායිනො, (ආලම්බනොපනිධ්‍යානලක්ෂණොපනිධ්‍යානවශයෙන් ද්විප්‍රකාර වූ ධ්‍යානයෙන්) ධ්‍යායී වූ; (හෙවත්: සමථවිදර්‍ශනාභාවනායෙහි නියුක්ත වූ යොගාවචරයෝ;) මාර බන්ධනා, (ත්‍රෛභූමකවෘත්තය යි කියනලද) මාරබන්ධනයෙන් පමොක්ඛන්ති, මිදෙන්නාහුයි.

පඤ්චසත භික්ඛූනං වත්ථු

20—2.

5. සබ්බෙ සඞ්ඛාරා, (කාමභවාදියෙහි උපදවන්නා වූ ස්කන්ධයහ යි කියනලද) සියලු සංස්කාරයෝ; අනිච්චා ඉති, (ඒ ඒ භවයෙහි මැ ඉපද නස්නාහෙයින්) අනිත්‍යයහයි; යදා, යම් කලෙක්හි; පඤ්ඤාය, විදර්‍ශනාප්‍රඥායෙන්; පස්සති, දක්නී ද; අථ, එකල්හි; දුක්ඛෙ, (මේ ස්කන්ධපරිහරණය යි කියනලද) දුක්ඛයෙහි; නිබ්බින්දති, ශිඛාප්‍රාප්ත වූ ව්‍යුත්ථානගාමිනීවිදර්‍ශනාවශයෙන්) කළකිරෙන්නේය; (එසේ කළකිරුණේ දුක්ඛපරිඥාතනාදිවශයෙන් [1] සත්‍යප්‍රතිවෙධකරන්නේය; එහෙයින්;) එසො, මේ සංස්කාරයන් කෙරෙහි නිර්‍වේදය; විසුද්ධියා, නිර්‍මලබවට නොහොත්: නිර්‍වාණයට; මග්ගො, මාර්‍ගයෙකි-කාරණයැ යි සේයි.

පඤ්චසතානං භික්ඛූනං වත්ථු

---

1. පරිඥාණාදිවශයෙන්-මු.

6. සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා. 278

7. සබ්බෙ ධම්මා අනත්තාති යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා. 279

8. උට්ඨානකාලම්හි අනුට්ඨහානො
යුවා බලී ආලසියං උපෙතො
සංසන්නසඞ්කප්පමනො කුසීතො
පඤ්ඤාය මග්ගං අලසො න වින්දති 280

## 20—3.

6. සබ්බෙ සඞ්ඛාරා, (භවත්‍රයපර්‍ය්‍යාපන්න වූ සියලු) සංස්කාර ධර්‍මයෝ; දුක්ඛා ඉති, (උදුවියෙන්[1] පෙළෙන හෙයින්) දුක්ඛය හයි; යදා, යම් කලෙක්හි; පඤ්ඤාය, විදර්ශනා ප්‍රඥායෙන්; පස්සති, දකි ද; අථ, එකල්හි; දුක්ඛෙ, මේ ස්කන්ධපරිහරණය යි කියනලද දුක්ඛයෙහි; නිබ්බින්දති, (ශිඛාප්‍රාප්ත වූ ව්‍යුත්ථානගාමිනීවිදර්ශනාවශයෙන්) කලකිරෙන්නේය;(එසේ කලකිරුණේ දුක්ඛපරිඥානාදිවශයෙන් සත්‍යප්‍රතිවේධ කරන්නේය එහෙයින්;)එසො,මේ සංස්කාරයන් කෙරෙහි නිර්වේදය;විසුද්ධියා,නිර්මලබවට නොහොත්: නිර්වාණයට; මග්ගො, මාර්ගයෙකි-කාරණයැ යී සේයි.

7. සබ්බෙ ධම්මා, සියලු ධර්‍මයෝ (හෙවත්: නිවන් පණත් සහිත වූ සියලු පස්කඳහු මැ); අනත්තා ඉති,(තමාවශයෙහි[2] නො පවත්නා හෙයින්) අනාත්මය හයි; යදා, යම් කලෙක්හි; පඤ්ඤාය, විදර්ශනා ප්‍රඥායෙන්;[3] පස්සති, දකී ද; අථ, එකල්හි; දුක්ඛෙ, (මේ ස්කන්ධපරිහරණය යි කියනලද) දුක්ඛයෙහි; නිබ්බින්දති, ශිඛා ප්‍රාප්ත වූ ව්‍යුත්ථානගාමිනී විදර්ශනාවශයෙන්) කලකිරෙන්නේය; (එසේ කලකිරුණේ දුක්ඛපරිඥානාදිවශයෙන් සත්‍යප්‍රතිවේධය කරන්නේය එහෙයින්;) එසො, මේ සංස්කාරයන් කෙරෙහි නිර්වේදය; විසුද්ධියා, නිර්මලබවට නොහොත්: නිර්වාණයට; මග්ගො, මාර්ගයෙකි-කාරණයැ යී සේයි.

පඤ්චසතභික්ඛුවත්ථු

## 20—4.

8. උට්ඨානකාලම්හි, වීර්‍ය්‍ය කරන්නට සුදුසු වූ කල්හි; අනුට්ඨහානො, වීර්‍ය්‍ය නො කරන්නා වූ මහණතෙමේ; යුවා, ප්‍රථම යෞවනයෙහි සිටියේ ද; බලී, කායබලසම්පන්නවූ යේ ද;

1. උදයව්‍යයෙන්-මු. 2. වශගයෙහි-මු. 3. විදර්ශනාඥානයෙන්-මු.

9. වාචානුරක්ඛී මනසා සුසංවුතො
කායෙන ච අකුසලං න කයිරා
එතෙ තයො කම්මපථෙ විසොධයෙ
ආරාධයෙ මග්ගං ඉසිප්පවෙදිතං. 281

10. යොගා වෙ ජායතී භූරි අයොගා භූරිසඞ්ඛයො
එතං ද්වෙධාපථං ඤත්වා භවාය විභවාය ච
තථත්තානං නිවෙසෙය්‍ය යථා භූරි පවඩ්ඪති. 282

---

ආලසියං උපෙතො, ඉඳින් ආලස්‍යයෙන් යුක්ත වූ යේද;(බඩ පුරා බත් වළඳාපියා කිසිමහණධමක් නොකොට වැදහෝනේ මෙ වේ ද;) සංසන්නසඞ්කප්පමනො, කාමවිතර්කාදි ත්‍රිවිධවිතර්කයන් විසින් මනාකොට මැ යට ගලනලදසම්‍යක්සඞ්කල්පනා සිත්ඇති; කුසීතො, කුශීත වූ; අලසො, අලසයා (ඒ මහමැළියා); පඤ්ඤාය මග්ගං, ප්‍රඥයෙන් දක්කයුතු වූ ආර්‍ය්‍යමාර්ගය; න වින්දති, නොලබන්නේයි; නොහොත්: පඤ්ඤාය, ලෞකිකලොකොත්තර ප්‍රඥවට; මග්ගං, උපායක්; න වින්දති, නො ලබන්නේයි.

## පධානකම්මිකතිස්සත්ථෙරවත්ථු

## 20—5.

9. වාචානුරක්ඛී, (යම්පුද්ගලයෙක් මෘෂාවාදදිචතුර්විධ වාග්දුශ්චරිතයන් දුරැකිරීමෙන්) වචසින් රක්නා සුලුවේ ද; මනසා සුසංවුතො, (අභිධ්‍යාදි ත්‍රිවිධමනොදුශ්චරිතයන් දුරැ කිරීමෙන්)මනසින් සුසංවෘත වේ ද-සුපිහිත වූ මනොවාර[1]ඇත්තේ වේද; කායෙන ච අකුසලං න කයිරා, (ප්‍රාණවධාදිත්‍රිවිධකාය දුශ්චරිතයන් දුරැකිරීමෙන්) කයින් අකුශලය නො කරන්නේ වේද; එතෙ තයො කම්මපථෙ විසොධයෙ, කායවාක් මනඃ සඞ්ඛ්‍යාත වූ මේ කර්මපථයන් තුන්දෙනා පිරිසුදුකරන්නේ වේ ද-ඒ පුද්ගලතෙමෙ; ඉසිප්පවෙදිතං, (ශීලස්කන්ධාදිපඤ්චවිධ ධර්මස්කන්ධයන් එසතය කළා වූ) බුද්ධාදිඍෂීන් විසින් ප්‍රතිවෙධ කරනලද; මග්ගං, ආර්‍ය්‍යමාර්ගය; .ආරාධයෙ, සිද්ධකරන්නේ යි; (බුදු පසේබුදු මහරහතුන් විසින් ප්‍රතිවෙධකරනලද ආර්‍ය්‍යමාර්ගයට පැමිණෙන්නේයැ යී සේයි )

## සූකරපෙත වත්ථු

## 20—6.

10. යොගා, (පර්විකසිතාදිඅටතිස් අරමුණෙහි යොනිසො මනසිකාරයෙහි) යෙදීම හෙතුකොටගෙනැ; වෙ, එකාන්තයෙන්;

---

1. දුශ්චරිත-මූ.

11. වනං ඡින්දථ මා රුක්ඛං වනතො ජායතී භයං
ඡෙත්වා වනඤ්ච වනථඤ්ච නිබ්බනා හොථ භික්ඛවො. 283

12 යාවං හි වනථො න ඡිජ්ජති අනුමත්තො පි නරස්ස නාරිසු
පටිබද්ධමනොව තාව සො වච්ඡො ඛීරපකොව මාතරි. 284

---

භූරි, ලෞකිකලොකොත්තරප්‍රඥාතොමො; ජායති, උපදනිය; අයොගා, උක්තප්‍රකාරභාවනාමනස්කාරයෙහි නො යෙදීම හෙතුකොටගෙන; භූරිසඞ්ඛයො, ලෞකිකලොකොත්තර ප්‍රඥාවගේ විනාශය වෙයි; භවාය විභවාය ච, වැඩ පිණිස ද අවැඩ පිණිසද පවත්නා වූ; එතං ද්වෙධාපථං ඤත්වා, (යොගය ද අයොගය ද යන) මේ දෙමග දැන; යථා භූරිපවඩ්ඪති, යම්ප්‍රකාරයෙකින් ප්‍රඥා වඩී ද; තථා, එපරිද්දෙන්; අත්තානං, තමා; නිවෙසෙය්‍ය, යොනිසොමනස්කාරයෙහි පිහිටුවන්නේයි.

## පොඨිලත්ථෙරවත්ථු

## 20—7.

11. භික්ඛවෙ, මහණෙනි; වනං ඡින්දථ, රාගාදිකෙලෙස් වනය කපව්; මා රුක්ඛං, (වනය කපව වනය කපව යි කී හෙයින් වැළින්) රුක් නො කපව්; (කෙලෙස්නමැති වනය කැපීමෙන් ප්‍රයොජන කිමැ යත්?) වනතො, රාගාදි කෙලෙස් වනයෙන්; භයං ජායති, (ජාතිභයාදි) භය උපදනේයි; (යම්සේ පියැව්වනයෙන් සිංහාදිභය වේද එසේ මැ කෙලෙස්වනය නිසා ජාතිභයාදි සියලු භය උපදනේයි—එහෙයින්;) වනං ච, භවොත්පත්තිසාධක වූ මහත් කෙලෙස් නමැති වනය ද; වනථං ච, ප්‍රවෘත්තිවිපාකදායක වූ ස්වල්ප වූ කෙලෙස් නමැති වනථය ද; නොහොත්: වනං ච, පළමු කොට උපදනා කෙලෙස් නමැති වනය ද; වනථං ච, පසුවැ පසුවැ උපදනා කෙලෙස් නමැති වනථය ද; ඡෙත්වා, අර්හත්මාර්ගඥාන නමැති ශස්ත්‍රයෙන් කපා; නිබ්බනා හොථ, කෙලෙස්වන රහිත වව්.

12. නරස්ස, පුරුෂයාගේ; නාරිසු, ස්ත්‍රීන් කෙරෙහි; අනුමත්තො අපි, ස්වල්පමාත්‍ර ද වූ; වනථො, කෙලෙස් නමැති වනථයෙක් (හෙවත්: තෘෂ්ණාලවයෙක්); යාවං හි, යම්තාක්කල්; න ඡිජ්ජති, නො සිඳේ ද; තාව, ඒතාක්කල්; සො, ඒ පුරුෂතෙම; මාතරි, මව කෙරෙහි ප්‍රෙමයෙන් ඇලුණු; ඛීරපකො වච්ඡො ඉව, කිරි බොන ලමා වස්සකු මෙන්; පටිබද්ධමනොව (හොති,) ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳසිත් ඇත්තේ මෙ වේ.

---

## මහල්ලකභික්ඛූනං වත්ථු

13. උච්ඡින්ද සිනෙහමත්තනො කුමුදං සාරදිකං ව පාණිනා
සන්තිමග්ගමෙව බ්‍රෑහය නිබ්බානං සුගතෙන දෙසිතං. 285

14. ඉධ වස්සං වසිස්සාමි ඉධ හෙමන්තගිම්හිසු
ඉති බාලො විචින්තෙති අන්තරායං න බුජ්ඣති. 286

15. තං පුත්තපසුසම්මත්තං ව්‍යාසත්තමනසං නරං
සුත්තං ගාමං මහොඝොව මච්චු ආදාය ගච්ඡති. 287

---

## 20—8.

13. සාරදිකං, (වප්ගිල් දෙමසය යි කියනලද) ශරත්කාලයෙහි වූ; කුමුදං, කුමුදු මලක්; පාණිනා ඉව, අතින් ගෙනැ උදුරන් නාක්හු මෙන්; අත්තනො, තාගේ; සෙනහං, තෘෂ්ණාසඞ්ඛ්‍යාත වූ සෙනහය; උච්ඡින්ද, (අර්හත්මාර්ගඥානශස්ත්‍රයෙන්) [1] උපුටාපිය-මුලින් මැ සිඳැපිය; සන්තිමග්ගමෙව, නිර්වාණයට පමුණුවන්නා වූ ආෂ්ටාඞ්ගිකමාර්ගය මැ; බ්‍රෑහය, වඩ-තාගේ සන්තානයෙහි උපදව; කුමක්හෙයින්ද යත්? නිබ්බානං, නිර්වාණය; සුගතෙන, තථාගතයා විසින්; දෙසිතං, (යම්හෙයකින් ශාන්තයැ ප්‍රණීතයැ ශාශ්වතයැ යනාදි විසින්) දෙසනලද ද; එහෙයින් ඒ නිවනට පමුණුවන්නා වූ අෂ්ටාඞ්ගිකමාර්ගය මැ උපදව.

### සුවණ්ණකාරථෙරස්ස වත්ථු

## 20—9.

14. වස්සං, වර්ෂාසාරමස; ඉධ වසිස්සාමි, (මේ මේ කටයුත්ත කෙරෙමින්) මෙතැන්හි මැ වෙසෙමි; හෙමන්තගිම්හිසු, හිමත් සාරමසද ගිමන්සාරමසද; ඉධ වසිස්සාමි, (මේ මේ කටයුත්ත කෙරෙමින්) මෙතැන්හි මැ වෙසෙමි; ඉති, මෙසේ; බාලො, (මෙලෝ පරලෝ වැඩ නොදන්නාවූ) අඥානපුද්ගලතෙමේ; විචින්තෙති, නො එක්පරිද්දෙන් සිතන්නේයි; අන්තරායං න බුජ්ඣති, (අසෝ කල අසෝදා අසෝතැනදී අසෝ වයසැ මියෙමි අතුරෙහි තමහට වන) ජීවිතාන්තරාය නොදන්නේයි.

### මහාධනවාණිජස්ස වත්ථු

## 20—10.

16. පුත්තපසුසම්මත්තං, දරුවන් කරණකොටගෙනැ ද ගව මහිෂාදීන් කරණකොටගෙනැ ද වෙසෙසින් මත් වූ; (හෙවත්: මාගේ දරුවෝ රූ ඇත්තොයැ බල ඇත්තොයැ නුවණැත්තොයැ

---

1 ශස්ත්‍රයෙන්.

16. න සන්ති පුත්තා තාණාය න පිතා නපි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස නත්ථි ඤාතිසු තාණතා. 288

17. එතමත්ථවසං ඤත්වා පණ්ඩිතො සීලසංවුතො
නිබ්බානගමනං මග්ගං ඛිප්පමෙව විසොධයෙ ති. 289

## මග්ගවග්ගො වීසතිමො

---

සියලු කටයුත්තෙහි දක්‍ෂයෝයැයි මෙසේ දරුවන්නිසා ද, මාගේ ගොන්හු බලසම්පන්නයෝයැ නිරෝගීයැ බර ඉසිලිය හෙති මාගේ දෙනු අභිරූපයෝයැ බොහෝ කිරි ඇත්තෝයැ යි මෙසේ ගවයන් නිසා ද ඉතා මත්වූ; ඛ්‍යාසත්තමනසං, (නොලද වස්තූ පැතීම් වශයෙන් ද ලද වස්තු යෙහි බලවත් ගෙධ වශයෙන් ද නො එක් පරිද්දෙන් රූපාදිපඤ්චකාමයෙහි) විශෙෂ යෙන් ලග්න වූ සිත් ඇති; තං නරං, ඒ පුරුෂයා; සුත්තං ගාමං, නිද්‍රාවට එළැඹි සත්වසමූහයා නොහොත්: නිදන්නා වූ ගම්වැසි ජනයා මුහුදට ගෙනැයන; මහොඝො ඉව, (දෙතුන් යොදනෙකැ පැතිරයන ගැඹුරු) මහවතුරක්මෙන්; මච්චු, මරණ තෙමෙ; ආදාය, හැරගෙනැ; ගච්ඡති, යන්නේයි–අපාය නමැති මහමුහුදට පමුණුවන්නේයි.

## කිසාගොතමියා වත්ථු

## 20—11.

16. අන්තකෙන, මරහු විසින්; අධිපන්නස්ස,මඩනාලද සත්වය හට; තාණාය, රක්‍ෂාව පිණිස; පුත්තා, (දූයැ පුත්තුයැ යන) දරු වෝ; න සන්ති, නො වන්නාහ; පිතා, වැදූ පියා ද; න, රක්‍ෂාව පිණිස නොවන්නේයැ; අපි, වැළි; බන්ධවා; (සෙසු නං මල් බෑ බුහුන් නෑදිමසිල් ආදී) නෑයෝ ද; න,(රක්‍ෂාව පිණිස) නො වන් නාහ; (මෙකියනලද සියල්ලෝ මැ සෙසු දවස් බත්පිළිදීම් ආදි යෙන් කෘෂිවාණිජ්‍යකර්මාන්ත රාජකාර්‍ය්‍යාදියටත් නැංවීමෙන් සත්ව යාහට, උපකාරීව ද මියන වේලෙහි කිසි උපායකිනුදු මරණ වලකන්නට අසමර්ථහෙයින් රක්‍ෂාවපිණිස නො වන්නාහ එහෙයින්;) ඤාතිසු, නෑයන් කෙරෙහි;තාණතා, පිහිටවියයුතුබවෙක්; නත්ථි, නැති.

17. එතං අත්ථවසං ඤත්වා, (මරහු විසින් මඩනාලද සත්වය හට නෑයන් පිහිට වන්නට අසමර්ථබවය යි කියනලද) මේ කාරණය දැනැ; පණ්ඩිතො, නුවණැති මහණතෙමෙ; සීලසංවුතො, චතුපාරිසුද්ධිසීලයෙන් රක්‍ෂිතගොපිත වූ යේ; නිබ්බාන ගමනං මග්ගං, නිවනට යන මග (අරීඅටඟිමග); ඛිප්පමෙව, වහා මැ; විසොධයෙ, පිරිසිදු කරන්නේයි.

## පටාචාරාය වත්ථු

## මග්ගවග්ගො වීසතිමො

1. මත්තා සුඛපරිච්චාගා පස්සෙ චෙ විපුලං සුඛං
චජෙ මත්තා සුඛං ධීරො සම්පස්සං විපුලං සුඛං. 290

2 පරදුක්ඛූපදානෙන අත්තනො සුඛමිච්ඡති
වෙර සංසග්ගසංසට්ඨො වෙරා සො න පරිමුච්චති. 291

3. යං හි කිච්චං තදපවිද්ධං අකිච්චං පන කයිරති
උන්නළානං පමත්තානං තෙසං වඩ්ඪන්ති ආසවා. 292

---

**21—1.**

1. මත්තා සුඛපරිච්චාගා, ස්වල්පමාත්‍ර වූ සුවයක් හැරීම හෙතු කොටගෙනැ; චෙ, ඉදින්; විපුලං සුඛං, උදාරවූ නිර්වාණ සුඛය; පස්සෙ, යම්හෙයෙකින් දක්නේ වේ ද එහෙයින්; විපුලං සුඛං සම්පස්සං, උදාර වූ නිර්වාණසුඛය දක්නා කැමැත්තා වූ; ධීරො, ප්‍රාඥපුද්ගලතෙමෙ; මත්තා සුඛං චජෙ, ඒ ස්වල්පවූසුඛය හරනේයි–එක් බත්තළියක් සරහා අනුභවකරන්නා හට මෙලොව ස්වල්ප වූ යම්සුවයෙක් උපදී ද ඒ සුවයහැර එදවස් පෙහෙවන්නහුට හෝ දන්දෙන්නහුට හෝ විපුල වූ යම් නිවන් සුවයෙක් ලැබේ ද ඒ නිවන්සුවය කැමති පුරුෂතෙමෙ ස්වල්ප වූ ඒ සුවය දුරුකරන්නේයැයි සේ යී.

**ගංගාරොහණ වත්ථු**

**21—2.**

2. පරදුක්ඛූපදානෙන, (අනුන් මරා තළා අනුන් ගැන්ත කොට ගෙනැ මේසේ) පරහට දුක්දීමෙන්; යො, යම් පුද්ගල යෙක්; අත්තනො, තමහට; සුඛං ඉච්ඡති, සුවකැමති වේ ද; සො, හෙතෙමෙ; වෙරසංසග්ගසංසට්ඨො, (බිණූවහුට පෙරළා බිණීමයැ ගැසුවහුට පෙරළා ගැසීමයැ යනාදී විසින් ඔවුනොවුන්ට කරන ලද) වෛරසංසර්ගයෙන් මිශ්‍රවූයේ; වෙරා, වෛරයෙන්; න පරිමුච්චති, නො මිදෙන්නේයි; (වෛරවශයෙන් සතතයෙන් දුකට පැමිණෙන්නේයි )

**කුක්කුටණ්ඩඛාදිකාය වත්ථු**

**21—3.**

3. යං හි, යමෙක් තෙමෙ; කිච්චං, මහණුන් විසින් කටයුතු ද; (හෙවත්: අපරිමාණශීලස්කන්ධගොපනය අරණ්‍යවාසය ධුතඞ්ග පරිහරණය භාවනාරාමතාය යනාදී වූ යමෙක් මහණුන් විසින් කටයුතු ද;)තං,ඒ;අපවිද්ධං,යම් කෙනෙකුන් විසින් හැරපියනලද ද; අකිච්චං පන,(මහණුන් විසින් නො කටයුතුවූ ශරීරමණ්ඩනයැ

4. යෙසඤ්ච සුසමාරද්ධා නිච්චං කායගතාසති
අකිච්චනෙත න සෙවන්ති කිච්චෙ සාතච්චකාරිනො
සතානං සම්පජානානං අත්ථං ගච්ඡන්ති ආසවා. 293

5. මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච ඛත්තියෙ
රට්ඨං සානුචරං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො. 294

---

පාත්‍රචීවරාදි පරිෂ්කාරමණ්ඩනයැ යන මේ) අකාරිය වනාහි; කයිරන්ති, කරනුලැබේ ද; උන්නළානං, හුවනලද මාන නළඇති; පමත්තානං, සමෘතිවිප්‍රවාසයෙන් ප්‍රමාද වූ; තෙසං, ඒ පුද්ගලයනට; ආසවා, කාමාශ්‍රවාදිචතුරාශ්‍රවයෝ; වඩ්ඪන්ති, වඩනාහුයි.

4. යෙසඤ්ච, යම් පුද්ගලකෙනෙකුන් විසින් වනාහි; කායගතා සති, කායිගයාසී භාවනා තොමෝ; නිච්චං, සතතයෙන්; සුසමාරද්ධා, මනාකොට වඩනාලද ද; කිච්චෙ, මහණුන් විසින් කටයුතුවූ සීල පරිපූරණයැ ධුතඞ්ගපරිහරණයැ භාවනාරාමතායැ යන මෙහි; සාතච්චකාරිනො, සතතකාරීවූ–සතතක්‍රියා ඇත්තාවූ; තෙ, ඔහු; අකිච්චං න සෙවන්ති, (ශරීරමණ්ඩන පරිෂ්කාරමණ්ඩනාදී) අකෘත්‍යය නොසෙව්නාහ; සතානං, සිහිඇත්තාවූ; සම්පජානානං, (චතු සම්පජඤ්ඤවසයෙන්) සම්පජානකාරීවූ; තෙසං, ඒ පුද්ගලයන්ට; ආසවා, කාමාශ්‍රවාදි චතුරාශ්‍රවයෝ මැ; අත්ථං ගච්ඡන්ති, පරික්ෂයට යන්නාහුයි.

## ලකුණ්ටකභද්දියත්ථෙරවත්ථු

### 21—4.

5. මාතරං, තෘෂ්ණා නමැති මවද; පිතරං, අස්මිමාන නමැති පියා ද; ද්වෙ ඛත්තියෙ රාජානො ච, ශාස්වතදෘෂ්ටිය උච්ඡේදදෘෂ්ටිය යන ක්ෂත්‍රිය රජුන් දෙදෙනා ද; හන්ත්වා, අර්හත්මාර්ගඥාන නමැති ඛඩ්ගයෙන් නසා; සානුචරං, නන්දිරාගය යි කියනලද අයකැමියා හා සහිතවූ; රට්ඨං, ද්වාදශායතනය යි කියනලද රටද; හන්ත්වා, අර්හත්මාර්ගඥාන නමැති ඛඩ්ගයෙන් නසා; බ්‍රාහ්මණො, බාහිතපාපීවූ ක්ෂීණාශ්‍රව තෙමේ; අනීඝො යාති, නිදුක්වැ නිවන්පුරට යන්නේ යි. මෙහි "තණ්හා ජනෙති පුරිසං" යි වදාළබැවින් භවත්‍රයෙහි සත්වයන් උපදවන හෙයින් තෘෂ්ණා තොමෝ මවු නම් වුව අසෝ රජහුගේ අසෝ රාජාමාත්‍යයාගේ පුත්‍රත්‍රයෙම් පියා නිසා පුතුව මාතය උපදනා හෙයින් නවවිධ වූ අස්මිමානය පියා නම් විය යි, සියලු ලෝ වැස්සා රජහු භජනය කරන්නා මෙන් සියලු දෘෂ්ටිහු තාක් ශාස්වතොච්ඡේද දෘෂ්ටින් දෙදෙනා භජනය කෙරෙත්නුයි

6. මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච සොත්ථියෙ
වෙය්‍යග්ඝපඤ්චමං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො. 295

7. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච නිච්චං බුද්ධගතාසති. 296

---

ශාශ්වතොච්ඡෙද දෘෂ්ටීන් දෙදෙනා ක්ෂත්‍රිය රජුන් දෙදෙනෙක් නම්වූය, චක්ඛායතනාදි දොළොස් ආයතනයෝ පතළ අර්ථයෙන් රටක් වැනිහෙයින් රට නම් වූය, ඔවුන් නිසා පවත්නාවූ නන්දිරාගය රටින් අය නඟන අයකැමියකු වැනිහෙයින් අනුචර නම් විය යි දතයුතු.

6. මාතරං, තෘෂ්ණා නමැති මව ද; පිතරං, අස්මිමාන නමැති පියා ද; ද්වෙ ච සොත්ථියෙ රාජානො, ශාශ්වතදෘෂ්ටියැ උච්ඡෙද දෘෂ්ටියැ යන බ්‍රාහ්මණරජුන්දෙදෙනා ද; හන්ත්වා, අර්හත්මාර්ගඥාන නමැති ඛඩ්ගයෙන් නසා; වෙය්‍යග්ඝපඤ්චමං හන්ත්වා, විචිකිත්සා නීවරණය පස්වනු කොට ඇති කාමච්ඡන්දාදිනීවරණපඤ්චකය අර්හත්මාර්ගඥාන නමැති ඛඩ්ගයෙන් සිඳිනැති කොට නසා; බ්‍රාහ්මණො, බාහිතපාපී වූ ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණතෙමෙ; අනීඝො යාති, නිදුක්වැ නිවන්පුරට යන්නේයි.— (මෙහි ව්‍යාඝ්‍රසඤ්චාර ඇති භයසහිත වූ නො බස්සැහැකි වූ මඟ වෙය්‍යග්ඝ නම් වෙයි, විචිකිත්සා නීවරණය ද ඒ හා සාදෘශ්‍ය හෙයින් වෙය්‍යග්ඝ නම් වෙයි; ඒ වෙය්‍යග්ඝය පස්වනු වූ යේ මේ කාමච්ඡන්දාදියට නු යි කාමච්ඡන්දාදිනීවරණපඤ්චකය වෙය්‍යග්ඝපඤ්චම නම් වේ.)

## —ලකුණ්ටකභද්දියත්ථෙරවත්ථු—

### 21—5.

7. යෙසං, යම් තථාගතශ්‍රාවකකෙනෙකුන්ට; දිවා ච, දිවා භාගයෙහි ද; රත්තො ච, රාත්‍රිභාගයෙහි ද; නිච්චං, සතතයෙන්; බුද්ධගතාසති, ("ඉතිපි සො භගවා අරහං" යනාදි වූ ප්‍රභෙදඇති) බුදුගුණ අරභයා උපදනා වූ සති තොමෝ; (අත්ථි, ඇත් ද;) ගොතම සාවකා, ගෞතමගෝත්‍රඇති බුදුන්ගේ ඒ ශ්‍රාවකයෝ; සදා, හැම කල්හි මැ; සුප්පබුද්ධං පබුජ්ඣන්ති, බුදුගුණ සිහින් මැ ගෙනැ[1] නිඳපුබුදිනා හෙයින් සුප්‍රබුද්ධ වැ පුබුදිනාහු යි-යෙහෙන් නිඳ යෙහෙන් පුබුදිනාහ යී සේයි.—

(මතු කියන ගාථා පසෙහිදු වෙනස් පදය තබා සෙසු පද යෙහි අර්ථ මෙමැ නයින් දතයුතු.)

---

1. සිහින් සලකාගෙනැ මැ-

8. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච නිච්චං ධම්මගතාසති. 297

9. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච නිච්චං සඞ්ඝගතාසති. 298

10. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච නිච්චං කායගතාසති. 299

11. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච අහිංසාය රතො මනො. 300

12. සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගොතමසාවකා
යෙසං දිවා ච රත්තො ච භාවනාය රතො මනො. 301

---

8. ධම්මගතාසති, ("ස්වාක්ඛාතො භගවතා ධම්මො" යනාදි වූ ප්‍රභෙද ඇති) සපර්‍යාප්තිකනවලොකොත්තරධර්මය අරභයා උපදනා සතිතොමෙ ඇත්ද.

9. සඞ්ඝගතාසති, ("සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො" යනාදි වූ ප්‍රභෙද ඇති) සඞ්ඝගුණය අරභයා උපන් සතිතොමෙ ඇත්ද.

10. කායගතාසති, (ද්වත්තිංසාකාරවසයෙන් හෝ නවසීවථිකාවසයෙන් හෝ චතුධාතුවවත්ථානවසයෙන් හෝ අජ්ඣත්තනීල කසිණාදි රූපධ්‍යානවශයෙන් හෝ) කය අරභයා උපදනා සති තොමෝ ඇත්ද.

11. යෙසං, යම් තථාගතශ්‍රාවක කෙනෙකුන්ගේ; මනො, සිත; දිවා ච, දිවාභාගයෙහි ද; රත්තො ච, රාත්‍රිභාගයෙහි ද; (නිච්චං, සතතයෙන්;) අහිංසාය රතො, ("සො කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති" යනාදිනයින් කියනලද) කරුණාභාවනායෙහි ඇලිණී ද; තෙ ගොතමසාවකා, ඒ ගෞතම ගොත්‍ර ඇති බුදුන්ගේ ශ්‍රාවකයෝ; සදා, හැමකල්හි මැ; සුප්පබුද්ධං පබුජ්ඣන්ති, කරුණාභාවනා සිතින් ගෙනැ නිදා එමැ සිතින් ගෙනැ පුබුදිනාහෙයින් සුප්‍රබුද්ධ වැ පුබුදිනාහුයි-යෙහෙන් නිදා යෙහෙන් පුබුදිනාහ යී සේයි.

12. යෙසං, යම් තථාගතශ්‍රාවකකෙනෙකුන්ගේ; මනො, සිත; දිවා ච, දිවාභාගයෙහි ද; රත්තො ච, රාත්‍රිභාගයෙහි ද; (නිච්චං, සතතයෙන්;) භාවනාය රතො, මෛත්‍රීභාවනායෙ හි ඇලිණී ද; තෙ ගොතමසාවකා,ඒ ගෞතමගොත්‍ර ඇති බුදුන්ගේ ශ්‍රාවකයෝ;

13. දුප්පබ්බජ්ජං දුරභිරමං දුරාවාසා ඝරා දුඛා
දුක්ඛො සමානසංවාසො දුක්ඛානුපතිතද්ධගූ
තස්මා න චද්ධගූ සියා දුක්ඛානුපතිතො සියා. 302

---

සදා, හැමකල්හි මැ; සුප්පබුද්ධං පබුජ්ඣන්ති, මෛත්‍රීභාවනාව සිතින් ගෙනැ නිදා එමැ සිතින් ගෙනැ පුබුදිනාහෙයින් සුප්‍රබුද්ධ වැ පුබුදිනාහුයි-යෙහෙන් නිදා යෙහෙන් පුබුදිනාහ යී සේයි.

දාරුසාකටිකපුත්තවත්ථු

## 21—6.

13. දුප්පබ්බජ්ජං, (මඳ වූ හෝ බොහෝ වූ හෝ භොගසම්පත්තිය ද බන්ධුජනයා ද හැරැපියා මේ බුදුසස්නෙහි ලා දී[1]) මහණ වීම දුක හෙවත්: උගහටයැ; දුරභිරමං, (එසේ පැවිදි වූ වහු විසිනුදු භික්ෂාචර්‍ය්‍යායෙන් ජීවිතවෘත්තිය පවත්වම් යි අපරිමාණ වූ ශීලස්කන්ධය රක්ෂාකිරීමෙන් ධර්මානුධර්මප්‍රතිපත්තිපූරණවශයෙන්) ශාසනයෙහි සිත ඇලවීම දුක-උගහටයැ; ඝරා ගෘහයෝ; දුරාවාසා, දුක් වූ වාස ඇත්තාහ-වසන්නට නොපිළිවන්හ; (යම් හෙයෙකින් ගිහිගෙයි වසන්නහු විසින් රජකාරිය කටයුතු ද තමහට සතුරු වැ සිටියවුන්ට කළම්නාකාරිය කටයුතු ද පරිජනයාහට ද ධාර්මිකශ්‍රමණබ්‍රාහ්මණයන්ට ද සංග්‍රහකටයුතු ද එසේ කල්හි ගෘහවාසය සිල්කළයක් මෙන් ද මහමුහුද මෙන් ද නො පිරියැහැකි ද එහෙයින් ගෘහවාසයෝ;) දුඛා, දුක්හ-උගහටයහ; අසමානසංවාසො, (ජාති ගොත්‍රකුලභොගාදියෙන් සමානවැ ද නො කවරෙක්හි ද මම් කවරෙකිම් දූයි යනාදින් බැණැ විවාදකරන සුලු ගිහිය සීලාචාරබාහුසච්චාදියෙන් සමාන වැ ද නො කවරෙක්හි ද මම් කවරෙකිම් දූ යනාදීන් බැණැ විවාදකරන සුලු වූ ප්‍රව්‍රජිතයෝයැ යන මේ) අසමාන වූ අදහස් ඇත්තවුන් හා එක් වැ විසීම; දුක්ඛො, දුක-උගහටයැ; අද්ධගූ, යම් කෙනෙක් සසරවට නමැති අධන්මගට පැමිණියො ද; දුක්ඛානුපතිතා, ඔහු ඒ සංසාරදුක්ඛය විසින් අනුව යන ලද්දාහු නම් වෙති; තස්මා, ඒ කාරණයෙන්; අද්ධගූ න ච සියා, සසරනමැති අධන්මගට නොද පැමිනෙන්නෙයැ; දුක්ඛානුපතිතො න ච සියා, ඒ සංසාරදුක්ඛයා විසින් අනුවැ යනලද්දේ නොද වන්නේයි.

වජ්ජිපුත්තකභික්ඛුස්ස වත්ථු

---

1. ලැදිවැ.

14. සද්ධො සීලෙන සම්පන්නො යසො භොගසමප්පිතො
යං යං පදෙසං භජති තත්ථ තත්ථෙව පූජිතො. 303

15. දූරෙ සන්තො පකාසෙන්ති හිමවන්තො ච පබ්බතො
අසන්තෙත්ථ න දිස්සන්ති රත්තිඛිත්තා යථා සරා. 304

---

## 21—7.

14. සද්ධො, (රත්නත්‍රය හැදහීම ලක්ෂණකොට ඇත්තා වූ ද කර්මඵල හැදහීම ලක්ෂණකොට ඇත්තා වූ ද) ලෞකික ලොකොත්තර ශ්‍රද්ධායෙන් සමන්විත වූ; සීලෙන සම්පන්නො, අගාරිකශීලයෙන් සමන්විත වූ; යසොභොගසමප්පිතො, (අනාථපිණ්ඩිකාදීන්ගේ පිරිවර බඳු වූ අගාරිකයසසින් ද ධනධාන්‍යයෑ සප්තවිධ වූ ආර්‍ය්‍යධනයෑ යන මේ) විවිධ භොගසම්පත්තීන් ද යුක්ත වූ කුලපුත්‍ර තෙමේ; යං යං පදෙසං භජති, පූර්වදිග්ආදීන් අතුරෙන් යම් යම් ප්‍රදෙශයකට එළැඹියේ වේ ද; තත්ථ තත්ථෙව, ඒ ඒ තන්හි මැ; පූජිතො, (දිව්‍යමනුෂ්‍යයන් විසින් නොඑක් පඬුරු එළවීමෙන් මහත් ලාභසත්කාරයෙන්) පුදනු ලබන්නේයි.

### චිත්තගහපතිකවත්ථු

## 21—8.

15. සන්තො, (පූර්වබුද්ධවරයන් කෙරෙහි දානශීලාදිවශයෙන් කෘතාධිකාර වූ උත්සන්නකුසලමූලයන් ඇති භාවිත වූ භාවනා ඇති) සාධුහු; දූරෙ, දුර සිටියාහු ද; හිමවන්තො පබ්බතො ඉව, (තුන්දහසක් යොදුන් අයම්විත්ථරඇති පන්සියක් යොදුන් උස ඇති සුවාසූදහසක් කූළින් සැදුම්ලද)හිමාලයපර්වතය මෙන්; පකාසෙන්ති, බුදුනුවණට ප්‍රකටවෙති, (පහළවැ වැටහෙති[1]); එත්ථ, මේ ලොකයෙහි; අසන්තො, (මෙලොව මැ ගරුකොට සිතන්නාවූ හළුවා වූ පරලොව ඇති ප්‍රත්‍යය භෙදයෙන්[2] යුක්ත වූ ජීවිකාජීවී වැ පැවිදි වූ) බාලපුද්ගලයෝ; රත්තිඛිත්තා සරා යථා, චතුරඞ්ගසමන්විතඝනාන්ධකාරරාත්‍රියෙහි විලම්විදි ශරයක්මෙන්; න දිස්සන්ති, නො පැනෙන්නාහුයි; (එබඳු වූ පූර්වහෙතුවක් නැතිහෙයින් බුදුන්ගේ දකුණු දණමඬල සමීපයෙහි උන්නාහු ද බුදුනුවණට හමුනොවන්නාය යී සේයි.)

### චූලසුභද්දා. වත්ථු

---

1. (පහළවෙති) 2. පුත්‍රභෙදයෙන්-මු.

16. එකාසනං එකසෙය්‍යං එකො චරමතන්දිතො
එකො දමයමත්තානං වනන්තෙ රමිතො සියා'ති. 305

—පකිණ්ණකවග්ගො එකවීසතිමො—

1. අභූතවාදී නිරයං උපෙති යො චාපි කත්වා න කරොමී'ති [1] චාහ
උභොපි තෙ පෙච්ච සමා භවන්ති නිහීනකම්මා මනුජා පරත්ථ. 306

21—9.

16. එකාසනං, හුදකලාවැ ඉඳීම සෙවුනේය- (ගණසඞ්ගණිකායෙන් දුරුවැ ද කෙලශසඞ්ගණිකායෙන් දුරු නුවුව හොත් හුදකලා උන්නා නම් නොවෙයි භික්ෂූන් දහසක් මැදවුවද මූල කර්මස්ථානය නො හැර එමැ මනස්කාරයෙන් යුක්ත වැ හුන්න හුගේ හිඳී ම එකාසන නම් වෙයි එසේ වූ) එකාසනය සෙවුනේයි; එකසෙය්‍යං, හුදකලා [2] හෙවීම සෙවුනේයි- (ගණසඞ්ගණිකායෙන් දුරුවැ ද කෙලශසඞ්ගණිකායෙන් දුරු නු වුව හොත් හුදකලා හොත්තා නම් නො වෙයි ලොවාමහපායවැනි මහ පායක ද භික්ෂූන් දහසක් මැද පණවනලද විසිතුරුපස තුරුණු කන්වයින් ඇති මහඇගි යහන්හි සිහි එළවා දකුණැලයෙන් මූලකර්මස්ථානයෙන් යෙදී හොත්තාහුගේ ශය්‍යාව එකශය්‍යා නම් වෙයි එසේ වූ) එකශය්‍යාව සෙව්නේය; අතන්දිතො, ජඞ්ඝා බලයෙන් පිඩුසිඟා ජීවත්වනබැවින් අකුසීත වැ; එකො චරං, සතරඉරියවුවෙහිමැ හුදකලාවැ පවත්මින්; අත්තානං, තමා; එකො දමයං,(රාත්‍රිස්ථාන දිවාස්ථානාදියෙහි කර්මස්ථානයෙහි යෙදී) හුදකලාවැ මැ තමා දමන්නාවූ මහණතෙමෙ;වනන්තෙ රමිතො සියා, ස්ත්‍රීපුරුෂ ශබ්දාදියෙන් විවික්ත වූ ගැඹුරුවල්හි මැ අභිරත වන්නේයි සිත් ඇලෙන්නේයි- හුදකලා වැ වැසැමූත් ආකිණ්ණ විහාරීවැ තමා දමන්නට නොපිළිවන්නැ යි සේයි—

—එකවිහාරිකත්ථෙරස්ස වත්ථු—

## —පකිණ්ණකවග්ගො එකවීසතිමො—

22—1.

1. අභූතවාදී, (මෙරමාගේ දොෂයක් නො දැක නො අසා මැ පරහට අභ්‍යාඛ්‍යානය කරනුපිණිස නො කී නො කළ දෙය කී කළහ යි) බොරු කියන පුද්ගල තෙමෙ; නිරයං උපෙති, නරකයට යන්නේයි; අපි, නැවත; යො, යමෙක්;කත්වා,පවුකම්කොට;

1. නකරොමි-ම. 2. හුදකලාහුගෙ.

2. කාසාවකණ්ඨා බහවො පාපධම්මා අසඤ්ඤතා
පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උපපජ්ජරෙ. 307

3. සෙය්‍යො අයොගුළො භුත්තො තත්තො අග්ගිසිඛූපමො
යඤ්චෙ භුඤ්ජෙය්‍ය දුස්සීලො රට්ඨපිණ්ඩං අසඤ්ඤතො. 308

---

න කරෙමීතිචාහ, නො කෙළෙම් යි කියාද; හෙද නරකයට යන්නෙයැ; නිහීනකම්මා, ලාමක වූ ක්‍රියා ඇති; තෙ උභොපි මනුජා, ඒ මිනිස්සු දෙදෙන මැ; පෙච්ච, මෙයින් මියැ; පරත්‍ථ, පරලොවදී; සමා භවන්ති, නරකයෙහි උත්පත්තිය හෙතු කොටගෙන ගතිවශයෙන් සමවන්නාහුයි. ගතිවශයෙන් මෙ දෙදෙන සමවුවද විපාකානුභවවශයෙන් වෙනස ඇතිබැවින් යමක්හු විසින් බොහෝ පව්කම් කරනලද්දේ වී නම් බොහෝ කලක් නරකයෙහි පැසෙයි යමක්හු විසින් මඳක් පව් කරන ලද්දේ වී නම් ඒ මඳ කලක් පැසෙයි යනු මොවුන්ගේ වෙනසයි.

### සුන්දරීපරිබ්බාජිකා වත්ථු

### 22—2.

2. කාසාවකණ්ඨා, කාෂායවස්ත්‍රයෙන් වෙළනලද ග්‍රීවා ඇති හෙවත්: දසරුවෙහි ලූ කසාකඩ ඇති; පාපධම්මා, මහණපිළිවෙතැ නොයෙදුණුහෙයින් ලාමකස්වරූප[1] ඇති; අසඤ්ඤතා, කායවාක්සංයම රහිත වූ පුද්ගලයෝ; බහවා, බොහෝ වූය; තෙ පාපා, ඒ ලාමකපුද්ගලයෝ; පාපෙහි කම්මෙහි, තමන්විසින් කරනලදපාපකර්මයෙන්; නිරයං, නරකයෙහි; උපපජ්ජරෙ, උපදනාහුයි.

### දුච්චරිතඵලානුභවසත්තානං වත්ථු

### 22—3.

3. දුස්සීලො, හීනශීලහෙයින් සිල් නැත්තා වූ; අසඤ්ඤතො, කායවාක්සංයමරහිත වූ පුද්ගලතෙමෙ; රට්ඨපිණ්ඩං, රට වැස්සන් විසින් සැදැහැයෙන් දෙනලදඅහර; චෙ, ඉදින්; භුඤ්ජෙය්‍ය, (මමත් ශ්‍රමණයෙමි ප්‍රතිඥ කොට) වළඳන්නෙ වේ ද (එයට වඩා); තත්තො, දිලිහුණා වූ; අග්ගිසිඛූපමො, ගිනිසිළක් වැනි වූ; අයොගුළො, යවට; භුත්තො, වළඳනලද්දේ; සෙය්‍යො, උත්තමයි; (කුමක් හෙයින් දූ යත්? ලෝගුළාගිලූපසයෙන් එක මැ අත්බැවෙකැ දන්නෙයැ දුශ්ශීලයා වනාහි ශ්‍රද්ධාදෙය වූ අහර වළඳ නො එක් ජාතිශතසහස්‍රයෙහි[2] නරකයෙහි පැසෙන්නේයැ එහෙයිනි.)

### වග්ගුමුදාතීරියභික්ඛූනං වත්ථු

---

1. සවභාව- 2. ශතසහස්‍රගණනෙහි-ඇතැම්.

4. චත්තාරී ඨානානි නරො පමත්තො ආපජ්ජති පරදාරූපසෙවී
අපුඤ්ඤලාභං න නිකාමසෙය්‍යං නින්දං තතියං නිරයං චතුත්ථං. 309

5. අපුඤ්ඤලාභො ච ගතී ච පාපිකා භීතස්ස භීතාය රතී ච ථොකිකා
රාජා ච දණ්ඩං ගරුකං පණෙති තස්මා නරො පරදාරං න සෙවෙ. 310

6. කුසො යථා දුග්ගහිතො හත්ථමෙවානුකන්තති
සාමඤ්ඤං දුප්පරාමට්ඨං නිරයායුපකඩ්ඪති. 311

---

## 22—4.

4. පරදාරූපසෙවී, පරස්ත්‍රීසෙවනයකරන සුලුවූ; පමත්තො නරො, ප්‍රමාද ශීලි වූ පුරුෂතෙමෙ; අපුඤ්ඤලාභං, පළමු වනු වූ අකුශලප්‍රතිලාභය ද; න නිකාමසෙය්‍යං, දෙවනු වූ නිකාම සෙය්‍යාව නොලැබීම ද හෙවත්: කැමති පරිද්දෙන් වැදහෙවීම නො ලදින් ස්වල්ප වූ මඳකලක් වැදහෙවීමද; තතියං; තුන්වනු වූ; නින්දං, මෙලොව මැ ලබනනින්දාව ද; චතුත්ථං, සතරවනු වූ, නිරයං, අපුණ්‍යප්‍රතිලාභයෙන් සිඬවන්නා වූ නරකොත්පත්තිය ද යන; චත්තාරි ඨානානි, මේ දුඃඛකාරණයන් සතරදෙනාම; ආපජ්ජති, පැමිණෙන්නේයි.

5. අපුඤ්ඤලාභො ච, (මෙ කී පරිද්දෙන් ඒ පුරුෂයහට මේ) අකුශල ප්‍රතිලාභය ද; පාපිකා ච ගති,(ඒ අකුශල ප්‍රතිලාභයෙන් සිඬවන්නා වූ නරකොත්පත්ති සඞ්ඛ්‍යාත වූ) ලාමකගතිය ද යම් හෙයෙකින් වේ ද; භීතස්ස, භයපත් වූ පුරුෂයාගේ; භීතාය, භයපත් වූ ස්ත්‍රිය හා සමඟ සංසර්ගයකරන්නහුට උපදනා වූ; රතී ච, කාමරතිය ද; ථොකිකා, සිත්සේ පවත්නට නො පිළිවන් බැවින් ස්වල්පවන්නීය; රාජා ච, රජ ද; ගරුකං දණ්ඩං පණෙති,(යම් හෙයෙකින් අත් පා කැපීම් ආදි වශයෙන්) ගරු වූ දණ්ඩනය යොදන්නේ ද; තස්මා, ඒ කාරණයෙන්; නරො, පුරුෂ තෙමෙ; පරදාරං න සෙවෙ, පරස්ත්‍රීසෙවනය නො කරන්නේයි.

~ඛෙමස්ස වත්ථු~

## 22—5.

6. කුසො, යම්කිසිකරතණයෙක්, දුග්ගහිතො, වරදවා ගන්නා ලද්දේ හෙවත්: නොපිටට අදනාලද්දේ; හත්ථමෙව, (ගත්) අතමැ; යථා අනුකන්තති, යම්සේ කපා ද (එපරිද්දෙන් මැ); සාමඤ්ඤං, ශ්‍රමණභාවය ද හෙවත්: මහණධම් ද; දුප්පරාමට්ඨං, ඛණ්ඩසීලාදිවශයෙන් වරදවා ගන්නාලද්දේ; නිරයාය, නරකයට; උපකඩ්ඪති, අදනේයි- ඔහු නරකයෙහි උපදවන්නේයැ යී යේයි.

7. යං කිඤ්චි සිථිලං කම්මං සඞ්කිලිට්ඨඤ්ච යං වතං
සඞ්කස්සරං බ්‍රහ්මචරියං න තං හොති මහප්ඵලං. 312

8 කයිරා චෙ [1] කයිරාථේතං දළ්හමෙතං පරක්කමෙ
සිථිලො හි පරිබ්බාජො භිය්‍යො ආකිරතෙ රජං. 313

9. අකතං දුක්කතං සෙය්‍යො පච්ඡා තපති දුක්කතං
කතඤ්ච සුකතං සෙය්‍යො යං කත්වා නානුතප්පති. 314

---

7. සිථිලං, (පසුබැසැ බැසැ)ශිථිල කොට කරනලද; යං කිඤ්චි කම්මං, යම්කිසි කුශලකර්මයෙක් ඇත්ද; සඞ්කිලිට්ඨං, (වෛශ්‍යාවීථි ආදි) අගොචරයෙහි හැසිරීමෙන් සකිලිටු වූ; යං වතං, ශීලසඞ්ඛ්‍යාත වූ යම් ව්‍රතයෙක් ඇත්ද; නොහොත්: සඞ්කිලිට්ඨං, (ඉච්ඡායෙන් මඩනාලදුව මේ නිසා ලොකයා මට සම්භාවනා කෙරෙයි) ලාභාශායෙන් කරනහෙයින් සකිලුටු වූ; යං වතං, ආරණ්‍යකාදි යම් ධුතාඞ්ගව්‍රතයෙක් ඇත්ද; සඞ්කස්සරං, ශඞ්කායෙන් යුක්ත වැ හැසිරියයුතුවූ; (හෙවත්: පොහෝපවුරුණු ආදිය පිණිස රැස් වූ සඞ්ඝයා දැක එකාන්තයෙන් මොහු මාගේ හසර දැනැ මට උත්ක්ෂෙපණිය කර්මකරන්නට රැස්වූවහයි මෙසේ තමා විසින් ශඞ්කායෙන් යුක්ත වැ ඇවිද්ද යුතුවූ ද යම්කිසිවක්හු විසින් විහාරයෙහිදී කරනලද අනාචාරයක් දැකැ මේ අනාචාරය කෙළේ වූ කලී මේ මහණය යි මෙසේ අනුන් විසින් සැකකටයුතු වූද පැවැතුම් ඇති හෙයින් ශඞ්කායෙන් යුක්ත වැ හැසිරියයුතු වූ); යං බ්‍රහ්මචරියං, යම් මහණධර්මයෙක් ඇත්ද; තං, ඒ සියල්ල; මහප්ඵලං න හොති,(ප්‍රතිසන්ධිප්‍රවෘත්ති විපාකවශයෙන්) මහත්ඵල ඇත්තේ නොවේ.

8. චෙ, ඉදින්; කයිරා, යම් කුශලකර්මයක් කරන්නේ වී නම්; කයිරාථ, ඒ කරන්නේ මැයැ; එතං, ඒ කුශලකර්මය ද; දළ්හං, තරකොට මැ; පරක්කමෙ, අවස්ථිත වූ සමාදාන ඇති වැ මැ කරන්නෙයැ; කුමක්හෙයින් දැ යත්? හි, යම්හෙයෙකින්; සිථිලො, ඛණ්ඩාදි භාවයට පමුණුවනලද; පරිබ්බාජො, ශ්‍රමණධර්මය; භිය්‍යො, වඩාලා මැ-බොහෝකොට මැ; රජං, රාගාදිරජස; ආකිරතෙ, (ඔහුගේ සන්තානයෙහි) වත්කරන්නෙ වේ ද එහෙයිනි.

### දුබ්බචභික්ඛුස්ස වත්ථු

22—6.

9. දුක්කතං, (සාවද්‍ය වූ දුඃඛවිපාක වූ) අකුශලකර්මය; අකතං, නො කරනලද්දේ මැ; සෙය්‍යො, උත්තම යි; කුමක්හෙයින්දැ යත්?

---

1 කයිරථෙ.

10. නගරං යථා පච්චන්තං ගුත්තං සන්තරබාහිරං
එවං ගොපෙථ අත්තානං ඛණො වෙ මා උපච්චගා
ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා. 315

11. අලජ්ජිතායෙ ලජ්ජන්ති ලජ්ජිතායෙ න ලජ්ජරෙ
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං. 316

---

දුක්කතං, අකුශලකර්මය තෙමෙ; පච්ඡා තපති, පසුව, (සිහිකල විටක් පාසා මෙලොව උපදනා විපිළිසරතැවිල්ලෙන්ද පර ලොව අපායතැවිල්ලෙන්ද) තවන්නෙයැ එහෙයින්; යං කත්වා, යම්[1] කර්මයක් කොට; පච්ඡා, පසුව; න අනුතප්පති, මෙලොවද පරලොවද නො තැවේද; සුකතං, එසේ වූ කුශල කර්මය; කතං, කරනලද්දේ; සෙය්‍යො, උත්තම යි.

## ආගන්තුකභික්ඛූනං වත්ථු

### 22—7.

10. පච්චන්තං,ප්‍රත්‍යන්තයෙහි වූ (හෙවත්: රට කෙළවර පිහිටි); සන්තරබාහිරං, (මාරප්‍රාකාරාදිය තරකිරීමෙන්) ඇතුළත හා (සහිතකොට දොරටු අටලුපදනම් අගල ආදි තරකිරීමෙන්) පිටත සහිතකොට (හෙවත්: ඇතුළතින් පිටතින්); ගුත්තං, සොරුන් තො වැද්දහැකිසේ රක්නාලද; නගරං, නුවරෙක්; යථා, යම්සේ ද; එවං, එපරිද්දෙන් මැ; අත්තානං, ආත්මය (හෙවත්: තොපගේ සිත); ගොපෙථ, රක්‍කු;[2] (හෙවත්: චක්ෂුරාදි සදොර පියාලා සිහිනමැති දොරටුගොච්චා එළවා සිටුවාලා බාහිරායතන යන් සදෙනා විසින් ආධ්‍යාත්මිකායතනයන් සදෙනාහට උප ඝාතනයක් නොවනලෙස සකස්කොට සිත රක්‍කු;) හි, යම් හෙයෙකින්; ඛණාතීතා,බුද්ධොත්පාදක්ෂණය ඉක්මුණාහු; නිරයම්හි සමප්පිතා, නරකයෙහි; ඉපැදැ; සොචන්ති,බොහෝකලක් ශොක කෙරෙත්ද එහෙයින්;ඛණො, අෂ්ටදුෂ්ටක්ෂණයෙන් විනිර්මුක්ත වූ පරම දුර්ලභ වූ) බුද්ධොත්පාදක්ෂණය තෙමේ; වෙ, එකාන්ත යෙන්මැ; මා උපච්චගා, න හමක් ඉක්මෙවා.

## සමණගුලානං ආගන්තුගනිගණ්ඨානං වත්ථු

### 22—8.

11. අලජ්ජිතායෙ ලජ්ජන්ති, (භික්ෂාභාජනයෙහි රජස්වගුලේවී නම් සියුම් සියුම් ප්‍රාණීන් දිවි නැසුවා නම් වම්හයි පාපයෙහි

---

1. යම්කුශල. 2. රක්කෙ.

12. අභයෙ ච භයදස්සිනො භයෙ ච අභයදස්සිනො
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං. 317

13. අවජ්ජෙ වජ්ජමතිනො වජ්ජෙ චාවජ්ජදස්සිනො
මිච්ඡාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතිං. 318

---

ලජ්ජායෙන් භික්ෂාභාජනය වසාගෙනැ ඇවිදිනා ආජීවකයන් මෙන්) ලජ්ජා නොකටයුතු තන්හි යමෙක් ලජ්ජා කෙරෙත්ද; ලජ්ජිතාමයෙ න ලජ්ජරෙ, (ලජ්ජාස්ථානය වැසුමෝ නම් අපගේ තපස් බිඳියෙත්යයි [1] ද : යෙහි ලජ්ජායෙන් රහස්පියෙස නො වසා ඇවිදිනා නිගණ්ඨයන් මෙන්) යමෙක් ලජ්ජාකටයුතු තන්හි ලජ්ජා නො කෙරෙත්ද; මිච්ඡාදිට්ඨිසමාදානා, (ලජ්ජා නො කළ මනා තන්හි ලජ්ජාකිරීමයැ ලජ්ජාකටයුතුතන්හි ලජ්ජා නො කිරීමයැ යන මේ) තුච්ඡ වූ විපරීත වූ දෘෂ්ටියෙන්; [2] සත්තා, අඥාන සත්ත්වයෝ; දුග්ගතිං ගච්ඡන්ති, නරකාදි සතරඅපායට යන්නාහුයි.

12. අභයෙ ච භයදස්සිනො, (රජස් නම් සියුම් ප්‍රාණීහුයැ ඉදින් භික්ෂාභාජනයෙහි රජස් වගුළේ වී නම් ප්‍රාණීන් දිවි නැසුවා නම් වෙතයි පාපයෙහි භයින් භික්ෂාභාජනය වසාගෙනැ ඇවිදිනා ආජීවකයන් මෙන්) භය නොකළමනා තන්හි භය දක්නා සුලුවූ; භයෙ ච අභයදස්සිනො, (ලජ්ජාස්ථානය ඉදින් වැසුමෝ නම් අපගේ තපස් බිඳී යන්නේයැ යි පාපයෙහි භයින් රහස් පියෙස නොවසා ඇවිදිනා නිගණ්ඨයන් මෙන්) භය කළ මනා තන්හි අභය දක්නා සුලු වූ; මිච්ඡාදිට්ඨිසමාදානා, මෙසේ තුච්ඡවූ විපරීතවූ දෘෂ්ටිය ගෙනැ වසන්නා වූ; සත්තා, ඒ අඥාන සත්ත්වයෝ; දුග්ගතිං ගච්ඡන්ති, නරකාදි දුගතියට යන්නාහුයි.

## නිගණ්ඨානං වත්ථු.

## 22—9.

13. අවජ්ජෙ, (දශවස්තුක වූ සම්‍යග්දෘෂ්ටියැ ඒ සම්‍යග්දෘෂ්ටියට උපනිශ්‍රය වූ ධර්මයැ යන මේ) නිරවද්‍යයෙහි; වජ්ජමතිනො, මේ සාවද්‍යය යන බුද්ධි ඇත්තාවූද; වජ්ජෙ ච, (දශවස්තුකවූ මිථ්‍යා දෘෂ්ටියැ ඒ මිථ්‍යාදෘෂ්ටියට උපනිශ්‍රය වූ ධර්මයැ යන මේ) සාවද්‍ය යෙහි; අවජ්ජදස්සිනො, නිරවද්‍යයැයි දක්නාසුලුවූ; මිච්ඡාදිට්ඨිසමාදානා, මෙසේ තුච්ඡවූ විපරීතදෘෂ්ටියැ ගෙනැ වසන්නාවූ; සත්තා, ඒ අඥාන සත්ත්වයෝ; දුග්ගතිං ගච්ඡන්ති, නරකාදි දුගතියට යන්නාහුයි.

---

1. බිඳීයෙයි. 2. දෘෂ්ටියගෙණ වසත්

14. වජ්ජඤ්ච වජ්ජතො ඤත්වා අවජ්ජඤ්ච අවජ්ජතො
සම්මාදිට්ඨිසමාදානා සත්තා ගච්ඡන්ති සුග්ගතින්ති. 319

## නිරයවග්ගො බාවීසතිමො

1. අහං නාගොව සඞ්ගාමෙ චාපාතො පතිතං සරං
අතිවාකං තිතික්ඛිස්සං දුස්සීලො හි බහුජ්ජනො. 320

2. දන්තං නයන්ති සමිතිං දන්තං රාජාභිරූහති
දන්තො සෙට්ඨො මනුස්සෙසු යොතිවාක්‍යං තිතික්ඛති. 321

---

14. වජ්ජඤ්ච වජ්ජතො ඤත්වා, (දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියැ ඒ මිථ්‍යාදෘෂ්ටියට උපනිශ්‍රය වූ ධර්මයැ යන මේ) වරද වරදහෙයින් දැන; අවජ්ජඤ්ච අවජ්ජතො, (දශවස්තුක වූ සම්‍යග්දෘෂ්ටියැ ඒ සම්‍යග්දෘෂ්ටියට උපනිශ්‍රයවූ ධර්මයැ යන මේ) නිරවද්‍යය නිරවද්‍ය හෙයින්; ඤත්වා, දැන; සම්මාදිට්ඨිසමාදානා, මිථ්‍යාදෘෂ්ටියැ හැර සම්‍යග්දෘෂ්ටියැ මනාකොට ගන්නාවූ; සත්තා, නුවණැතිසත්ත්වයෝ; සුග්ගතිං ගච්ඡන්ති, (දිව්‍යමනුෂ්‍යලොකයයි කියනලද) සුගතියට යන්නාහුයි.

### තිත්ථියසාවකානං වත්ථු

## නිරයවග්ගො බාවීසතිමො

### 23—1.

1. හි, යම් හෙයෙකින්; බහුජ්ජනො, මේ ලෞකිකමහාජන තෙමේ; දුස්සීලො, දුස්සීලද (සීලසංවරයක් නැත්තේද එහෙයින්); සඞ්ගාමෙ, යුද්ධභූමියෙහි; චාපාතො පතිතං සරං, දුන්නෙන් මුක්තවැ අවුත් තමාගේ ඇඟහුණු ශරතාක් ඉවසන්නා වූ; නාගො ඉව, සංග්‍රාමාවචරවූ සුශික්ෂිත ඇතකු මෙන්; අහං, මම; අතිවාක්‍යං, (බොහෝදෙනා විසින් අෂ්ටඅනාර්‍ය්‍ය ව්‍යවහාරවශයෙන්) බණනලද පරුෂවචනතාක්; තිතික්ඛිස්සං, ඉවසම්(හෙවත්: ක්‍ෂමාකෙරෙම්.)

2. දන්තං, දැමුණු ඇතකු අසකුම; සමිතිං, (දියකෙළි උයන්කෙළි ආදියෙහි) බොහෝදෙනා රැස්වූ තැනට; නයන්ති, (රථ ආදියෙහි යොදා) පමුණුවන්නාහ; රාජා, රජද; දන්තං, දැමුණු ඇතකු අසකුටම; අභිරූහති, නැඟෙන්නෙය (එහෙයින්); යො, යමෙක්තෙම; අතිවාක්‍යං, අනුන් බිණූ පරොස් තෙපුල්; තිතික්ඛති, ඉවසාද-ක්‍ෂමාකෙරේද; සො, හෙතෙමෙ; මනුස්සෙසු, මිනිසුන් අතුරෙහි; සෙට්ඨො, උත්තමයි.

3. වරමස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා
කුඤ්ජරා ච මහානාගා අත්තදන්තො තතො වරං. 322

4. නහි එතෙහි යානෙහි ගච්ඡෙය්‍ය අගතං දිසං
යථාත්තනා සුදන්තෙන දන්තො දන්තෙන ගච්ඡති. 323

5. ධනපාලකො නාම කුඤ්ජරො කටුකප්පභෙදනො දුන්නිවාරයො
බද්ධො කබලං න භුඤ්ජති සුමරති නාගවනස්ස කුඤ්ජරො. 324

---

3. අස්සතරා, (කොටළුවහට ද වෙළඹකුසැ උපන්) අශ්වතරයෝ; **දන්තා**, දැමුණාහුම; **වරං**, උත්තමයහ; **ආජානීයාච**, (අශ්වදමකයා විසින් කරනලද ශික්ෂණයා වහාදක්නට සමර්ථහෙයින්ද පිටහුන්නහුගේ අදහස් දත්නා හෙයින්ද) ආජානෙයනම් වූ අශ්වයොද; **දන්තා**, දැමුණාහුම; **වරං**, උත්තමයහ; **සින්ධවා**, (සින්ධුදේශයෙහි උපන් හෙයින් සින්ධවනම් වූ) සෛන්ධව අශ්වයෝද; **දන්තා**, දැමුණාහුම; **වරං**, උත්තමයහ; **මහානාගා**, මහානාගයැයි කියනලද; **කුඤ්ජරාච**, ඇත්තුද; **දන්තා**, දැමුණාහුම; **වරං**, උත්තමයහ; **තතො**, ඔවුන් හැමදෙනහට වඩා; **අත්තදන්තො**, (චතුර්විධ ආර්‍ය්‍යමාර්ගයෙන්) ආත්මයදමනලද්දේ තොහොත්: (චතුර්විධ ආර්‍ය්‍යමාර්ගයෙන්) තමා දැමුයේ; **වරං**, උත්තමයි.

**අත්තානං ආරබ්භ කථිතවත්ථු**

**23—2.**

4. **දන්තො**, (චතුර්විධ ආර්‍ය්‍යමාර්ගයෙන්) දැමුණු මහණතෙමෙ; **දන්තෙන**, (පූර්වභාගයෙහි) ඉන්ද්‍රියදමනයෙන් දැමුණාවූ; **සුදන්තෙන**, (අපරභාගයෙහි ආර්‍ය්‍යමාර්ගභාවනායෙන්) මනාව දැමුණා වූ; **අත්තනා**, චිත්තයකාරණකොටගෙනැ; **අගතං දිසං**, (ස්වප්නයෙනුත් නොගියවිරූ හෙයින් අගතනම් වූ) නිර්වාණනමැති දිගට; **යථා ගච්ඡති**, යම්සේ යේද; **තථා**, එසේමැ; **එතෙහි යානෙහි**, මේ ඇත් අස් ආදි යානායෙන්; **නහි ගච්ඡෙය්‍ය**, නො යන්නේයි.

**හත්ථාචරියපුබ්බකභික්ඛුස්ස වත්ථු**

**23—3.**

5. **ධනපාලකො නාම**, ධනපාලකය යන නම් ඇති; **කුඤ්ජරො**, මාතුපොසකඇත්තෙමෙ; **කටුකප්පභෙදනො**, (දෙකන්සිළින් වැහෙන) තීව්‍ර වූ මද ඇත්තේ; **දුන්නිවාරයො**, (කිසිවක්හු විසින්) නොවැළැකිය හැකිවූයේ; **බද්ධො**, (ඇත්හලට ගෙනැවුත් විසිතුරු පටකඩතිරයෙන්) පරික්ෂෙපකරනලද්දේ; **කබලං න භුඤ්ජති**,

6. මිද්ධී යදා හොති මහග්ඝසො ච නිද්දායිතා සම්පරිවත්තසායී
මහාවරාහොව නිවාපපුට්ඨො පුනප්පුනං ගබ්භමුපෙති මන්දො. 325

---

(උඩ බඳනාලද විසිතුරුවියන් ඇති සුවඳ පිරිබඩගන්නාලද භූමියෙහි ඇරැ සිටුවනලද්දේ රජහු විසින් එළවනලද නො එක් රස මසවුළෙන් යුත්)රාජභොජනය පවා (මාතෘවියොගයෙන් දුක්ඛිත හෙයින්) නොකන්නෙය (මව හැරපියා කනු මැලියෙ එබඳු රාජ භොජනයෙන් කිසිවක් කනු නො කැමැතිවිය); කුඤ්ජරො, ඒ මාතු පොසක ඇත්තෙමෙ; නාගවනස්ස සුමරති, (මව වසන්නා වූ නාගවනයම සිහිකරන්නේයි.—පුත්‍ර වියොගයෙන් දුක්ඛිත වූ අන්ධ වූ මාගේ මෑණියෝ කණුකටු පයින් මැඩගෙනැ බොන්නාට පැන් නොලදින්ම චණ්ඩොර නම් වනයෙහි හඬා ඇවිදිනීය මාතුපණ්ඩනධර්මය නොපිරෙනකලැ මේ රාජභොජනය අනුභවකිරීමෙන් මට කම් කිම්ද ඒ මාතුපණ්ඩනධර්මය මට පිරෙන්නෙ ඒ නාගවනයෙහිදීමයැ යි නාගවනය සිහිකෙරෙයි. යනු භාවයි.

## අඤ්ඤතරබ්‍රාහ්මණස්ස පුත්තානං වත්ථු

## 23—4.

6. යදා, යම්කලෙක්හි; මිද්ධී හොති, (පුරුෂතෙමෙ) මිඩබහුල වේද (හෙවත්: ථිනමිඩයෙන් මඩනා ලැබේද); මහග්ඝසො ච, (තමාගේ ජඨරාග්නියෙහි පමණ නොදැනැ ආහරහත්ථක අලංසාටක තත්‍රවට්ටක කාකමාසක භුත්තවමිතක බමුණන් මෙන්) බොහෝ කොට කාද; නිවාපපුට්ඨො, (කුඩු දඹුකඩ නිසුඩු කැඳ දෙවුන්දිය ආදි); ශූකරභක්තයෙන් (බාලකලපටන්) පොෂණය කරනලද; මහාවරාහො ඉව, (ස්ථූලවූ ශරීර ඇති) මහගම්හූරකු මෙන්; නිද්දායිතා,(හුන්තැන සිටිතැන) නිදන්නෙමවේද; සම්පරිවත්තසායී, (ස්ථූලවූ ශරීරඇතිහෙයින් අනික් ඉරියවුවකින් පවත්නට අසමර්ථ වැ)පෙරළිපෙරළී වැද හෝනේ වේද;(එකල්හි ඒ පුරුෂතෙමෙ අනිත්‍යය දුක්ඛය අනාත්මයහයි තිලකුණු මෙනෙහිකටනොහෙන්නෙය තිලකුණු මෙනෙහි නොකිරීමෙන්;) මන්දො, ප්‍රඥාරහිතවූයේ; පුනප්පුනං, නැවත නැවත; ගබ්භං, මව්කුසට; උපෙති, එළඹෙන්නේයි; (මවුකුස විසීමෙන් නො මිදෙන්නේයි.)

## පසෙනදිකොසලවත්ථු

7. ඉදං පුරෙ චිත්තමචාරි චාරිකං
යෙනිච්ඡකං යත්‍ථ කාමං යථා සුඛං
තදජ්ජහං නිග්ගහෙස්සාමි යොනිසො
හත්‍ථිප්පභින්නං විය අඞ්කුසග්ගහො. 326

8. අප්පමාදරතා හොථ සචිත්තමනුරක්ඛථ
දුග්ගා උද්ධරථත්තානං පඞ්කෙ සන්නොව කුඤ්ජරො.

9. සචෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං සාධුවිහාරි ධීරං 327
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි චරෙය්‍ය තෙනත්තමනො සතීමා. 328

---

**23—5.**

**7.** ඉදං චිත්තං, අනවස්ථිත වූ මේ චිත්තය; **පුරෙ,** මෙයින් පූර්වයෙහි; **යෙනිච්ඡකං,** (රූපාදී අරමුණෙහි ලොභාදි) යම් ආකාරයෙකින් පවත්නා කැමැත්තේද; **යත්‍ථ කාමං,** රූපාදි යම් අරමුණෙක්හි පවත්නා කැමැත්තේවේද; **යථාසුඛං,** (යම්සේ පවත්නාහට සුවද එලෙස පවත්නා හෙයින්) සුවසේ; **චාරිකං** අචාරි, (බොහෝ කලක්) චාරිකාකෙළේද-සැරිසරා ඇවිද්දේද; **තං,** ඒ සිත; **අජ්ජ,** අද; **අහං,** මම; **යොනිසො,** නුවණින්; **පභින්නං හත්‍ථිං,** ගිළියෙන මදඇතිඇතක්හු නිගන්නා වූ; **අඞ්කුසග්ගහො විය,** දක්‍ෂ වූ හස්ත්‍යාචාරියක්හු මෙන්; **නිග්ගහෙස්සාමි,** නිගනිම්-වළකම්.

**—සානුසාමණෙරවත්‍ථු—**

**23—6.**

**8.** අප්පමාදරතා හොථ, (මහණෙනි! සමාහි අවිප්‍රවාසයයි කියනලද) නොපමාබව ඇලෙව්; **සචිත්තමනුරක්ඛථ,** (රූපාදි නානාලම්බනයෙහි දිවන්නාවූ) තොපගේ සිත (එයින් වළකා) මනාකොට රකුව; **පඞ්කෙ සන්නො කුඤ්ජරො ඉව,** ගැඹුරුමඩෙහි ගැලුණු(බාවෙරු නම්)ඇතු(අතින් පයින් ව්‍යායාම කොට ඒ මඩින් නැගී ගොඩපිහිටියා) මෙන්; **අත්තානං,** කෙලශපඞ්කයෙහි ගැලීගිය තොප; **දුග්ගා,** ඒ කෙලෙස්දුදුලෙන්; **උද්ධරථ,** (යොනිසො මනස්කාරයෙන් යුක්තවැ වීර්‍ය්‍ය කොට) ගොඩනගව්.

**—බද්ධෙරකහත්‍ථිවත්‍ථු—**

**23—7.**

**9.** **නිපකං,** ප්‍රඥාවත්වූ; **සද්ධිං චරං,** තමා හා සමහ වසන්නට නිසිවූ; **සාධුවිහාරිං,** යහපත්වූවාසඇති; **ධීරං,** ධෘතිසම්පන්නවූ;

10. නො චෙ ලභෙථ නිපකං සහායං සද්ධිං චරං සාධුවිහාරි ධීරං
රාජාව රට්ඨං විජිතං පහාය එකො චරෙ මාතඞ්ගරඤ්ඤෙව නාගො. 329

11. එකස්ස චරිතං සෙය්‍යො නත්ථි බාලෙ සහායතා
එකො චරෙ න ච පාපානි කයිරා
අප්පොස්සුක්කො මාතඞ්ගරඤ්ඤෙව නාගො. 330

---

සහායං, කල්‍යාණමිත්‍රයකු; සචෙ, ඉදින්; ලභෙථ, ලද්දේවීනම්; සබ්බානි පරිස්සයානි, (සිංහව්‍යාඝ්‍රාදි ප්‍රකටඋපද්‍රවද රාගද්වේෂාදි අප්‍රකටඋපද්‍රවද යන) සියලුඋපද්‍රවයන්; අභිභුය්‍ය, මැඩ; තෙන, ඒ (කල්‍යාණ මිත්‍රයා) හා සමග; අත්තමනො, සතුටුසිත් ඇතිවැ; සතිමා, සිහිනුවණින් යෙදී; චරෙය්‍ය, වසන්නේයි.

10. නිපකං, ප්‍රඥාවත්වූ; සද්ධිං චරං, තමා හා සමග වසන්නට නිසිවූ; සාධුවිහාරිං, යහපත්වූ වාස ඇති; ධීරං ධෘතිසම්පන්නාවූ; සහායං, කල්‍යාණමිත්‍රයකු; නො චෙ ලභෙථ, ඉදින් නොලද්දේ වීනම්; විජිතං, දිනතලද (හෙවත්: අතට පැමිණි); රට්ඨං පහාය, රට හැරපියා; (රාජ්‍යසම්පත් නම් ප්‍රමාදයට කාරණයයි රජකිරීමෙහි ආදීනව දැක අතට පැමිණි රට හැරපියා එකලාව වනයට වැද තාපසප්‍රව්‍රජ්‍යාවට එළැඹි;) රාජා ඉව, මහාජනක රජහු මෙන්ද; අරඤ්ඤෙ, (ඇත්මුල හැරපියා) මේ රක්ෂිතවනයෙහි හුදකලාව වසන්නාවූ; මාතඞ්ගො නාගො ඉව, මාතඞ්ගය යන නම්ඇති මේ පාරිලෙය්‍යක ඇතුමෙන්ද; එකො චරෙ, (ගණයා හැර) එකලාව වසන්නේයි.

11. එකස්ස, හුදකලාහුගේ; චරිතං, වාසය; සෙය්‍යො, උත්තමයි; බාලෙ, (මෙලෝ පරලෝ වැඩනොදන්නා) අඥනයා කෙරෙහි; සහායතා, සහාය බැව්; (හෙවත්: චූලසීලය මජ්ඣිමසීලය[1] දශකථාවස්තුය තෙළෙස්ධුතාඞ්ගගුණය විදර්ශනාඥනය චතුර්විධමාර්ගඵලය ත්‍රිවිද්‍යාය ෂඩභිඥය අමෘතමහානිර්වාණය යන මේ සහාය බැව්); නත්ථි, නැති (ඒ බාලයා නිසා මෙකියනලද සහායබැව් ලැබිය නොහැකිය එහෙයින්); එකො චරෙ, ගණයා හැර එකලාව වසන්නෙය; පාපානි, ස්වල්පමාත්‍රවූද අකුසලකෙනකුන්; න ච කයිරා, නොමකරන්නෙය; අරඤ්ඤෙ, (ගණයා හැර) මේ රක්ෂිතවනයෙහි හුදකලාව වසන්නාවූ; මාතඞ්ගො නාගො ඉව, මාතඞ්ගය යන නම් ඇති මේ පාරිලෙය්‍යක ඇතුමෙන්; අප්පොස්සුක්කො, ගණපරිහරණයෙහි නිරුත්සාහව; චරෙ, වසන්නේයි.

පඤ්චසතදිසාවාසිභික්ඛුවත්ථු

---

1. මහාසීලය-මූ.

12\. අත්ථම්හි ජාතම්හි සුඛා සහායා තුට්ඨී සුඛා යා ඉතරීතරෙන
පුඤ්ඤං සුඛං ජීවිතසඞ්ඛයම්හි සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහාණං. 331

13\. සුඛා මත්තෙය්‍යතා ලොකෙ අථො පෙත්තෙය්‍යතා සුඛා
සුඛා සාමඤ්ඤතා ලොකෙ අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා. 332

14\. සුඛං යාව ජරා සීලං සුඛා සද්ධා පතිට්ඨිතා
සුඛො පඤ්ඤාය පටිලාභො පාපානං අකරණං සුඛංති. 333

නාගවග්ගො තෙවීසතිමො.

---

**23—8.**

12\. අත්ථම්හි ජාතම්හි, (ප්‍රව්‍රජිතයන්ගේ චීවරකරණ පාත්‍ර පචනාදි වූ හෝ ගිහින්ගේ කෘෂිවණිකකර්මාන්තාදි වූ හෝ)කිසියම් ප්‍රයොජනයක් උපන්කල්හි; සහායා, (ඒ කටයුත්ත සපයන්නට සමර්ථවූ) සහායයෝ; සුඛා, සුවයහ; ඉතරීතරෙන, (හීනවූද ප්‍රණීතවූද මඳවූද බොහෝවූද) තමා සතු යම්කිසි පසයෙකින් උපදනාවූ; යා තුට්ඨී, යම් තුෂ්ටියෙක් ඇද්ද; සා, ඒ තුෂ්ටිතොමෝ; සුඛා, සුවය; ජීවිතසඞ්ඛයම්හි, මරණාසන්නකාලයෙහි; පුඤ්ඤං, (කැමති පරිද්දෙන් විපුලකොට කරනලද) කුශලකර්මය; සුඛං, සුවය; සබ්බස්ස දුක්ඛස්ස, සියලු සංසාරදුක්ඛයාගේ; පහාණං, ප්‍රහාණය (හෙවත්: අර්හත්ඵලය); සුඛං, සුවයි.

13\. ලොකෙ, මේ සත්වලොකයෙහි; මත්තෙය්‍යතා, මවුන් කෙරෙහි මනා පිළිවෙත් ඇතිබැව්; සුඛා, සුවය; අථො, නැවත; පෙත්තෙය්‍යතා, පියන්කෙරෙහි මනා පිළිවෙත් ඇතිබැව්; සුඛා, සුවය; ලොකෙ, මේ සත්වලොකයෙහි; සාමඤ්ඤතා, ශ්‍රමණයන් කෙරෙහි මනා පිළිවෙත් ඇතිබැව්; සුඛා, සුවය; අථො, නැවත; බ්‍රහ්මඤ්ඤතා, (බාහිතපාපීවූ බුදුපසේබුදු මහරහත්හු යන) ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණයන් කෙරෙහි මනාපිළිවෙත් ඇතිබැව්; සුඛා,සුවයි.

14\. සීලං,(පඤ්චශීල අෂ්ටාඞ්ගශීල දශශීලාදි ප්‍රභෙදඇති)ශීලය; යාවජරා, ජරාවයස දක්වා; සුඛා, සුවය; (මිණිකොඩොල් මුත්හර මෙවුල්දම් ආදි සෙසුආභරණයෝද විසිතුරු පැහැඇති නොයෙක්වස්ත්‍ර ජාතිහුද ඒ ඒ වයස සිටියවුන්ටම හොබනාහ තරුණයන්ගේ අලඞ්කාරයෝ වෘද්ධයන්ටද වෘද්ධයන්ගේ අලඞ්කාරයෝ තරුණයන්ටද නොහොබනාහ පඤ්චශීල අෂ්ටාඞ්ගශීල දශශීලාදි වූ සීලාලඞ්කාරය වනාහි තරුණයන්ටද වෘද්ධයන්ටද හොබනේය එහෙයින් ශීලය ජරාවයස් දක්වා සුවය); සද්ධා,

1. මනුජස්ස පමත්තචාරිනො තණ්හා වඩ්ඪති මාලුවා විය
සො පලවති හුරාහුරං ඵලමිච්ඡංව වනස්මිං වානරො. 334

2. යං එසා සහතී ජම්මී තණ්හා ලොකෙ විසත්තිකා
සොකා තස්ස පවඩ්ඪන්ති අභිවඩ්ඪංව[1] බීරණං. 335

3. යො චෙතං සහතී ජම්මිං තණ්හං ලොකෙ දුරච්චයං
සොකා තම්හා පපතන්ති උදබින්දුව පොක්ඛරා. 336

---

(ලෞකික ලොකොත්තර වශයෙන් ද්විප්‍රකාරවූ ශ්‍රද්ධාතොමෝ; පතිට්ඨිතා, නිශ්චලව පිහිටීම; සුඛා, සුවය; පඤ්ඤාය පටිලාභො, (ලෞකික ලොකොත්තර) ප්‍රඥවගේ ප්‍රතිලාභයද; සුඛො, සුවය; පාපානං අකරණං, (මාර්ගයෙන් සමුච්ඡින්නහෙයින්) සියලු පාපයන්ගේ නොකිරීම; සුඛං, සුවයි.

මාරස්සවත්ථු.

## නාගවග්ගො තෙවීසතිමො

### 24—1.

1. පමත්තචාරිනො, (සමෘති විප්‍රවාස ලක්ෂණවූ) ප්‍රමාදයෙන්, ප්‍රමාදචාරිවූ; මනුජස්ස, පුරුෂයහට; තණ්හා, (සදෙර උපදනා) රූපතෘෂ්ණාදි වශයෙන් ෂට්ප්‍රකාරවූ) තෘෂ්ණාතොමෝ; මාලුවා විය,(රුකක් වළඳිමින් වැඩෙන) මාලුවාලියය (ඒ රුකට විනාසය පිණිස වඩනා) මෙන් (ඒ පුද්ගලයහට විනාසයපිණිස); වඩ්ඪති, වඩනීය; සො, ඒ තෘෂ්ණා වසඟවූ පුද්ගලතෙමෙ; වනස්මිං, වන යෙහි; ඵලමිච්ඡං, (අඹදඹ ඈ නො එක්) ඵලකැමති වැ රුකින් රුකට පනන්නාවූ; වානරො ඉව, වඳුරකු මෙන්; හුරා හුරං, භව යෙන් භවයට; පලවති, පනන්නේයි (හෙවත්: දිවන්නේයි).

2. ජම්මී, ලාමකවූ; විසත්තිකා, (රූපාදි සඅරමුණෙහි ආසක්ත විසක්ත හෙයින්) විසත්තිකා යන නම්ඇති; (එසා) තණ්හා, (මේ) ෂඩ්ද්වාරික තෘෂ්ණාතොමෝ; (ලොකෙ, ලොකයෙහි;) යං, යම් පුද්ගලයක්හු; සහති, අභිභවනය කෙරේද- මැඩපවතීද; තස්ස, ඒ පුද්ගලයහට; අභිවඩ්ඪං,(මහවැස්සෙන්) නැවත නැවත වස්නා ලද (හෙවත්: තෙමනලද); බීරණං ඉව, හොටතණ වඩනා මෙන්; සොකා, වට්ටමූලකවූ සොකයෝ; පවඩ්ඪන්ති, වඩනාහුයි.

3. ජම්මිං, ලාමකවූ; දුරච්චයං, ඉක්මවියනොහැකිවූ; එතං තණ්හං,(ෂඩ්ද්වාරිකවූ)මේ තෘෂ්ණාව;(ලොකෙ,ලොකයෙහි;)යොච

---

1. අභිවට්ටංව.

4. තං වො වදාමි භද්දං වො යාවන්තෙත්ථ සමාගතා
තණ්හාය මූලං ඛණථ උසීරත්ථොව බීරණං
මා වො නලංව සොතොව මාරො භඤ්ජි පුනප්පුනං. 337

5. යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තතී දුක්ඛමිදම්පුනප්පුනං. 338

---

යම්පුද්ගලයෙක් වනාහි; සහති, මැඩපවතීද; තම්හා, ඒ පුද්ගලයා කෙරෙන්; සොකා, වට්ටමූලකවූ සොකයෝ; පොක්ඛරා, පොකුරු පතෙකින් ගලෑහෙන්නාවූ; උදබින්දු ඉව, දියබිඳු මෙන්; පපතන්ති, ගිළිහෙන්නාහුයි–පහවන්නාහුයි.

4. යාවන්තො, යම්පමණකෙනකුන්; එත්ථ, මෙතැන්හි; සමාගතා; රැස්වූද; වො, ඒ තොපෑ හැමදෙනහට; භද්දං (හොතු), වැඩ වෙවයි(මේ කපිලමත්ස්‍යයාහට මෙන් අවැඩෙක් නොවෙවයි); තං, ඒ කාරණයෙන්; වො, තොපහැමදෙනහට; වදාමි, මේ අව වාදය කියමි; (හෙ කිමෙක්ද යත්?) උසීරත්ථො බීරණං ඉව, සුවඳ හොටමුලින් ප්‍රයෝජනඇති එකක්හු (මහ උදැල්ලෙකින්) බෙරෑ තණ කණින්නා මෙන්; තණ්හාය මූලං ඛණථ, (භවොත්පත්තියට ප්‍රධාන කාරණවූ) ෂඩ්වාරිකතෘෂ්ණාවගෙ මූලයයි කියනලද අවිද්‍යාව (අර්හත්මාර්ගඥානයයි කියනලද මහඋදැල්ලෙන්) කණින්නාවූ; නලං ඉව,(ගංතෙර හටගත්)රණහුණපඳුරක් හෝ බටහුණපඳුරක් හෝ කැණගෙනෑ යන්නාවූ; සොතො, ඉව, මහාවේගයෙන් ආ ගංවතුරක් මෙන්; මාරො,(ක්ලේශමාරය මෘත්‍යුමාරය|දිව්‍යපුත්‍ර මාරය යන)ත්‍රිවිධ මාරතෙමෙ; වො, තොපහැමදෙන; පුනප්පුනං, නැවත නැවත; මාභඤ්ජි, නහමක් බිඳීවා.

## කපිලමච්ඡස්ස වත්ථු

## 24—2.

5. යථාපි, යම්සේ; මූලෙ, වෘක්ෂයාගේ පඤ්චමහාමූලය; අනුපද්දවෙ, (ඡේදන ඵාලන කෘමිවෙධාදි එක්තර උපද්‍රවයෙකින්) උපද්‍රවයකට නොපැමිණිකල්හි; දළ්හෙ, එහෙයින්ම ස්ථිරතර කල්හි; ඡින්නොපි රුක්ඛො,අගින් කපන ලද්දවූද නුග ඇසතු ආදි වනස්පතිවෘක්ෂය; පුනරෙව, නැවතද; රූහති, (ශාඛා ප්‍රශාඛාවශයෙන්) හටගන්නේවේද; එවම්පි, එහෙයින් ම; තණ්හානුසයෙ, තෘෂ්ණාසඞ්ඛ්‍යාත අනුසය (හෙවත්: කාරණලාභයක් ඇතිකල්හි

6. යස්ස ඡත්තිංසති සොතා මනාපස්සවනා භුසා
වාහා වහන්ති දුද්දිට්ඨිං සඞ්කප්පා රාගනිස්සිතා. 339

7. සවන්ති සබ්බධි සොතා ලතා උබ්භිජ්ජ තිට්ඨති
තඤ්ච දිස්වා ලතං ජාතං මූලං පඤ්ඤාය ඡින්දථ. 340

---

මූෂිකාදිවිෂයක් මෙන් නැවත නැවත සන්තානයෙහි උපදනට නිසිවූ කාමරාග භවරාගානුසය); අනූහතෙ, අර්හත්මාර්ගඥානයෙන් සිඳ නොපියනලදකල්හි; ඉදං දුක්ඛං, (ඒ ඒ භවයෙහි ජාති ජරා ව්‍යාධි මරණ යයි කියනලද) මේ දුඃඛජාතය; පුනප්පුනං, නැවත නැවත; නිබ්බත්තති, උපදනේමැයි.

6. යස්ස, යම්පුද්ගලයක්හට; ඡත්තිංසති සොතා, (චක්ෂුරාදි ආධ්‍යාත්මිකායතනයන් විෂයකොට පවත්නාවූ තෘෂ්ණාවිචරිතයෝ අටළොස්දෙනය රූපාදිබාහිරායතනයන්විෂයකොට පැවැත්නාවූ තෘෂ්ණාවිචරිතයෝ අටළොස්දෙනය යන මේ තෘෂ්ණාවිචරිතයන්ගේ වශයෙන්)සතිස්වැදෑරුම්වූ තෘෂ්ණාශ්‍රොතසින් සමන්විතවූ; මනාපස්සවනා, මනාපවූ රූපාදි අරමුණෙහි ශ්‍රවත්ව පවත්නාවූ තෘෂ්ණාතොමෝ; භුසා, බලවත්වැ උපදීද; දුද්දිට්ඨිං, විපන්නවූ බුද්ධිඇතිබැවින් නුවණ නැති ඒ පුද්ගලයා; රාගනිස්සිතා, (ධ්‍යානයක්වත් විදර්ශනාවක්වත් ඇසුරුනොකොට) රාගය ඇසුරුකළාවූ; සඞ්කප්පා, විතර්කයෝ; වාහා, නැවත නැවත උපදනාබැවින්) බලවත් වූවාහු; වහන්ති, අපායට පමුණුවන්නාහුයි.

7. සොතා, තෘෂ්ණා ශ්‍රොතස්හු (හෙවත්: තෘෂ්ණානමැති ගඞ්ගාප්‍රවාහයෝ); සබ්බධි, (චක්ෂුරාදීන්ගේ වශයෙන් රූපාදි. සඅරමුණෙන්ද කාමභවාදි සියලු භවයෙන්ද ශ්‍රවත්වන හෙයින්-වැහෙනහෙයින්) හැමතන්හිම පවත්නාහුනම් වෙති; ලතා, (භවයෙන් භවය වලඳනා අර්ථයෙන්ද හිවනඅර්ථයෙන්ද) ලතානම් වූ ඒ තෘෂ්ණාතොමෝ;උබ්භිජ්ජ, සදොරින් ඉපද; තිට්ඨති, රූපාදි ස අරමුණෙහි සිටිනීය (හෙවත්: පවත්නීය); ජාතං, එසේ උපන්නාවූ, තඤ්ච ලතං; ඒ තෘෂ්ණාලතාව වනාහි; දිස්වා, ("එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති"යි මෙසේ උත්පත්තිස්ථානවශයෙන්)දැක; පඤ්ඤාය, මාර්ගප්‍රඥයෙන්; මූලං ඡින්දථ,(වෙනෙහි හට ගත් පියවිළියක් සැතෙකින් කපන එකක්හු මෙන්) මුලින්ම සිඳපියැව්.

8. සරිතානි සිනෙහිතානි ච සොමනස්සානි භවන්ති ජන්තුනො
තෙ සාතසිතා සුඛෙසිනො තෙ වෙ ජාතිජරූපගා නරා. 341

9. තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසොව බන්ධිතො[1]
සංයොජනසඞ්ගසත්තා දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය. 342

10. තසිණාය පුරක්ඛතා පජා පරිසප්පන්ති සසොව බන්ධිතො[1]
තස්මා තසිණං විනොදයෙ භික්ඛු ආකඞ්ඛී[2] විරාගමත්තනො. 343

---

8. සරිතානි, රූපාදිඅරමුණෙහි විසිරපතළාවූද; සිනෙහිතානිච, (උපභොග පරිභොග වස්තුයෙහි පවත්නාවූ) තෘෂ්ණා ස්නෙහයෙන් ස්නෙහිත වූද (හෙවත්: ගල්වනලද්දවූද); සොමනස්සානි, සොම්නස්හු; ජන්තුනො, තෘෂ්ණාවශිකසත්වයාහට; භවන්ති, වන්නාහ; තෙ, ඒ තෘෂ්ණාවශිකසත්වයෝ; සාතසිතා, සුඛසොම්නස් අසුරුකළාහු; සුඛෙසිනො, කායික චෛතසික සුව සොයන සුලුවෙති; තෙ නරා, එබඳු වූ ඒ සත්වයෝ; වෙ, ඒකාන්තයෙන්; ජාතිජරූපගා, (ජාති ජරා ව්‍යාධි මරණයට පැමිණෙන්නාහුම වෙත්නුයි) ජාති ජරාවට පැමිණෙන්නොනම් වෙත්.

9. තසිණාය, (ත්‍රාසය උද්වෙගය කරනඅර්ථයෙන් තසිණායයි කියනලද) තෘෂ්ණාව විසින්; පුරක්ඛතා, පිරිවරනලද්දවූ; (හෙවත්: වළඳනාලද්දවූ;) පජා, මේ සත්වයෝ; බන්ධිතො, සාවැද්ද විසින් බඳනාලද; සසො, ඉව, සාවකුමෙන් (හෙවත්: දැලබැඳුණු සාවකුමෙන්); පරිසප්පන්ති, සැපෙන්නාහ-භයපත් වන්නාහ; සංයොජනසඞ්ග, දසවිධසංයොජනසඞ්ගයෙන්ද රාගසඞ්ගාදිසප්තවිධ සඞ්ගයෙන්ද; සත්තා, බැඳුනාහු (හෙවත්: වළඳනාලද්දාහු); චිරාය, බොහෝකලක්; පුනප්පුනං, නැවත නැවත; දුක්ඛං, ජාති ජරා ව්‍යාධි මරණ දුක්ඛයට; උපෙන්ති; පැමිණෙන්නාහුයි.

10. තසිණාය, (ත්‍රාසය උද්වෙගය උපදවන අර්ථයෙන් තසිණායයි කියනලද) තෘෂ්ණාව විසින්; පුරක්ඛතා, පිරිවරනලද්දවූ (හෙවත්: වළඳනාලද්දවූ); පජා, මේ සත්වයෝ; බන්ධිතො, සාවැද්ද විසින් බඳනාලද; සසො ඉව, සාවකුමෙන්; (හෙවත්: දැලබැඳුණු සාවකු මෙන්;) පරිසප්පන්ති, සැපෙන්නාහ-භයපත් වන්නාහ; තස්මා, එහෙයින්; අත්තනො, තමහට; විරාගං, රාගවිගමනය හෙවත්: නිර්වාණය; ආකඞ්ඛී, කැමතිවන්නාවූ; භික්ඛු, මහණ තෙමෙ; තසිණං, ෂඩ්වාරිකවූ තෘෂ්ණාව; විනොදයෙ, අර්හත්මාර්ග ඥානයෙන් ප්‍රහීණකරන්නේයි.

සූකරපොතිකාය වත්ථු.

---

1. බාධිතො. 2. ආකඞ්ඛ.

11. යො නිබ්බනථො වනාධිමුත්තො වනමුත්තො වනමෙව ධාවති
තං පුග්ගලමෙව[1] පස්සථ මුත්තො බන්ධනමෙව ධාවති. 344

12. නතං දළ්හං බන්ධනමාහු ධීරා
යද යසං දාරුජං බබ්බජඤ්ච
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා. 345

---

**24—3.**

11. යො, යම් පුද්ගලයෙක්; නිබ්බනථො, ගිහිභාවයෙහි ආලයයි කියනලද වනථය හැර පැවිදිවූ බැවින්) තෘෂ්ණාරහිතවූයේ; වනාධිමුත්තො, (විහාරයයි කියනලද) තපොවනයෙහි ඇලුනේ; වනමුත්තො,(ගිහිබන්ධනයයි කියනලද) තෘෂ්ණාවනයෙන් මුක්තවූයේ;වනමෙව ධාවති,(නැවත ගිහිබන්ධනයයි කියනලද)තෘෂ්ණාවනයටම දිවේද; මුත්තො, ගිහිබන්ධනයෙන් මුක්තවූයේ; බන්ධනමෙව ධාවති, නැවත ඒ ගිහිබන්ධනයටම දිවේද; තං පුග්ගලං, ඒ පුද්ගලයා; එවං පස්සථ, ව්‍යසනයට පැමිණියහු මෙසේ බලව්.

**ඒකස්ස විබ්භන්තකභික්ඛුස්ස වත්ථු**

**24—4.**

12. අයසං, යකඩින් කරනලද්දවූද; දාරුජං, දණ්ඩෙන් කරන ලද්දවූද; බබ්බජඤ්ච, බබුස්තණින් කරනලද්දවූද; යං, යම් බන්ධනයෙක් ඇද්ද; නොහොත්: යං, යම්බන්ධනයෙක්; ආයසං, යකඩින්කරනලදද; දාරුජං, යම්බන්ධනයෙක් දණ්ඩෙන් කරන ලදද; බබ්බජඤ්ච, යම්බන්ධනයෙක් බබුස්තණින් කරනලදද; තං බන්ධනං, ඒ සියලු බන්ධනයම; ධීරා, (බුද්ධ පසේබුද්ධ මහරහත් යන) ප්‍රාඥයො; න දළ්හමාහු, (කඩුආදියෙන් කැපියහැකිබැවින්) දැඩිවූ බන්ධනයෙකැයි නොකියති; මණිකුණ්ඩලෙසු, (ඉන්ද්‍රනීල මහානීලාදි)මාණික්‍යයෙහිද කුණ්ඩලාභරණයෙහිද; නොහොත්: මැණිකින් විසිතුරුවූ කුණ්ඩලාභරණයෙහිද; සාරත්තරත්තා, අතිසයින් සංරක්තවූ ඇලුනාවූද; නොහොත්: සාරත්තරත්තා, මිණිකොඩොල්ආදීන්ගේ සාරබව හෙතුකොට ගෙන අත්‍යසයෙන්ම ඇලුනාවූ ඒ රාගයද; පුත්තෙසු, දරුවන් කෙරෙහිද; දාරෙසු ච, අඹුන් කෙරෙහිද;යා අපෙක්ඛා,යම් අපෙක්ෂාවෙක් ඇද්ද; (හෙවත්: යම් තෘෂ්ණාවෙක් ඇද්ද ඒ තෘෂ්ණාද යන).

---

1. පුග්ගලංමෙථ-මූ-අ.

13. එතං දළ්හං බන්ධනමාහු ධීරා
ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං
එතම්පි ඡෙත්වාන පරිබ්බජන්ති
අනපෙක්ඛිනො[1] කාමසුඛං පහාය. 346

14. යෙ රාගරත්තානුපතන්ති සොතං
සයං කතං මක්කටකොව ජාලං
එතම්පි ඡෙත්වාන වජන්ති ධීරා
අනපෙක්ඛිනො සබ්බදුක්ඛං පහාය. 347

---

13. එතං, මේ කෙලශබන්ධනය; ධීරා, බුද්ධාදිප්‍රාඥයෝ; දළ්හං බන්ධනං ආහු, (ශස්ත්‍රාදියෙන් කැපිය නොහැකිහෙයින්) ස්ථිරවූ බන්ධනයෙකැයි කියති; ඔහාරිනං, (සත්වයන් සතරඅපායෙහි ඇද හෙළාගෙනැ)යට බලා ගෙනයන්නාවූ; සිථිලං, (බැඳිතැන සිවිසම් මස් නොසිඳ ලේ නොසොල්වා බැඳිබවද නොදන්වා ථලපථ ජලපථ ආදියෙහි සියලුකර්මාන්තයන්ට අවසරදෙනහෙයින්) ලිහිල්වූ; දුප්පමුඤ්චං, (ලොභවසයෙන් එකවරෙකද උපන්කෙලශ බන්ධනය ඩැහැගත් තැනින් කටහරවාගත නොහැකි කැස්බකු මෙන්) ගලවාගත නොහැකිහෙයින් උනා හැරපියනොහැකිවූ; එතම්පි, මේ කෙලශබන්ධනයපවා; ඡෙත්වාන, ඥානඛඩ්ගයෙන් කපා හැර; අනපෙක්ඛිනො, වස්තුකාමකෙලශකාමයෙහි අපෙක්ෂා රහිතවූවාහු; කාමසුඛං පහාය, කාමසුඛය හැර; පරිබ්බජන්ති, නුවණැත්තාහු පැවිදිවන්නාහුයි.

බන්ධනාගාරස්ස වත්ථු.

24—5.

14. රාගරත්තා, රාගයෙන් රත්වූ ද්වෙෂයෙන් දුෂ්ටවූ මොහ යෙන් මූඪවූ; යෙ, යම්සත්වකෙනෙක්; සයං කතං ජාලං, තමා විසින් කරනලද දැලඅනුවපවත්නාවූ (එහිම වැදහෝනාවූ); මක්කටකො ඉව, මකුළුවාමෙන්) සයං කතං, තමාවිසින් කරන ලද්දවූ(තමන්ම උපදවාගත්තාවූ); සොතං,(තෘෂ්ණාශ්‍රොතස ඉක්මෙන්නට උගහට වූවාහුම)තෘෂ්ණාවතුරෙහි; අනුපතන්ති, හෙද්ද (ඔහු තෘෂ්ණාශ්‍රොතස ඉක්මවන්නට නොපොහොසත් වන්නාහ); ධීරා, ප්‍රාඥයෝවනාහි; එතම්පි ඡෙත්වාන, (මෙසේ ඉක්මවන්නට උගහටවූ) මේ තෘෂ්ණාශ්‍රොතසපවා සිඳපියා; අනපෙක්ඛිනො, වස්තුකාමකෙලශකාමයෙහි නිරාලයව; සබ්බදුක්ඛං පහාය, (රහත්මගින්) සියලු සසරදුක් පහකොට; වජන්ති, නිවන්පුරයට යන්නාහුයි.

ඛෙමාථෙරියා වත්ථු.

---

1. අනපෙඛිනො.

15. මුඤ්ච පුරෙ මුඤ්ච පච්ඡතො මජ්ඣෙ මුඤ්ච භවස්ස පාරගූ
සබ්බත්ථ විමුත්තමානසො න පුන ජාතිජරං උපෙහිසි. 348

16. විතක්කපමථිතස්ස ජන්තුනො
තිබ්බරාගස්ස සුභානුපස්සිනො
භියො තණ්හා පවඩ්ඪති
එසඛො දළ්හං කරොති බන්ධනං. 349

17. විතක්කූපසමෙ ච යො රතො අසුභං භාවයති සදා සතො
එස ඛො ව්‍යන්තිකාහිති එස ඡෙජ්ජති මාරබන්ධනං. 350

---

## 24—6.

15. පුරෙ, අතීතවූ පඤ්චස්කන්ධයන් කෙරෙහි ප්‍රවෘත්තවූ තෘෂ්ණාවද; මුඤ්ච, හරෑ; පච්ඡතො, අනාගතවූ පඤ්චස්කන්ධයන් කෙරෙහි පවත්නාවූ තෘෂ්ණාවද; මුඤ්ච, හරෑ; මජ්ඣෙ, වර්තමානවූ පඤ්චස්කන්ධයන්කෙරෙහි පවත්නාවූ තෘෂ්ණාවද; මුඤ්ච, හරෑ; භවස්ස පාරගූ, මෙසේකල්හි ත්‍රිවිධභවයාගේ පාරයට පැමිණියාවූ තෝ; සබ්බත්ථ විමුත්තමානසො, (ස්කන්ධධාත්වායතනයයි යන ප්‍රභෙද ඇති) සියලුප්‍රත්‍යයසමුත්පන්නධර්මයන්කෙරෙන් මිදුණු සිත් ඇත්තෙහි; පුන, නැවත; ජාතිජරං, ජාතියට ජරාවට; න උපෙහිසි, නොපැමිණියහි වී.

### උග්ගසෙනසෙට්ඨිපුත්තවත්ථු

## 24—7.

16. විතක්කපමථිතස්ස, (කාමවිතර්ක ව්‍යාපාදවිතර්ක විහිංසාවිතර්කයයි යන) ත්‍රිවිධවිතර්කයන් විසින් මඩනාලද්දාවූ; තිබ්බරාගස්ස, තීව්‍රවූ කාමරාගඇති; සුභානුපස්සිනො, (ඉෂ්ටාලම්බනයෙහි සිත විහිද අත්ල පත්ල යහපත නතබඹතුරෑ යහපත දත්මුව යහපත යනාදින් නිමිත්තානුව්‍යඤ්ජනග්‍රහණය කොට) විසභාගඅරමුණු සුභවසයෙන් බලනසුලුවූ; ජන්තුනො, සත්වයාහට; භියො, බොහෝකොටම; තණ්හා, ෂඩ්වාරිකවූ තෘෂ්ණා තොමෝ; පවඩ්ඪති, වඩනීය; එසො ඛො, මේ පුද්ගලතෙමෙ වනාහි; බන්ධනං, තෘෂ්ණානැමැතිබන්ධනය; දළ්හං කරොති, තරකරන්නේයි.

17. යො,යම් මහණෙක්; විතක්කූපසමෙ රතො,(කාමවිතර්කාදි) ත්‍රිවිධවිතර්කයන්ගේ ව්‍යුපශමයයි කියනලද (උද්ධුමාතකාදිදසඅසුභාලම්බනයෙහි උපන්) ප්‍රථමධ්‍යානයෙහි ඇලුනේවේ ද;

18. නිට්ඨඞ්ගතො අසන්තාසී වීතතණ්හො අනඞ්ගණො
අච්ඡින්දි [1] භවසල්ලානි අන්තිමොයං සමුස්සයො. 351

19. වීතතණ්හො අනාදානො නිරුත්තිපදකොවිදො
අක්ඛරානං සන්නිපාතං ජඤ්ඤා පුබ්බාපරානි ච
ස වෙ අන්තිමසාරීරො මහාපඤ්ඤො මහාපුරිසොති වුච්චති. 352

---

සද, හැමකල්හිමැ; සතො, සිහිඇතියේ; අසුභං භාවයති, ඒ අසුභ ධ්‍යානය උපදවාද-වඩාද; එසො ඛො, මේ මහණවනාහි; ව්‍යන්තිකාහිති, (භවත්‍රයෙහි උපදනා) නිකන්තියයි කියනලද තෘෂ්ණාව පහකරන්නෙය-නසන්නෙය; එසො, මේ මහණතෙමෙ; මාර බන්ධනං, ත්‍රෛභූමකවෘත්තසඞ්ඛ්‍යාතමාරබන්ධනය; ඡෙජ්ජති, අර්හන්මාර්ගඥාන නැමැති ශස්ත්‍රයෙන් කපන්නේයි.

—දහරභික්ඛුස්ස වත්ථු—

**24—8.**

18. නිට්ඨඞ්ගතො, (යම්මහණෙක්තෙමෙ අර්හත්ඵලසඞ්ඛ්‍යාත නිෂ්ඨාවට පැමිණියේ වේද මේ බුද්ධශාසනයෙහි පැවිදිවූවවුන්ගේ නිෂ්ඨාවනම් අර්හත්ඵලයයි ඒ නිෂ්ඨාවයයි කියනලද අර්හත්ඵලය තමාසතන්හි ඉපදවීමෙන්) නිෂ්ඨාවට පැමිණියේවේද; අසන්තාසී, (තමාසතන්හි උපදනා රාගාදිසන්ත්‍රාසයක් නැතිහෙයින්ද ජීවිත නිකන්තිය ප්‍රහීණහෙයින් සිංහව්‍යාඝ්‍රාදීන්කෙරෙන් වන්නාවූ සන්ත්‍රාසයක් නැතිහෙයින්ද) සන්ත්‍රාස රහිතද-භයනැත්තේද; වීතතණ්හො, පහවූ කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණා ඇත්තේවේද; අනඞ්ගණො, එහෙයින්ම රාගාද්‍යඞ්ගනරහිතද; හෙවත්: නිකෙලශද; භවසල්ලානි, භවගාමීවූ සියලු රාගාදිකෙලශශල්‍යයන්; අච්ඡින්දි, අර්හන්මාර්ගඥානශස්ත්‍රයෙන් කපාපීද (හෙවත්: රාගාදිවූ ඒ සියලු කෙලෙස්හුල්නාක් උදුරාහැරපීද ඒ මහණහුගේ); අයං, මේ පවත්වමින් සිටි දෙහය; අන්තිමො සමුස්සයො, අන්තිම ආත්මභාවයයි; (කියනලද මෙබඳුමහණ භවපරියන්තයෙහි සිටි හෙයින් ඔහට මතුභවයෙහි පිළිසඳෙක් නැත්නුයි. මෙ පවත් වමින් සිටි ආත්මභාවයනම් කෙළවර ආත්මභාවයයි සේයි.)

19. වීතතණ්හො, (යම් මහණෙක් අර්හත්මාර්ගයෙන්) පහකරන ලද භවතෘෂ්ණා ඇත්තේද; අනාදානො, (ස්කන්ධාදියෙහි ආත්ම ආත්මීය වශයෙන්)ග්‍රහණයෙක් නැත්තේද; නිරුත්තිපදකොවිදො, නිරුක්තියෙහිද සෙසුතුන්පදයෙහිද දක්ෂද (හෙවත්: සිවුපිළිසිඹියායෙහි දක්ෂද;) අක්ඛරානං සන්නිපාතං, (අක්ෂරයන්ගේ

---

1. අච්ඡිද්ද-අච්ඡිද්දි-අච්ඡිජ්ජ—

20. සබ්බාභිභූ සබ්බවිදූහමස්මි
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං. 353

---

සන්නිපාතයයි කියනලද) අක්ෂරසමූහයද; පුබ්බපරානිච, පූර්වාක්ෂර පරාක්ෂරයන්ද; ජඤ්ඤා, දන්නේවේද; (හෙවත්: පූර්වාක්ෂරයෙන් පරාක්ෂරය දැනගන්නේ වේද පරාක්ෂරයෙන් පූර්වාක්ෂරය දැනගන්නේ වේද පූර්වාක්ෂර පැනේනම් පරාක්ෂරය නොපැනේනම් මේ පූර්වාක්ෂරය මේ පරාක්ෂරය වියයුතුයයි කියනලද පූර්වාක්ෂරයෙන් පරාක්ෂරය දැනගනීද පරාක්ෂරය පැනේනම් පූර්වාක්ෂර නොපැනේනම් මේ පරාක්ෂරයට මේ පූර්වාක්ෂරය වියයුතුයයි කියනලද පරාක්ෂරයෙන් පූර්වාක්ෂරය දැනගනීද;) අන්තිමසාරීරෙ, අන්තිමශරීරයෙහි පිහිටියාවූ; සො, ඒ මහණතෙමේ; වෙ, ඒකාන්තයෙන්; මහාපඤ්ඤො, (මහත්වූ අර්ථධර්මයෙහි නිරුක්ති ප්‍රතිභාන ප්‍රතිසංයුක්ත වශයෙන් සිවුපිළිසිඹියාවන්ද මහත්වූ ශීලස්කන්ධාදි පඤ්චවිධධර්මස්කන්ධයන්ද පිරිසිඳ දන්නාවූ ප්‍රඥයෙන් සමන්විතහෙයින්ද) මහත් ප්‍රඥඇත්තේයයිද; මහාපුරිසො ඉති, (සකලක්ලේශයන් කෙරෙන් විමුක්තවූ සිත් ඇති හෙයින්) මහාපුරුෂයයිද; වුච්චති, කියනුලැබේ.

~මාරස්ස වත්ථු~

24—9.

20. අහං, මම; සබ්බාභිභූ අස්මි, සියලු ත්‍රෛභූමකධර්මයන් අභිභවනය කෙළෙම් වීමි; සබ්බවිදූ අස්මි, චාතුර්භූමකධර්මයන් සර්වාකාරයෙන් මනාකොට මම්ම දත්තේ වීමි; සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො, සියලු ත්‍රෛභූමකධර්මයන්හි (තෘෂ්ණාදෘෂ්ටිලෙපයෙන් අනුපලිප්තයෙමි) නොඇලිනිමි; සබ්බඤ්ජහො, සියලු ත්‍රෛභූමකධර්මයන් පහකොට සිටියෙමි; තණ්හක්ඛයෙ විමුත්තො, තෘෂ්ණාක්ෂයයයි කියනලද) අර්හත්ඵලයෙහි අශෛක්ෂ විමුක්ති වශයෙන් විශෙෂයෙන් ඇලිනිමි; සයං අභිඤ්ඤාය, (අභිඥෙය්‍යාදිවූ ප්‍රභෙද ඇති චතුරාර්‍ය්‍ය සත්‍යයන්) මම්ම ප්‍රත්‍යක්ෂකොට දැන; කං උද්දිසෙය්‍යං, අනික් කවරක්හු මෙ මාගේ උපාධ්‍යායයයි වත් ආචාර්‍ය්‍යයයි වත් කියම්ද.

~උපකාජීවක වත්ථු~

21. සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බං රසං ධම්මරසො ජිනාති
සබ්බං රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති. 354

## 24—10.

21. ධම්මදානං, (ලාභසත්කාරයෙහි නිරපෙක්‍ෂවැ හිතාධ්‍යාස යෙන් යටත්පිරිසෙයින් සතරපදගාථාවකින් අනුමෙවෙනි වසයෙන් පවත්වනලද්දාවූ) ධර්‍මදානයතෙම; සබ්බදානං ජිනාති, (අන්නදාන පානදානාදි) සියලුදශවිධදානවස්තුපරිත්‍යාගය දිනන් නේයි; (ඉදින් යමෙක් සක්වළගබ මුළුල්ලෙහි බඹලොව දක්වා දනින්දනගාවා[1] වැඩහුන් බුදු පසේබුදු මහරහත්නට කෙහෙල් ගොප් වැනිවූ සිවුරු දන්දුන්නේ වීනම්ද පාත්‍ර පුරා ප්‍රණීත පිණ්ඩපාත දන්දුන්නේ වීනම්ද එසේම පාත්‍ර පුරා තෙල් මී සකුරු ආදි ගිලන්පස බෙහෙත්සත්පිරිකර දන්දුන්නේවීනම්ද මහා විහාරයබඳුවූ නොඑක් ලක්‍ෂගණන්විහාර කරවා දන්දුන්නේ වීනම්ද ලොවාමහාප්‍රාසාදයබඳු නොඑක් ලක්‍ෂගණන් ප්‍රාසාද කරවා දුන්නේ වීනම්ද ඒ සියලුදානටද වඩා අනේපිඬුමහ සිටාණන් විසින් ජේතවනවිහාරයඋදෙසා කරනලද සූපනස් කෙළක්පමණ ධනපරිත්‍යාගයටද වඩා ධර්‍මාශොක රජ්ජුරුවන් සුවාසූදහසක්විහාරඋදෙසාකරනලද සයානූකෙළක් පමණ ධනපරිත්‍යාගයටද වඩා යටත්පිරිසෙයින් සතරපදගාථාවකින් අනුමෙවෙනිවසයෙන් පවත්වනලද ධර්‍මදානයම උත්තමයයි සේයි. කුමක්හෙයින්ද යත්? මෙසී නාක් පින් කරන්නාහු බණ අසාම කරන්නාහුමය නොඅසා කරන්නාහු නොවෙත් එහෙ සින් ධර්‍මදානයම උත්තමයි;) ධම්මරසො, (සත්තිස්බොධපාක්‍ෂික ධර්‍මයැ නවලොකොත්තරධර්‍මයැ යන මේ) ධර්‍මරසයතෙමෙ; සබ්බං රසං ජිනාති,(මේ ලොකයෙහි පවත්නාවූ ලවණාම්ල තික්ත කටුක කසාය මධුරය යන) සියලුරසනාක් දිනන්නෙයි; (කුමක් හෙයින්ද යත්? උඩත්පිරිසෙයින් දෙවියන්ගේ සුධාභොජනරස යද සත්වයන් සංසාර වෘත්තයෙහි හෙළා දුක් අනුභව කැරවීමට පමුණුවන්නෙයැ ධර්‍මරසයවනාහි සත්වයන් අජරාමරකරන හෙයින් සියලුරසයන්ට වඩා උත්තමරසනම් වෙයි;) ධම්මරතී, (ලාභසත්කාරාදියෙහි නිරපෙක්‍ෂවැ නිස්සරණාධ්‍යාසයෙන් ධර්‍ම දෙශනා කරන්නාහටද මෙ ඉගෙණ අනුන් තෙප්ලෙහි දෙස්

1. දනින්දනශගා-මු.

22. හනන්ති භොගා දුම්මෙධං නො චෙ පාරගවෙසිනො
භොගතණ්හාය දුම්මෙධො හන්ති අඤ්ඤෙව අත්තනං. 355

23. තිණදොසානි ඛෙත්තානි රාගදොසා අයං පජා
තස්මා හි වීතරාගෙසු දින්නං හොති මහප්ඵලං. 356

---

කියමින් මාගේ තෙප්ලෙහි අනුන් කී දෙස් මෙසෙයින් මුදමි මට ලාභසත්කාර උපදවමි මෙසේ අලගද්දපය්‍ය්‍යාප්තියට නො පමුණුවා පය්‍ය්‍යාප්ති පූරණයෙන් ප්‍රතිපත්තිපුරා අධිගම සිඬකෙරෙමි යන නිස්සරණාධ්‍යාශයෙන් අසන්නහුටද උපදනා ප්‍රීතියයි කියනලද) ධර්මරතිතොමො; සබ්බං රතිං ජිනාති, (පුත්‍රරති ධීතෘරති ආදිවූ) සියලුරතිනාක් දිනන්නීය; තණ්හක්ඛයො, (සියලු තෘෂ්ණාවන් ක්ෂයකරනහෙයින් තෘෂ්ණා ක්ෂය යි කියනලද අර්හත්මාර්ගඥානාවසානයෙහි උපදනාවූ) අර්හත්ඵලතෙමෙ; සබ්බ දුක්ඛං ජිනාති, (සියලු සංසාරදුක්ඛය අභිභවනයකරනහෙයින්) සියලුදුක්නාක් පරදවන්නේයි.

### සක්කදෙවරාජවත්ථු

### 24—11.

22. භොගා, වස්ත්‍රාභරණාදි උපභොගවස්තුහුද දාසිදාසගව මහිෂාදි පරිභොගවස්තුහුද; දුම්මෙධං, අඥනපුද්ගලයා; හනන්ති, නස්නාහ; නො චෙ පාරගවෙසිනො, නිවන් නමැති පරතෙර සොයන සුලුවූ ප්‍රාඥපුද්ගලයන් නොනස්නාහුයි (යම්හෙයෙකින් අඥනපුද්ගලතෙමෙ ප්‍රාණවධාදියෙන් උමං බිඳීම් මං පැහැරීම් ආදියෙන් තුලාකූට මානකූටාදියෙන් භොගපරියෙසනය කරන්නේ බොහෝ අකුසල් රැස්කෙරේද එහෙයින් භොගයෝ ඔහු නසන්නාහුනම් වෙති ප්‍රාඥපුද්ගලයෝ වනාහි ධාර්මිකවූ කෘෂිවාණිජ්‍යකර්මාන්තාදියෙන් භොගපරියෙසනය කරන්නාහු අකුසල් රැස් නොකෙරෙත්නුයි භොගයෝ ඔවුන් නොනස්නාහු නම් වෙති සේයි;) දුම්මෙධො, අඥනපුද්ගලතෙමෙ; භොගතණ්හාය, උපභොගපරිභොගවස්තුයෙහි උපන්තෘෂ්ණාව හෙතුකොටගෙන (බොහෝ පව් රැස් කොට;) අත්තානං, තමා; අඤ්ඤෙ ඉව, අනුන්නසන එකක්හුමෙන්; හන්ති, නසන්නේයි-තමා අපායෙහි හෙලන්නේයි.

### අඞ්කුරකසෙඨිස්ස වත්ථු

### 24—12.

23. ඛෙත්තානි, හැල්කෙත් ආදීවූ ක්ෂෙත්‍රයෝ; තිණදොසානි, (යම්සේ මාරතු කුඩුමැටි ආදීවූ) තණදෙස්කොට ඇත්තාහුද එසේම; අයං පජා, මේ මනුෂ්‍ය ප්‍රජාවද; රාගදොසා, රාගදෝෂ

24. තිණදෙසානි ඛෙත්තානි දෙස දෙසා අයං පජා
තස්මා හි වීතදෙසෙසු දින්නං හොති මහප්ඵලං. 357

25. තිණදෙසානි ඛෙත්තානි මොහදෙසා අයං පජා
තස්මා හි වීතමොහෙසු දින්නං හොති මහප්ඵලං. 358

26. තිණදෙසානි ඛෙත්තානි ඉච්ඡාදෙසා අයං පජා
තස්මා හි විගතිච්ඡෙසු දින්නං හොති මහප්ඵලං. 359

තණ්හාවග්ගො චතුවීසතිමො

---

කොට ඇත්තීය; තස්මා, එහෙයින්; වීතරාගෙසු, පහවූ කාමරාග රූපරාග අරූපරාග ඇති ක්ෂීණාශ්‍රවයන්ට; දින්නං, දෙනලද දානය; මහප්ඵලං හොති, මහත්ඵල වන්නේයි; (ප්‍රතිසන්ධිවිපාක ප්‍රවෘත්තිවිපාකවශයෙන් මහත්ඵල මහානිසංස වන්නේයි.)

24. ඛෙත්තානි, හැල්කෙත් ආදිවූ ක්ෂෙත්‍රයෝ; තිණදෙසානි, (යම්සේ මාරතු කුඩුමැටි ආදිවූ) තෘණදෙෂකොට ඇත්තාහුද එසේම; අයං පජා, මේ මනුෂ්‍ය ප්‍රජාවද; දෙස දෙසා, වෙෂය දෙස්කොට ඇත්තීය; තස්මා හි, එ හෙයින්; විතදෙසෙසු, පහවූ වෙෂඇති ක්ෂීණාශ්‍රවයන්ට; දින්නං දෙනලද දානය; මහප්ඵලං හොති, මහත්ඵලවන්නේයි (ප්‍රතිසන්ධිවිපාක ප්‍රවෘත්තිවිපාකවශයෙන් මහත්ඵලමහානිසංස වන්නේයි;)

25. ඛෙත්තානි, හැල්කෙත් ආදි ක්ෂෙත්‍රයෝ; තිණදෙසානි, (යම් සේ මාරතු කුඩුමැටි ආදිවූ)තෘණදෙෂකොට ඇත්තාහුද එසේම; අයං පජා, මේ මනුෂ්‍ය ප්‍රජාවද; මොහදෙසා, (චතුරාර්‍ය්‍යසත්‍යයන් දැක්ක නොදී මුවාකොට සිටිනා අඥනලක්ෂණවූ) මොහය දෙෂකොට ඇත්තීය; තස්මා හි, ඒ කාරණයෙන්; වීතමොහෙසු,(අර්හත්මාර්ගඥානයෙන්) පහකරනලදමොහඇති ක්ෂීණාශ්‍රවයන්ට; දින්නං, දෙනලද දානය; මහප්ඵලං හොති, මහත්ඵලවන්නේයි (ප්‍රතිසන්ධි විපාක ප්‍රවෘත්තිවිපාක වශයෙන් මහත්ඵලමහානිසංස වන්නේයි.)

26. ඛෙත්තානි, හැල්කෙත් ආදිවූ ක්ෂෙත්‍රයො; තිණදෙසානි, (යම්සේ මාරතු කුඩුමැටි ආදිවූ) තෘණදෙෂකොට ඇත්තාහුද එසේම; අයං පජා, මේ මනුෂ්‍ය ප්‍රජාවද; ඉච්ඡාදෙෂා, (නොලද ලාභ පැතීමය ලද ලාභයෙහි බලවත් ගෙධය යන) ඉච්ඡාව දෙෂකොට ඇත්තීය; තස්මා හි, ඒ කාරණයෙන්; විගතිච්ඡෙසු, (අර්හත්මාර්ගඥානයෙන්) පහකරනලද තෘෂ්ණාඇති ක්ෂීණාශ්‍රවයන්ට; දින්නං, දෙනලද දානය; මහප්ඵලං හොති, මහත්ඵල වන්නේයි (ප්‍රතිසන්ධිවිපාක ප්‍රවෘත්තිවිපාක වශයෙන් මහත්ඵල මහානිසංස වන්නේයි)

අඞ්කුරස්ස වත්ථු

තණ්හාවග්ගො චතුවීසතිමො

1. චක්ඛුනා සංවරො සාධු සාධු සොතෙන සංවරො
ඝාණෙන සංවරො සාධු සාධු ජිව්හාය සංවරො. 360

2. කායෙන සංවරො සාධු සාධු වාචාය සංවරො
මනසා සංවරො සාධු සාධු සබ්බත්ථ සංවරො
සබ්බත්ථ සංවුතො භික්ඛු සබ්බදුක්ඛා පමුච්චති. 361

---

## 25—1.

1. චක්ඛුනා සංවරො, චක්ෂුර්ද්වාරයට (ඉෂ්ටවූද අනිෂ්ටවූද) රූපාරම්මණයක් හමුවූ කල්හි (යොනිසො අවජ්ජන් පැවැත්වීමෙන් ජවනක්ෂණයෙහි ලොභද්වෙෂමොහ නොඋපදවා ලොභාදිපාපධර්මයන් කෙරෙන් තමාගේ) සිතරැක්ම; සාධු, යහපත; සොතෙන සංවරො, ශ්‍රොත්‍රද්වාරයට (ඉෂ්ටවූද අනිෂ්ටවූද) ශබ්දාලම්බනයක් හමුවූකල්හි (යොනිසො අවජ්ජන් පැවැත්වීමෙන් ජවනක්ෂණයෙහි ලොභද්වෙෂමොහ නොඋපදවා ලොභාදි පාපධර්මයන් කෙරෙන් තමාගේ) සිතරැක්ම; සාධු, යහපත; ඝාණෙන සංවරො, ඝ්‍රාණද්වාරයට (ඉෂ්ටවූද අනිෂ්ටවූද) ගන්ධාලම්බනයක් හමුවූකල්හි (යොනිසො අවජ්ජන් පැවැත්වීමෙන් ජවනක්ෂණයෙහි ලොභද්වෙෂමොහ නොඋපදවා ලොභාදි පාපධර්මයන් කෙරෙන් තමාගේ) සිතරැක්ම; සාධු, යහපත; ජිව්හාය සංවරො, ජිහ්වාද්වාරයට (ඉෂ්ටවූද අනිෂ්ටවූද) රසාලම්බනයක් හමුවූකල්හි (යොනිසො අවජ්ජන් පැවැත්වීමෙන් ජවනක්ෂණයෙහි ලොභද්වෙෂමොහ නොඋපදවා ලොභාදිපාපධර්මයන් කෙරෙන් තමාගේ) සිතරැක්ම; සාධු, යහපති.

2. කායෙන සංවරො, කායප්‍රසාදය යන කායද්වාරයට (ඉෂ්ටවූද අනිෂ්ටවූද) ස්ප්‍රෂ්ටව්‍යාලම්බණයක් හමුවූ කල්හි (යොනිසො අවජ්ජන් පැවැත්වීමෙන් ජවනක්ෂණයෙහි ලොභද්වෙෂමොහ නොඋපදවා ලොභාදිපාපධර්මයන් කෙරෙන් තමාගේ සිතරැක්මද කායවිඥප්තියයි කියනලද කායද්වාරයෙන් ජවනක්ෂණයෙහි සිඳුවන ප්‍රාණවධ අදත්තාදාන කාමමිථ්‍යාචාරයෙන් දුරුවැ තමාගේ) සිතරැක්ම; සාධු, යහපත; වාචාය සංවරො, වචීවිඥප්තියයි කියනලද වචීද්වාරයෙන් (සිඳුවන මෘෂාවාද පෛශුන්‍ය පරුෂවචන සම්ඵප්‍රලාපයෙන් දුරුවැ තමාගේ) සිත රැක්ම; සාධු, යහපත; මනසා සංවරො, (මනොද්වාරාවර්ජනයට අනන්තරප්‍රත්‍යයවූ භවාඞ්ගයයි කියනලද) මනොද්වාරයෙන් (ජවනක්ෂණයෙහි සිඳුවන අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටියෙන් දුරුවැ තමාගේ) සිතරැක්ම; සාධු, යහපත; සබ්බත්ථ සංවරො, චක්ෂුරාදිසදොරම සංවරය; සාධු, යහපත;

3. හත්ථ සඤ්ඤතො පාදසඤ්ඤතො
වාචාය සඤ්ඤතො සඤ්ඤතුත්තමො
අජ්ඣත්තරතො සමාහිතො
එකො සංතුසිතො තමාහු භික්ඛුං. 362

4. යො මුඛසඤ්ඤතො භික්ඛු මන්තභාණි අනුද්ධතො
අත්ථං ධම්මඤ්ච දීපෙති මධුරං තස්ස භාසිතං. 363

---

සබ්බත්ථ සංවුතො භික්ඛු, සදොරම රක්ෂිත ගොපිත වූ සිත් ඇති මහණතෙම; සබ්බදුක්ඛා පමුච්චති, සියලු සංසාරදුක්ඛයෙන් මිදෙන්නේයි.

**—පඤ්චභික්ඛූනං වත්ථු—**

**25—2.**

3. යො, යම්ක්ෂීණාශ්‍රවපුද්ගලයෙක්; හත්ථසඤ්ඤතො, (අත් කෙළවීම් ආදියක් නැතිහෙයින්ද අතින් අනුන් පැහැරීම් ආදියක් නැතිහෙයින්ද)අතින් සඤ්ඤතද; පාදසඤ්ඤතො, (පා සැලීම් ආදියක් නැතිහෙයින්ද පයින් අනුන් පැහැරීම් ආදියක් නැතිහෙයින්ද) පයින් සඤ්ඤතද; වාචාය සඤ්ඤතො, (මුසාවාදාදිය නොකියන හෙයින්) වචසින් සඤ්ඤතද; සඤ්ඤතුත්තමො, (හිස් සැලීම් බැමබිදීම්[1] ආදි කායවිකාරයක් නැතිහෙයින්) කයින් සඤ්ඤතද; අජ්ඣත්තරතො, ගොචරජ්ඣත්තයයි කියනලද(සමාපත්ති ප්‍රස්ථානාදි) කර්මස්ථානභාවනායෙහි ඇලීද; සමාහිතො, උපචාර සමාධි අර්පණාසමාධියෙන් සමාහිතද; එකො, සතරඉරියව්වෙහිම එකවිහාරීද; සන්තුසිතො, විදර්ශනාරම්භයෙහි පටන් තමාගේ අධිගමයෙන් සතුටුද; නොහොත්: චීවරාදි චතුර්විධප්‍රත්‍යයෙහි යථාලාභසන්තොෂාදියෙන් සතුටුද; තං, ඔහු; භික්ඛුං ආහු,(බුද්ධාදි ප්‍රාඥයෝ භින්නවූකෙලශයන් ඇතිහෙයින්) භික්ෂුයයි කියත්.

**—හංසඝාතකභික්ඛුස්ස වත්ථු—**

**25—3.**

4. යො භික්ඛු, යම් මහණෙක්; මුඛසඤ්ඤතො, (අනුන්ට ජාත්‍යාදියෙන් සටා නොබණන බැවින්ද මුසාවාදාදිය නොකියන බැවින්ද) මුඛයෙන් සඤ්ඤතද; මන්තභාණි, අර්ථානර්ථ පරීක්ෂා කොට නුවණින් යෙදී බණනසුලුද; අනුද්ධතො, සන්හුන්.නිවිසිත් ඇත්තෙද; අත්ථං, පාලි අර්ථයද; ධම්මඤ්ච, පාලිධර්මයද; දීපෙති, (පරිමණ්ඩලවූ පදව්‍යඤ්ජයෙන්) මනාකොට ප්‍රකාශකෙරේද; තස්ස, ඒ මහණහුගේ; භාසිතං, වචනය; මධුරං, මධුර නම් වේ.

**—කොකාලිකස්ස වත්ථු—**

---

1. බැමහැගිම.

5. ධම්මාරාමො ධම්මරතො ධම්මං අනුවිචින්තයං
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති. 364

6. සලාභං නාතිමඤ්ඤෙය්‍ය නාඤ්ඤෙසං පිහයං චරෙ
අඤ්ඤෙසං පිහයං භික්ඛු සමාධිං නාධිගච්ඡති. 365

7. අප්පලාභොපි චෙ භික්ඛු සලාභං නාතිමඤ්ඤති
තං වෙ දෙවා පසංසන්ති සුද්ධාජීවිං අතන්දිතං. 366

---

## 25—4.

5. ධම්මාරාමො, සමථවිදර්ශනාධර්මය වාසස්ථානකොට ඇති; ධම්මරතො, ඒ සමථවිදර්ශනාධර්මයෙහි ඇලුණාවූ; ධම්මං, අනුවිචින්තයං, ඒ සමථවිදර්ශනාධර්මය නැවතනැවත මෙනෙහි කරන්නාවූ; ධම්මං අනුස්සරං, ඒ සමථවිදර්ශනාධර්මය නැවත නැවත සිහිකරන්නාවූ; භික්ඛු,මහණතෙමෙ; සද්ධම්මා නපරිහායති, (සත්තිස්බොධපාක්ෂිකනවලොකොත්තරධර්මයයි කියනලද) සද්ධර්මයෙන් නොපිරිහෙන්නේයි.

ධම්මාරාමථෙරවත්ථු

## 25—6.

6. සලාභං,ස්වකීයවූ ලාභය(හෙවත්:උච්චනීචකුලයෙහි ගෙපිළිවෙළින් දොරදොරසිටැ සිඟා ලැබියයුතු හෙයින් තමාසතු මදවූද බොහෝවූද රූක්ෂවූද ප්‍රණීතවූද ලාභය); නාතිමඤ්ඤෙය්‍ය, අවඥ නොකරන්නෙය (ඒ ලාභය හෙලා නොදක්නෙය); අඤ්ඤෙසං, අනුන්ගේ බොහෝවූ ප්‍රණීතවූ ලාභය; පිහයං, ප්‍රාර්ථනාකෙරෙමින්-කැමැතිවෙමින්; න චරෙ, නො ඇවිදිනෙය; අඤ්ඤෙසං පිහයං භික්ඛු, අනුන්ගේ චීවරාදිලාභය පතන්නාවූ මහණතේමේ; සමාධිං නාධිගච්ඡති, උපචාරසමාධියටවත් අර්පණාසමාධියටවත් නො පැමිණෙන්නේයි.

7. අප්පලාභොපි භික්ඛු, (විපුලවූ ප්‍රණීතවූ චීවරපිණ්ඩපාතාදි චතුර්විධ ප්‍රත්‍යයට)ලාභි නොවූද මහණතෙමෙ;චෙ,ඉදින්;සලාභං, (උච්චනීචකුලයෙහි ගෙපිළිවෙළින් දොරදොරසිට සිඟා ලබනලද) තමාගේ ලාභය; නාතිමඤ්ඤති, අවඥ නො කෙරේද—හෙලා නො දකීද; සුද්ධාජීවිං,(සාරවූ ජීවිකා ඇති බැවින්)පිරිසුදුවූ ජීවිකා ඇති; අතන්දිතං, (ජඞ්ඝාබලනිසා ජීවත්වනබැවින්) අකුසීතවූ; තං, ඒ මහණුට; දෙවාපි, දෙවියෝද; වෙ, ඒකාන්තයෙන්; පසංසන්ති, ප්‍රශංසාකෙරෙත්-සතුතිකෙරෙත් සේයි.

විපක්ඛසෙවකභික්ඛුස්ස වත්ථු

'8. සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං
අසතා ච න සොචති ස වෙ භික්ඛූති වුච්චති. 367

9. මෙත්තාවිහාරී යො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං. 368

10. සිඤ්ච භික්ඛු ඉමං නාවං සිත්තා තෙ ලහුමෙස්සති
ඡෙත්වා රාගඤ්ච දොසඤ්ච තතො නිබ්බානමෙහිසි. 369

---

**25—6.**

8. යස්ස, යම් ක්ෂීණාශ්‍රවපුද්ගලයක්හට; නාමරූපස්මිං, නාමරූපදෙක්හි (හෙවත්: රූප වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණය යන පඤ්චස්කන්ධයෙහි); සබ්බසො, සර්වප්‍රකාරයෙන්මැ; මමායිතං නත්ථි, මමත්වයෙක් නැද්ද (මම යැ මාගේයැ යි ආත්ම ආත්මීය වශයෙන් ගැන්මෙක් නැද්ද); අසතා ච නසොචති, (ඒ නාම රූප දෙක නටකලත්) නටබව හේතුකොට ගෙනැ සොක නොකෙරේද (නස්නා සවභාව වූ ධර්මය නටැයි සිතත් මූත් මාගේ රූපය නට වෙදනා සඤ්ඤා සඞ්ඛාරයෝ නටහයි විඤ්ඤාණය නටැ යි මෙසේ)චිත්තදුක්ඛයට නො පැමිණේද; සො,ඒක්ෂීණාශ්‍රව පුද්ගලතෙම; භික්ඛූති වුච්චති, භින්නවූ කෙලශයන් ඇතිහෙයින් භික්ෂුයැ යි කියනුලැබේ.

**පඤ්චග්ගදයකබ්‍රාහ්මණවස්තු**

**25—7.**

9. යො භික්ඛු, යම් මහණෙක්; මෙත්තාවිහාරී, (මෛත්‍රී කර්මස්ථානයෙහි පරිකර්මකිරිමෙන්ද ත්‍රිකචතුෂ්කධ්‍යාන උපදවීමෙන්ද) මෛත්‍රිවිහාර ඇත්තෙද; බුද්ධසාසනෙ, සර්වඥශාසනයෙහි; පසන්නො, (අචලශ්‍රද්ධාවෙන් යුක්තහෙයින්) ප්‍රසන්නද මෙබඳු මහණතෙම; සඞ්ඛාරූපසමං, සියලු සංස්කාරයන් සංහිඳුවන්නාවූ; සුඛං, අත්‍යන්තසුඛවූ; සන්තං පදං, සාන්ත වූ නිර්වාණය; අධිගච්ඡෙ, ලබන්නේයි (සාන්ත වූ නිර්වාණයට පැමිණෙන්නේයැ යි සේයි).

10. භික්ඛු, මහණ; ඉමං නාවං, (කාමවිතර්ක මිථ්‍යාවිතර්කාදි ජලයෙන් භරිත වූ තාගේ) මේ ශරීර නමැති නැවටවන් මිථ්‍යා විතර්කජලය; සිඤ්ච, ඉස පියා; තෙ, තා විසින්; සිත්තා (චක්ෂුරාදි ඒ ඒ සිදුරු [1] සංවර නමැති ඇණ ගසා හැසවාලා [2] ඇතුළට වන්)

---

1 එමසිදුරු, 2 ඇලවාලා, වසාලා.

11. පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ පඤ්චවුත්තරි භාවයෙ
පඤ්ච සඞ්ගාතිගො භික්ඛු ඔඝතිණ්ණොති වුච්චති. 370

12. ඣාය භික්ඛු මා ච පමාදො මා තෙ කාමගුණෙ භමස්සු චිත්තං
මා ලොහගුළං ගිලී පමත්තො මා කන්දි දුක්ඛමිදන්ති ඩය්හමානො 371

---

මිථ්‍යාවිතර්ක නැමැති ජලය ඉසපියනලද්දවූ මේ ශරීර නමැති නෞකාතොම; ලහු සැහැල්ලුව; තොහොත්: වහාම; එස්සති, (සංසාර සාගරයෙහි නො ඇලී) නිවන්පුරයට පැමිණෙන්නේයි; රාගඤ්ච, රාගබන්ධනයද; දොසඤ්ච, ද්වේෂබන්ධනයද; ඡෙත්වා, (අර්හ ත්මාර්ගඥාන නමැති ශස්ත්‍රයෙන්)කපා හැර; තතො, ඉක්බිත්තෙන්; නිබ්බානං එහිසි, නිරුපධිශෙෂනිර්වාණයට පැමිණෙන්නේයි;

11. පඤ්ච ඡින්දෙ, (යටදිසායැයි කියනලදකාමධාතුවට[1] පමුණුවන හෙයින්) ඔරම්භාගියනම් වූ (සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස කාමරාග ව්‍යාපාදය යන) සංයොජනයන් පස් දෙනා (පයබැඳි රැහැනක් ශස්ත්‍රයකින් කපන පුරුෂයකු මෙන් ශ්‍රොතාපත්තිමාර්ගාදි යට තුන්මගින්) කපන්නේය; පඤ්ච ජහෙ, (උඩදිශාවයැයි කියනලද රූපාරූප ධාතුන්ට[2] පමුණුවනහෙයින්) උද්ධම්භාගිය නම් වූ (රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන) සංයොජනයන් පස්දෙනා(ග්‍රීවායෙහි බැඳි රැහැනක් ශස්ත්‍රයකින් කපන පුරුෂයකුමෙන් අර්හත්මාර්ගයෙන් සිඳ) දුරුකරන්නේය; පඤ්චවුත්තරි භාවයෙ,(උද්ධම්භාගිය සංයොජනයන් පස්දෙනාගේ ප්‍රහාණය පිණිස) ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් පස්දෙනා අධික කොට වඩන්නේය; පඤ්චසඞ්ගාතිගො භික්ඛු, (මෙසේ කළ කල්හි රාගසඞ්ගය ද්වේෂසඞ්ගය මොහසඞ්ගය මානසඞ්ගය දෘෂ්ටිසඞ්ගය යන)සඞ්ගයන් පස්දෙනා ඉක්මුණු මහණතෙම; ඔඝතිණ්ණො ඉති වුච්චති, කාමෞඝාදි සතරමහවතුරෙන් එතරවීයැයි කියනු ලැබේ.

12. භික්ඛු, මහණ; ඣාය,(ආලම්බනොපනිධ්‍යාන ලක්ෂණොපනිධ්‍යාන වශයෙන් ද්විවිධවූ) ධ්‍යානය වඩ; මා ච පමාදො, (කාය කර්මාදි ත්‍රිවිධසුචරිතයෙහි) පමාබවට නොපැමිණ (ධ්‍යානභාවනායෙහිද ත්‍රිවිධසුචරිතධර්මයෙහිද ප්‍රමාදවිහාරීබවට නො පැමිණෙන්නෙඃ සේයි);තෙ චිත්තං,තාගේ සිත; කාමගුණෙ, පස්කම් කොටස්හි; මා භමස්සු, නහමක් බමවයි; පමත්තො,(ධ්‍යානභාවනායෙහිද ත්‍රිවිධවූ සුචරිතයෙහිද) ප්‍රමාදවූයේ (පඤ්චකාමගුණයෙහි

---

1. සතරඅපායට. හෙට්ඨා අපාය සම්පාපකානි-අ. කථා.)
2. දෙව්ලොවට. (උපරි දෙවලොක සම්පාපකානි-අ. කථා.)

13. නත්ථි ඣානං අපඤ්ඤස්ස පඤ්ඤා නත්ථි අඣායතො
යම්හි ඣානඤ්ච පඤ්ඤා ච ස වෙ නිබ්බානසන්තිකෙ. 372

14. සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො
අමානුසී රතී හොති සම්මා ධම්මං විපස්සතො. 373

15. යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං
ලභති පීතිපාමොජ්ජං අමතං තං විජානතං. 374

---

ගිජ්වූයෙහි); ලෙහගුලං මා ගිලී, නරකයෙහි ඉපද ලොහොගුළ නොගිල; ඩය්හමානො, නරකගින්නෙහි දමින් පැලහෙමින්; ඉදං දුක්ඛන්ති, මේ දුකැයි; මා කන්දි, නහමක් හඬ.

13. අපඤ්ඤස්ස, ධ්‍යානොත්පාදකවූවීර්‍ය්‍යසම්ප්‍රයුක්තවූ ප්‍රඥාව නැත්තාහට; ඣානං නත්ථි, ධ්‍යානනම් නැත; අඣායතො, භාවනා නොකරන්නාහට; පඤ්ඤා, ("සමාහිතො යථාභූතං පජානාති" කියනලද ලක්ෂණ ඇති) ප්‍රඥතොමො; නත්ථි, නැත; යම්හි, යම් පුද්ගලයක්හු කෙරෙහි; ඣානඤ්ච, ධ්‍යානයද; පඤ්ඤා ච, ප්‍රඥාවද යන මේ දෙක ඇද්ද; සො, ඒ පුද්ගලතෙමෙ; වෙ, ඒකාන්තයෙන්; නිබ්බානසන්තිකෙ, නිර්වාණයට සමීපව සිටියේම වේ.

14. සුඤ්ඤාගාරං පවිට්ඨස්ස, ශූන්‍යාගාරයට වන්නාවූ; (හෙවත්: යම්කිසි ජන විවික්තස්ථානයෙක්හි කර්මස්ථාන මෙනෙහි කෙරෙමින් උන්නාවූ); සන්තචිත්තස්ස, නිවිසිත් ඇත්තාවූ; ධම්මං, රූපාරූප ධර්මයන්; සම්මා, මනාකොට; විපස්සතො, අනිත්‍යාදිවශයෙන් විශෙෂයෙන් බලන්නාවූ; භික්ඛුනො, මහණුට; අමානුසී රතී හොති, (විදර්ශනායෙහි අභියොගයක් නැති අන්ධපෘථග්ජන වූ ලෞකිකජනයාවිසින් ලැබිබ නොහැකිවූ විදර්ශනාසංඛ්‍යාත වූ) අමානුසික වූ ප්‍රීතිද; (අෂ්ටසමාපත්තිසංඛ්‍යාත වූ) දිව්‍යරතියද වන්නීයි-උපදින්නීයි සේයි.

15. යතො යතො, යම් යම් කාලෙක්හි; (හෙවත්: අටතිස් අරමුණෙන් එක්තර අරමුණෙක්හි පිරියම්කරන මහණ පෙරවරු පස්වරු ආදිවූ යම්කිසි කාලෙක්හි;) ඛන්ධානං, රූපාදි පඤ්චස්කන්ධයන්ගේ; උදයබ්බයං, ("අවිජ්ජාසමුදයා රූපසමුදයො" යනාදි පස්විසි ආකාරයකින්)උදයද;("අවිජ්ජා නිරොධා රූපනිරොධො" යනාදි පස්විසිආකාරයකින්) ව්‍යයද; සම්මසති, සම්මර්ශනය කෙරේද-සලකාද එකල්හි; පීතිපාමොජ්ජං ලභති, (මෙසේ සමපනස් ආකාරයෙන් ස්කන්ධයන්ගේ උදයව්‍යය සලකන මහණ) යම්

16. තත්‍රායමාදි භවති ඉධ පඤ්ඤස්ස භික්ඛුනො
ඉන්ද්‍රියගුත්ති සන්තුට්ඨි පාතිමොක්ඛෙ ච සංවරෙ
මිත්තෙ භජස්සු කල්‍යාණෙ සුද්ධාජීවෙ අතන්දිතෙ. 375

17. පටිසන්ථාරවුත්‍යස්ස [1] ආචාරකුසලො සියා
තතො පාමොජ්ජබහුලො දුක්ඛස්සන්තං කරිස්සසි. 376

---

ධර්මප්‍රීතියක් යම් ධර්මප්‍රමොද්‍යයක් ලබාද; තං, ඒ (ප්‍රත්‍යය වූ නාම රූපධර්මයන් ප්‍රකටවැ වැටහෙන කල්හි උපන්නාවූ) ප්‍රීතිප්‍රමොද්‍යය;විජානතං, නුවණැත්තවුන්ට; අමතං,(අමෘතමහා නිර්වාණයට පමුවන හෙයින්) අමෘතනම් වේ.

16. ඉධ, මේ බුඩශාසනයෙහි; පඤ්ඤස්ස භික්ඛුනො, නුවණැති මහණුට; තත්‍ර, ඒ පඤ්චස්කන්ධයන්ගේ උදයව්‍යය·සමමර්ශනයෙහි; අයං ආදි භවති, මේ චතුපාරිශුඩිශීලය පූර්වස්ථානයවේ-පූර්වකාරණය වේ; හේ කවරේදයත්? ඉන්ද්‍රියගුත්ති, (චක්ෂුරාදි සදොරට හමු වූ රූපාදි ස අරමුණෙහි ලොභ ද්වෙෂ මොහ නො උපදවා යොනිසො අවජුන් පැවැත්වීමය යන) ඉන්ද්‍රිය සංවරශීලයද; සන්තුට්ඨි, චීවරාදි චතුර්විධප්‍රත්‍යයෙහි යථාලාභසන්තොසය යථාබලසන්තොසය යථාසාරුප්පසන්තොසයද; පාතිමොක්ඛෙ ච සංවරෙ, ප්‍රාතිමොක්ෂසංවරශීලඛ්‍යාතවූ ප්‍රධානශීලයෙහි පරිපූර්ණකාරී බවද යනමෙ යි (එහෙයින් මේ චතුපාරිශුඩිශීලයෙහි පිහිටා;) සුඩාජීවෙ, (එක්විසි අනෙස්නෙන් දුරු වැ සාරවූ ජීවිකා ඇති බැවින්) පිරිසුදුවූ ආජීව ඇති; අතන්දිතෙ, (ජඩ්ඝා බලය නිසා ජීවිකාව කරන හෙයින්) අකුසීතවූ; කල්‍යාණෙ මිත්තෙ භජස්සු, (දශකථාවස්තුලාභී වූ) කල්‍යාණමිත්‍රයන් සේවනය කර.

17. පටිසන්ථාර වුත්‍යස්ස (අන්තෙවාසික සද්ධිවිහාරිකයන්ටද සපැමිණි ආගන්තුකයන්ටද ධර්මපටිසන්ථාර ආමිසපටිසන්ථාර කිරීමෙහි සම්පන්න වූ ප්‍රවෘත්ති ඇතිබැවින්) පටිසන්ථාර සීලිවැ (සඞ්ග්‍රහ කරන සුලුවූ); ආචාරකුසලො සියා, සීලය වත් පිළිවෙත [2] යන අචාරයෙහි දක්ෂවන්නේය; තතො පාමොජ්ජබහුලො, ඒ (පටිසන්ථාරයෙහි පැවැත්මෙන්ද ආචාරයෙහි දක්ෂවීමෙන්ද උපන් ධර්මප්‍රමොද්‍යයෙන්ද) ප්‍රීති බහුලවූ තෝ; දුක්ඛස්සන්තං කරිස්සසි, සියලු සංසාර දුඃඛය ක්ෂය කරන්නේ යි.

සම්බහුලානං භික්ඛූනං වත්ථු.

---

1. ප[illegible]සන්ථාරවුත්තිස්ස. 2. සියලු වත්පිළිවෙත්-ම්.

18. වස්සිකා විය පුප්ඵානි මද්දවානි පමුඤ්චති
එවං රාගඤ්ච දොසඤ්ච විප්පමුඤ්චෙථ භික්ඛවො. 377

19. සන්තකායො සන්තවාචො සන්තවා සුසමාහිතො
වන්තලොකාමිසො භික්ඛු උපසන්තොති වුච්චති. 378

20. අත්තනා චොදයත්තානං පටිමාසෙ අත්තමත්තනා
සො අත්තගුත්තො සතිමා සුඛං භික්ඛු විහාහිසි 379

---

**26—8.**

18. මද්දවානි, පරවැ මලාගියා වූ; පුප්ඵානි, පුෂ්පයන්; වස්සිකා විය පමුඤ්චති, වස්සිකලතාතොමෝ යම්සේ තුවටුයෙන් මූදද; (ඊයේ පිපි මල් අද පර වැ ගිය කල දූසමන්ලියය ඒ පරමල්තාක් තුවටුයෙන් මූදා යම්සේ බිම හෙළා පියාද;) එවං, එපරිද්දෙන්ම; භික්ඛවො, මහණෙනි, රාගඤ්ච, රාගයද; දොසඤ්ච, ද්වෙෂයද; විප්පමුඤ්චෙථ, තොපගේ සන්තානයෙන් මූදා හැරපියව්.

**පඤ්චසතභික්ඛූනං වත්ථු**

**26—9.**

19. සන්තකායො, (ප්‍රාණවධාදිත්‍රිවිධකායදුශ්චරිතයෙන් දුරුවූ හෙයින්) ශාන්තවූ කායචාර ඇති; සන්තවාචො, (මෘෂාවාදාදි චතුර්විධවාග්දුශ්චරිතයෙන් දුරුවූ හෙයින්) ශාන්තවූ වාග්චාර ඇති; සන්තවා, (අභිධ්‍යාදි ත්‍රිවිධමනොදුශ්චරිතයෙන් දුරුවූ හෙයින්) ශාන්තවූ මනොචාර ඇති; සුසමාහිතො, කායාදි චාරත්‍රය මනාකොට පිහිටිහෙයින් ඉතා සමාහිතවූ; වන්තලොකාමිසො භික්ඛු, (චතුර්විධආර්‍ය්‍යමාර්ගඥනමුඛයෙන්) වමනය කරනලද පඤ්චකාමගුණසඞ්ඛ්‍යාත ලොකාමිස ඇති මහණතෙමේ; උපසන්තොති වුච්චති, (සන්තානයෙහි රාගාදීන් සන්හුන්බව හේතු කොට ගෙන) අතිශයින් ශාන්තයැයි කියනු ලැබේ.

**සන්තකායත්ථෙරවත්ථු**

**26—10.**

20. අත්තනා, තෙමේ; අත්තානං, තමාට; චොදය; (චොදනා කරන මහණ මෙබඳු නෛර්‍ය්‍යානිකවූ බුඬශාසනයෙහි මහණවූ තා විසින් මේ කායදුශ්චරිතය කළ සේ නපුරුවේද මේ වාග්දුශ්චරිතය කීසේ නපුරුවේද මේ මනොදුශ්චරිතය සිතූසේ නපුරු වේදැයි) තොමෝ තට චොදනා කර; අත්තං, තා; අත්තනා, තෝම; පටිමාසෙ, (විමසා කිම හෝ රුදුවල්හි මැ වත් පිළිවෙත් කරන්නාහට බණ හදාරන්නාහට කමටහන්හි යෙදෙන්නාහට ඉක්මෙද්දේ හෝ නො එසේ වූවාහට ඉක්මෙද්දේ හෝයි) තෝම තා පරීක්ෂා කර; භික්ඛු, මහණ; සො ත්වං, හේ තෝ; අත්තගුත්තො,

21. අත්තා හි අත්තනො නාථො අත්තා හි අත්තනො ගති
තස්මා සඤ්ඤමයත්තානං අස්සං භද්‍රංව වාණිජො 380

22. පාමොජ්ජබහුලො භික්ඛු පසන්නො බුද්ධසාසනෙ
අධිගච්ඡෙ පදං සන්තං සඞ්ඛාරූපසමං සුඛං. 381

23. යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ
සො ඉමං ලොකං පභාසෙති අබ්භා මුත්තොව චන්දිමාති

භික්ඛුවග්ගො පඤ්චවීසතිමො 382

---

තා විසින් මැ රක්නා ලද්දෙහි; සතිමා, එළැඹ සිටි සිහි ඇතිබැවින් ස්මෘතිමත් වූයෙහි; සුඛං විහාහිසි, සතර ඉරියවුවෙහි මැ සුවයෙන් වසන්නෙහි සි.

21. හි, යම්හෙයෙකින්; අත්තා, පුද්ගලතෙමේ ම; අත්තනො, තමහට; නාථො, පිහිට වේද; හි, යම්හෙයෙකින්; අත්තා, පුද්ගල තෙමේ මැ; අත්තනො, තමහට; ගති, පිළිසරණද; තස්මා, එහෙසින් (හෙවත්: තමාම තමහට පිහිට වන හෙයින් තමාම තමහට පිළිසරණ වන හෙයින්); භද්‍රං අස්සං, (සින්ධුදෙශයෙහි උපන්වර්ණ ජව බල සම්පන්නාවූ) උත්තමවූ අශ්වාජානෙයයකු පොෂණය කරන්නාවූ (හෙවත්: මොහු නිසා බොහෝ ලාභ ලබම්සි ඔහු ප්‍රපාතස්ථාන විෂමස්ථානයෙහි ඇවිද්ද නොදී තුන්වේලෙහි නහවා කවා පොවා රක්‍ෂාකරන); වාණිජො ඉව, අස්වෙළඳකු මෙන්; අත්තානං, තමා; සඤ්ඤමය, (කායාදිවාරත්‍රයෙන් අකුසලුන් වැද්ද නොදී) මනාකොට රක්‍ෂාකර.

නඞ්ගලකුලත්ථෙරවත්ථු

25—11.

22. පාමොජ්ජබහුලො, පියවියෙන්ම බුදුන්කෙරෙහි සන්තොෂ බහුල වූ; බුද්ධසාසනෙ, බුදුන්ගේ අනුශාසනායෙහි; පසන්නො, ප්‍රසන්නාවූ; භික්ඛු, මහණතෙමෙ; සඞ්ඛාරූපසමං, සියලු සංස්කාරයන් සංසිඳුවන්නාවූ; සුඛං, එහෙයින් මැ ඒකාන්ත සුව වූ; සන්තං පදං, අත්‍යන්තශාන්ත වූ නිර්වාණයට; අධිගච්ඡෙ, පැමිණෙන්නේ සි.

වක්කලිත්ථෙරවත්ථු

25—12.

23. දහරො, ළදරුවූ; යො භික්ඛු, යම් මහණෙක්; බුද්ධසාසනෙ, බුදුන්ගේ අනුශාසනායෙහි හෙවත්: කම්ටහන්හි; යුඤ්ජති, යෙදේද; සො, ඒ මහණතෙමෙ; අබ්භාමුත්තො, වලාපටලයකින් මුක්තවූ; චන්දිමා ඉව, පූර්ණචන්ද්‍රයා අවකාශලොකය බබුළුවන්නාක් මෙන්; ඉමං ලොකං, ස්කන්ධාදිසඞ්ඛ්‍යාත වූ මේ ලොකය; හවෙ ඒකාන්තයෙන්; පභාසෙති, ඥාණාලොකයෙන් බබුළුවන්නේ සි.

සුමනසාමණෙරවත්ථු

භික්ඛුවග්ගො පඤ්චවීසතිමො

1. ඡින්ද සොතං පරක්කම්ම කාමෙ පනුද බ්‍රාහමණ
සඞ්ඛාරානං ඛයං ඤත්වා අකතඤ්ඤූසි බ්‍රාහමණ. 383

2. යදා ද්වයෙසු ධම්මෙසු පාරගූ හොති බ්‍රාහමණො
අථස්ස සබ්බෙ සංයොගා අත්ථං ගච්ඡන්ති ජානතො. 384

3. යස්ස පාරං අපාරං වා පාරාපාරං න විජ්ජති
වීතද්දරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහමණං. 385

---

## 26—1.

1. බ්‍රාහමණ, බමුණ; පරක්කම්ම, (ඥානසම්ප්‍රයුක්ත වූ සම්‍යක් ප්‍රධානයයි කියනලද) වීර්‍ය කොට; සොතං, (අනාදිමත්කාලයෙහි අවිච්ඡින්න වැ පැවැත්තාවූ) තෘෂ්ණා නමැති දියවතුරු; ඡින්ද, සිඳ පිය; කාමෙ පනුද, (ඒ තෘෂ්ණා ශ්‍රොතස සිඳිනා පිණිස) වස්තුකාමක්ලෙශකාමයන් (සන්තානයෙන්) පහකර; බ්‍රාහමණ, බමුණ; සඞ්ඛාරානං ඛයං ඤත්වා, පඤ්චස්කන්ධයන්ගේ (ක්ෂණිකනිරොධ සන්තතිනිරොධවශයෙන් මැ වන්නාවූ) විනාසය විදර්ශනඥානයෙන් දැන; අකතඤ්ඤූ අසි, (මෙසේ කල්හි තෝ රත්රිදී ආදී කිසිවෙකින් වත් ශක්‍රබ්‍රහමාදි කිසිකෙනකුන් විසින්වත් නොකරනලද හෙයින් අකෘතනම් වූ නිර්වාණය ආලම්බනය කිරීම්වශයෙන් ප්‍රත්‍යක්ෂකොට දූත්මෙන්) අකෘතඥනම් වන්නෙහි යි.

### පසාදබහුලබ්‍රාහමණවත්ථු

## 26—2.

2 බ්‍රාහමණො, ක්ෂීණාශ්‍රවබ්‍රාහමණතෙමෙ; යදා, යම්කලෙක්හි; ද්වයෙසු ධම්මෙසු, සමථවිදර්ශනාවශයෙන් ද්විවිධවූ ධර්මයෙහි; පාරගූ හොති, අභිඥාපාරගාදිවශයෙන් පරතෙරට පැමිණියේ වේද; අථ, එකල්හි; ජානතො, (දුඃඛසත්‍යය පරිඥෙය්‍යය සමුදය සත්‍යය ප්‍රහාතව්‍යය යනාදීන්) චතුරාර්‍ය්‍යසත්‍යයන් (සත්‍යඥාන කෘත්‍යඥානාදිවශයෙන්) මනාකොට දන්නාවූ; අස්ස, ඒ ක්ෂීණාශ්‍රව බ්‍රාහමණයාගේ; සබ්බෙ සංයොගා, (සංසාරවෘත්තයෙහි යොදන්නට සමර්ථවූ කාමයොගාදි)සියලු සංයෝගයෝ; අත්ථං ගච්ඡන්ති, ක්ෂයට පැමිණෙන්නාහුයි.

### සම්බහුලානං භික්ඛූනං වත්ථු

## 26—3.

3. යස්ස, යම් ආර්‍ය්‍යශ්‍රාවකයෙක්හට; පාරං, (ආධ්‍යාත්මිකවූ චක්ෂුරාදිෂඩායතනයැයි කියනලද) පාරයද (හෙවත්: එතෙරද;) අපාරං වා, (බාහිරවූ රූපාදිෂඩායතනයැයි කියනලද) අපාරයද

4. ඣායිං විරජමාසීනං කතකිච්චං අනාසවං
උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහමණං. 386

5. දිවා තපති ආදිච්චො රත්තිං ආභාති චන්දිමා
සන්නද්ධො ඛත්තියො තපති ඣායී තපති බ්‍රාහමණො
අථ සබ්බමහොරත්තිං බුද්ධො තපති තෙජසා. 387

---

හෙවත්: මෙතෙරද;) පාරාපාරං, අජ්ඣත්තිකබාහිරායතනයෑයි කියනලද) පාරයද අපාරයද; හෙවත්: එතෙරද මෙතෙරද; න විජ්ජති, (මමයෑ යි වත් මාගේයෑ යි වත් ගැන්මක් නැති හෙයින්) නැද්ද; වීතද්දරං, පහවූ කෙලශපීඩා ඇති; විසංයුත්තං, සකල කෙලශයන්කෙරෙන් විනිර්මුක්තවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහමණං බ්‍රෑමි, (බාහිතවූ පාපයන් ඇතිහෙයින්) බ්‍රාහ්මණ යෑ යි කියමි.

## මාරස්ස වත්ථු

## 26—4.

4. ඣායිං, (ආලම්බනොපනිධ්‍යාන ලක්ෂණොපනිධ්‍යාන වශයෙන්) විවිධවූ ධ්‍යානයෙන් ධ්‍යායීවූ-සමථවිදර්ශනා භාවනායෙහි යුක්ත ප්‍රයුක්තවූ; විරජං, රාගාදිරජස් නැත්තාවූ; ආසීනං, වෙනෙහි හුදකලාව උන්නාවූ; හෙවත්: ගැඹුරුවල්හි හුදකලාව වසන්නාවූ; කතකිච්චං, (චතුර්විධ ආර්‍ය්‍යමාර්ගයෙන් කරනලද පරිඥාදිෂොඩශ විධකෘත්‍ය ඇතිහෙයින්) කෘතකෘත්‍යවූ; අනාසවං, (චතුර්විධආර්‍ය්‍යමාර්ගයන්ටතිසිතිසිපරිද්දෙන්) ප්‍රහීණකරනලද චතුරාශ්‍රවයන් ඇතිහෙයින් අනාශ්‍රව වූ; උත්තමත්ථං අනුප්පත්තං, උත්තමාර්ථයෑයි කියනලද අර්හත්ඵලයට පැමිණියා වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, (බාහිතවූ පාපයන් ඇතිහෙයින්) බ්‍රාහ්මණ යෑයි කියමි.

## අඤ්ඤතරබ්‍රාහමණවත්ථු

## 26—5.

5. ආදිච්චො, සූර්‍ය්‍යයා; දිවා තපති, දවල්ම දිලියෙන්නේය; (රෑනොදිලියෙන්නේය); චන්දිමා, චන්ද්‍රයා; රත්තිං ආභාති, (අභ්‍ර මහික ධූම රජෝ රාහුය යන පඤ්චොපකෙලශයෙන් විනිර්මුක්ත වූයේ) රාත්‍රියෙහි මෑ දිලියෙන්නේයෑ (දවල් නො දිලියෙන් නේයෑ); ඛත්තියො, රජතෙමෙ; සන්නද්ධො තපති, (රත්රුවණින් විසිතුරු වූ) සර්වාභරණයෙන් සැරහී සියුරඟ සෙනගින් පිරිවරන ලද්දේ මෑ දිලියෙන්නේය- හොබනේය (අප්‍රසිද්ධවෙශයෙන් සිටියේ නොහොබනේ); බ්‍රාහමණො, ක්ෂීණාශ්‍රවතෙමෙ; ඣායී තපති, ගනසඞ්ගනිකායෙන් වෙන්වෑ සමාපත්තියට සමවන්නේමෑ

6. බාහිතපාපොති බ්‍රාහ්මණො සමචරියා සමණොති වුච්චති
පබ්බාජයත්තනො මලං තස්මා පබ්බජිතොති වුච්චති. 388

7. න බ්‍රාහ්මණස්ස පහරෙය්‍ය නාස්ස මුඤ්චෙථ බ්‍රාහ්මණො
ධී බ්‍රාහ්මණස්ස හන්තාරං තතො ධී යස්ස මුඤ්චති. 389

---

දිලියෙන්නේය-හොබනේය; (ගණසඞ්ගනිකායෙන් යුක්තවූයේ නො හොබනේය;) අථ, නැවත; සබ්බං අහොරත්තිං, සියලු දිවාරාත්‍රියෙහි; බුද්ධො, සම්‍යක්සම්බුද්ධතෙමෙ; තෙජසා, (චරණතෙජස [1] ගුණතෙජස ඥානතෙජස පුණ්‍යතෙජස ධර්මතෙජස යන) පඤ්චවිධතෙජසින්; තපති, දිලිසෙන්නේයි.

### ආනන්දථෙරවත්ථු

### 26—6.

6. (යස්මා, යම්හෙයෙකින්); බාහිතපාපොති, සන්තානයෙන් බාහ්‍යකරනලද පාපධර්මයන් ඇත්තේනුයි; බ්‍රාහ්මණොති වුච්චති, බ්‍රාහ්මණයැ යි කියනු ලැබේද; සමචරියා, කායවිෂමාදියෙන් දුරුවැ සියලු අකුශලයන් සන්හිඳුවා වසන හෙයින්; සමණොති වුච්චති,ශ්‍රමණයැ යි කියනු ලැබේද;(යස්මා,යම්හෙයෙකින්;) අත්තනො මලං, තමාගේ රාගාදිමල; පබ්බාජයති, තදඞ්ගාදිවශයෙන් පහ කෙරේද; තස්මා, එහෙයින්; පබ්බජිතොති වුච්චති, ප්‍රව්‍රජිතයැ යි කියනු ලැබේ.

### අඤ්ඤතරපබ්බජිතවත්ථු

### 26—7.

7. බ්‍රාහ්මණො, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණතෙමෙ; බ්‍රාහ්මණස්ස, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණයකුවත් එක්තරු ජාතිබ්‍රාහ්මණයකුවත්;න පහරෙය්‍ය, (අතින් පයින් දණ්ඩෙන් සැතින්)නො පහරන්නේය;බ්‍රාහ්මණො, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණතෙමෙ; අස්ස, ඒ තමා පහළ පුද්ගලයාහට; න මුඤ්චෙථ,කෝප නො කරන්නේයි; බ්‍රාහ්මණස්ස හන්තාරං ධී, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණයා(අතින් පයින් දණ්ඩෙන් සැතින්)පහරන්නාහට නින්දා කෙරෙමි-ගර්හාකෙරෙමි; යො, යමෙක්තෙමෙ; අස්ස, ඒ තමා පහළ තැනැත්තහුට; මුඤ්චති, කෝපකෙරේද; තතො, ඒ ක්ෂීණාශ්‍රවයා පහළ තැනැත්තහුට වඩා; තස්ස ධි, ඕහට නින්දා කෙරෙමි-ගර්හාකෙරෙමි.

---

1. සරණතෙජස-මු,

8 න බ්‍රාහ්මණස්සෙතදකිඤ්චි සෙය්‍යො
යදා නිසෙධො මනසො පියෙහි
යතො යතො හිංසමනො නිවත්තති
තතො තතො සම්මතිමෙව දුක්ඛං. 390

9. යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කතං
සංවුතං තීහි ඨානෙහි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 391

10. යම්හා ධම්මං විජානෙය්‍ය සම්මාසම්බුද්ධදෙසිතං
සක්කච්චං තං නමස්සෙය්‍ය අග්ගිහුත්තංව බ්‍රාහ්මණො. 392

---

8. එතං, (පාණිප්‍රහාරාදියෙන් පහළ තැනැත්තහුට පෙරළා නො පැහැරීමයැ ජාත්‍යාදියෙන් සවා බිණුවහුට පෙරළා නොබිණීමයැ යන) මේ; බ්‍රාහ්මණස්ස, ක්ෂීණාශ්‍රවබ්‍රාහ්මණයාහට; කිඤ්චි සෙය්‍යො න; ස්වල්පමාත්‍ර වූ ශ්‍රෙයසෙක් නොවේ; නොහොත්: යදා යම් කාලෙක්හි; මනසො පියෙහි, (ක්‍රොධීපුද්ගලයාගේ) මනසට ප්‍රියවූ ක්‍රොධචිත්තොත්පාදයෙන්; යො නිසෙධො, යම් වැළැක්මෙක් ඇද්ද; (ක්‍රොධකාරණයෙන් උපදනාවූ ප්‍රතිඝචිත්තයාගේ යම් වැළැක්මෙක් ඇද්ද-නිග්‍රහකිරීමෙක් ඇද්ද;) එතං, මේ ක්‍රොධනිග්‍රහය; බ්‍රාහ්මණස්ස, ක්ෂීණාශ්‍රව බ්‍රාණයාහට; අකිඤ්චි සෙය්‍යොන, ස්වල්පමාත්‍රවූ ශ්‍රෙයසෙක් නොවේ; (මහත්වූම ශ්‍රෙයසෙකි;) යතො යතො, යම් යම් කාරණයෙකින්; හිංසමනො, ක්‍රොධචිත්තය; නිවත්තති, අනාගාමිමාර්ගයෙන් සමුද්ඝාතයට යන්නේ) නවතීද; තතො තතො, ඒ ඒ කාරණයෙන්; දුක්ඛං, සියලු සංසාරදුක්ඛය; සම්මතිමෙව, සංහිඳෙන්නේම වේ.

**සාරිපුත්තත්ථෙරවත්ථු**

**26—8.**

9 යස්ස, යම් පුද්ගලයක්හට; කායෙන, කයින් සිඩවන්නාවූද; වාචාය, වචසින් සිඩවන්නාවූද; මනසා, මනසින් සිඩවන්නාවූද; දුක්කතං, (සාවද්‍ය; දුඃඛවිපාකවූ අපායගාමීවූ) අකුශලකර්මයෙක්; නත්ථි, නැද්ද; තීහි ඨානෙහි, මේ තුන්තැනින්; (හෙවත්: මේ තුන් දොරින් වදනා අකුශලයන්ගේ නිවාරණය පිණිස;) සංවුතං, පිහිතවූ රක්ෂිතගොපිතවූ දොරඇති; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

**මහාපජාපතිගොතමිය වත්ථු**

**26—9.**

10. යම්හා, (හීනමධ්‍යමොත්තමවූ ස්ථවිර නවක මධ්‍යමවූ හෝ) යමක්හු කෙරෙන්; සම්මාසම්බුද්ධදෙසිතං, සම්‍යක්සම්බුද්ධයන්

11. න ජටාහි න ගොත්තෙන න ජච්චා හොති බ්‍රාහ්මණො
යම්හි සච්චඤ්ච ධම්මො ච සො සුචී සො ච බ්‍රාහ්මණො. 393

12. කිං තෙ ජටාහි දුම්මෙධ කිං තෙ අජිනසාටියා
අබ්භන්තරං තෙ ගහණං බාහිරං පරිමජ්ජසි. 394

---

විසින් දෙසන ලද්දවූ; ධම්මං, පර්‍ය්‍යාප්තිධර්මය; විජානෙය්‍ය, (යම් පුද්ගලයෙක්) දන්නේවීනම්; (හෙවත්: යම් පුද්ලයෙක් සම්‍යක් සම්බුද්ධයන් විසින් දෙසනලද පාලිධර්මයෙන් යටත් පිරිසෙයින් එකගාථාවකුදු ගාථාර්ධයෙකුදු යමක්හු කෙරෙන් දත්තේ වීනම්;) තං ඒ ආචාරීහු; අග්ගිහුත්තං බ්‍රාහ්මණො ඉව, අග්නිගොත්‍රයට පූජාකරන බමුණකු මෙන්; (හෙවත්: ගිනිදෙවියාහට සකස් කොට පරිහරණය කිරීමෙන් බලිකර්ම කිරීම් ආදීන් පූජාකරන බමුණකු මෙන්;) සක්කච්චං, සකස්කොට; නමස්සෙය්‍ය, නමස්කාරකරන්නේයි; (සතර ඉරියව්වෙහි මැ ඔහු වසන දිගටද ආදර ඇතිවැ සකස්කොට වඳනේයි)

## සාරිපුත්තත්ථෙරවත්ථු

## 26—10.

11. ජටාහි, බඳනාලද [1] ජටාවන් කාරණකොටගෙනැ; බ්‍රාහ්මණො න හොති, බ්‍රාහ්මණනම් නො වෙයි; ගොත්තෙන, (කෞශික[2] කාශ්‍යපාදී ප්‍රසිද්ධ) ගොත්‍රකාරණකොටගෙනද; බ්‍රාහ්මණො න හොති, බ්‍රාහ්මණ නම් නොවෙයි; ජච්චා, (උත්තමවූ ධනසඤ්ජාතිකුල යයි කියනලද) ජාතිය කාරණකොට ගෙනද; බ්‍රාහ්මණො න හොති, බ්‍රාහ්මණ නම් නොවෙයි; (වැලි කෙසේ බ්‍රාහ්මණ නම් වේද යත්?) යම්හි, යම් පුද්ගලයක්හු කෙරෙහි; සච්චඤ්ච, (චතුරාර්‍ය්‍ය සත්‍යයන් ප්‍රතිවෙධ කොට සිටි) සත්‍යඥානයද; ධම්මො ච, නවලොකොත්තර ධර්මයද ඇද්ද; සො සුචී, හෙතෙමෙ සුචි නමුදු වෙයි; සො ච බ්‍රාහ්මණො, හෙතෙමෙ බ්‍රාහ්මණ නමුදුවේ.

## ජටිලබ්‍රාහ්මණවත්ථු

## 26—11.

12. දුම්මෙධ, නුවණනැත්ත; තෙ, තට; ජටාහි, බඳනාලද තෙල ජටාවෙන්; කිං, ප්‍රයොජන කිම්ද; තෙ, තට; අජිනසාටියා, හඳනාලද තෙල අජිනචර්මමය සාටිකාවෙන් හෙවත්: තිය ඇති අඳුන් දිවිසමින්; කිං, ප්‍රයොජන කිම්ද; තෙ, තාගේ; අබ්භන්තරං,

---

1. වලඳනාලද-මු. 2. කෞණ්ඩඤ්ඤ.

13. පංසුකූලධරං ජන්තුං [1] කිසං ධමනිසන්ථතං
එකං වනස්මිං ඣායන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 395

14. නචාහං බ්‍රාහ්මණං බ්‍රෑමි යොනිජං මත්තිසම්භවං [2]
භොවාදිනාම සො හොති සවෙ හොති සකිඤ්චනො
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 396

---

ඇතුළත; ගහණං, රාගාදි කෙලෙසුන් විසින් ගහණය-ගැවසී ගත්තෙයැ; (එතකුදුළුවත්) බාහිරං පරිමජ්ජසි, (ඇතුළෙන් සිලුටු නොවැ පිටතින් සිලුටු වූ ඇත්බෙටි අස්බෙටි ආදියමෙන් ඇතුළෙන් පිරිසුදු නොවූ තෝ ජටාජිනවාකචීරාදි තවුස්පිරිකරින්) පිටතම පිරිමදනෙහි- පිටතම සිලුටු කරන්නෙහියි.

කුහකබ්‍රාහ්මණවත්ථු

2[illegible]—1[illegible].

13. පංසුකූලධරං, (සුසානසඞ්කාරකූටාදියෙන් අවුලාගත් රෙදි කඩින්කොට ගත්) පවුල් සිවුරු දරන්නාවූ; කිසං, රූක්‍ෂ ප්‍රතිපත්ති පිරිමෙන් කෘශවූ ශරීර ඇති; ධමනිසන්ථතං, ඉපැල පැනෙන නහරවැලින් ගැවසීගත් ශරීරඇති; වනස්මිං, ජන විවික්තවූ ගැඹුරු මහවල්හි; එකං, හුදකලාව; ඣායන්තං, භාවනා කරන්නවූ; තං, ඒ ක්‍ෂීණාශ්‍රාවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

කිසාගෝතමීවත්ථු

[illegible]6—13.

14. යොනිජං, මවගේ යොනිමාර්ගයෙන් උපන්නාවූ; මත්ති සම්භවං, බැමිණිය මවුකුසැ උපන්නාහට එපමණෙකින්; අහං, මම; බ්‍රාහ්මණං, බ්‍රාහ්මණයැයි; නචා බ්‍රෑමි, නො කියමි; සචෙ, ඉදින් සකිඤ්චනො හොති, යමෙක් (බ්‍රාහ්මණජාති ඇතිවත් රාගාදි පළිබොධසහිතවීනම්) රාගාදි කෙලෙස් පළිබොධ ඇත්තේ වී නම්; සො, හෙතෙමෙ; භොවාදිනාම හොති, (ආමන්ත්‍රණාදි කාලයෙහි දුටුදුටුවන්ට භො භො යැයි කියමින්; ඇවිදිනා හෙයින්) භොවාදිනම් වෙයි; (බ්‍රාහ්මණ නම් නොවෙයි එහෙයින්;) අකිඤ්චනං, රාගාදි කිසි පළිබොධයක් නැත්තාවූ; අනාදානං, (කාමූපාදානාදි

---

1. "ජන්තු." යන්නට සන්ධ අටුවා දෙක්හිමැ අර්ථ නොපෑනේ. එහෙයින් ඒවා ළපත පාදපූරණනිපාතමාත්‍රවශයෙන් දෙශිතයක් යී හැඟෙන හෙයින් ගාථාවෙහි විතීයාන්තයකට සම්බන්ධ කිරීම යොග්‍යයයි සිතමු.

2. ඛත්තිසම්භවං-

15. සබ්බසංයොජනං ඡෙත්වා යො වෙ න පරිතස්සති.
සඞ්ගාතිගං විසඤ්ඤුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 397

16. ඡෙත්වා නද්ධිං වරත්තං ච සන්දාමං සහනුක්කමං
උක්ඛිත්තපලිඝං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 398

---

චතුරුපාදානයන් අතුරෙන් කිසි උපාදානයක්) තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් නොගත්තාවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

**එකස්ස බ්‍රාහ්මණස්ස වත්ථු**

**26—14.**

15. සබ්බසංයොජනං ඡෙත්වා, (කාමරාගසංයොජනාදි) සියලු දසවිධසංයොජනයන් (ඒ ඒ මාර්ගයට අනුරූපපරිච්ඡෙදෙන් චතුර්විධ අර්‍ය්‍යමාර්ගයෙන්) සමුච්ඡෙදය කොට සිටිහෙයින්; යො, යම්ක්ෂීණාශ්‍රවපුද්ගලයෙක්; වෙ, ඒ කාන්තයෙන්; න පරිතස්සති, ජීවිතනිකාන්තිරහිතහෙයින් නොබාද; (කිසි සත්වසංස්කාර කෙනකුන් කෙරෙහි භය නොකෙරේද) සඞ්ගාතිගං, රාගසඞ්ගාදි සප්තවිධ සඞ්ගයන් ඉක්මුණාවූ; විසංයුත්තං, රාගාදිසකලක්ලේශයන් කෙරෙන් වියුක්තවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවපුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

**උග්ගසෙනවත්ථු**

**26 – 15.**

16. නද්ධිං, (පරාපකාරය නැවත නැවත සිත්හිලා වෙළන ස්වභාවයෙන් පවත්නා) ක්‍රොධනමැති දළවර ද; වරත්තංච (සත්වයන් සංසාරයෙහි බඳනා ස්වභාවවූ) තෘෂ්ණා නමැති වරපටද; සහනුක්කමං, (කාරණලාභයක් ඇතිකල්හි සත්වසන්තානයෙහි නැවත නැවත පවත්නා හෙයින්) අනුක්‍රමනම්වූ කාමරාගාදි අනුසයන් සත්දෙනා හා සහිත වූ; සන්දාමං, ද්වාෂෂ්ටිදෘෂ්ටි නමැති මහ දමද; ඡෙත්වා, ඒ ඒ මාර්ගයෙන් සමුච්ඡෙදය කොට සිටියාවූ; උක්ඛිත්තපලිඝං,(අර්හද්මාර්ගඥාන නමැති හස්තයෙන්) උදුරා හරණලද අවිද්‍යා නමැති හිදිබාව ඇති; බුද්ධං, චතුරාර්‍ය්‍ය සත්‍යයන් තත්වූ පරිච්ඡෙදෙන් දත්තාවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි;

**ද්වින්නං බ්‍රාහ්මණානං වත්ථු**

17. අක්කොසං[1] වධබන්ධඤ්ච අදුට්ඨො යො තිතික්ඛති
ඛන්ති බලං බලානීකං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 399

18. අක්කොධනං වතවන්තං සීලවන්තං අනුස්සුතං.
දන්තං අන්තිම සාරීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 400

19. වාරිපොක්ඛරපත්තෙව ආරග්ගෙරිව සාසපො.
යො න ලිප්පති[2] කාමෙසු තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 401

---

**26—16.**

17. අක්කොසං, (ජාත්‍යාදියෙන් සවා බණන්නාවූ) දශවිධ ආක්‍රොශයද; වධබන්ධඤ්ච, (පාණිප්‍රහාරාදි හස්තපාදච්ඡේදාදි) වධයද (අන්දුබන්ධන රජ්ජුබන්ධනාදි) බන්ධනයද යන මේ සියල්ල; යො, යම්පුද්ගලයෙක්; අදුට්ඨො, ද්වෙෂයෙන් දූෂිත නොවූයේ; හෙවත්: නොකිපියේ; තිතික්ඛති, ඉවසාද; ඛන්තිබලං, ක්ෂාන්තිබලකොට ඇති; බලානීකං, නැවත නැවත උපදනාවූ එම ක්ෂාන්තිය බල ඇණිකොට ඇති; නොහොත්: ඛන්තිබලං බලානීකං, ක්ෂාන්ති බලයම බලඇණිකොට ඇති; තං, ඒ ක්ෂීණාශ්‍රව පුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

—අක්කොසකභාරද්වාජවත්ථු—

**26—17.**

18. අක්කොධනං, ක්‍රොධනැත්තාවූ; (ආක්‍රොශකළවුන් කෙරෙහි නොකිපෙන්නාවූ;) වතවන්තං, ධූතාඞ්ගව්‍රතයෙන් සමන්විතවූ; සීලවන්තං, චතුපාරිසුද්ධිසීලයෙන් සිල්වත්වූ; අනුස්සුතං, තෘෂ්ණා ස්නෙහයෙන් තෙත්නොවූ; දන්තං, චක්ෂුරාදිෂඩින්ද්‍රියදමනයෙන් දැමුණාවූ; අන්තිමසාරීරං, භවපරියන්තයෙහි සිටිහෙයින් අන්තිමශරීර ඇති; තං, ඒ ක්ෂීණාශ්‍රව පුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

—සාරිපුත්තත්ථෙරවත්ථු—

**26—18.**

19. පොක්ඛරපත්තෙ වාරි ඉව, පියුම්පතෙහි නො ඇලෙන දියබින්දුමෙන්ද; ආරග්ගෙ සාසපොරිව, හිදිකටුඅග නොරඳන අබඇටමෙන්ද; යො, යම් පුද්ගලයෙක්; කාමෙසු, වස්තුකාම ක්ලෙශකාමදෙක්හි; න ලිප්පති, නොඇලේද; තං, ඒ ක්ෂීණාශ්‍රව පුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

—උප්පලවණ්ණාථෙරියාවත්ථු—

---

1. අක්කොධං. 2. කලිම්පති.

20. යො දුක්ඛස්ස පජානාති ඉධෙව ඛයමත්තනො
පන්නභාරං විසඤ්ඤුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 402

21. ගම්භීරපඤ්ඤං මෙධාවිං මග්ගාමග්ගස්ස කොවිදං
උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 403

22. අසංසට්ඨං ගහට්ඨෙහි අනාගාරෙහි චූභයං
අනොකසාරිං අප්පිච්ඡං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 404

---

**26—19.**

20. යො, යම් පුද්ගලයෙක්; ඉධෙව, ප්‍රත්‍යක්‍ෂවූ මෙමැ ආත්ම භාවයෙහි; අත්තනො තමාගේ; දුක්ඛස්ස, ස්කන්ධදුඃඛයාගේ; ඛයං, විනාශය; පජානාති, දනිද; (මේ ජාතියෙහිමැ මාගේ ස්කන්ධදුඃඛය නිරුද්ධවන්නේයැයි දනීද;)පන්නභාරං; බහා තබනලද ස්කන්ධභාරය ඇති; විසංයුත්තං, සියලු කෙලෙසුන්කෙරෙන් මිදුණාවූ; තං, ඒ ක්‍ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

~අඤ්ඤතරබ්‍රාහ්මණවත්ථු~

**26—20.**

21. ගම්භිරපඤ්ඤං, ගැඹුරුවූ ස්කන්ධධාත්වායතනයෙහි පැවැත්තාවූ ප්‍රඥවෙන් සමන්විතවූ; මෙධාවිං, ධර්මෞජසප්‍රඥවයැයි කියනලද විදර්ශනාඥානයෙන් මෙධාවීවූ;මග්ගාමග්ගස්ස කොවිදං, (මේ දුගතියට මඟය මේ සුගතියට මඟය මේ නිවණට මඟයැයි මෙසේ) මාර්ගාමාර්ගදෙක්හි දක්‍ෂවූ; උත්තමත්ථං අනුප්පත්තං, රහත්ඵලයැයි කියනලද උත්තමාර්ථයට පැමිණියාවූ; තං, ඒ ක්‍ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

~ඛෙමායභික්ඛුණියාවත්ථු~

**26—21.**

22. ගහට්ඨෙහි, ගිහිමිනිසුන්හාද; අනාගාරෙහිච, ප්‍රව්‍රජිතයන් හාද යන; උභයං, දෙපක්‍ෂයෙහි ඇත්තවුන්හා; අසංසට්ඨං, (දර්ශන සංසර්ගය ශ්‍රවණසංසර්ගය සමුල්ලාපසංසර්ගය පරිභොගසංසර්ගය කායසංසර්ගය යන) පඤ්චවිධ සංසර්ගය නැත්තාවූ; අනොකසාරිං, ආලයසඤ්චාරයක් නැත්තාවූ; (හෙවත්: තෘෂ්ණා නමැති ගෙහි හැසිරීමක් නැත්තාවූ;) අප්පිච්ඡං, (ප්‍රත්‍යයගෙධයක් නැතිහෙයින් චතුර්විධ ප්‍රත්‍යයෙහි) ඉච්ඡාරහිතවූ; තං,ඒ ක්‍ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

~පබ්භාරවාසිතිස්සත්ථෙරවත්ථු~

23. නිධාය දණ්ඩං භූතෙසු තසෙසු ථාවරෙසුච
යො න හන්ති න ඝාතෙති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 405

24. අවිරුද්ධං විරුද්ධෙසු අත්තදණ්ඩෙසු නිබ්බුතං
සදානෙසු අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 406

25. යස්ස රාගො ච දොසො ච මානො මක්ඛො ච පාතිතො
සාසපොරිව ආරග්ගා තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 407

---

26—22.

23. තසෙසු, තෘෂ්ණා සන්ත්‍රාසයෙන් සභයවූද; ථාවරෙසු ච, තෘෂ්ණාසන්ත්‍රාසරහිතහෙයින් නිර්භයවූද; භූතෙසු, සියලු සතුන් විෂයෙහි; දණ්ඩං, කායදණ්ඩය; නිධාය, බහා තබා; හෙවත්: දණ්ඩනය දුරුකොට; යො, යම් පුද්ගලයෙක්; න හන්ති, කිසි සතක් හු තෙමේත් නොමරාද; න ඝාතෙති; අනුන් ලවාත් නොමරවාද; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

අඤ්ඤතරභික්ඛුස්ස වත්ථු

26—23.

24. විරුද්ධෙසු, ආඝාතවසයෙන් සත්ත්වයන් කෙරෙහි විරුද්ධවූ ලෞකික මහාජනයා අතුරෙහි; අවිරුද්ධං, ආඝාතයක් නැති හෙයින් අවිරුද්ධවූ; අත්තදණ්ඩෙසු, (පරහිංසායෙන් නොවැළකී හෙයින්) පරහිංසා පිණිස ගන්නාලද දඬුඇති ලෞකික මහාජනයා අතුරෙහි, නිබ්බුතං, නිවිසිත් ඇති; සාදානෙසු, පඤ්චස්කන්ධයන් මමය මාගේ යැයි ගන්නාවූ ලෞකික මහාජනයා අතුරෙහි; අනාදානං, පඤ්චස්කන්ධයන් මමය මාගේයැයිගැන්මක් නැත්තාවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි; බ්‍රාහ්මණයැයි කියමි.

චතුන්නං සාමණෙරානං වත්ථු

26—24.

25 යස්ස, යම් පුද්ගලයක්හුවිසින්; රාගො ච, (කාමරාග රූපරාග අරූපරාග වශයෙන්) ත්‍රිවිධ රාගයද; දොසො ච, (මේ සත්හු නසිත්වයි යනාදීන් යම්කිසි අරමුණෙක්හි යම්කිසි ආකාරයකින් සැටෙමින් උපදනා) ද්වෙෂයද; මානො, ("සෙය්‍යස්ස සෙය්‍යොහමස්මි" යනාදීන් උපදනාවූ ත්‍රිවිධවශයෙන් පවත්නාවූ) නවවිධ මානයද; මක්ඛො ච, (අනුන් විසින් කරනලද) උපකාර මැකීම ලකුණු කොට ඇති මක්ඛයද; ආරග්ගා, ඉදිකටුඅග නොරඳා එයින් ගැලහෙන්නාවූ; [1] සාසපො රිව, අබඇටක්මෙන්; පාතිතො, හෙලනලදද-ඒ ඒ මාර්ගයෙන් පහකරනලදද; තං ඒ ක්ෂීණාශ්‍රවයා, අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

මහාපන්ථකත්ථෙරවත්ථු

---

1. ගිලිහෙන්නාවූ.

26. අක්කකසං විඤ්ඤාපනිං[1] ගිරං සච්චං උදීරයෙ
යාය නාභිසජෙ කඤ්චි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 408

27. යොධ දීඝංව රස්සං වා අණුං ථූලං සුභාසුභං
ලොකෙ අදින්නං නාදියති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 409

28. ආසා යස්ස න විජ්ජන්ති අස්මිං ලොකෙ පරම්හි ච
නිරාසයං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 410

---

26. යාය, යම් වාචාවක් කාරණකොට ගෙන; කඤ්චි, කිසි පුද්ගලයකු; නාභිසජෙ, නොකුප්පවාද; (කිසිවකුගේ සිත කොපයෙහි ලග්නනොකරවාද එබඳුවූ;) අක්කකසං, කර්කශනොවූ මටසිලුටුවූ; විඤ්ඤාපනිං, මෙලෝ පරලෝ වැඩ හඟවන්නාවූ; සච්චං ගිරං, සැබෑතෙපුල්; උදීරයෙ, යමෙක් කියන්නේවේද; තං, ඒ පුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැ යි කියමි.

පිලින්දිවච්ඡත්ථෙරවත්ථු

26—6.

27. යො, යම් පුද්ගලයෙක්; ඉධ, මේ සත්වලොකයෙහි; දීඝංවා රස්සංවා, වස්ත්‍රාභරණාදීන්ගේ වසයෙන් දික්වූ හෝ ලුහුඬුවූ හෝ; අණුං ථූලං, මණිමුක්තාදීන්ගේ වසයෙන් අණුවූ හෝ ස්ථූලවූ හෝ; සුභාසුභං, (මාහැඟි නොමාහැඟි වස්තූන්ගේ වසයෙන්) යහපත්වූ හෝ නපුරුවූ හෝ; අදින්නං, පරසන්තක වස්තුවක්; නාදියති, සොරසිතින් නොගනීද; තං, ඒ පුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

අඤ්ඤතරත්ථෙරවත්ථු

26—27.

28. යස්ස, යම් පුද්ගලයකුහට; අස්මිං ලොකෙ, මෙලොවද; පරම්හිච, පරලොවද; ආසා නවිජ්ජන්ති, ආසාවෝ නැද්ද; (මනුෂ්‍ය ලොක සම්පත්තියෙහිවත් දිව්‍යලොක සම්පත්තියෙහිවත් ආසා නැද්ද;) නිරාසයං, තෘෂ්ණා රහිතවූ; විසංයුත්තං, සියලු කෙලෙසුන් කෙරෙන් මුක්තවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

සාරිපුත්තත්ථෙරවත්ථු

---

1. විඤ්ඤාපනිං. සමහර—විඤ්ඤාතත්ථං-ම්.

29. යස්සාලයා න විජ්ජන්ති අඤ්ඤාය අකථංකථී
අමතොගධං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 411

30. යොධ පුඤ්ඤඤ්ච පාපඤ්ච උභො සඞ්ගං උපච්චගා
අසොකං විරජං සුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 412

31. චන්දංව විමලං සුද්ධං විප්පසන්නමනාවිලං
නන්දීභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං 413

---

**26—28.**

29. යස්ස, යම් පුද්ගලයක්හට; ආලයා න විජ්ජන්ති, (මෙලොව පරලොව රූපාදීන් විෂයකොට පවත්නාවූ) තෘෂ්ණාවො නැද්ද; අඤ්ඤාය, බුද්ධාදී වස්තූන්අටදෙනා වූ පරිද්දෙන් දැන; (හෙවත්: යථාභූතවශයෙන් දත් හෙයින්;) අකථංකථී, කථංකථා රහිතද; බුද්ධාදි අටතන්හි විචිකිත්සාව නැත්තේද;) අමතොගධං, අමෘත යැයි කියනලද නිර්වාණයට බැස; අනුප්පත්තං, ඒ නිර්වාණයට පැමිණියාවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

## මහාමොග්ගල්ලානත්ථෙරවත්ථු

**29—29.**

30. ඉධ, මේ සත්ත්වලොකයෙහි; යො, යම් පුද්ගලයෙක්; පුඤ්ඤඤ්ච, කුශලයද; පාපඤ්ච, අකුශලයද යන මේ; උභො, දෙකම; උපච්චගා, පහකොට සිටියේද; (හෙවත්: කෙලශසහාය වෛකල්‍යයෙන් විද්‍යමානවූද කුසලයන් විපාකදීමට අසමර්ථ හෙයින් කුසලයන්ද අග්‍රමාර්ගයෙන් සකලකෙලශයන් ප්‍රහීණකළහෙයින් අකුසලයන්ද යන මේ උභය පක්ෂයම නසාපීද;) සඞ්ගං උපච්චගා, රාගසඞ්ගාදිසප්තවිධ සඞ්ගය ඉක්මීද; අසොකං, ශොකරහිතවූ; විරජං, රාගාදිරජස් නැත්තාවූ; සුද්ධං, රාගාදිඋපකෙලශවිගමනයෙන් පරිසුද්ධවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

## රේවතත්ථෙරවත්ථු

**26—39.**

31. චන්දං ඉව, (අභ්‍ර මහිකා ධූම රජෝ රාහුය යන පඤ්චවිධ උප කෙලශයෙන් විනිර්මුක්තවූ) පූර්ණචන්ද්‍රයාමෙන්; විමලං, නිර්මලවූ; සුද්ධං, රාගාදි කෙලෙස්මල විගමනයෙන් පරිසුද්ධවූ; විප්පසන්නං, (ගැඹුරුවූ මහවිලක්මෙන්) විශෙෂයෙන්ම ප්‍රසන්නවූ; අනාවිලං,

32. යො ඉමං පළිපථං දුග්ගං සංසාරං මොහමච්චගා
තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී
අනුපාදාය නිබ්බුතො තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 414

33. යොධ කාමෙ පහන්ත්වාන අනාගාරො පරිබ්බජෙ
කාමභව[1] පරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 415

---

(ක්ලෙශකාලුෂ්‍ය නැතිහෙයින්) නොකැලඹුණු සිත් ඇති; නන්දිභව පරික්ඛීණං, භවයෙහි නන්දනයකරනහෙයින් නන්දිභවයැයි කියන ලද භවතෘෂ්ණාව ක්ෂයකළාවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

## චන්දාභත්ථෙරවත්ථු

**26—31.**

32. යො, යම් මහණෙක්; ඉමං පළිපථං, මේ රාගාදිකෙලෙස් නැමැති කලල්මඩසහිතමාර්ගයද; දුග්ගං, මේ කෙලෙස්නමැති දුර්ගයද; සංසාරං, සංසාරවෘත්තයද; මොහං, චතුරාර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධකළනොදෙනමොහයද; අච්චගා, ඉක්මීද; තිණ්ණො, කාමොඝාදිසතරමහවතුරෙන් එතරවීද; පාරගතො, නිර්‍වාණයැයි කියනලද පාරයට පැමිණියේ වේද; ඣායී, ආලම්බනොපනිධ්‍යාන ලක්ෂණොපනිධ්‍යාන වශයෙන් ධ්‍යායීද, (හෙවත්: සමථවිදර්ශනා භාවනායෙහි යුක්තප්‍රයුක්තද;) අනෙජො, එජාසඞ්ඛ්‍යාතතෘෂ්ණා රහිතද; අකථංකථී, බුද්ධාදිඅටතන්හි උපදනා සංසයක් නැති හෙයින් කථංකථා රහිතද; (හෙවත්: බුද්ධාදි අටතන්හි උපදනා සංසය ලක්ෂණවූ විචිකිත්සාවනැත්තේවේද;)අනුපාදාය නිබ්බුතො, (කාමොපාදානාදීන් නැතිහෙයින් කිසි කෙලෙශයකුදු) තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් මමය මාගේ යැයි) නොගෙන කෙලෙශපරිනිර්‍වාණයෙන් නිවිණිද;තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණ යැයි කියමි.

## සීවලිත්ථෙරවත්ථු

**26—32.**

33. ඉධ, මෙ සත්ත්වලොකයෙහි; යො, යම් පුද්ගලයෙක්; කාමෙ පහන්ත්වාන, වස්තුකාමක්ලෙශකාමයන් පහකොට; අනාගාරො පරිබ්බජෙ, ගෙය හැර මහණවේද; කාමභවපරික්ඛීණං, වස්තුකාමක්ලෙශකාමයන්ද කාමභව රූපභව අරූපභවයන්ද ක්ෂයකළාවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

## සුන්දරසමුද්දත්ථෙරවත්ථු

---

1. කාමාභව.

34. යොධ තණ්හං පහත්වාන අනාගාරො පරිබ්බජෙ
තණ්හාභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 416

35. හිත්වා මානුසකං යොගං දිබ්බං යොගං උපච්චගා
සබ්බයොගවිසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 417

36. හිත්වා රතිඤ්ච අරතිඤ්ච සීතිභූතං නිරූපධිං
සබ්බලොකාභිභුං වීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 418

---

**26—33.**

34. ඉධ, මේ සත්වලොකයෙහි; යො, යම් පුද්ගලයෙක්; තණ්හං පහත්වාන, ෂඩ්වාරිකවූ රූපතෘෂ්ණාදි තෘෂ්ණා දුරුකොට; අනාගාරො, ගෙය නැතිව; පරිබ්බජෙ, පැවිදි වේද; තණ්හාභවපරික්ඛීණං, තෘෂ්ණාවද භවයද ක්ෂයකළාවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

ජෝතිකත්ථෙරවත්ථු

**26—34.**

35. [ඉධ, මේ සත්වලොකයෙහි;] යො, යමෙක්; [1] මානුසකං යොගං, මනුෂ්‍යලොකයෙහි ආයුෂයද මානුසකවූ පඤ්චකාමයද; හිත්වා, හැර;(එහි නිකන්ති පහකිරීම්වසයෙන් හැර;)දිබ්බං යොගං උපච්චගා, දිව්‍යවූ ආයුසයද දිව්‍යවූ පඤ්චකාමගුණයද ඉක්මුණේ වේද; සබ්බයොගවිසංයුත්තං, කාමයොගාදි සියලුයොගයන් කෙරෙන් වෙන්වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

නටපුත්තකවත්ථු

**26—35.**

36. රතිඤ්ච, පඤ්චකාමගුණයෙහි ඇලීමද; අරතිඤ්ච, අධිකුසලයෙහි අරණ්‍යවාසයෙහි උපදනා උකටලියද; හිත්වා, දුරුකොට; සීතිභූතං, නිවිසිත් ඇති; නිරූපධිං, සකන්ධොපධිආදිවූ සතරඋපධීන් නැත්තාවූ; සබ්බලොකාභිභුං, සීලාදිගුණයෙන් සකලලොකයා මැඩපැවැත්තාවූ; වීරං, චතුර්විධසම්‍යක්ප්‍රධාන යැයි කියනලද වීර්‍ය්‍යයෙන් යුක්තවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

නටපුත්තකවත්ථු

---

1. පුද්ගලයෙක්.

37. චුතිං යො වෙදි සත්තානං උපපත්තිඤ්ච[1] සබ්බසො
අසත්තං සුගතං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 419

38. යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා
ඛීණාසවං අරහන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 420

39. යස්ස පුරෙ ච පච්ඡා ච මජ්ඣෙ ච නත්ථි කිඤ්චනං
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 421

---

**26—36.**

37. යො, යම් මහණෙක්; සත්තානං, චුතවන උපදනා සත්ත්වයන්ගේ; චුතිං, චුතිආසන්නයද; උපපත්තිඤ්ච, උත්පත්ති ආසන්නයද; සබ්බසො, සර්වප්‍රකාරයෙන්; වෙදි, ප්‍රකටකොට දනීද; (චුති, චිත්තයද ප්‍රතිසන්ධිචිත්තයද දිවඇසින් දක්නට නොපිළිවන් හෙයින් චුතිචිත්තආසන්නයද ප්‍රතිසන්ධිආසන්නයද ගෙන චුති උත්පත්තිදෙක වදාරනලදී;) අසත්තං, කිසිභවයෙක්හි අලගනාවූ; සුගතං, (අන්තවය පරිවර්ජනයකොට මධ්‍යමප්‍රතිපත්තියෙන් සුන්දරවූ නිර්වාණපුරයට ගියහෙයින්) සුගතනම්වූ; බුද්ධං, චතුරාර්‍ය සත්‍යයන් අවබොධකළහෙයින් බුද්ධනම්වූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

38. යස්ස, යම් ක්ෂීණාශ්‍රවයක්හුගේ; ගතිං, උත්පත්තිගතිය නොහොත්: නිෂ්ඨාව; දෙවා, ශක්‍රාදිදෙවියෝද; ගන්ධබ්බ, තිම්බරු නාරදාදි ගන්ධර්වයෝද; මානුසා, ක්ෂත්‍රියබ්‍රාහ්මණාදි මනුෂ්‍යයෝද; න ජානන්ති, නොදනිද්ද; ඛීණාසවං, ක්ෂීණවූ චතුරාශ්‍රවයන් ඇති; අරහන්තං, කෙලෙසුන් කෙරෙන් දුරුවූ; තං, ඒ ක්ෂීණාශ්‍රව පුද්ගලයා; අහං, මම; බ්‍රාහ්මණං, බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

වඞ්ගීසත්ථෙරවත්ථු.

**26—39.**

39. යස්ස, යම් පුද්ගලයක් හට; පුරෙච, අතීතභවයෙහි නිරුද්ධවූ රූපාදිපඤ්චස්කන්ධයන් කෙරෙහිද; පච්ඡාච, අනාගත භවයෙහි වන සුලුවූ රූපාදිපඤ්චස්කන්ධයන් කෙරෙහිද; මජ්ඣෙච, වර්තමානභවපර්‍යාපන්නවූ රූපාදිපඤ්චස්කන්ධයන් කෙරෙහිද; කිඤ්චනං නත්ථි, තෘෂ්ණාග්‍රහණයැයි කියනලද කිසි පළිබොධයෙක් නැද්ද; අකිඤ්චනං, රාගාදිකිඤ්චනයක් නැත්තාවූ; අනාදානං, තෘෂ්ණාදෘෂ්ටිමානග්‍රාහයක් නැත්තාවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

ධම්මදින්නාථෙරියා වත්ථු.

---

1. උපපත්තිඤ්ච-මූ-අ.

40\. උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං
අනෙජං නහාතකං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 422

41\. පුබ්බෙනිවාසං යො වෙදි සග්ගාපායඤ්ච පස්සති
අථො ජාතික්ඛයං පත්තො අභිඤ්ඤාවොසිතො මුනි
සබ්බවොසිත වොසානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං. 423.

බ්‍රාහ්මණවග්ගො ඡබ්බීසතිමො

---

**26—39**

40\. උසභං, භයසන්ත්‍රාස රහිතබැවින් වෘෂභාජානෙයයකු බඳුවූ; (නිර්භයකාරණයෙන් වෘෂභරාජවූ;) පවරං, උත්තමකාරණයෙන් ප්‍රවරවූ; වීරං, වීර්‍ය්‍යසම්පන්න බැවින් වීරවූ; මහෙසිං, (මහත්වූ ශීලස්කන්ධාදි පඤ්චවිධධර්මස්කන්ධයන් එසනයකළ හෙයින්) මහර්ෂි වූ; විජිතාවිනං, (ක්ලෙශමාරය ස්කන්ධමාරය මෘත්‍යුමාරය යන තුන් මරුන් දිනූ හෙයින්) දිනනලද සතුරන් ඇති; අනෙජං, කාමභවවිභවසඞ්ඛ්‍යාත ත්‍රිවිධ තෘෂ්ණා රහිතවූ; නහාතකං, (අර්හද් මාර්ගඥානසලිලයෙන් ධෞතලද කෙලෙස්මල ඇතිබැවින්) නැහැවාවූ; බුද්ධං, චතුරාර්‍ය්‍යසත්‍යයන් දත්තාවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවයා; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බ්‍රාහ්මණයැයි කියමි.

අඞ්ගුලිමාලස්ථවිරවස්තු

**26—40.**

41\. යො මුනි, යම් මහණෙක්; පුබ්බෙනිවාසං වෙදි, පෙරවිසූ කඳපිළිවෙළ පහළකොට දනීද; සග්ගාපායඤ්ච පස්සති, සවිසි වැදෑරුම්වූ ස්වර්ගයද, නරකාදිසතරඅපායද දිවඇසින් දකීද; අථො, නැවත; ජාතික්ඛයං පත්තො, ජාතික්ෂයයැයි කියනලද අර්හත්ඵලයට පැමිණියේද; අභිඤ්ඤාවොසිතො, (විශිෂ්ටඥානයෙන් දතයුතුවූ අභිඥෙයයාදිධර්මයන්) විශෙෂයෙන් දැන නිෂ්ඨාවට පැමිණියේ වේද; සබ්බවොසිතවොසානං, (සකලක්ලෙශයන්ගේ අවසානයැයි කියනලද අර්හත්ඵලඥානසඞ්ඛ්‍යාත බ්‍රහ්මචර්‍ය්‍යාවාසය වැසනිමවූ; තං, ඒ ක්ෂීණාශ්‍රවමහණහු; අහං, මම; බ්‍රාහ්මණං බ්‍රෑමි, බාහිතවූ පාපධර්මයන් ඇතිහෙයින් බ්‍රාහ්මණයැයි කියමි.

දෙවඞ්ගිසබ්‍රාහ්මණවස්තු

## බ්‍රාහ්මණවග්ගො ඡබ්බීසතිමො

## උද්දානං.

1. යමකොප්පමාදෙ චිත්තං පුප්ඵං බාලෙන පණ්ඩිතො
අරහන්තො සහස්සන පාපදණ්ඩෙන තෙදස.
2. ජරා අත්තා ච ලොකො ච බුද්ධො සුඛ පියෙන ච
කොධො මලඤ්ච ධම්මට්ඨො මග්ගවග්ගෙන වීසති.
3. පකිණ්ණකං නිරයො නාගො තණ්හා භික්ඛුච බ්‍රාහ්මණො
එතෙ ඡබ්බීසතිවග්ගා දෙසිතාදිච්චබන්ධුනා

4. යමකෙ වීසති ගාථා අප්පමාදම්හි ද්වාදස
එකාදස චිත්තවග්ගෙ පුප්ඵවග්ගම්හි සොළස

5. බාලෙ ච සොළස ගාථා පණ්ඩිතම්හි චතුද්දස
අරහන්තෙ දස ගාථා සහස්සෙ හොන්ති සොළස.

6. තෙරස පාපවග්ගම්හි දණ්ඩම්හි දස සත්ත ච
එකාදස ජරාවග්ගෙ අත්තවග්ගෙ භවෙ දස.

7. ද්වාදස ලොකවග්ගම්හි බුද්ධෙ චට්ඨාරසා භවෙ
සුඛෙ ච පියවග්ගෙ ච ගාථායො හොන්ති ද්වාදස.

8. චුද්දස කොධවග්ගම්හි මලවග්ගෙකවීසති
සත්තරස ච ධම්මට්ඨෙ මග්ගවග්ගෙ තථෙව ච

9. පකිණ්ණෙ සොළසගාථා නිරයෙ නාගෙ චතුද්දස
ඡබ්බීසති තණ්හාවග්ගම්හි තෙවීස භික්ඛුවග්ගිකා.

10. චත්තාළීසෙකගාථායො බ්‍රාහ්මණෙ වග්ගමුත්තමෙ
ගාථා සතානි චත්තාරි තෙවීසා ච පුනාපරෙ
ධම්මපදෙ නිපාතම්හි දෙසිතාදිච්චබන්ධුනාති.

ධම්මපදං නිට්ඨිතං.

සිද්ධිරත්ථු.

# ධම්මපදව්‍යාඛ්‍යා

## ග්‍රන්ථිපදවිවරණය.

### නමෝබුද්ධාය.

16 අගාධ- ගැඹුරුවූ;

107 අඞ්ගණරහිතවූයෙහි- රාගද්වේෂාදි තියුණු කෙලෙස් රහිතවූයෙහි; (නැත්තෙහි;)

22 අචලප්‍රසාදයෙහි-නිශ්චලවූ පැහැදීමෙහි;

105 අච්ඡිද්‍රවූ-නොසිදුරුවූ;

131 අජ්ඣත්තිකනීලකසිණාදිරූපධ්‍යාන වශයෙන්- තමාගේ කෙස්ආදි කොටස් නීලකසිණාදිවශයෙන් පරිකර්මකරන්නාහට උපදනා රූපාවචරධ්‍යානයාගේ වශයෙන්;

124 අටතිස් අරමුණ- කර්මස්ථානවිෂයෙහි දක්වනලද පඨවිකසිණ. ආපොකසිණ. තෙජොකසින. වායොකසිණ. නීලකසිණ. පීතකසිණ ලොහිතකසිණ. ඔදාතකසිණ. යන අෂ්ටවිධකසිණයද; උද්ධුමාතක. විනීලක. විපුබ්බක. විච්ඡිද්දක. විඛායිතක. වික්ඛිත්තක. හත වික්ඛිත්තක. ලොහිතක. පුළවක. අට්ඨික. යන දසඅසුභයද; බුද්ධානුස්සති. ධම්මානුස්සති. සඞ්ඝානුස්සති. සීලානුස්සති. චාගානුස්සති. දෙවතානුස්සති. උපසමානුස්සති. යන සප්තානුස්මෘතියද; කායගතාසති. මරණසති. ආනාපානසති. යන ත්‍රිවිධ සතියද, මෙත්තා. කරුණා. මුදිතා. උපෙක්ඛා. යන සතර බ්‍රහ්මවිහරණයද; ආකාසානඤ්චායතන. විඤ්ඤාණඤ්චායතන. ආකිඤ්චඤ්ඤායතන. නෙවසඤ්ඤානාසඤ්ඤායතන. යන චතුර්විධ ආරූප්‍යයද; චතුධාතුවවත්ථාන. ආහාරෙ පටික්කූල සඤ්ඤා. යන විකයදූයි,මෙසේ අෂ්ටත්‍රිංසත් ප්‍රභේදවූ ආරම්මණය;

5 අත්‍ථානනියොජනයට-නුසුදුසු තන්හි යෙදවීමට;

18 අණුවූද-සවල්පවූද=කුඩාවූද;

115 අත්තුක්කංසන- තමා උසස්කොට දැකීම;

27 අනාපත්තිවූවන්හු මැ- නාපත්තියට නොපැමිණියාහු මැ;

132 අධත්මගට- දීර්ඝමාර්ගයට;

18 අධිගමයෙන්ද- මාර්ගඵලාවබොධයෙන්ද;

97 අධිශීලාදිශික්ෂාත්‍රයසංඛ්‍යාත- අධිශිල අධිචිත්ත අධිපඤ්ඤ යන ත්‍රිවිධ ශික්ෂායයි කියනලද;

26 අනධවනියතාවකාලිකාර්ථයෙන්- බොහෝකලක් නොපවත්නා තාවකාලි අර්ථයෙන්;

158 අනන්තරප්‍රත්‍යයවූ- අනතුරුව ප්‍රත්‍යයවූ; (සුවිසිප්‍රත්‍යයෙහි "අනන්තර පච්චයො"යි වදරනලද්දයි.)

143 අනවස්ථිතවූ-එක්අරමුණෙක නොපැවැත්තාවූ;

94 අනිවරණඅවස්ථාවක්- ආවරණ නොවන අවස්ථාවක්; (සර්ග මාර්ග

දෙන ආවරණ කරනහෙයින් නීවරණ නම්. නීවරණ නොවූයේ අනීවරණයි.)

17 අනුබද්ධවූ ශොකශල්‍ය- නොඋදුළු ශෝක නමැති හුල්;

113 අණුමාත්‍රවූ-ස්වල්පමාත්‍රවූ=ස්වල්පවූ;

109 අනුයොගය-නැවත නැවත යෙදීම;

43 අනුරොධ විරොධයක්-අනුකූලත්වයක් හෝ විරුද්ධත්වයක්;

122 අනුශ්‍රවානුමානාදියක්- අනුශ්‍රැති කථා අනුමානය යනාදියක්;

181 අන්තවය- කාමසුඛල්ලිකානුයොගය අත්තකිලමථානුයොගය යන අන්තවය;

36 අපරාපර්‍යවෙද්‍ය වූ- අනාගතයෙහි යථාවකාශ වශයෙන් විපාකදෙන කර්මයක්වූ;

16 අපාරවූ-පරතෙරක් නැත්තාවූ;

77 අපිස්බැව් ආදි- අල්පේච්ඡ භාවය යනාදිවූ; (මෙහි ආදිග්‍රහණයෙන් සන්තුෂ්ට සල්ලෙඛ පවිවෙක වීර්‍යාරම්භ සමාධි පඤ්ඤා විමුක්ති විමුක්ති ඤාණදස්සන ගණන්නේයි.)

23 අප්‍රත්‍යාවර්තනය- නැවත පෙරළා නොඊම;

88 අපොලප්‍රකල- ආස්ඵොටනය කළ කල්හි=අත්පොළසන් දුන්කල්හි;

56 අර්පණාසමාධි- මහද්ගතභාවයට (රූපාවචර අරූපාවචර භාවයට) පැමිණි සමාධිය;

23 අබලදුබලබැවින්ද-බලහැකිබැවින්ද දුබල බැවින්ද;

61 අබවසා- අභ්‍යවකාශයෙහි;

47 අභිධ්‍යාකායග්‍රන්ථාදිසියලුග්‍රන්ථයන්- අභිධ්‍යාකායග්‍රන්ථය ව්‍යාපාදකායග්‍රන්ථය සීලබ්බතපරාමාසකායග්‍රන්ථය ඉදංසච්චාභිනිවෙසකායග්‍රන්ථය යන සියලුකායග්‍රන්ථයන්; "ගන්ථෙන්ති වෙඨෙන්තීති ගන්ථා" යනු ග්‍රන්ථශබ්දයාගේ නිර්වචනයි. අභිධ්‍යා නම්, විෂමලොභයයි. නාමකායින් රූපකාය හෝ ප්‍රත්‍යයොත්පන්නකායින් අනාගතකාය හෝ ග්‍රන්ථනය කෙරෙයි මුදවාලිය නොහැකිසේ වෙළානුයි විෂමලොභත්වය කායග්‍රන්ථනම්. අභිධ්‍යාවම කායග්‍රන්ථනුයි අභිධ්‍යාකායග්‍රන්ථනම්. සෙස් සඳ මේ නයින් දතයුතුයි.

75 අභිනීහාරය- ප්‍රණිධිය=ප්‍රාර්ථනාව;

163 අභියොගයක්-යෙදීමක්;

මනසකාරවශයෙන්- මෙනෙහි නොකිරීම් වශයෙන්;

133 අයම් විතර ඇති- දිගපුළුල් ඇති;

23 අයොධ්‍යවූ- යුධනොකට හැකිවූ;

77 අරිවස් පිළිවෙත්-ආර්‍යවංශ ප්‍රතිපද (ඉතරීතරචීවරාදිසන්තොස භාවනාරාමතා යනු ආර්‍ය වංශ ප්‍රතිපදනම් වේ;)

142 අලංසාටක- බොහෝකොට කාමහත්වයිය බඩඇතිහෙයින් නැභිසිට පිළි හැඳගත නොහී "අලංසාටකා" යි කියන බමුණා අලංසාටකනම්.

15 අවජන්- ආවර්ජනා;

59 අවසරයක්- අවකාශයක්;

32 අවිවර්තිත වූ- නොපුත් වූ;

138 අෂ්ටදුෂ්ටක්ෂණයෙන්- නිරය තිරිසන්යොනිය අසුරනිකාය අරූප අසංඥතල අබුද්ධොත්පාදකාලයපිට සත්වල පඤ්චෙන්ද්‍රියයන්ගේ විකලත්වය දරුනු මිථ්‍යාදෘෂ්ටිය යන අෂ්ටදුෂ්ටක්ෂණයෙන්;

40 අෂ්ටසමාපත්ති-ප්‍රථමධ්‍යානාදිසතර හා ආකාශානඤ්චායතනාදි සතරද යන රූපාරූපඅෂ්ටසමාපත්තිනු;

12 අෂ්ටොත්තරශත ප්‍රභෙදවූ තෘෂ්ණා තොමෝ-එක්සිය අටක් ප්‍රභෙදවූ තෘෂ්ණාව; රූප ශබ්ද ගන්ධ රස

සප්ත ධම් වශයෙන් සවැදෑරුම්වූ තෘෂ්ණාව, කාම භව විභව වශයෙන් අටළොසක. ඒ අටළොස ආධ්‍යාත්මික බාහිර වශයෙන් සතිසක. ඒ සතිස අතීත අනාගත වර්තමාන වශයෙන් එක්සිය අටෙකි;

38 අසද්ගුණහෙතුයෙන්-අසත්‍යගුණ=නැතිගුණ හෙතුයෙන්;

17 අසමුච්ඡින්නවූ වට්ට බීජ ඇති-මනාකොට නොසිඳිනලද භවබීජ ඇති;

28 අසෙඛබුද්ද-ත්‍රිවිධ ශික්‍ෂාව පරිපූර්ණ කළහෙයින් අශෛක්‍ෂබුද්ද=රහත්බුද්ද;

28 අසෝ උපාසක- අසවල් උපාසක තෙම;

88 අහරපිරියෙස්නෙහි-ආහාරපර්‍යෙෂණයෙහි=අහර සෙවීමෙහි;

## ආ.

134 ආකීර්ණවිහාරී වැ-ජනයාගෙන් ගැවසීගත් විහරණ ඇතිව;

18 ආගමයෙන්ද- ත්‍රිපිටක බුද්ධවචනයෙන්ද;

5 ආජීව-ජීවිකාව=දිවිපැවැත්ම;

80 ආදිබ්‍රහ්මචරියය- ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍ර චාරිත්‍රශීලයෙන් (ආභිසමාචාරිකයෙන්) අන්‍යවූශීලය ආදිබ්‍රහ්මචරිය නම්; (මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට ආදියෙහි ඉපදවියයුතුනුයි ආදිබ්‍රහ්මචරියකනාම්. ආජීවඅෂ්ටමක ශීලයයි.)

138 ආද්‍යන්තමික ආයතනයන් සදෙනාහට-චක්‍ෂු ශ්‍රොත ඝ්‍රාන ජිව්හා කායමන යන සදෙනාහට;

80 ආභිසමාචාරිකවත්- ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍ර චාරිත්‍රශීලය පිළිබඳ වත්; මෙහි අභිසමාචාරය නම් උතුම්වූ හැසිරීමයි. අභිසමාචාරයම ආභිසමාචාරිකනම්;

164 ආමිසපටිසන්ථාර- ආමිසයෙන් සතුටුකිරීම;

104 ආලම්බනකරණවශයෙන්-අරමුණුකිරීම් වශයෙන්;

14 ආලම්බනූපනිධ්‍යානය-පඨවිකසිණාදි ආරම්මණයෙහි සිත එකඟකිරීම;

104 ආශ්‍රවධර්මයෝ සතරදෙන-කාමභවදිඨි අවිජ්ජා යන චතුරාශ්‍රවයෝ;

86 ආසන්නවිසන්නවනහෙයින්-ඇලීම විශෙෂයෙන් ඇලීම වනහෙයින්;

142 ආහරහත්ථක- බොහෝකොට කෑනැගී සිටිය නොහී "ආහරහත්ථං" යි (අතඅරනනුව යි) කියන බමුණා ආහර හත්ථක නම්;

49 ඇක්ම- ආක්‍රමණය කොට=මැඩගෙන;

## ඉ.

38 ඉච්ඡාචාරයෙහිසිට- කැමැති අදසෙහි සිටැ;

115 ඉඤ්ජිතයක්-චලිතයක්;

119 ඉදිතුලාවක්-තරාදියක්;

## උ.

65 උදග්‍රනහෙයින්- ප්‍රීති සෞමනස්සහගතවචනකියනා හෙයින්;

114 උදහන සුලුවු-අවමන් කරනසුලුවු;

57 උදුවියට- උත්පත්තිවිභාග දෙකට;

11 උද්දෙශ පරිප්‍රච්ඡාදි වශයෙන්ද- පෙළ ඉගැනීම් අර්ථ පිළිවිසීම් ආදි වශයෙන්ද;

71 උමෙඟ-කලකිරීම;

18 උද්ධම්භාගියවශයෙන් ඔරම්භාගිය වශයෙන්-උද්ධම්භාගිය ඔරම්භාගිය යනු සංයොජනවිශෙෂණවූ වචනවෙයෙකි. උද්ධයයි කියනලද රූපාරූප ධාතුව භජනය කෙරෙත් නුයි උද්ධම්භාගියනම්, ඔරයයි කියනලදකාම ධාතුව භජනය කෙරෙත්නුයි ඔරම්භාගියනම්. මේ මෙහි වචනාර්ථයි;

43 උත්‍රාසනාවනතියක්- හිත්‍රප්‍රසංගාදියෙහි සිතපිළිබඳ උත්පතන් බවක්;

138 උපඝාතනයක්- නැසීමක්=විනාශයක්;

56 උපචාර සමාධි-අර්පණාවට සමීපචාරිවූ කාමාවචර සමාධිය උපචාර සමාධිනම්;

11 උපනිසින්නක කථා ඉතනානුමෝදනා වශයෙන්ද- සමීපයට එළඹ සිටියවුන් හා කරන කථා වළඳ කරන අනුමෝදන ධර්මකථා වශයෙන්ද;

36 උපපද්‍යවෙද්‍යවූ- අනතුරු අත් බැව්හි විපාක දෙන කර්‍මයක්වූ;

3 උපභොග පරිභොග වස්තු- වස්ත්‍රාභරණාදි උපභොගවස්තු හා දැසි දස ගවමහිෂාදි පරිභොග වස්තු;

88 උපවාදයක්-නුගුණ කීමක්;

18 උපාදානයන්-දර;

65 උපෙක්‍ෂකම වෙත්- මධ්‍යස්ථම වෙත්;

## එ.

26 ඒකත්වනය නානත්වනයාදි නය වශයෙන්ද-හෙතුඵල සම්බන්ධයෙන් ධර්‍මපරම්පරාවගේ සඬනොවීම් වශයෙන් පැවැති ධර්‍ම සමූහය තෙම ඒකත්වනයනම් වේ. මෙසේකීහ.

"හෙතුඵල සම්බන්ධෙන
සන්තානානුපච්ඡෙදතො
පච්චෙතො එකත්තනයො
කව්හෙන පකාසිතො" යි,

තමතමන් අයත් ප්‍රත්‍යයෙන් නානා ධර්‍මයන්ගේ යම් ඉපදීමෙක් ඇද්ද හෙතෙම නානත්වනය නම් වේ. එයින් කීහ.

"සකසක පච්චයෙහි
නානාධම්මානුපජ්ජනං
සොව නානත්තනයොති
වෙදිතබ්බො විභාවිනා" යි,

12 එකුද්දනිය ස්ථවිරයන්මෙන්-ධම්මපදඨකථා 19, 3, වස්තුව බලනු;

72 එකොළොස් ගින්නෙන්-රාග ද්වෙෂ මොහ ජාති ජරා මරණ ශොක පරිදෙව දුක්ඛ දෞර්මනස්‍ය උපායාස යන එකාදශ වහ්නියෙන්;

5 එක්විසි අනෙසනෙන්- වෙළුදානං පුප්ඵදානං ඵලදානං දන්තකට්ඨදානං මුඛොදකදානං සිනානදානං චුණ්ණදානං මත්තිකාදානං චාටුකම්‍යතා මුග්ගසූප්‍යතා පාරිභට්‍යතා ජඞ්ඝපෙසනිකං වෙජ්ජකම්මං දූතකම්මං පහෙණකම්මං පිණ්ඩපතිපිණ්ඩදානානුප්පදානං වත්ථුවිජ්ජා නක්ඛත්තවිජ්ජා අඞ්ගවිජ්ජා යන එකවීසති ප්‍රභෙදවූ අනෙවෂණයෙන්;

67 ඒ මතු නොවෙයි- එපමණෙක්ද නොවෙයි;

## ඔ.

18 ඖදරික කෙලශයන්- ඔළාරිකවූ කෙලෙසුන්; (ප්‍රත්‍යයභෙද ගණ සංඝී යනාදීයයි.)

## ක.

101 කත්තුකම්‍යතා වශයෙන්- කරනු කැමැතිබැව් වශයෙන්;

55 කඩපොල්ලක්-රෙදි කඩක්;

111 කණත්තේය-සැරත්තේය;

105 කථා පරියන්තයෙක්- කථාකෙළවරෙක්;

134 කත්වයින්- බිම්බොහන=කොච්ච;

68 කප්ඇට- කපුඇට;

26 කම්වටය, කෙලෙස්වටය, විවටය- ප්‍රතීත්‍යසමුත්පාදයෙහි දක්වනලද සංස්කාර කර්‍මභව යන දෙදෙන කර්‍මවෘත්ත(කම්වට)නමි. අවිද්‍යා තෘෂ්ණා උපාදාන යන මොහු කෙලශවෘත්ත (කෙලෙස්වට) නමි. විඥානනාම රූප සළායතන ස්පර්ශ වෙදනා උපපත්තිභව ජාති ජරා මරණ යන මොහු විපාකවෘත්ත (විවට) නමි;

3 කර්‍ම ප්‍රත්‍යවෙක්‍ෂා වශයෙන් හෝ- කර්‍මය සලකාබැලීම්වශයෙන්හෝ;

9 කර්‍මානුස්මරණ වශයෙන්-කර්‍මය සිහිකිරීම් වශයෙන්;

13 කල්‍යාණධර්‍මයෙහි-කුශලධර්‍මයෙහි;

142 කාකාමංසක- බොහෝ කොට කැයම්සේ කවුඩන් විසින් ආමර්ෂනය කළහැකිවේද එසේ මුඛවාරය දක්වා ආහාර බුදින බමුණා "කාකාමාසක" නමි.

117 කාකස්වර- කවුඩන්ගේ ස්වරබඳු ස්වර;

129 කාගියාසී- කය අනුවගිය සිහිය=කායගතාසති;

310 කාමච්ඡන්දාදි නීවරණ පඤ්චකය- කාමච්ඡන්ද ව්‍යාපාද ථීනමිද්ධ උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා යන පඤ්ච නීවරණය;

14 කාමයෝගාදි සතර යෝගයන් කෙරෙන්- කාම භව දිට්ඨි අවිජ්ජා යන සතර යෝගයන් කෙරෙන්;

23 කායගෙලඤ්ඤාදි වශයෙන්- කය ගිලන්වීම් ආදිවශයෙන්;

111 කායප්‍රගල්භරහිතවූ- කය පිළිබඳ නොසරුප් බුහුටි කමින් තොරවූ,

62 කැටිවසන- එක්වසන;

22 කැලම- කලින්ම;

5 කුලසන්තාට-කුලසංග්‍රහයපිණිස;

3 කුළුදෙස්-කූටසාක්ෂි;(බොරුසාක්ෂි;)

87 කෘච්ඡ්‍රය-දුක;

167 කෘත්‍යඥාන- දුඃඛය පිරිසිඳ දත යුතුයෑ සමුදය පහ කටයුතුයෑ නිරෝධය ප්‍රත්‍යක්ෂ කටයුතුයෑ මාර්ගය වැඩිය යුතුයෑයි උපදනා නුවණ කෘත්‍යඥාන නම්;

103 කෘත්‍රිමදෝෂය- ක්‍රියායෙන් නිපන් කිලුට;

81 කොණ්ඩ අහරෙහි- සැදිපමණින් ලද ආහාරයෙහි;

4 කොඹුමුකුළු- කෙලහොටු;

109 කෙළියදී- ක්‍රීඩාකරද්දී;

179 ක්ලේශකාලුෂ්‍යය-කෙලෙස් කසල;

23 ක්ලේශයුක්තයාක්-කෙලෙසුන් ඇති හාක්;

167 ක්ෂණිකනිරෝධ- ක්ෂණයක් පාසා වන නිරෝධය; (නැතිවීම;)

ග.

117 ගද්ගදස්වර-ගද්ගද යන අනුකරණ ඇති ස්වර;

107 ගමිනී මිනිසුන්ගේ- (අන්තැනකට යනුකැමැති) ගමිකමනුෂ්‍යයන්ගේ;

26 ගැටවනුමල්- ගැටසැපුණුමල්;

128 ගැන්තකොට-දසකොට;

134 ගැඹුරුවල්හිම- ඝනවනයෙහිම;

176 ගැලහෙන්නාවූ-මිදී වැටෙන්නාවූ;

126 ගිමන්සාරමසද- මැදින් බක් වෙසක් පොසොන් යන ගිම්හාන ඍතුයෙහිවූ සාරමසද;

27 ගෙධ වශයෙන්ද- ගිජුවීම් වශයෙන්ද;

69 ගෝව්‍රතය- ගවයන්ට බඳු ව්‍රතය;

5 ග්‍රන්ථධුරයෙහිද- පෙළදහම් ඉගෙන එය දැරීමය කීමය කියවීමය යන ග්‍රන්ථධුරයෙහිද;

ඝ.

12 ඝැටෙමින්-ඝට්ටනයවෙමින්=ගැටෙමින්;

ච.

131 චතුධාතුවවත්ථාන වශයෙන්- චතුධාතුවවත්ථාන යනු කර්මස්ථාන භාවනා ක්‍රමයෙකි. එහි චතුධාතු නම් පඨවි ආපෝ තේජෝ වායු යන සතරයි. වවත්ථානනම් ස්වභාවොප ලක්ෂණ වශයෙන් සන්ටුහන් කිරීමයි;

133 චතුරඞ්ග සමන්විත ඝනාන්ධකාර රාත්‍රියෙහි-අවතුදුස්වක ඝනවූ වන ලැහැබ මේඝය අර්ධරාත්‍රිය යන අඞ්ග සතරෙන් යුත් මහ අඳුරු රැයෙහි;

13 චතුරුපාදානයන්- කාමොපාදාන දිට්ඨුපාදාන සීලබ්බතුපාදාන අත්තවාදුපාදාන යන සතරයි;

101 චතුර්විධප්‍රත්‍යය පූජයෙන්- චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍යය යන සිවුපස පූජයෙන්;

7 චතුර්විධමාර්ගඥානයෙන්-සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතරමගනුවණින්;

106 චතුර්විධවාග්දුශ්චරිතය- මුසාපෙසුඤ්ඤ ඵරුස සම්ඵප්පලාප යන සිවුවැදෑරුම් වාග්දුශ්චරිතය;

180 චතුර්විධ සම්‍යක්ප්‍රධානය- නූපන් අකුශලධර්මයන්ගේ අනුත්පාදය පිණිසද උපන් අකුශලධර්මයන්ගේ ප්‍රහාණය පිණිසද නූපන් කුශලධර්මයන්ගේ උත්පාදය පිණිසද උපන් කුශලධර්මයන්ගේ පරිපූර්ණභාවය පිණිසද පැවැති සතර වීර්‍ය්‍යය;

129 චතුසම්පජඤ්ඤවශයෙන්-"සාත්ථක සම්පජඤ්ඤං සප්පායසම්පජඤ්ඤං ගොචරසම්පජඤ්ඤං අසම්මොහ සම්පජඤ්ඤං" යි දක්වනලද චතුර්විධ සම්ප්‍රජන්‍යයන්ගේ වශයෙන්; ("සම්පජඤ්ඤ" යනු ප්‍රඥාවට නමෙකි මනාවදන්නාබවයයනු එහි අර්ථයි.)

12 චතුඃපාරිශුද්ධිශීල ත්‍රයොදශධුතාඞ්ග-ප්‍රාතිමොක්ෂසංවරශීලය ඉන්ද්‍රිය සංවරශීලය ආජීවපාරිශුද්ධිශීලය ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලය යන සතර සංවර ශීලය හා පංසුකූලිකාඞ්ගය තෙචීවරිකාඞ්ගය පිණ්ඩපාතිකාඞ්ගය සපදානචාරිකාඞ්ගය ඒකාසනිකාඞ්ගය පත්තපිණ්ඩිකාඞ්ගය ඛලුපච්ඡාභත්තිකාඞ්ගය ආරඤ්ඤිකාඞ්ගය රුක්ඛමූලිකාඞ්ගය සොසානිකාඞ්ගය යථා සන්ථතිකාඞ්ගය යන තෙළෙස් ධුතාඞ්ගය;

46 චරිමවිඤ්ඤාණනිරොධයෙන්- පශ්චිම විඥානයාගේ නිරුද්ධවීමෙන්;

1 චාතුර්භූමිකවූ-සතරභූමි පිළිබඳවූ; (කාම රූප අරූප ලොකොත්තර යනුයි.)

34 චාරයෑ- හැසිරියයුතු පරිදි;

33 චුල්ලසීලය- බ්‍රහ්මජාලසූත්‍රයෙහි "පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො සමණො ගොතමො" යි යනාදීන් වදළ ශීලය චූලශීලයයි;

17 ච්‍යවමානවූද-චුතවනු ලබන්නාවූද;

## ජ.

117 ජිතසවර- අනන්තරනතරයෙහි ජිතනාවූ සවර;

101 ජඞ්ඝමාගී- පාදමාගීය;

88 ජනවිවිත්තවූ- ජනශූන්‍යවූ;

158 ජවනක්ෂණයෙහි-ජවනචිත්තක්ෂණයෙහි;

105 ජම්බුනද කනක පුඤ්ජයකට- දඹ රන්රැසකට;

173 ජීවිතනිකාන්තිරහිතහෙයින්-ජීවිතයෙහි ආසානැතිහෙයින්;

## ත.

142 තත්‍රවට්ටක- බොහෝතොට කා නැගිසිටිය හොහී එහිම පෙර ලෙන බමුණා "තත්‍රවට්ටක" නම්;

121 තථ අවිතථ- සැබවූ නිබොරු යහ;

31 තදඞ්ගවිමුක්ත්‍යාදි පඤ්චවිධ විමුක්තීන්ගේ වශයෙන්- තදඞ්ග විෂ්කම්භන සමුච්ඡෙද ප්‍රතිප්‍රශ්‍රබ්ධි නිස්සරණසඞ්ඛ්‍යාත පඤ්චවිධ විමුක්තීන්ගේ වශයෙන්;

8 තදුපනිශ්‍රයවූ-ඊට හේතුවූ;

51 තරුවනෂණ්ඩමණ්ඩිතවූ- වෘක්ෂ වනලැහැබ් යන මෙයින් සැරසුණාවූ;

23 තාවකාලී- තාවකාලික;

49 තිරිසන් යොන් පියෙන්-තිරශ්චීන යෝනිපදයෙන්=තිරිසන් ගතිකාරණයෙන්:

141 තිවුවූ- තියුණුවූ;

59 තුන් දුසිරිත්- කාය වාක් මනඃ සඞ්ඛ්‍යාත ත්‍රිවිධදුශ්චරිතයෙන්;

101 තුන්මඟතුන්ඵල-සොවාන් සකෘදාගාමි අනාගාමි යන මාර්ගත්‍රය හා ඵලත්‍රය;

108 තුන්වයසමෑ-ප්‍රථම මධ්‍යම පශ්චිම යන ත්‍රිවිධ වයස්හුමෑ;

125 තෘෂ්ණාලවයෙක්-අනුමාත්‍රවූ තෘෂ්ණාවෙක්;

148 තෘෂ්ණාවිචරිතයෝ අට්ලොස්දෙන-රූපාදි ෂඩාලම්බනයෙහි එකක් එකක් පාසා උපදින කාමතෘෂ්ණා භවතෘෂ්ණා විභවතෘෂ්ණාසඞ්ඛ්‍යාත අටලොස් තෘෂ්ණාව; (මෙහි විස්තර 2 පිටේ 12 වෙනි අඞ්කය බලනු.)

16 තෘෂ්ණාසන්ථවයෙහි- තෘෂ්ණා සඞ්ඛ්‍යාත සන්ථවයෙහි (ඇල්මෙහි);

29 ත්‍යාගගන්ධයද-ත්‍යාගනමැති සුවඳද;

161 ත්‍රිකචතුෂ්කධ්‍යාන-මෛත්‍රීධ්‍යාන යන් පිළිබඳ චතුෂ්කනය වාරයෙහි වූ ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයෝ "ත්‍රිකධ්‍යාන" යයිද ඒ පිළිබඳවූ පඤ්චකනය වාරයෙහි ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථධ්‍යානයෝ "චතුෂ්ක ධ්‍යාන" යයිද දතයුතුයි;

33 ත්‍රිවිද්‍යාවෝ- පූර්වේනිවාසානුස්මෘති ඥානය දිව්‍යං චක්ෂුරභිඥානය ආශ්‍රවක්ෂයකර ඥානය යන ත්‍රිවිද්‍යායි;

106 ත්‍රිවිධකායදුශ්චරිතය- ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර සංඛ්‍යාත කයපිළිබඳ ත්‍රිවිධ දුශ්චරිතය;

50 ත්‍රිවිධමනෝදුශ්චරිතයෙන්- අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි සංඛ්‍යාත සිත පිළිබඳ ත්‍රිවිධදුශ්චරිතයෙන්;

124 ත්‍රිවිධවිතර්කයන් විසින්-කාමවිතර්ක ව්‍යාපාදවිතර්ක විහිංසාවිතර්ක යන ත්‍රිවිධ විතර්කයන්ගේ වශයෙන්;

18 ත්‍රෛභූමක සංස්කාරයන්- කාමාවචර රූපාවචර අරූපාවචර යන තුන් භූමියට ඇතුලත් සංස්කාර ධර්මයන්;

142 දඹුකඩ- දම්කඩ;

11 දවස් බැල- දවසපිළිබඳ කුලිය;

22 දවසෙසිරුස-දහවියා රුසෙස්යි;

24 දශඅකුශල කර්මපථයෙහි- ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර මුසාවාද පිසුණාවාචා පරුෂාවාචා සම්ඵප්‍රලාප අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි යන දශවිධ අකුශල කර්ම පථයෙහි;

33 දශකථා වස්තූන්- "අප්පිච්ඡකථා සන්තුට්ඨිකථා පවිවිත්තකථා අසංසග්ගකථා විරියාරම්භකථා සීලසම්පදා කථා සමාධිසම්පදාකථා පඤ්ඤාසම්පදාකථා විමුත්ති සම්පදාකථා විමුත්තිඤාණදස්සනසම්පදාකථා" යනු "මජ්ඣිමනිකායෙහි" වදළපරිදි දශකථා වස්තූන්ය;

(සීලමෙඝවර්ණ අභයකාශ්‍යප නරේන්ද්‍රප්‍රණීත ධම්පියා ගැටපද යෙහි මෙහි අන්‍යක්‍රමයක්ද පැනේ.)

25 දශකුශලකර්මපථයෙහි- දශඅකුශල කර්මපථයට ප්‍රතිපක්ෂවූ ප්‍රාණාතිපාතාදීන්ගේ විරමණය යන දශකුශල කර්මපථයෙහි; (මෙහි විස්තර 24 වෙනි අංකයෙහිබලනු.)

7 දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියෝ- "මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්ප මිච්ඡාකම්මන්ත මිච්ඡාආජීව මිච්ඡාවායාම මිච්ඡාසති මිච්ඡාසමාධි මිච්ඡාඤාණ මිච්ඡාවිමුත්ති" යන දසමිච්ඡත්තය දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියයි;

මෙහි අන්‍යක්‍රමයෙක්ද වේ-'නත්ථි දින්නං නත්ථියිට්ඨං නත්ථිහුතං නත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො නත්ථිඅයං ලොකො නත්ථි පරලොකො නත්ථිමාතා නත්ථිපිතා නත්ථිසත්තා ඕපපාතිකා නත්ථිලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා" යනුයි;

8 දශවස්තුක සම්‍යග්දෘෂ්ටියෝ- දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියට ප්‍රතිපක්ෂවූ සම්මාදිට්ඨියනාදි දශය දශවස්තුක සම්‍යග්දෘෂ්ටියයි "අත්ථි දින්නං" යනාදි දශප්‍රභේදයද ග්‍රන්ථාන්තර යන්හි පෑනේ;

174 දශවිධ ආක්‍රොශයද- "චොරොසි බාලොසි මූළ්හොසි ඔට්ඨොසි ගොණොසි ගද්‍රභොසි නෙරයිකොසි තිරච්ඡානගතොසි නත්ථි තුය්හං සුගති දුග්ගතියෙව තුය්හං පාටිකඞ්ඛා" යි ප්‍රකාශිත දශවිධ ආක්‍රොශයද;

155 දශවිධ දානවස්තු-

"අන්නං පානං ඝරං වත්ථං
යානං මාලා විලෙපනං
ගන්ධා සෙය්‍යා පදීපෙය්‍යං
දානවත්ථු සියුං දස"

යනු දශවිධ දාන වස්තූන්ය;

102 දශවිධසංයොජනය- "සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස කාමච්ඡන්ද ව්‍යාපාද රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා" යන සංයොජන ධර්මදශය;

6 දස අසුභයන්,"උද්ධුමාතක විනීලක විපුබ්බක විච්ඡිද්දක වික්ඛායිතක වික්ඛිත්තක හතවික්ඛිත්තක ලොහිතක පුළුවක අට්ඨික" යන දස අසුභයන්;

71 දියාළුවෝදි-යඇළුවේ=ජලයගෙන යන්නෝ;

181 දුඃඛපරිඥානාදිකෘත්‍ය සාධක බැවි නුදු- දුක පිරිසිඳ දැනීම් ආදි කෘත්‍ය යන් සිදුකරන හෙයිනුදු;

72 දුක්ඛාදි අටතැන්හි- "දුක්ඛ දුක්ඛ සමුදය දුක්ඛනිරෝධ දුක්ඛනිරෝධ ගාමිනීපටිපදා පුබ්බන්ත අපරන්ත පුබ්බන්තාපරන්ත ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නා" යන අටතැන්හි;

36 දෘෂ්ටධර්මවේදනීය වූ- මෙ ආත්මයෙහි විපාක දෙන කර්මයක්ව;

121 දෘෂ්ටිසත්‍යයෑ- "ඉදමේව සච්චං මොඝමඤ්ඤං" යනාදි තන්හි පැවතුන පරිදි සකල දෘෂ්ටීහුම සැබවයි ගැන්ම දෘෂ්ටි සත්‍යයයි;

4 දෙවෑ-ධොවනය කොට;

142 දෙවුත්දිය-සනහා සේදුජලය;

130 දෙළොස් ආයතනයෝ- චක්ඛු සොත ඝාන ජිව්හා කාය මන යන ආධ්‍යාත්මික ආයතනයෝ සදෙනා ද රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධර්ම යන බාහිරායතනයෝ සදෙනදැයි මෙසේ වූ ද්වාදශායතනයෝය;

121 ද්වාෂෂ්ටි දෘෂ්ටිගත මාර්ගය- දෙසැට මිථ්‍යා දෘෂ්ටි සංඛ්‍යාත මාර්ගය;

මෙහි දෙසැටදෘෂ්ටිහුනම්, ශාස්වතවාද 4 එකත්‍ය ශාස්වත වාද 4 අන්තානන්තිකවාද 4 අමරාවික්ෂේපිකවාද 4 අධීත්‍ය සමුත්පන්නවාද 4 සඤ්ඤීවාද 16 අසඤ්ඤීවාද 8 නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද8 උච්ඡේදවාද7 දෘෂ්ට ධර්ම නිර්වාණවාද 5 යනුයි; මෙහි විස්තර "දීඝනිකාය බ්‍රහ්මජාල" සූත්‍රාදියෙන් දතයුතුයි.

## ධ.

133 ධනධාන්‍යය-රන්රිදී ආදිධනය හා සාලි ව්‍රීහ්‍යාදි ධාන්‍යය;

164 ධර්මප්‍රතිසංස්කාර-ධර්මයෙන් පිළිසඳර කිරීම;

132 ධර්මානුධර්මප්‍රතිපත්ති පූරණ වශයෙන්- ප්‍රතිවේධ සංඛ්‍යාත නවලෝකෝත්තර ධර්මයට අනුරූපවූ විදර්ශනා ධර්මයෙහි පිළිවෙත් පිරීම් වශයෙන්;

105 ධර්මෞජඃ ප්‍රඥා සංඛ්‍යාතවූ- ධර්මයෙන් දීප්තිමත්වූ නුවණයයි කියන ලද්දවූ;

5 ධැමින්- ධර්මයෙන්;

128 ධුතාඞ්ගපරිහරණය- ධුතාඞ්ගවංශයෙහි පැවැත්ම;

20 ධුතාඞ්ගාරණ්‍යවාසයෙන්- ධුතාඞ්ග සමාදන්ව අරණ්‍යයෙහි විසීමෙන්;

20 ධූරනික්ෂේප නොකොට- උත්සාහය බහා නොතබා (නොහැර);

97 ධෘතිසම්පන්නවූ-වීර්‍ය්‍ය සම්පන්නවූ;

14 ධ්‍රැවවූ-සස්ථිරදු;

## න.

130 නන්දිරාගය- සප්‍රීතික තෘෂ්ණාව;

46 නය හෙයින්-ක්‍රම වශයෙන්;

17 නවදියවතුරක්මෙන්-අභිනව ජල ප්‍රවාහයක් මෙන්;

14 නවලෝකෝත්තරධර්මයෑ- සතර මග 4 සතරඵල 4 නිර්වාණ 1 යන නවලෝකෝත්තර ධර්මයෑ;

39 නවවිධ මානයද : "සෙය්‍යස්ස සෙය්‍යොහමස්මීති මානො-සෙය්‍යස්ස සදිසොහමස්මීති මානො සෙය්‍යස්ස හීනොහමස්මීති මානො-සදිසස්ස සෙය්‍යොහමස්මීති මානො සදිසස්ස සදිසොහමස්මීති මානො-සදිසස්ස හීනොහමස්මීති මානො-හීනස්ස සෙය්‍යොහමස්මීති මානො-හීනස්ස සදිසොහමස්මීති මානො-හීනස්ස හීනොහමස්මීති මානො" යනු නව විධමානයයි;

131 නවසිවපිකාවශයෙන්- උද්ධුමාතක විනීලක විපුබ්බක විච්ඡිද්දක වික්ඛායිතක වික්ඛිත්තක හතවික්ඛිත්තක ලොහිතක පුලවක යන සිව පිකයන් නවදෙනාගේ වශයෙන්,

16 නාමක්- ප්‍රතිෂේධාර්ථයෙහි අව්‍යයකි;

116 නාමකායයෙන්- වේදනා සඤ්ඤා සංඛාර විඥ්ඥාණ යන නාමකායින්;

49 නිඃක්ෂෙපයයිද-බහාලීමෙහිද;

190 නිකාන්ති- ආශාව;

54 නිකෙලෙස් හෙයින්- නිකෙලෙශ හෙයින්=කෙලෙස් නැතිහෙයින්;

103 නිගනීද-නිග්‍රන්ථයොරේද;

29 නිද්‍රාරම වූ-නිද්‍රායෙහි ඇලී;

21 නිෂ්පොපිකිරීම- නිශ්චල කිරීම (දූම්ම);

112 නියුක්තවූ- යෙදුණාවූ;

3 නිරින්ධනවන්නියක්මෙන්- දරනැති ගින්නක්මෙන්;

162 නිරුපධිශෙෂනිර්වාණයට- උපධිශෙෂරහිතවූ නිර්වාණයට;(බුද්ධපක්ෂ බුදු මහරහතුන්ගේ ස්කන්ධපරිනිර්වාණයෙන් පසුව වූ නිවන පඤ්චස්කන්ධොපධිය ශෙෂනොවනහෙයින් නිරුපධිශෙෂ නිර්වාණයැයි කියනු ලැබේ;)

123 නිවන් පණත් සහිතවූ- නිර්වාණ ප්‍රඥප්ති සහිතවූ;

50 නිර්විකාරහෙයින්- විකාරනැති හෙයින්;

14 නිර්විශෙෂ හෙයින්- වෙනසක් නැතිහෙයින්;

55 නිෂ්ප්‍රපඤ්චපරිහරණය පිණිස-තෘෂ්ණා දෘෂ්ටි මාන යන ත්‍රිවිධ ප්‍රපඤ්ච රහිත පරිහරණය පිණිස;

40 නිශ්‍රය ප්‍රණාමන- විනයෙහි කී පරිදි නිස පිළිබඳ ප්‍රණාමනය; (ඉවත්කිරීම;)

1 නිස්සත්ත නිර්ජීවාත්මයෙන්- සත්ව නොවූ ජීවනොවූ අත්මයෙන්;

5 නුනුවණින්-අනුවණින්;

49 නෙරූ- නෙරපා;

23 නොතර බැමිත්ද- ස්ථිර නොවන බැමිත්ද;

## ප.

97 පඤ්චකාමගුණය- රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පස්කම්ගුණය;

112 පඤ්චදෞශීල්‍යකර්මයෙහි- ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර මුෂාවාද සුරාමේරය යන පඤ්චවිධ දුශ්ශීල්‍යකර්මයෙහි;

147 පඤ්ච මහාමූලය- සතර දිශාවට සතරෙක යටට හාජුව එකෙකැයි මෙසේ ව්‍යාසය පිළිබඳව පැවැති පස්මහමුල, පඤ්චමහාමූලයයි;

117 පඤ්චවිධ මාත්සර්යයෙන්-"ආවාස මච්ජරී කුලමච්ජරී ධම්මමච්ජරී වණ්ණමච්ජරී භොගමච්ජරී" යි, කියනලද පඤ්චප්‍රකාර මාත්සර්යයෙන් (මසුරුකමින්);

175 පඤ්චවෛරයන් කෙරෙන්- (9) පිටේ පයනු පෙළේ (112) අඞ්කය බලනු;

76 පණිවාආදීන්- ප්‍රාණවධාදීන්;

34 පයිරුපාසනය කරත්තේ- සමීපයෙහි හිඳීම් වශයෙන් නැවත නැවත සේවනය කරත්තේ;

34 පය්‍යාප්ති ධර්මයද- (සාඨකථා) ත්‍රිපිටක බුද්ධවචනයද;

27 පර්‍ය්‍යෙෂණයෙන්ද- සෙවීමෙන්ද;

121 පරමාර්ථසත්‍යය-'දුක්ඛං අරියසච්චං' යනාදීන් වදළ ප්‍රභෙද ඇත්තේ පරමාර්ථ සත්‍යයයි;

115 පරවම්භන- අනුන්හෙලාදකීම;

161 පරිකම්- පිරියම්(පූර්වභාගයෙහි කළ යුතු ක්‍රියා);

129 පරික්ෂයට- අභාවයට;

101 පරිඥාප්‍රහාණාදිසොළොස්ආකාරයෙන්-චතුරාර්‍ය්‍යසත්‍යාවබොධකාලයෙහිදී සෝවාන් ආදි සතරමාර්ගඥානයන් අතුරෙහි එක් එක් මාර්ගඥානයක් පිළිබඳව පරිඥා, ප්‍රහාන, සච්ඡිකිරියා, භාවනා, යන සතර සතර කෘත්‍ය සොළොසක් කියන ලදහ. ඔව්හු පරිඥාප්‍රහාණාදි සොළොස් ආකාරයෝයි;

36 පරිඥාත ධර්මයන් ඇති- පිරිසිඳ දත් ධර්මයන් ඇති;

173 පරිඥාදි ෂොඩශවිධකෘත්‍ය- (9) පිටේ (101) වෙනි අඞ්කය බලනු;

12 පරිච්ඡෙදයයැ- දතයුතුයැ;

66 පරොස් තෙපුල්- පරුෂ වචන;

172 පවුල්සිවුරු- පාංශුකූලචීවරය;

21 පස්ඇස්- මසැස දිවඇස පැණ ඇස බුදුඇස සමන්තැස යන පඤ්චවිධ චක්ෂුස;

77 පස්නිවරණයන්- කාමච්ඡන්ද ව්‍යාපාද ථිනමිද්ධ උද්ධච්චකුක්කුච්ච විචිකිච්ඡා යන පඤ්චවිධ නිවරණය;

88 පස්විකා- ප්‍රත්‍යවෙක්ෂාකොට;

111 පස්විසි අවහාරයන්- විනයෙහි අදත්තාදාන පාරාජිකායෙහි දක්වූ පස්විසි අවහාරයන්;

ඒ වනාහි, නානාභණ්ඩපඤ්චකය එකභණ්ඩපඤ්චකය සාහත්ථික පඤ්චකය පුබ්බපයෝගපඤ්චකය ථෙය්‍යාවහාර පඤ්චකය යන පඤ්චක පසින් ප්‍රකාශිත අන්සතුදෙය පැහැර ගැණීමෙහි පාරාජිකාඞ්ගයෝය.

එහි නානාභණ්ඩපඤ්චකය නම්, ආදියෙය්‍ය හරෙය්‍ය අවහරෙය්‍ය ඉරියාපථං විකොපෙය්‍ය ඨානා චාවෙය්‍ය යන මෙයින් දක්වූ සවිඤ්ඤාණක අවිඤ්ඤාණක දෙකින් මිශ්‍රවූ නානා වස්තූන් පැහැර ගැනීමයි.

එකභණ්ඩපඤ්චකය නම්, ආදියති හරති අවහරති ඉරියාපථං විකොපෙති ඨානා චාවෙති යන මෙයින් දැක්වූ සවිඤ්ඤාණක වස්තූන්ගේ පැහැරගැණීමයි.

සාහත්ථික පඤ්චකය නම්, සාහත්ථිකය ආණත්තිකය නිස්සග්ගියය අත්ථසාධකය ධුරනික්ඛෙපය යන පසයි.

පුබ්බපයෝගපඤ්චකය නම්, පුබ්බපයෝගය සහපයෝගය සංවිධාවහාරය සංකෙත කර්මය නිමිත්ත කර්මය යන පසයි.

ථෙය්‍යාවහාරපඤ්චකය නම්, ථෙය්‍යාවහාරය පසය්හාවහාරය පරිකප්පාවහාරය පටිච්ඡන්නාවහාරය කුසාවහාරය යන පසයි.

මෙහි විස්තර විභාගය විනය අටුවාවෙහි කී නයින් දතයුතුයි.

163 පස්විසිආකාරයෙකින් උදයද- }
පස්විසි ආකාරයෙකින් ව්‍යයද- }
"අවිජ්ජා සමුදයා රූපසමුදයො"
"අවිජ්ජානිරොධා රූපනිරොධො"
යනාදීන් වදාළපරිදි රූප වෙදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ යන පඤ්චස්කන්ධයෙහි එකී එකී ස්කන්ධයෙක්හි උදයව්‍යය දක්නවශයෙන් දශයක් දශයක් බැගින් සමපනස් ආකාරවූ උදයව්‍යය දෙක; (මේ මෙහි දිග්මාත්‍රයි.)

71 පසළොස්චරණ ධර්මයන්- සීල සංවර ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා භොජනෙ මත්තඤ්ඤුතා ජාගරියානුයොග සද්ධා හිරි ඔත්තප්ප බාහුසච්ච විරිය සති පඤ්ඤා සතර රූපාවචරධ්‍යාන යන පසළොස් චරණ ධර්මයන්;

78 පහනමයවූ- පාෂාණමයවූ;

74 පාබුත්- පාබිඳුණාවූ;

120 පාණිප්‍රහාරාදීන්- අතින් පහර දීමාදියෙන්;

49 පියක්- පාදයක්;

111 පියොගෙකින්- ප්‍රයොගයකින්;

5 පිරියෙස්නෙහිද- සෙවීමෙහිද;

71 පිරිවහන- පාඩම් කියන;

47 පිලව කාරණ්ඩ-මහවෙල්ලු කාරළු යන පක්ෂීහු;

106 පිහිතවූ- වැසුවාවූ;

50 ප්‍රතිඝානුනය-කොපය හා ඇල්ම;

29 ප්‍රතිපත්තිගන්ධයද- පිළිවෙත් නමැති සුවඳද;

92 ප්‍රතිපත්තිපූජාව- පිළිවෙත් පිරීමෙන් කරනා පූජාව;

23 ප්‍රතිබාහනය- මැඩපැත්වීම= වැළැක්වීම;

25 ප්‍රතිවෙධ කරන්නෙය- අවබොධ කරන්නේය;

121 ප්‍රත්‍යය සමුත්පන්නවූද- හේතූන් ගෙන් පහළවූද;

13 ප්‍රමත්තයා- පමාවූවහු;

12 ප්‍රවෘත්තවූ- පැවැත්තාවූ;

152 ප්‍රවෘත්ති විපාකදායකවූ- ප්‍රවෘත්ති විපාක දෙන්නාවූ; (ප්‍රතිසන්ධිවලින් අතර පැවැත්මෙහිදී ඇතිවන විපාක ප්‍රවෘත්ති විපාකයි.)

12 ප්‍රහාතව්‍යයෑ- පහකටයුතුයෑ;

## බ.

74 බණත්තාහුසි- කියත්තාහුය;

65 බම්ද- කියවෙම්ද;

174 බලඇණිකොට- යුධසේනාවක් කොට බලසෙනගක් කොට);

34 බහුශ්‍රැතයෙක්- බොහෝ ඇසූපිරූ තැන් ඇත්තෙක්;

130 බාහිතපාපීවූ-බැහැරකරනලද පව් ඇත්තාවූ;

138 බාහිරායතනයන් සදෙනා විසින්- (8) පිටේ 130) අංකය බලනු;

103 බික- භික්ෂාව= අහර;

81 බිස්සිගත බැවින්- භික්ෂාටනය (පිණ්ඩපාතය) කරන හෙයින්;

178 බුද්ධාදි වස්තූන් අටදෙනා- "බුද්ධෙ කඞ්ඛති ධම්මෙ කඞ්ඛති සඞ්ඝෙ කඞ්ඛති සික්ඛාය කඞ්ඛති පුබ්බන්තෙ කඞ්ඛති අපරන්තෙ කඞ්ඛති පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති" යන අටය;

## භ.

65 භඞ්ගමාත්‍රයක්- බිඳීම මාත්‍රයක්;

123 භවත්‍රය පර්‍ය්‍යාපන්නවූ- කාමභව රූපභව අරූපභව යන තුන්භව යට ඇතුළත්වූ;

125 භවොත්පත්තිසාධකවූ-සසරඉපැත්ම සිද්ධකරන්නාවූ;

29 භස්සාරාමවෑ-අල්ලාප සල්ලාපයෙහි ඇලී;

114 භින්න සවර- අභ්‍යන්තරයෙහි භින්නාවූ සවර;

142 භුත්තවමිතක- බොහොකොට කා මුඛයෙහි නොදැරිය හැකිව එහිම වමනය කරන බමුණා "භුත්තවමිතක" නම්;

## ම.

33 මජ්ඣිමසීලය- බ්‍රහ්මජාල සූත්‍රයෙහි "යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාම භූතගාම සමාරම්භං අනුයුත්තා විහරන්ති" යනාදීන් වදාළ ශීලය මධ්‍යම ශීලයයි;

22 මට්ටනතලයාභිත- ඔල්ලාටශිෂියෙහි=කොණ්නැති හිසෙහි;

92 මනින්නටවත්- මැනීමටවත්;

108 මරණ මුඛයෙහි- මරුමුවෙහි;

28 මර්මච්ඡේදකවූ-මර්මස්ථාන සිඳිනාවූ;

33 මහාසීලයෑ- බ්‍රහ්මජාල සූත්‍රයෙහි "යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති" යනාදීන් වදාළ ශීලය මහාශීලයයි:

12 මංශිණය- පෙවීම;

118 මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යයෙන්- සතරආර්‍ය්‍ය මාර්ගය පිළිබඳ බ්‍රහ්මචර්‍ය්‍යයෙන්;

107 මාර්ගෝපකරණයකුදු- මගවියදම කුදු;

88 මාත්‍රඥබව- භොජනයෙහි පමණ දන්නාබව;

18 මාරායත්තහෙයින්- මාරයා අයත් හෙයින්;

105 මාලුවපත් මෙන්- වියලි තල්පතක් සේ;

49 මූත්‍රපුරීෂාදීන්ගේ-මූත්‍රමලාදීන්ගේ;

111 මෙරමාහට- අනුන්ට;

104 මොනෙය්‍යප්‍රතිපදායෙන්- මාර්ගඥාන සඞ්ඛ්‍යාත මෞනෙය්‍ය ප්‍රතිපදායෙන්;

## ය.

4 යත්න කෙරෙත්ද- උත්සාහ කෙරෙත්ද;

164 යථාලාභසන්තොසය-

,, යථාබලසන්තොසය-

,, යථාසාරුප්පසන්තොසය-

තමාගේ ලාභයට අනුරූපවූ සන්තොසය යථාලාභ සන්තොස නම්; තමාගේ බලයට අනුරූපවූ සන්තොසය යථාබලසන්තොසනම්; තමාගේ සාරුප්පයට අනුරූපවූ සන්තොසය යථාසාරුප්ප සන්තොස නම්;

(මෙහි වනාහි "යොයො ලාභො යථාලාභං තෙන සන්තොසො යථාලාභසන්තොසො" යි, විග්‍රහ බැවින් යම්යම් ලාභයක් "යථාලාභ" නම් ඒ යථාලාභයෙන් සතුටුවීම යථාලාභ සන්තොස නමැයිද අර්ථ ගතයුතු වේ. "යථාබල" "යථාසාරුප්ප" යනතන්හිදු මෙසේමැයි එහි බලය යනු ද්‍රීකායබලයයි. සාරුප්ප යනු භික්ෂුවට අනුච්ජවිකබවයි. හෙවත්: සුදුසු බවයි.)

25 යථා සභාව වශයෙන්- තත්වූ පරිද්දෙන්;

93 යුක්ති බිණීම- යුක්තිකීම=නඩුකීම;

ර.

40 රත්නමෙණිනොවූ- සිදුරු නොහොයන්නෙක්වූ;

149 රාගසඞ්ගාදි සප්තවිධසඞ්ගයෙන්ද- "කාමරාගසඞ්ග දෙෂසඞ්ග මාන සඞ්ග දෘෂ්ටිසඞ්ග විචිකිච්ඡාසඞ්ග භවරාගසඞ්ග අවිජ්ජාසඞ්ග" යන සප්තවිධ සඞ්ගයෙන්;

7 රාගාදිකෂාය- රාගදෙෂාදි කෂට;

153 රාගාද්‍යඞ්ගන රහිතද- රාගාදි කෙලෙස් නැත්තේද;

127 රූපාදි පඤ්චකාමයෙහි- රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පස්කම්හි;

14 රූපාරූප අෂ්ටසමාපත්තිසංඛ්‍යාත- රූපාරූප අෂ්ටසමාපත්තියයි කියන ලද; (ප්‍රථමධ්‍යාන ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථධ්‍යාන යන රූප සමාපත්ති සතර හා ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන අරූප සමාපත්ති සතරද රූපාරූප අෂ්ටසමාපත්ති නම්.)

ල.

14 ලක්ෂණොපනිධ්‍යානයැ- අනිත්‍ය ලක්ෂණාදි සංස්කාර ලක්ෂණ නැරඹීම;

28 ලාබත් පමණත්- දිනපතා දෙන සලාක භක්තයත් ප්‍රමාණවත්;

ව.

139 වගුලේවීනම්- වැටුණේවීනම්;

6 වර්ණසංස්ථාන දිශාකාශ පරිච්ඡෙද වශයෙන්- කාලාදිවර්ණ වශයෙන්; සටහන් (ආකාර) වශයෙන්; නාභියෙන් උඩයට යන දෙදිශා වශයෙන්; පිහිටි අවකාශ වශයෙන්; පිරිසිඳගැනීම්වශයෙන්;

5 වත්පිළිවෙත්- වරක් කිරීම වත නම්; නැවැත නැවැත කිරීම පිළිවෙත නම්; [හේ වනාහි කළයුතු සිරිත් වෙසෙසි.]

80 වදුරමෙන්- වජ්‍රයමෙන්;

23 වධ්‍යවූ- නැසියයුතුවූ;

150 වනථය- තෘෂ්ණාව;

138 වලවිදි- වනයෙහි විදිනලද;

69 වහල්- දසයන්;

70 වළඤ්ජන්නාවූ- වළඳන්නාවූ;

121 වාක්සත්‍යය- "සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය" යනාදි තන්හි පැනෙන සැබෑතෙපුල වාක්සත්‍යයයි;

66 වාග්දණ්ඩ- වචන නමැති දණ්ඩයෙන්;

35 විඥානාධිෂ්ඨිතවූ- ජීවා විඥානයට ආධාරස්ථානවූ;

5 විදර්ශනා ධුරයෙහිද- විදසුන් වඩා රහත්ඵලය ලැබනැඟීමය යන විපස්සනා ධුරයෙහිද;

138 විපිළිසර- නොසතුටු;

97 විප්‍රතිපත්තිය- වරදවා පිළිපැදීම;

119 විමුක්ති- මිදීම [අර්හත්ඵලය];

119 විමුක්තිඥාන දර්ශනය- ප්‍රත්‍යවෙක්ෂා ඥානය;

8 විරලකොට- තුනීකොට;

107 විලික්සව- වියලීගොස්;

29 විසඞ්ඛාය චිත්තවූ- හරණලද කාය හා සිත් ඇතිවූ;

73 විසිදුරු- මහසිදුරු;

51 වෘත්තසන්ධියද- සංසාරයද;

38 වෙහෙරපසත-විහාරපසුභාගයෙහි

ශ.

140 ශරතාක්-හිදඹු=ශරසිගල්ල;

129 ශරීරමණ්ඩන-සිරුර සැරසීම;

81 ශාශ්වතොච්ඡෙද දෘෂ්ටියද- ස්කන්ධ පඤ්චක සඞ්ඛ්‍යාත ලොකය නිත්‍යයැ ධ්‍රැවයැ සදාකාලිකයැයි ගන්නා දෘෂ්ටිය හා එකී ස්කන්ධ පඤ්චක සඞ්ඛ්‍යාත ලොකයම සිදෙන්නේයැ වැනසෙන්නේයැයි පැවැති දෘෂ්ටියද යන මෙකී දෙදෙන ශාශ්වතොච්ඡෙද දෘෂ්ටිනම්;

122 ශිඛාප්‍රාප්තවූ ව්‍යුත්ථාන ගාමිනී විදර්ශනා වශයෙන්- මුදුන් පැමිණියාවූ මාර්ගයට පැමිණෙන විදර්ශනා වශයෙන්;

124 ශීලස්කන්ධාදි පඤ්චවිධ ධර්මස්කන්ධයන් එසනය කලාවූ- සීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥාන දර්ශන යන පඤ්චවිධ ධර්මස්කන්ධය සෙවීම කලාවූ;

128 ශීලස්කන්ධ ගොපනය- ශීලරාශිය හෝ කොට්ඨාසය රැකීම;

23 ශ්‍රද්ධාදි පඤ්චවිධ ජාගර ධර්මයෙන්- සද්ධා විරිය සති සමාධි පඤ්ඤා යන පස්වැදෑරුම් නිදිවර්ජිත ධර්මයන් ගෙන්;

148 ශ්‍රවත්ව- වැගිරී;

29 ශ්‍රුතගන්ධයද-ශ්‍රුතමය ඥානනමැති සුවඳද;

ෂ.

97 ෂඩ්විධ අගොචර සෙවනය- වෙසියගොචර විධව ථුල්ලකුමාරිකා පණ්ඩක භික්ඛුනී පානාගාර යන ෂඩ්විධ අගොචර(නොඑළඹියයුතු) ස්ථානයි;

33 ෂඩභිඥයෑ- දිබ්බචක්ඛු දිබ්බසොත ඉද්ධිවිධ චෙතොපරිය පුබ්බෙනිවාසානුස්සති ආසවක්ඛය යනු ෂඩභිඥායි;

78 ෂඩින්ද්‍රිය දමනයෙන්-චක්ඛු සොත ඝාන ජිව්හා කාය මන යන සයිඳුරන්ගේ දමනයෙන්;

ස.

45 සකායතීරයටමැ- ආත්මභාව සඞ්ඛ්‍යාත තීරයට (ඉවුරට)මැ;

40 සගරමින්- සඞ්ඝාරාමයෙන්;

29 සඞ්ගනිකාරාමවූ-ගණයා කෙරෙහි ඇලී;

140 සඞ්ගාමාවචරවූ- යුධයෙහි හැසිරෙන්නාවූ=යුධයට පැමිණියාවූ;

14 සත්තිස් බොධිපාක්ෂික ධර්මයෑ- චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්චබලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො, යන සප්ත ත්‍රිංසත් බොධ පාක්ෂික ධර්මයෑ; (සතර මාර්ගඥාන සංඛ්‍යාත බොධිගුණයට පක්ෂවූ ධර්මයෝයි.)

129 සතතක්‍රියා ඇත්තාවූ- නිරන්තර ක්‍රියා ඇත්තාවූ;

5 සතර ඉරියව්වෙහිමෑ- ස්ථාන ගමන නිසද්‍ය ශයන යන ඉරියව් සතරෙහිමෑ;

180 සතරඋපධීන්-ඛන්ධූපධි ක්ලෙශූපධි අභිසඞ්ඛාරූපධි කාමගුණූපධි යන කොලෙස් කොටස් සතර;

84 සතරඍද්ධි පාදයන්- ඡන්ද චිත්ත විරිය විමංසා යන චතුර්විධ ඍද්ධි පාද (කොට්ඨාස)යන්;

22 සතර මහාභූතයන්- පඨවි ආපො තෙජො වායො යන සතර මහා භූතයන්;

74 සඳෙර- (13) පිටේ (78) අඞ්කය බලනු;

167 සත්‍යඥාන- "මේ දු ඛයෑ මේ සමුදයයෑ මේ නිරොධයෑ මේ මාර්ගය"යි උපදනා නුවණ 'සත්‍යඥාන' නම් වෙයි;

13 සන්තතිච්ඡෙද සංඛ්‍යාත- ජීවිතෙන්ද්‍රියයාගේ පැවැත්ම සිඳයාමයයි කියනලද;

6 සන්තානයෙහි- චිත්තාභ්‍යන්තරයෙහි;

81 සපදන චරියායෙන්- නෙපිළිවෙළින් හැසිරීමෙන්;

11 සප්ත කාමස්වර්ගයෙහි- සදෙව්ලොව මිනිස්ලොව යන සත් වැදෑරුම් කාම ස්වර්ගයෙහි;

133 සප්තවිධවූ ආර්යධනයෝ- ශ්‍රද්ධා ශීල හිරි ඔත්තප්ප ශ්‍රැත ත්‍යාග ප්‍රඥා යන සත්වැදෑරුම් ආර්යධනයෝ;

26 සප්තවිධ ශෛක්‍ෂතෙමෙ- අධිශීල අධිචිත්ත අධිප්‍රඥා යන ත්‍රිවිධ ශික්‍ෂායෙහි හික්මෙන හෙයින් ශෛක්‍ෂ නම්වූ සෝවාන් මාර්ගස්ථයා පටන් අර්හත්මාර්ගස්ථයා අවසන් කොට ඇති මාර්ගස්ථ ඵලස්ථ සත්දෙන;

57 සමථ විදර්ශනා ප්‍රඥායෙන්ද- සමාධියෙහි හා විදර්ශනායෙහි පැවැති නුවණින්ද;

26 සමාසව්‍යාසසාකල්‍යාදි වශයෙන්ද- සංක්‍ෂෙපය විස්තරය මුලුල්ලය යනාදි වශයෙන්ද;

24 සර්වහරණය කළාවූ-සියලු අයිති දෑය පැහැර ගත්තාවූ;

85 සවිසිවැදෑරුම්වූ ස්වර්ගයද- සදෙව්ලොව සොළොස් බඹතල සතර අරූතල යන ෂඩ්විංශද්විධ ස්වර්ගයද;

2 සහජාතාධිපති වශයෙන්- එක්ව උපදනාවූ චෛතසිකයන්ට අධිපතිවීම් වශයෙන්;

121 සංවෘති සත්‍යයෑ- "සවෙවා බ්‍රාහ්මණො" "සවෙවා ඛත්තියො" යනාදි නන්ති පැනෙන ප්‍රඥප්තිය (පැනවීම්) සංවෘති සත්‍යයයි;

12 සාක්‍ෂාත් කාතිව්‍යයෑ- ප්‍රත්‍යක්‍ෂකට යුතුයෑ;

62 සාදීනවයහයි-ආදීනවසහිතයහයි;

111 සාහත්ථිකාදි පයොගො- සාහත්ථිකයෑ ආණත්තිකයෑ නිස්සග්ගියයෑ ථාවරයෑ විජ්ජාමයයෑ ඉද්ධිමයයෑ යන ෂඩ්විධ ප්‍රයොගයෝ;

37 සාලගුරු රුක්ඛා- ගිනිගෙන දිළියෙන අගුරු රුක්ඛා;

18 සැලෙත්තෙය- කම්පාවන්නෙය;

55 සිද්ධත්ථ- සඹුපු; (අබ;)

130 සිවිනැතිකොට- නිඃශෙෂකොට; (සම්ප්‍රකාරයෙන්;)

16 සියුපිළිසිඹියාවට- අර්ථ ධර්ම නිරුක්ති ප්‍රතිභාන සංඛ්‍යාත චතුර්විධ ප්‍රතිසම්භිදාවට;

147 සුවදෙනාට- සැවැත්ත; (සැවැත් දර ;

5 සෙමින්- සමිභාවයෙන්;

28 සෙබවූද- (14) පිටේ (26) අඞ්කය බලනු;

2 සේය මෙනි- ඡායාව (සෙවනැල්ල) මෙනි;

116 සොළොස් ආකාරයෙකින්- (10) පිටේ (101) අඞ්කය බලනු;

83 ස්කන්ධපඤ්චකය- රූප වේදනා සඤ්ඤා සංස්කාර විඤ්ඤාණ යන පඤ්චස්කන්ධය;

5 ස්මෘතිකවාටයෙන්- සිහි නමැති කවුළුවෙන්;

17 ස්මෘතිජාගර්‍ය්‍යාභාවයෙන්- සිහි යෙන්තොතිදම් නොමැති බැවින්; (සිහිනැතිව නිදීමෙන්;)

159 ස්මෘතිප්‍රස්ථානාදි- සතිපට්ඨානාදිවූ;

129 ස්මෘති විප්‍රවාසයෙන්- සිහියෙන් වෙන්ව විසීමෙන්; (ප්‍රමාදයෙන්;)

17 ස්මෘති වෛපුල්‍යයට- සිහියගේ මහත් බවට;

### හ.

55 හඹුසරලුවක්- කැදහැන්දක්;

62 හලාහල විෂයක්- විෂභෙදයක්;

133 හළුවාවූ- හැරියාවූ;

89 හිණිමැක්පමණ-කාර්ෂාංශප්‍රමාණ (උකුලක් පමණ;)

173 හිදිබාව- පලිසය; (අගුල;)

126 හිමත් සාරම්සද-ඉල් උදුවප් දුරුතු නවම් යන හෙමන්ත ඍතුයෙහිවූ සාරමසද;

86 හිවන- සංසිබ්බනය= මැසීම;

129 හුවනලද- ඔසවනලද;

### ළ.

18 ළැව්ගින්නක්- දවාග්නියක්; (වෙණු සි වෘක්‍ෂවයක් එකට ඇතිමෙන් තෙමෙම හටගත් ගින්නක්;)

49 ළෙත්පැහැර ගියෝය-ළයින් ප්‍රහරණයකොට ගියෝය,

ශිවමස්තු.

---

පැලියගොඩ විද්‍යාලඞ්කාර පිරිවෙන්හි උපාචාර්ය ධුරන්ධර
**කඹුරුපිටියේ ධම්මරතන ස්ථවිරයන් වහන්සේ**
විසින් ලියනලද
**ධම්මපදට්ඨව්‍යාඛ්‍යා ග්‍රන්ථපද විවරණයයි.**

# ධම්මපියා අකාරාදිය.


පිට.

අ.

177 අකක්කසං
137 අකතං දුක්කතං
3 අක්කොච්ඡිමං
174 අක්කොධනං
103 අක්කොධෙන
174 අක්කෝසං
75 අචරිත්වා
76 අචරිත්වා
24 අචිරං වත
39 අඤ්ඤාහි
73 අට්ඨීනං නගරං
80 අත්තදත්ථං
165 අත්තනාචොදය
78 අත්තනාව
79 අත්තනාවකතං
77 අත්තානමෙව
77 අත්තනා චෙ
76 අත්තානං චෙ
54 අත්තාහවෙ
77 අත්තාහි
166 අත්තාහිඅත්තනො
145 අත්ථම්හිජාතම්හි
69 අථවස්ස
67 අථපාපානි
22 අනවට්ඨිත
22 අනවස්සුත
7 අනික්කසාවො
108 අනුපුබ්බෙන
88 අනූපවාදො
74 අනෙකජාති
83 අන්ධභූතො
89 අපිදිබ්බෙසු
136 අපුඤ්ඤලාභොච
44 අප්පකාතෙ
31 අප්පමත්තො අයං
17 අප්පමත්තො
143 අප්පමාදරතා
18 අප්පමාදරතො
19 අප්පමාදරතො

පිට.

18 අප්පමාදෙන
13 අප්පමාදො
12 අප්පම්පිචෙ
160 අප්පලාභොපි
74 අප්පස්සුතායං
139 අභයෙච
58 අභිත්ථරෙථ
56 අභිවාදන
134 අභූතවාදී
109 අයසාවමලං
97 අයොගෙ
70 අලඞ්කතො
138 අලජ්ජිතායෙ
140 අහං නාගොව
104 අහිංසකායෙ
139 අවජ්ජෙ
176 අවිරුද්ධං
38 අසතංභාවන
109 අසජ්ඣායමලා
175 අසංසට්ඨං
7 අසාරෙ
115 අසාහසෙන
6 අසුභානුපස්සිං
51 අස්සද්ධො
71 අස්සොයථා
114 ආකාසෙ
95 ආරොග්‍යපරමා
177 ආසායස්ස

ඉ.

143 ඉදංපුරෙ
19 ඉධතප්පති
19 ඉධනන්දති
9 ඉධමොදති
126 ඉධවස්සං
9 ඉධසොචති

උ.

126 උච්ඡින්ද
123 උට්ඨානකාලම්හි
15 උට්ඨානවතො
15 උට්ඨානෙනා

පිට.

81 උත්තිට්ඨෙ
71 උදකංහි
108 උපනීතවයොච
47 උය්‍යුඤ්ජන්ති
182 උසභංපවරං

එ.

84 එකං ධම්මං
144 එකස්සචරිතං
134 එකාසනං
127 එතමත්ථවසං
90 එතං ඛො සරණං
151 එතං දළ්හං
14 එතං විසෙසතො
121 එතම්හිතුම්හෙ
82 එථපස්සථිමං
112 එවමෙභො
32 එවංසඞ්කාර
121 එසොවමග්ගො

ඔ.

41 ඔවදෙය්‍යානුසාසෙය්‍ය

ක.

45 කණ්හං ධම්මං
137 කයිරාචෙ
100 කාමතොජායති
106 කායප්පකොපං
106 කායෙන
158 කායෙනසංවරො
135 කාසාවකණ්ඨා
87 කිච්ඡො
171 කිංතෙජටාහි
23 කුම්භූපමං
136 කුසොයථා
25 කොඉමං
102 කොධංජහෙ
72 කොනුහාසො

ඛ.

87 ඛන්තීපරමං

ග.

46 ගතද්ධිනො
63 ගබ්භමෙකෙ

පිට.
175 ගම්භීරපඤ්ඤං
75 ගහකාරක
51 ගාමෙවා

ච.

158 චක්ඛුනා
136 චත්තාරිඨානානි
30 චන්දනංතගරං
178 චන්දංවවිමලං
33 චරංචෙ
35 චරන්තිබාලා
101 චිරප්පවාසිං
18 චුතිං යොවෙදි

ඡ.

101 ඡන්දජාතො
167 ඡින්දසොතං
173 ඡෙත්වානන්දිං

ජ.

93 ජයංවෙරං
94 ජිඝච්ඡාපරමා
73 ජීරන්තිවෙ

ඣ.

162 ඣායභික්ඛු
168 ඣායිංවිරජ

ත.

35 තඤ්චකම්මං
100 තණ්හාය
110 තතොමලා
145 තත්‍රාභිරති
164 තත්‍රායමාදි
126 තංපුත්තා
147 තංවො වදමි
102 තථෙව
149 තසිණාය
98 තස්මාපියං
97 තස්මාහි
156 තිණදොසානි
157 තිණදොසානි
122 තුම්හෙහිකිච්චං
14 තෙඣායිනො
92 තෙතාදිසෙ
31 තෙසංසම්පන්නා

ද.

112 දදන්තිවෙ
140 දන්තංනයන්ති

පිට.
168 දිවාතපති
24 දිසොදිසං
22 දීඝාජාගරතො
90 දුක්ඛං දුක්ඛ
21 දුන්නිග්ගහස්ස
113 දුප්පබ්බජ්ජං
91 දුල්ලභො
21 දූරඞ්ගමං
133 දූරෙසන්තො

ධ.

141 ධනපාලකො
42 ධම්මපීති
160 ධම්මාරාමො
81 ධම්මංචරෙ

න.

44 නඅත්තහෙතු
64 නඅන්තලික්ඛෙ
88 නකහාපණ
138 නගරං යථා
172 නචාහං බ්‍රාහ්මණං
105 නචාහු නච
171 නජටාහි
150 නතං දළ්හං
116 නතාවතා
118 නතෙනභික්ඛු
35 නතංකම්මං
25 නතංමාතා
119 නතෙනඅරියො
116 නතෙන ථෙරො
115 නතෙනපණ්ඩිතො
115 නතෙනහොති
163 නත්ථිඣානං
94 නත්ථිරාගසමො
113 නත්ථිරාගසමො
69 නනග්ගචරියා
28 නපරෙසං
130 නපුප්ඵගන්ධො
169 න බ්‍රාහ්මණස්ස
70 න බ්‍රාහ්මණස්සෙ
141 නභජෙ
117 නමුණ්ඩකෙන
119 නමොනෙන
117 නවාක්කරණ
84 නවෙකදරියා

පිට.
127 නසන්ති
120 නසීලබ්බත
141 නහිඑතෙහි
37 නහිපාපං
3 නහිවෙරෙන
153 නිට්ඨංගතො
176 නිධායදණ්ඩං
40 නිධීනංව
105 නෙක්ඛං
89 නෙතං ඛො
54 නෙවදෙවො
144 නොචෙලභෙථ

ප.

162 පඤ්චඡින්දෙ
164 පටිසන්ථාර
49 පඨවිසමො
107 පණ්ඩුපලාසොව
85 පඨව්‍යා
17 පමාදං අප්පමාදෙන
16 පමාදමනුයුඤ්ජන්ති
128 පරදුක්ඛූප
114 පරවජ්ජානු
72 පරිජිණ්ණමිදං
4 පරෙචනවිජානන්ති
95 පවිවෙකරසං
72 පස්සචිත්තකතං
172 පංසුකූලධරං
63 පාණිම්හිචෙ
59 පාපංචෙ
119 පාපානි
60 පාපොපිපස්සති
166 පාමොජ්ජ
98 පියතොජායති
60 පුඤ්ඤංචෙ
33 පුත්තාමත්ථි
27 පුප්ඵානිහෙව
182 පුබ්බෙනිවාසං
92 පූජරහෙ
96 පෙමතො
104 පොරාණමෙතං

ඵ.

19 ඵන්දනංචපලං
120 ඵුසාමිනෙක්ඛම්ම සුඛ
26 ඵෙණූපමං

පිට.

බ.

89 බහුංචෙ
11 බහුම්පිචෙ
96 බාලසඞ්ගතචාරී
169 බාහිතපාපොති

භ.

61 භද්‍රොපිපස්සති

ම.

121 මග්ගානට්ඨඞ්ගිකො
110 මලිත්ථියා
128 මත්තාසුඛ
36 මධුවාමඤ්ඤති
146 මනුජස්ස
106 මනොපකොපං
1 මනොපුබ්බඞ්ගමා
39 මාතෙව
129 මාතරංපිතරං
130 මාතරං පිතරං
16 මාපමාදමනු
61 මාප්පමඤ්ඤෙථ
62 මාප්පමඤ්ඤෙථ
98 මාපියෙහි
66 මාවොච ඵරුසං
36 මාසෙමාසෙ
142 මිද්ධීයදාහොති
152 මුඤ්චපුරෙ
34 මුහුත්තමපිචෙ
141 මෙත්තාවිහාරී

ය.

105 යඤ්චෙවිඤ්ඤූ
163 යතොයතො
8 පථාගාරං දුච්ඡන්නං
9 යථාගාරං සුච්ඡන්නං
67 යථාදණ්ඩෙන
30 යථාපිපුප්ඵරාසිම්හා
28 යථාපිභමරො
147 යථාපිමූලෙ
43 යථාපිරහදො
29 යථාපිරුචිරං
82 යථාබුබ්බුලකං
31 යථාසංකාර
167 යදවයෙසු
170 යමහාධම්මං

පිට.

116 යම්හිසච්චඤ්ච
78 යස්ස අච්චන්ත
170 යස්සකායෙන
181 යස්සගතිං
112 යස්සචෙතං
117 යස්සචෙතං
148 යස්සජත්තිංසති
86 යස්සජාලිනී
85 යස්සජිතං
83 යස්සපාපං
176 යස්සපාරං
181 යස්සපුරෙච
176 යස්සරාගොච
178 යස්සාලයා
48 යස්සාසවා
49 යස්සින්ද්‍රියානි
146 යංඑසාසහති
55 යංකිංචි
137 යංකිංචි
128 යංහිකිච්චං
73 යානිමානි
34 යාවජීවම්පිචෙ
38 යාවදෙව
125 යාවංහි වනථො
45 යෙචඛො
86 යෙඣානපසුතා
151 යෙරාගරත්තා
129 යෙසඤ්ච
48 යෙසං සන්නිචයො
46 යෙසංසම්බොධි
63 යො අප්පදුට්ඨස්ස
179 යොඉමංපලිපථං
124 යොගාවෙ
82 යොචපුබ්බෙ
90 යොචබුද්ධඤ්ච
118 යොචසමෙති
7 යොචවන්ත
146 යොචෙතං සහතී
53 යොචගාථා
56 යොචවස්සසතං
57 යොචවස්සසතං
58 යොචවස්සසතං
69 යොදණ්ඩෙන
175 යොදුක්ඛස්ස

පිට.

179 යොධකාමෙ
180 යොධතණ්හං
118 යොධපුඤ්ඤඤ්ච
177 යොධදීඝඤ්ච
178 යොධපුඤ්ඤඤ්ච
150 යොනිබ්බනථො
111 යොපාණ
33 යොබාලො
159 යොමුඛසඤ්ඤතො
203 යොවෙඋප්පතිතං
53 යොසහස්සං
79 යො සාසනං
166 යොහවෙ

ර.

99 රතියා
51 රමණීයානි
68 රාජතොවා

ව.

106 වචීපකොපං
125 වනංඡින්දථ
140 වජ්ජඤ්ච
141 වරමස්ස
165 වස්සිකාවිය
124 වාචානුරක්ඛී
62 වාණිජොව
20 වාරිජොව
174 වාරිපොක්ඛර
152 විතක්ක
152 විතක්කූපසමෙ
153 විතතණ්හා
68 වෙදනං ඵරුසං

ස.

67 සචෙනෙරෙසි
143 සචෙලභෙථ
103 සච්චංභණෙ
104 සදජාගර
133 [illegible]
165 [illegible]
50 [illegible]
43 [illegible]
155 [illegible]
87 [illegible]
161 [illegible]

පිට.
173 සබ්බසංයොජනං
154 සබ්බාභිභූ
123 සබ්බෙධම්මා
65 සබ්බෙතසන්ති
125 සබ්බෙසංඛාරා
122 සබ්බෙසංඛාරා
149 සරිතානි
160 සලාභං
148 සවන්තිසබ්බධි
52 සහස්සම්පිචෙ
52 සහස්සම්පිචෙ
8 සාරඤ්චසාරතො
36 සාහුදස්සන
161 සිමගිකාබු
109 සීලදස්සන


පිට.
79 සුකරානි
66 සුඛකාමානි
145 සුඛාමත්තෙනායස
91 සුඛො බුද්ධානං
146 සුඛංයාවජරා
110 සුජීවං අහිරිකෙන
163 සුඤ්ඤාගාරං
113 සුදස්සං වජ්ජං
21 සුදුද්දසං
130 සුප්පබුද්ධං
131 සුප්පබුද්ධං
5 සුභානුපස්සිං
92 සුසුඛංවත
93 සුසුඛංවත
111 සුරාමෙරය

පිට.
26 සෙඛොපථවිං
135 සෙය්‍යො
42 සෙලොයථා
107 සො කරොති
108 සො කරොති

හ.

159 හත්ථසඤ්ඤතො
156 හනන්තිභොගා
83 හංසා ආදිච්චපථෙ
180 හිත්වාමානුසංයොගං
180 හිත්වාරතිඤ්ච
70 හිරිනිසෙධො
111 හිරිමනාච
81 හීනං ධම්මං

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු